# පරිවර්තනයක
# ගමන් මඟ

සේවය සඳහා කැපවූ නියාමකයෙක්



SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

වාර්ෂික වාර්තාව 2020

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# පරිවර්තනයක ගමන් මඟ

## සේවය සඳහා කැපවූ නියාමකයෙක්

රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ අධීක්ෂණය කිරීමේ කර්තව්‍යය දී ඇති ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අතීතයේ දී නියාමකයෙකුගේ සාම්ප්‍රදායික භූමිකාවට පමණක් සීමා විය. කෙසේ වෙතත්, කාලය වෙනස්වීම් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළෙඳපොළේ ඉල්ලීම් සැළකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය සහ සංවර්ධනය අතර නිවැරදි සමතුලිතතාවයක් පවත්වා ගනිමින් පහසුකම් සපයන නියාමකයෙකු බවට පරිවර්තනය වී තිබේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද නම්‍යශීලී සහ ක්‍රියාකාරී ප්‍රවේශය මඟින් සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ ප්‍රගතිශීලී ක්‍රියාකාරකම් රාශියකට මුල පිරීමට හැකි වී තිබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචරණය සීමාකර ඇති මොහොතක ඩිජිටල්කරණය හරහා සුරැකුම්පත් වෙළෙඳපොළේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීමට හැකිවීම පුළුල් පරිවර්තනයක් ලෙස සැළකිය හැකිය.

අත්තිවාරම දැමීමත් සමඟ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට රටේ සුරැකුම්පත් වෙළෙඳපොළ ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇතැයි විශ්වාස කෙරේ.

# පටුන


03 අප ගැන
04 සභාපතිතුමාගේ සමාලෝචනය
08 අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය
18 කොමිෂන් සභා සාමාජිකයින්
23 විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනිය හැකි ප්‍රාග්ධන වෙළෙඳපොළ උපායමාර්ග
24 ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග
26 කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම සඳහා වූ ඒකාබද්ධ කමිටුව
27 ඩිජිටල්කණය තුළින් සෑම ශ්‍රී ලාංකිකයෙකු වෙතම ළඟාවීම
30 අනාගතයට අඩි පිම්මක්
32 ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය
35 කළමනාකාරුවන් සහ කළමනාකාරිනියන්
36 කාර්යමණ්ඩලය
42 මෙහෙයුම් සමාලෝචනය
74 අතිරේක තොරතුරු

මූල්‍ය වාර්තා

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
81 විගණකාධිපති වාර්තාව
84 මුල්‍ය තත්ත්ව ප්‍රකාශය
85 මුල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය
86 සංචිතවල වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය
87 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
89 මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
103 විගණකාධිපති වාර්තාව
106 මුල්‍ය තත්ත්ව ප්‍රකාශය
107 මුල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය
108 සෙස් අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය
109 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
110 මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
114 විගණකාධිපති වාර්තාව
117 මුල්‍ය තත්ත්ව ප්‍රකාශය
118 මුල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය
119 මුල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය
120 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
121 මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල
125 විගණකාධිපති වාර්තාව
127 මුල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය
128 මුල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය
129 ශුද්ධ වත්කම් වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය
130 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
131 මුල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
පිට කවරයේ ඇතුළු පැත්ත - සාංගමික තොරතුරු




Scan the QR code or visit
https://www.sec.gov.lk/

# අප ගැන

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, 1991 අංක 26, 2003 අංක 18 සහ 2003 අංක 47 යන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මුදල් අමාත්‍යාංශ විෂය පථයට අයත් වේ.

## දැක්ම

"ඵලදායී, කාර්යක්ෂම හා ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයේ දකුණු ආසියා කලාපයේ ප්‍රමුඛ පෙළේ නියාමකයා බවට පත්වීම"

## මෙහෙවර

"සාධාරණ, කාර්යක්ෂම, ක්‍රමානුකූල හා විනිවිදභාවයෙන් යුත් ප්‍රාග්ධන වෙළෙඳපොළක් ප්‍රවර්ධනය කිරීම, සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම"



# සභාපතිතුමාගේ සමාලෝචනය



**ප්‍රාග්ධන වෙළෙඳපොළක අවසාන පරමාර්ථය වනුයේ ආයෝජකයින්ට සහ ලයිස්තුගත සමාගම්වලට එකසේ ගණුදෙනු කළහැකි පරිසරයක් නිර්මාණය කිරීම හා විශ්වාසය සහතික කිරීමයි.**

**ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න**
සභාපති

කොවිඩ් 19 වසංගතයේ විනාශකාරී බලපෑම නොතකා පසුගිය වසර තුළ වෙළෙඳපොළෙහි දක්නට ලැබුණු කැපී පෙනෙන කාර්යසාධනය තුළින් යළිත් වරක් පෙන්නුම් කරන්නේ, ඕනෑම අභියෝග යක් හමුවේ අපගේ වෙළෙඳපොළෙහි ඇති ඔරොත්තු දීමේ හැකියාව වන අතර ඒ සඳහා සහාය දුන් සියලු පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ උත්සාහය පැසසිය යුතුය. ආයෝජකයින්ගේ සහභාගීත්ව මට්ටම කැපී පෙනෙන ලෙස ඉහළ යාම තුළින් පිළිබිඹු කරන්නේ ආයෝජකයින්ගේ විශ්වාසය හා ශුභවාදී බවයි.

ප්‍රාග්ධන වෙළෙඳපොළක අවසාන පරමාර්ථය වනුයේ ආයෝජකයින්ට සහ ලයිස්තුගත සමාගම්වලට එකසේ ගණුදෙනු කළහැකි පරිසරයක් නිර්මාණය කිරීම හා විශ්වාසය සහතික කිරීමයි. අවශ්‍ය ප්‍රතිසංස්කරණ හා මඟ පෙන්වීම් සමඟ වර්ධනය හා ස්ථාවරත්වය ළඟා කරගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ප්‍රාග්ධන වෙළෙඳපොළේ නියාමකයා ලෙස අඛණ්ඩව සහාය වනු ඇත.

### වසංගතයට එරෙහිව සටන් කිරීම

කොරෝනා වසංගතයෙන් පීඩාවට පත් ලයිස්තුගත සමාගම්වලට සහාය වීම සඳහා, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාංගමික වාර්තාකරණය සහ අවම මහජන හිමිකාරීත්ව අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා කාලය දීර්ඝ කිරීම් ඇතුළු ඇතැම් සහන ක්‍රියාමාර්ග ලබා දෙන ලදි. සියලුම ලියාපදිංචි ආන්තික ණය සැපයුම්කරුවන්ගේ සහ සියලුම බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ගේ ගනුදෙනුකරුවන්ට ඔවුන් විසින් ලබාගත් ණය සඳහා පොළිය ගෙවීම අප තාවකාලිකව අත්හිටවනු ලැබීය. අප විසින් නියාමනය කරනු ලබන ආයතන සඳහා, මූල්‍ය වාර්තාකරණය සහ හෙළිදරව් කිරීම්, වාර්ෂික බලපත්‍ර ලබාදීමේ / ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම කල් දැමීමට සහ ණය ලබාදීමේ තත්ත්වයන් මැනීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීමට ද පියවර ගැණුනි.

මාර්තු මාසයේදී පනවන ලද දැඩි අගුලු දැමීම් හේතුවෙන් කොටස් වෙළෙඳපොළ ගණුදෙනු සඳහා විවෘතව තැබීමට නොහැකි විය. ඒ සඳහා ප්‍රධාන බාධකය වූයේ ඇතැම් මූලික ක්‍රියාකාරකම් ඩිජිටල් ආකාරයෙන් සිදු කිරීමට නොහැකි වීමයි. කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ආරම්භ කළ හැකි ආකාරය පිළිබඳව සෙවීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පාර්ශවකරුවන් සමඟ පවත්වන ලද සාකච්ඡාවලදී, පද්ධතිවල පවතින ආවේණික අඩුපාඩු අනාවරණය විය. එය කොළඹ කොටස් හුවමාරුව ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ

විනිමය කොමිෂන් සභාව පෙළඹවීමට හේතු විය. මේ සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ සාමාජිකයින්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලද අතර ඩිජිටල්කරණයේ පළමු අදියර වාර්තාගත කාලයක් තුළ නිම කිරීමට හැකිවිය. ඒ අනුව ඩිජිටල්කරණය සනිටුහන් කිරීම සඳහා 2020 සැප්තැම්බර් මාසයේදී ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ අනුග්‍රහය යටතේ දෛනික ගණුදෙනු ආරම්භ කිරීමේ උත්සවයක් පවත්වන ලදී. සියලු පාර්ශවකරුවන් ආවරණය වන පරිදි ඩිජිටල්කරණ ක්‍රියාවලිය අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත.

පළමු අදියරේ වැදගත්ම ලක්ෂණය වූයේ අන්තර්ජාලය හරහා ගිණුමක් විවෘත කර එක්සැණෙකින් ගණුදෙනු ආරම්භ කිරීමට හැකිවීමයි. ගණුදෙනුකරු හඳුනාගැනීමේ (KYC) ක්‍රියාවලියේ කොටසක් ලෙස, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් (DRP) අළුතින් සම්බන්ධ වන ආයෝජකයෙකුගේ ජාතික හැඳුනුම්පත් (NIC) තොරතුරුවල සත්‍යතාවය අන්තර්ජාලය හරහා තහවුරු කළ හැකි ශ්‍රී ලංකාවේ පළමු ආයතනය බවට කොළඹ කොටස් හුවමාරුව පත්විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව අතර ත්‍රෛපාර්ශ්වීය අවබෝධතා ගිවිසුමකට එළඹීම (MOU) මගින් මෙය කළ හැකි විය.

ඩිජිටල්කරණ ක්‍රියාවලියේ අනෙකුත් අංග අතරට කඩදාසි මත පදනම් වූ ගිණුම් ප්‍රකාශන ඉලෙක්ට්‍රොනික ස්වරූපයට පරිවර්තනය කිරීම, ලයිස්තුගත සමාගම්වලට ලාභාංශ විද්‍යුත් වශයෙන් ගෙවීමට ඇති හැකියාව සහ ගනුදෙනු පිළිබඳ කෙටි පණිවුඩයක් මගින් ආයෝජකයින්ට දැනුම් දීම ආදිය ඇතුළත්වේ. වසංගතය හේතුවෙන් සංචරණ සීමා සහ වරින් වර පනවන ලද බාධක නොතකා ඩිජිටල්කරණය මගින් වෙළෙඳපොළ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

වෙළෙඳපොළේ ස්ථායිතාවයට බලපාන තියුණු මිල වෙනස්වීම් වලක්වා ගැනීම සඳහා එස් ඇන්ඩ් පී එස්එල් 20 දර්ශකයට අධියර 3 කින් යුත් සීමිත කාලයක් සඳහා ගණුදෙනු නැවැත්වීමේ ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. සැළකිය යුතු ලෙස වෙළෙඳපොළ පහත වැටීමකදී මිනිත්තු තිහක කාලයක් ගණුදෙනු නතර කිරීමට මෙමගින් හැකියාව ලැබෙන අතර වෙළෙඳපොළ සහභාගීවන්නන්ට වෙළෙඳපොළ තත්ත්වයන් තක්සේරු කිරීමට ද අවස්ථාව ලැබේ. එමගින් වෙළෙඳපොළ කෙරෙහි ආයෝජක ප්‍රජාව තුළ විශ්වාසය ගොඩනැංවීමටත් හැකියාව ලැබේ.

## නෛතික හා නියාමන රෙගුලාසි

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි නියාමනය කිරීමේ කාර්යය

**සංචරණ සීමා සහ වරින් වර පනවන ලද බාධක නොතකා ඩිජිටල්කරණය මගින් වෙළෙඳපොළ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වී තිබේ.**

**රු. බිලියන 396.8**

මුළු වෙළෙඳපොළ පිරිවැටුම

### කොළඹ කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණය

කොළඹ කොටස් හුවවාරුවේ ජංගම ඇප් එක ශ්‍රී ලංකාවෙ වේගයෙන් වර්ධනය වන ඇප් එකකි.

**97%**

දේශීය තනි පුද්ගල CDS ගිණුම් කොළඹ කොටස් හුවමාරුවේ මොබයිල් ඇප් එක හරහා විවෘත කරන ලදී.

ඵලදායී හා අර්ථවත් ලෙස ඉටු කිරීමට මෙන්ම ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නම්, අනෙකුත් රටවල සිදුවන වෙනස්කම් ද සමඟ ඉදිරියට යමින් අපගේ නීතිමය රාමුව ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය වේ. අන්තර්ජාතික ආචාරධර්ම, විශේෂයෙන්ම ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO) යෝජනා කරන ලද ආචාරධර්ම වලට අනුගතවීම ද ඉතා වැදගත්වේ.

අපගේ නීතිමය රාමුව නවීකරණය කිරීම සම්බන්ධව දශකයකට වැඩි කාලයක් තිස්සේ විවිධ සාකච්ඡා පැවති අතර,
පසුගිය කොමිෂන් සභාව විසින් නව පනත් කෙටුම්පතක් සකස් කර තිබුණද, එය බලාත්මක කිරීමට නොහැකි විය. කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද එම නව නීති කෙටුම්පත ඉතා ප්‍රවේශමෙන් විමසා බැලීමෙන් පසු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නව පනත් කෙටුම්පත සම්පාදනය කර අවසන් කිරීමට හැකි වූ අතර එය දැන් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේ අවසාන අදියරට ළඟා වෙමින් පවතී. එය කඩිනමින් බලාත්මක කිරීමට රජය පියවර ගනු ඇතැයි අප තුළ දැඩි විශ්වාසයක් ඇත. යෝජිත නව පනතට නියාමනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙන්ම වෙළෙඳපොළ සංවර්ධනයට ඉවහල් වන බොහෝ වැදගත් විධිවිධාන අන්තර්ගතව ඇත. දීර්ඝ කාලීන ප්‍රමාදය, අපගේ වාසියට හේතු විය හැකි බැවින්, වසර ගණනාවක් තිස්සේ වැඩි වැඩියෙන් පියවර ගත් රටවල් මුහුණ දී ඇති අභියෝග යන්ගෙන් ඉගෙන ගෙන නූතනත්වයට පිම්මක් පැනීමට අපට හැකි වනු ඇතැයි අපි විශ්වාස කරමු.

ආයෝජකයින්ගේ ආරක්ෂාව තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ආයෝජකයින් සහ තැරැව්කාර සමාගම් අතර ඇතිවන ආරවුල් විසඳීම සඳහා නව යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කරමින් සිටී. අවසන් කර ඇති යාන්ත්‍රණය මගින් ක්‍රියාවලියේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්වය ශක්තිමත් වන අතරම එය වඩා ඉක්මන් කරනු ඇත.

වඩාත් පැහැදිලි බව, පුරෝකථනය කිරීමේ හැකියාව සහ අනුකූලතාව ඉහළ නැංවීම සඳහා වෙළෙඳපොළ අතරමැදි ආයතන සඳහා පනවා ඇති නීති සංශෝධනය කිරීමේ කටයුතුවල අප නිරතව සිටී.

# සභාපතිතුමාගේ සමාලෝචනය

නැගී එන ප්‍රවණතා සමග මෙම ක්ෂේත්‍රයට අදාළ අපගේ නියාමන කාර්යයන් පෙළගැස්වීම සඳහා නව අත්පත් කර ගැනීමේ හා ඒකාබද්ධ කිරීමේ නීතිරාමුවක් හඳුන්වා දීමට ද පියවර ගනු ලැබ ඇත.

### සාධාරණ ගණුදෙනු සඳහා හිතකර වෙළෙඳපොළක

වෙළෙඳපොළ කොටස් මිල ගණන් හෝ ප්‍රමාණයන් සම්බන්ධයෙන් ආයෝජකයන් නොමඟ යැවීම හෝ වංචනික හැසිරීම් වලක්වා ගැනීම සඳහා කඩිනම් ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු වී තිබේ. පසුගිය වසරේ මැයි මාසයේ සිට වෙළෙඳපොළ මෙහෙයුම්වල ඉහළ මට්ටමේ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර වාර්තාගත නව ආයෝජක ගිණුම් සංඛ්‍යාවක් ද විවෘත විය. එබැවින්, වෙළෙඳපොළ අක්‍රමිකතා හඳුනා ගැනීම සඳහා අප අපගේ නිරීක්ෂණ කටයුතු වේගවත් කර ඇත්තෙමු. නුදුරු අනාගතයේ දී නවීන ආවේක්ෂණ පද්ධතියක් යොදාගැනීමත් සමඟ අපගේ ආවේක්ෂණ හැකියාවන් තවදුරටත් ශක්තිමත් වනු ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොටස් තැරැව්කාර සමාගම් විසින් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ මාලාවක් අනුමත කරන ලදි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව විසින් කොටස් තැරැව්කාර සමාගම් සමඟ සාකච්ඡා කර මෙම මාර්ගෝපදේශ සකස් කරන ලද අතර එමගින් ප්‍රමිතින් ඉහළ නැංවීම සහ ඔවුන් විසින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ වී වෙළෙඳාමට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වෙළෙඳපොළ අතරමැදියන් සහ ආයෝජකයින් සඳහා කළ යුතු දේ සහ නොකළ යුතු දේ පිළිබඳ මග පෙන්වීම් ඇතුළත් ආවේක්ෂණ අත්පොතක් සකස් කරන ලදී.

### කාලෝචිත හා නිරවද්‍ය ප්‍රකාශන

ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීමට හැකි බව සහතික කිරීම සඳහා, සියලු වැදගත් තොරතුරු කාලෝචිත ආකාරයකින් වෙළඳපොළට බෙදා හැරීම වැදගත් ය. ලයිස්තුගත සමාගම්වල වාර්ෂික වාර්තා මෙන්ම සාංගමික සන්නිවේදනයන් තුළින් සිදුකරනු ලබන හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් අඛණ්ඩව සමාලෝචනයන් සිදු කරනු ලබන අතර මෙම ක්‍රියාකාරකම් සියළු සාංගමික අක්‍රමිකතා අනාවරණය කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපට විශ්වාසය. කොවිඩ් වසංගතයෙන් තම ව්‍යාපාර කටයුතු වලට සිදු වූ බලපෑම ලයිස්තුගත සමාගම් අනාවරණය කළ අතර එය ආයෝජකයින්ට ඔවුන්ගේ තීරණ ගැනීමේදී උපකාරයක් විය.

ලයිස්තුගත සමාගම්වල වඩා හොඳ සාංගමික යහපාලනයක් ඇති කිරීම සඳහා සහ වගවීම, සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා අප සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සාංගමික යහපාලන රාමුවක් සකස් කර අවසන් කිරීමට පෙර මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු.

### මූල්‍ය ප්‍රවේශය

සුදුසුකම් නිර්ණායක ලිහිල් කිරීම, සාංගමික යහපාලන සම්මතයන් සහ වාර්තාකරණ අවශ්‍යතා වැනි ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දීමෙන් සමාගම් සඳහා සරල ලැයිස්තුගත අත්දැකීමක් සහතික කිරීම සඳහා නියාමන රාමුව විධිමත් කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පියවර ගත්තේය. ලයිස්තුගත කිරීම් සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුවට පූර්ණ ස්වාධීනත්වයක් ලබා දී ඇත.

ඉතා සුරක්ෂිත ආයෝජන විකල්පයක් ලෙස ශ්‍රී ලංකාවේ ආයෝජකයින්ට සෑම විටම දේපළ ආයෝජනය කෙරෙහි ඉහළ විශ්වාසයක් තබා ඇත. දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (REIT) හඳුන්වාදීමත් සමඟ ආයෝජකයින්ට එම භාරවල ආයෝජනය සඳහා අවස්ථාව උදාවී ඇත. ඒ සඳහා බොහෝ කාලයක් තිස්සේ බලා සිටි නීතිමය රාමුවක් හඳුන්වාදීමට අප කටයුතු කළ අතර එමගින් දේපල වෙළෙඳාම් සමඟ බැඳී ඇති ප්‍රාග්ධනය විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.

අන්තර්ජාල විකල්ප මූල්‍යකරණ ක්‍රමවේද දිරිගැන්වීම සඳහා, සමූහ අරමුදල් ක්‍රම හඳුන්වාදීම සහ ණය ලබා දීම හඳුන්වා දීම අප සළකා බලමින් සිටින්නෙමු. මෙවැනි නව ක්‍රමවේද සඳහා අදාළ නියාමන රාමුව කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව සංවර්ධනය කෙරෙන අතර එසේ කිරීමෙන් ණය දෙන්නන්ට සහ ආයෝජකයින්ට සිදුවිය හැකි අවදානම් වලට එරෙහිව

**වෙළෙඳපොළ කොටස් මිල ගණන් හෝ ප්‍රමාණයන් සම්බන්ධයෙන් ආයෝජකයන් නොමඟ යැවීම හෝ වංචනික හැසිරීම් වලක්වා ගැනීම සඳහා කඩිනම් ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ගැනීම කෙරෙහි අපගේ අවධානය යොමු වී තිබේ.**

ප්‍රාග්ධන සම්පාදනය කිරීමේ ප්‍රතිලාභ සමතුලිත කිරීමේ අවශ්‍යතාව අප අවධානය යොමුකර ඇත.

### ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩතාව

වෙළෙඳපොළ ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ අතරමැදියන්ට තම කටයුතු පවත්වාගෙනයාමට හැකි බව සහතික කිරීම සඳහා විශේෂයෙන් මෙම අස්ථාවර කාල පරිච්ඡේදය තුළ අප ඔවුන්ගේ ප්‍රාග්ධනය සහ අනෙකුත් විශේෂ අවශ්‍යතා, ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළෙමු. වෙළෙඳපොළ සහභාගිවන්නන්ට ඔවුන්ගේ ව්‍යාපාරවල අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ඔවුන්ගේ මෙහෙයුම් සූදානම හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට මෙය උපකාරී විය.

### දැනුවත්භාවය ඇති කිරීම

ශ්‍රී ලංකාවේ විවිධ වූ ආයෝජක ජනගහනයක් සිටින අතර තාක්ෂණික දියුණුව විසින් ආයෝජකයින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ කටයුතු කරන ආකාරය වෙනස් කර ඇත. සමාජ මාධ්‍ය හරහා ආයෝජන උපදෙස් ලබා දෙන පුද්ගලයින් සහ ආයතනවල සැළකිය යුතු වැඩි වීම ගැන අප සැළකිලිමත් වන්නේ ඔවුන්ගෙන් බහුතරයක් පිළිගත් ආයෝජන උපදේශකයින් නොවන බැවිනි. ආයෝජකයින් නොමඟ යැවීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා, ඔවුන්ට ප්‍රධාන මූල්‍ය සංකල්ප පිළිබඳ නිසි අවබෝධයක් ඇති බව සහතික කිරීම මෙන්ම සිදුවිය හැකි අවදානම් පිළිබඳව දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජ මාධ්‍ය

ක්‍රියාමාලාවක් දියත් කළ අතර භාෂා ත්‍රිත්වයම ආවරණය වන කෙටි සජීවිකරණ වීඩියෝ හතරක් ඇතුළුව වැදගත් අධ්‍යාපන හා නියාමන සම්පත් රාශියක් බෙදා හැර තිබේ.

ඉතුරුම් හා ආයෝජන වැනි සංකල්පවල වැදගත්කම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළේ කාර්යභාරය හා ප්‍රතිලාභ පිළිබඳව පාසල් ළමුන් තුළ මෙන්ම විශ්ව විද්‍යාල සිසුන් තුළ ද දැනුමක් ඇති කිරීම ඉතා වැදගත් වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, පාසල් විෂය මාලාව සැකසීමට සම්බන්ධ අදාළ නිලධාරීන් සමඟ අප සාකච්ඡා කළ අතර, අපගේ යෝජනා වලට හොඳ ප්‍රතිචාරයක් ලැබී ඇති බව සඳහන් කිරීමට ලැබීම සතුටට කරුණකි. අදාළ විෂයයන් පාසල් විෂය මාලාවට 6 වන ශ්‍රේණියේ සිට ඇතුළත් කරන බව අප වෙත දන්වා ඇති අතර එය 2023 දී පාසල් විෂය මාලාව සංශෝධනය කරන අවස්ථාවේ දී ක්‍රියාවට නැංවෙනු ඇත. මේ ආකාරයෙන් විශ්වවිද්‍යාල විෂය නිර්දේශය ද සංශෝධනය කිරීමට සැළසුම් කර ඇත.

## අනාගතය දෙස බැලීම

ශක්තිමත් හා පහසු නියාමන පරිසරයක් නිර්මාණය කිරීමට අප සෑම උත්සාහයක්ම දරන අතර, නවෝත්පාදනයන් දිරිගැන්වීම සහ දියුණු වන ප්‍රාග්ධන වෙළෙඳපොළක් නිර්මාණය කිරීම ද එක හා සමානව වැදගත් බව අපි දනිමු. මෙය මනසේ තබා ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පසුගිය වසර තුළ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කර ඇති අතර අපගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පුළුල් කිරීමට හා ගැඹුරු බව වැඩි කිරීමට උපකාරී වන ක්‍රියාමාර්ග රැසක් කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව හඳුන්වා දෙන ලදී.

ඩිජිටල්කරණ වැඩසටහනේ දෙවන අදියර 2021 ජූනි මාසය වන විට අවසන් කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් ප්‍රතිලාභ රැසක් ලැබෙනු ඇත. මිල කාර්යක්ෂමතාව, ද්‍රවශීලතාවය සහ කොටස්වල අස්ථාවරත්වය අවම කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ATS හි ටික් ප්‍රමාණය (ඇණවුම් දෙකක් අතර මිලෙහි පරතරය) සංශෝධනය කරන ලදී. විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ (SPACS) සමාගම්වලට කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කිරීම සඳහා විකල්ප මාර්ගයක් සැපයීමේ අරමුණ ඇතිව ඊට අදාළ නීති රීති සකස් කරමින් සිටින අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒ සඳහා මූලික අනුමැතිය ලබා දී ඇත. අනාගත ආයෝජකයින් සඳහා ලබා ගත හැකි ආයෝජන නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමේ අරමුණින්, රන් ආධාරක නිෂ්පාදන හඳුන්වාදීම සහ සාංග මික ණය සුරැකුම්පත් මත ප්‍රති මිලදී ගැනීමේ (REPO) ගනුදෙනු සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ඕවර් ද කවුන්ටර් (OTC) පුවරුව හරහා ලබා දීමට අපි මූලික වශයෙන් අනුමැතිය ලබා දී ඇත්තෙමු.

සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම තුළින් ආවරණය වන හිඟ විකුණුම් හඳුන්වාදීමට පහසුකම් සැපයීම, ඉස්ලාමීය ආයෝජන උපකරණ, ව්‍යුහාත්මක බලපත්‍ර සහ හරිත බැඳුම්කර යනාදිය ඉදිරියේදී හඳුන්වාදීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, විදේශීය මුදල් වලින් කොටස් හෝ ණයකර මාර්ගයෙන් ප්‍රාග්ධනය රැස්කර ගැනීමට දේශීය සමාගම්වලට පහසුකම් සැළසීමේ කටයුතු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආශිර්වාදය ඇතිව කොළඹ කොටස් හුවමාරුව විසින් ආරම්භ කර ඇති අතර මේ වන විට ඊට අදාළව මහ බැංකුවේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.

ආයෝජකයින්ට කොටස් වෙළෙඳපොළට බාධාවකින් තොරව ප්‍රවේශ වීමට හැකිවන පරිදි, ඩිජිටල් ක්‍රමවේද ක්‍රියාකරුවන්ට තම ග්‍රාහකයින්ට ඔවුන්ගේ ක්‍රමවේද හරහා කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමේ පහසුකම ලබා දීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නීතිමය රාමුව සකස් කිරීමට කොටස් වෙළෙඳපොළ වෙත අනුමැතිය ලබා දී ඇත.

2021 දෙවන කාර්තුවේදී බෙදා හැරීමට එදිරිව ගෙවීම් (DVP) යාන්ත්‍රණය සහ වැඩිදියුණු කළ ආන්තික ආකෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. බෙදා හැරීමට එදිරිව ගෙවීම් යාන්ත්‍රණය සුරැකුම්පත් වෙළෙඳපොළේ ස්ථාවරත්වය ඉහළ නංවන අතර පශ්චාත් වෙළෙඳ අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට උපකාරී වනු ඇත. ශ්‍රී ලංකා සුරැ කුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් හුවමාරුවේ අවසාන පරමාර්ථය වන්නේ මධ්‍යම ප්‍රතිපාර්ශව යාන්ත්‍රණයක් (CCP) ඇති කිරීමයි. කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය කිරීම සඳහා නීති සම්පාදනය කිරීම ද අපේක්ෂා කෙරේ. ඒ සඳහා කෙටුම්පත් කළ පනත් කෙටුම්පත සම්පූර්ණ කර ඇති අතර ඉතිරිව ඇති එකම කාරණය කොටස් වෙන් කිරීම වන අතර එය එකඟ වූ පසු කෙටුම්පත අවසන් කරනු ලැබේ.

## දැනුවත්වීම්

ප්‍රාග්ධන වෙළඳපොළ සහ එහි සංවර්ධනය වෙනුවෙන් රජයේ ඇති කැපවීම මා හොඳින් දැනුවත්ව සිටිමි. ප්‍රථමයෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනුවෙන් වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් නිර්මාණය කිරීමත් අනතුරුව බදු සහන කිහිපයක් ද ලබා දීමෙන් මෙය වඩා හොඳින් තහවුරු වේ. ගරු අග්‍රාමාත්‍ය හා මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාටත්, මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාර්ඩ් කබ්රාල් මහතාටත් භාණ්ඩාගාර ලේකම් එස්.ආර්.ආටිගල මහතාටත් ඔවුන් විසින් ලබාදුන් උනන්දුව සහ සහයෝගය වෙනුවෙන් මා ස්තුතිවන්ත වෙමි.

කොමිෂන් සභාවේ සාමාජිකයින් සමඟ කටයුතු කිරීම සතුටට කරුණක් වන අතර, ඔවුන් සතු පුළුල් හා විවිධාකාර වූ විශේෂඥතාවන් සහ පළපුරුද්ද කොමිෂන් සභාවේ කටයුතු මෙහෙයවීමේදී සුළු වශයෙන් මැනිය නොහැකිය. මම ඔවුන්ට මගේ අවංක ස්තුතිය පිරිනමමි.

අධ්‍යක්ෂ ජනරාල් චින්තක මෙන්ඩිස් මහතා වෙහෙස මහන්සි වී වැඩ කර ඇති අතර ලේකම් කාර්යාලයේ කටයුතු වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කර ඇත. අධ්‍යක්ෂවරුන් සහ කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින් දුෂ්කර අවස්ථාවන් නොතකා ඔවුන්ගේ උපරිමය කළ අතර ඔවුන්ගේ යුතුකම් වඩාත් ඵලදායී ලෙස ඉටු කළහ. ඔවුන් සියලු දෙනාටම මාගේ කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. කොළඹ කොටස් හුවමාරුවේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරී සහ සෙසු කාර්ය මණ්ඩලය සමඟ අපි ඉතා සමීපව කටයුතු කළ අතර ඔවුන් විසින් සපයනු ලැබූ උපකාර සහ සහයෝගය පිළිබඳව මාගේ අගයකිරීම සටහන් කිරීමට කැමැත්තෙමු. අවසාන වශයෙන් , අපගේ කාර්යය පහසු කරවීම සඳහා දායක වූ සියලු පාර්ශවකරුවන්ගේ නොසැළෙන සහයෝගය වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි.



**ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න**
**සභාපති**

2021 මැයි 20

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



බඳුනකට වත් කළ ජලය එහි හැඩය ගන්නාක් මෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි, අප අභිමුවෙහි ඇති බාධක ජය ගැනීමට, අපට ඇති තර්ජන, අවස්ථා බවටත්, අපගේ දුර්වලතා ශක්තීන් බවටත් පත් කර ගත්තෙමු.

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජනරාල්

### ගෝලීය වසංගත තත්වය මධ්‍යයේ නොසැලී සිටීම

2020, සුවිශේෂී වසරකි. අප සිටියේ අසීරු කාලසීමාවක් මධ්‍යයේ ලෙස පෙනී ගිය නමුත් පසුගිය කාලය දෙස ආපසු හැරී බලන විට එය ගතවූ හොඳම කාලයක් ලෙසද හැඳින්විය හැකිය. මා එසේ පැවසීමට හේතුව නම්, පසුගිය වසර යනු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ අතරමැද නවතා තිබූ පද්ධතීන් සහ ක්‍රියාවන් සකස් කර ඒවා රටේ සුරැකුම්පත් වෙළඳපොළ වැඩිදියුණු කිරීමට යෙදවූ වසරක් වීමයි.

දිවයින පුරා නිරෝධායන ඇඳිරිනීතිය පනවා රට වසා තැබූ කාලය තුළ යම් මට්ටමකට හෝ ආයතන කටයුතු පවත්වාගෙන යාමට හැකි වුයේ මාසයක් වැනි කෙටි කාලයක් පමණි. රට වසා තැබීම හේතුවෙන් සුරැකුම්පත් වෙළඳපොළ විවෘත කර සාධාරණ සහ ක්‍රමානුකූල ලෙස පවත්වාගෙන යාමට හැකියාවක් නොතිබිණි. මෙම අනපේක්ෂිත වාතාවරණය හමුවේ අපට මුහුණ දීමට සිදුවිය හැකි අතිමහත් ගැටලු පිළිබඳ අපි අතිශයින්ම සැලකිලිමත් වීමු. කෙසේ නමුත් 2020 වසර දෙස නැවත හැරී බලන විට අවබෝධ වූ කරුණ නම් 2020 යනු ඉහල හා පහල යාම් සාධාරණව තුලනය වූ අද්විතීය වර්ෂයක් බවයි.

ප්‍රථම වරට නිරෝධායන ඇඳිරිනීතිය පනවා රට වසා දැමීමට පෙර 2020 වර්ෂයේ මුල් මාස කිහිපය තුළ ලොව පුරා අනෙකුත් සුරැකුම්පත් වෙළඳපොළවල් සේම ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළඳපොළටද දැඩි ලෙස බලපෑම් එල්ල විය. 2020 වසරේ මුල භාගය තුල නිරෝධායන ඇඳිරිනීතිය සමඟ මුළු දිවයිනම වසා දැමීමට පෙර සියලු කොටස් මිල දර්ශකය 25% ක පහළ යාමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, මෙම තත්වයට සාර්ථකව මුහුණ දෙමින් මෙරට කොටස් වෙළඳපොල අනෙකුත් කලාපීය වෙළඳපොළවල් අභිබවා ගොඩනැගුනු අතර එය 2020 වසරෙහි කැපී පෙනෙන අවසානයක් සනිටුහන් කිරීමට සමත් විය. 2020 වර්ෂයේ මුල භාගය මෙන් නොව රට වසා තැබීමෙන් පසු කාලයේදී සියලු කොටස් මිළ දර්ශකය 48% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර S&P ශ්‍රී ලංකා 20 මිළ දර්ශකය 35% කින් වර්ධනය විය. සංසන්දනාත්මකව ගත් කල 2019 වර්ෂයේ 1.2% ක සාමාන්‍ය වර්ධනයක් හා 2018 වර්ෂයේ 5% ක ඍණ වර්ධනයක්

වාර්තා කල සියලු කොටස් මිළ දර්ශකය, 2020 වසරේ 10.5% ක වර්ධනයක් වාර්තා කිරීමත් සමඟ, සමස්තයක් ලෙස ගත් කල 2020 වසර කැපීපෙනෙන ප්‍රගතියක් පෙන්නුම්කල වර්ෂයක් ලෙස සැලකිය හැකි වේ. තවද 2018 වර්ෂයේ රුපියල් මිලියන 710 ක් සහ 2019 වර්ෂයේ රුපියල් මිලියන 833 ක් වූ දෛනික සාමාන්‍ය පිරිවැටුම අභිබවමින් 2020 වර්ෂයේ රුපියල් බිලියන 1.8 ක දෛනික සාමාන්‍ය පිරිවැටුමක් වාර්තා විය. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව සුරැකුම්පත් වෙළඳපොළ ඩිජිටල්කරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම වසර ඇතුලත මධ්‍යම තැන්පතු ක්‍රමයේ අලුතින් ලියාපදිංචි වූ ගිණුම් සංඛ්‍යාවේ වැඩිවීමක් පෙන්නුම් කරන ලදි. පසුගිය වර්ෂය හා සංසන්දනාත්මකව ගත් කල 2020 වර්ෂයේ දෛනික ගනුදෙනු ප්‍රමාණය, 2019 වර්ෂයේ ගනුදෙනු ප්‍රමාණය මෙන් දෙගුණයකි. අද වන විට දෛනික ගනුදෙනු ගණන 22,000 - 25,000 පරාසයක පවතින අතර එය 2019 වර්ෂයේ වාර්තා වූ දෛනික ගනුදෙනු ගණන මෙන් පස් ගුණයකි. මෙම වර්ෂය ගෝලීය වසංගතයේ ප්‍රතිවිපාක වලින් බැටකමින් සිටියද දේශීය ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගනිමින් වෙළඳපොළ ක්‍රියා කල ආකාරය ඉහත සංඛ්‍යාලේඛන තුලින් පෙන්නුම් කෙරේ. මෙසේ සුරැකුම්පත් වෙළඳපොළෙහි දිශානතියේ හැරවීම, වෙළඳපොළ නැවත ඉහළට ශ්‍රේණිගත කිරීම, නව ආයෝජකයින්, අඩු පොලී අනුපාත, කොරෝනා වසංගතය හමුවේ ලැයිස්තුගත සමාගම් අපේක්ෂා කල මට්ටම වඩා හොඳින් ක්‍රියා කිරීම සහ ඉදිරි වසර කිහිපය තුළ ආයතනික ලාභ ඉහල යනු ඇතැයි අපේක්ෂා කිරීම වැනි හේතුන් කෙරෙහි ආරෝපණ කල හැක.

එක් දෙයක් නිසැකයි. සුරැකුම්පත් වෙළඳපොළ සාක්ෂාත් කරගත් කිසිදු ජයග්‍රහණයක් පහසුවෙන් ලඟා කරගත්තක් නොවේ. වෙළඳපොළ සියලුම පාර්ශවකරුවන්ගේ අඛණ්ඩ උත්සහය නොවන්නට නිශ්චිතවම මේ කිසිදු ජයග්‍රහණයක් අත්කරගැනීමට හැකි නොවුණු ඇත. ඇත්ත වශයෙන්ම ප්‍රාග්ධන වෙළඳපොළවල් හොඳින් ක්‍රියා කිරීමට නම් ආයෝජකයන් හා නිකුත් කරන්නන් යන දෙපාර්ශවයම ඔවුන් ගනුදෙනු කරනා වෙළඳපොළ කෙරෙහි විශ්වාසය තැබිය යුතු වේ. සමස්ත වෙළඳපොළ වර්ධනයෙන් පිළිබිඹු කෙරෙන්නේ වෙළඳපොළ කෙරෙහි සහ සමස්තයක් ලෙස රට කෙරෙහි ඇති විශ්වාසයයි. කෙසේ වෙතත්, වෙළඳපොළ කෙරෙහි විශ්වාසය මඳවීමෙන් අප වෙළඳපොළට එල්ල වූ බලපෑම් අපි අතීතයේ දැක ඇත්තෙමු.

ගෝලීය වසංගතයන නිසා ඇති වූ වෙනස්කම් වලට අනුගත වීමේ වැදගත්කම සහ සුරැකුම්පත් වෙළඳපොළ පවත්වාගෙන යාමට වෙළඳපොළෙ හා සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් ඒ පිළිබඳව අවබෝධ කර ගෙන සිටීම නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියාමකයාගේ සාම්ප්‍රදායික භූමිකාවට සීමා නොවී ආරක්ෂකයා සහ පහසුකම් සපයන්නා ලෙසද ක්‍රියා කළේය.

එම නිසා මා පෙර සඳහන් කල පරිදි ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අපි, වෙළඳපොළ සහ ආයෝජකයන්ගේ අවශ්‍යතා ආරක්ෂා කල යුතු බැවින් කිසි විටෙකත් අප නියාමනය කරන වෙළඳපොළ විශ්වාසනීයත්වය පහල නොයන ලෙස කටයුතු කිරීම කෙරෙහි අවධානයෙන් සිටිමු.

*ගෝලීය වසංගතයන නිසා ඇති වූ වෙනස්කම් වලට අනුගත වීමේ වැදගත්කම සහ සුරැකුම්පත් වෙළඳපොළ පවත්වාගෙන යාමට වෙළඳපොළෙ හා සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් ඒ පිළිබඳව අවබෝධ කර ගෙන සිටීම නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියාමකයාගේ සාම්ප්‍රදායික භූමිකාවට සීමා නොවී ආරක්ෂකයා සහ පහසුකම් සපයන්නා ලෙසද ක්‍රියා කළේය.*




**රු. බිලියන 1.8**

2020 වර්ෂයේ දෛනික සාමාන්‍ය වෙළෙඳපොළ පිරිවැටුම



**දෛනික ගනුදෙනු ගණන**

**25,000 – 22,000**

2019 වර්ෂය මෙන් පස් ගුණයකි

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**පෙර නොවූ විරූ මෙම අනපේක්ෂිත අවස්ථාවේ නව පනත බලාත්මක කරගැනීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පමණක් ලබන අසීරූ ජයග්‍රහණයක් පමණක් නොව එය සමස්ත ප්‍රාග්ධන වෙළඳපොළ සහ එහි පාර්ශවකරුවන් සියල්ලම මෙන්ම රටේ ආර්ථිකය ද ලබා ගන්නා ජයග්‍රහණයක් වේ.**

මා කතාව මදක් වෙනස් කරමින් ඇමරිකාව වැනි ලෝකයේ ධනවත් යැයි හැඳින්වෙන රටවල් විශාල වශයෙන් ආර්ථික අවස්ථාවන් සහ ධනය උත්පාදනය කෙරෙන්නේ ඇයි දැයි ඇසුවහොත්?. නොබෙල් ත්‍යාගලාභී කීර්තිමත් ආර්ථික විද්‍යාඥ ඩග්ලස් නෝර්ත් (Douglass North) මෙම ප්‍රශ්නයම පරීක්ෂණයට ලක් කළා. ඔහුට අනුව නූතන මිනිසා ගල් යුගයේ මිනිසාගෙන් වෙන් කෙරෙන සාධකය නම් විශ්වාසයයි. වෙළඳපොළ ආර්ථිකයක් සාර්ථකත්වය කරා ගෙන යාමට රටෙහි සම්පත් සහ තාක්ෂණික නවෝත්පාදනයන් පමණක් ප්‍රමාණවත් නොවන බව ඔහු තම පරීක්ෂණ තුලින් සොයාගත්තේය. තවද, ආර්ථික පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශ්වාසය සහ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නීති සහ රෙගුලාසි සාධාරණව ක්‍රියාත්මක කිරීමට අධිකරණය සහ නියාමනය වැනි නීතිමය මෙවලම් අවශ්‍ය බව ඔහු තම පරීක්ෂණ තුලින් සොයාගත්තේය.

අනෙක් අතට, මෙම දුෂ්කර කාල සීමාවේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වසර ගණනාවක් තිස්සේ ඉටු කරන ලද සම්ප්‍රදායික භූමිකාවෙන් සහ අනුගමනය කළ සම්ප්‍රදායික ප්‍රවේශය තුලින් අත්මිදෙන්නට සිදු විය. වෙළඳපොළ නියාමනය සහ වෙළඳපොළ සංවර්ධනය අතර මනා තුලනයක් පවත්වා ගනිමින් ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ භූමිකාව නැවත ක්‍රමාංකනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලද්දේ මෙම ගෝලීය වසංගතය පැමිණීමටත් පෙර සිටයි. කෙසේ වෙතත් කටයුතු කිරීමට සිදුවූ අවිනිශ්චිත තත්වයන් හමුවේ ශ්‍රී ලංකා සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාවට තවදුරටත් නිෂ්ක්‍රියව සිටීමට නොහැකි බව ගම්‍ය විය. බඳුනකට වත් කළ ජලය එහි හැඩය ගන්නාක් මෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි, අප අභිමුවෙහි ඇති බාධක ජය ගැනීමට, අපට ඇති තර්ජන, අවස්ථා බවටත්, අපගේ දුර්වලතා ශක්තීන් බවටත් කර පත් කර ගත්තෙමු. නිරෝධායන ඇඳිරිනීතියත් සමග රට වසා තැබීම හේතුවෙන් මුහුණ දීමට සිදුවූ අපහසුතා මධ්‍යයේ කොටස් වෙළඳපොළ ආරක්ෂා කිරීමට සහ එහි කාර්යයන් පවත්වාගෙන යාමට පියවරයන් හඳුන්වාදීමේදී මගේ කාර්යමණ්ඩලය කල්පනාකාරීව සහ ප්‍රවේශමින් කඩිනම්ව කටයුතු කරන ලදී. වේගයෙන් වෙනස් වන තත්වයන් හමුවේ ඉදිරිපෙළ ප්‍රධාන කාර්යයන්හි නිරත වූ කාර්යමණ්ඩල සාමාජිකයින් අත්‍යවශම වූ කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළහ.

පෙර නොවූ විරූ මෙම අනපේක්ෂිත අවස්ථාවේ නව පනත බලාත්මක කරගැනීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පමණක් ලබන අසීරූ ජයග්‍රහණයක් පමණක් නොව එය සමස්ත ප්‍රාග්ධන වෙළඳපොළ සහ එහි පාර්ශවකරුවන් සියල්ලම මෙන්ම රටේ ආර්ථික යද ලබා ගන්නා ජයග්‍රහණයක් වේ.

මෙම පසුබිම තුළ, සාමාන්‍ය නොවූ තත්වයන් යටතේ වසරක කාලයක් ඇතුලත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අත් කරගත් සාර්ථකත්වය පිළිබඳ පහත අංශයන් යටතේ සමාලෝචනය කිරීමට හැකිවීම ගෞරවයක් ලෙස සලකමි.

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, නියාමකයා, ආරක්ෂකයා සහ පහසුකම් සපයන්නා ලෙස

ගෝලීය වසංගතය නිසා ඇති වූ වෙනස්කම් වලට අනුගත වීමේ වැදගත්කම සහ සුරැකුම්පත් වෙළඳපොළ පවත්වාගෙන යාමට වෙළඳපොළෙ හා සම්බන්ධ සියලුම පාර්ශවකරුවන් ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින් ඒ පිළිබඳව අවබෝධ කර ගෙන සිටීම නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නියාමකයාගේ සාම්ප්‍රදායික භූමිකාවට සීමා නොවී ආරක්ෂකයා සහ පහසුකම් සපයන්නා ලෙසද ක්‍රියා කළේය. මෙසේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සක්‍රිය කල ආරක්ෂකයා සහ පහසුකම් සපයන්නාගේ භූමිකාව තුළින් ගෝලීය වසංගත කාලය තුළ තම කාර්යයන් පවත්වා ගැනීමට කොටස් තැරැව්කරුවන්ට/වෙළඳුන්ට, ආයෝජකයින්ට, සහ අනෙකුත් නියාමන ආයතන වලට බොහෝ සහන ලබා දීමේ හැකියාව හිමිවුණි. එසේ ක්‍රියාත්මක කල සහන පියවරයන් කිහිපයක් පහතින් සඳහන් කිරීමට කැමැත්තෙමි.

‘ලැයිස්තුගත සමාගම් සඳහා අවම මහජන හිමිකාරිත්වය’ (minimum public holding) සමඟ අනුකූල වීමට සහ වාර්ෂික වාර්තා/කාර්තුමය වාර්තා හා අනෙකුත් අතිරේක වාර්තා ඉදිරිපත් කිරීමට ලබා දී තිබූ කාලය දීර්ඝ කරන ලද අතර ලැයිස්තුගත කිරීමේ නීති යටතේ වන පොදු අනුකූතා සඳහා වෙනත් සහන පියවරයන් ක්‍රියාත්මක කරන ලදී. තවද, බාධාවකින් තොරව වෙළඳපොළ ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමට කොටස් තැරැව්කරුවන්/වෙළඳුන් විසින් භාරගන්නා ණය නිරාවරණ නියාමනය සහ අධීක්ෂණය සඳහා නිශ්චිත මාර්ගෝපදේශ මාලාවක් නිකුත් කල අතර ආන්තික සීමාවන් ඉක්ම නොයෑම සහතික කිරීම සඳහා ආන්තික සැපයුම්කරුවන්වද අධීක්ෂණයට ලක් කෙරිණි. ඉහත සඳහන් කල සහන පියවරයන්ට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආන්තික සැපයුම්කරුවන් සහ බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් යටතේ ලියාපදිංචි වී සිටින සියලුම ගනුදෙනුකරුවන්ට ලබා ගත් ණය සීමාවන්

සඳහා පොලී ගෙවීමට ලබාදී තිබෙන කාලය දීර්ඝ කරන ලද අතර වෙළඳපොළ අතරමැදියන් විසින් 2020 වර්ෂය සඳහා ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර/ලියාපදිංචි ගාස්තු ගෙවීමේ කාලය වසරකින් දීර්ඝ කරන ලදී

මෙම අර්බුධකාරී අවස්ථාවේ සුරැකුම්පත් වෙළඳපොළ බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක වූ ආකාරය ඉහත සඳහන් සහන පියවරයන් තුලින් පිළිබිඹු වේ.

## ඵලදායී නියාමනය සඳහා නීතිය සහ ප්‍රතිපත්ති

1987 වසරේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත බලාත්මක කර දශක තුනක් ගතවන මේ මොහොතේ අප සිටින්නේ ප්‍රාග්ධන වෙළඳපොළ නියාමනය සඳහා වඩා ශක්තිමත් සහ පහසුකම් සලසන නිතියක අවශ්‍යතාවය දැනෙන සංධිස්ථානයකයි. ඉතා දීර්ඝ කාලයක් මුළුල්ලේ ක්‍රියාත්මක නොවී තිබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නව පනත නොබෝ දිනකින් බලාත්මක කර ගැනීමට හැකි වනු ඇත. පෙර නොවූ විරූ මෙම අනපේක්ෂිත අවස්ථාවේ නව පනත බලාත්මක කරගැනීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පමණක් ලබන අසීරු ජයග්‍රහණයක් පමණක් නොව එය සමස්ත ප්‍රාග්ධන වෙළඳපොළ සහ එහි පාර්ශවකරුවන් සියල්ලම මෙන්ම රටේ ආර්ථික යද ලබා ගන්නා ජයග්‍රහණයක් වේ.

බොහෝ විශේෂාංග සමගින් නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් වෙළඳපොල කාර්යක්ෂමතාවය, පුරෝකථනය කිරීමේ හැකියාව සහ නියාමනයේ අනුකූලතාවය; විශේෂයෙන් වෙළඳපොළ අක්‍රමිකතා සිදුකරන්නන් සඳහා පනවනු ලබන දඩ මුදලේ ප්‍රමාණය සිදුකල වූ අක්‍රමිකතාවයට අනුරූපීව පැනවීමට අපේක්ෂා කරනු ලබයි. නව පනත මගින් නවීන යටිතල පහසුකම් හඳුනාගැනීමට සහ සක්‍රීය කිරීමට පහසුකම් සලසන අතර එහි ඇති සුවිශේෂී විශේෂාංග කිහිපයක් තුලින්ම ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය සක්‍රීය කිරීම සඳහා පහසුකම් සලසයි. නව පනත මගින් ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය රැස් කිරීමට බොහෝ අවස්ථාවන් සහ විකල්පයන් ලබා දෙන අතර එය සමස්ත ආර්ථිකයටම වාසිදායක වනු ඇත. තවද මහජනයාට වැඩි ආයෝජන අවස්ථා ලබා දෙන ප්‍රතිපාදන එයට ඇතුලත් වේ. ඒ අනුව, මෙම පියවරයන් මඟින් රට තිරසාර ආර්ථික වර්ධනයක් හා සංවර්ධනයක් ලඟා කරගැනීම සහතික කෙරේ.

නව පනත තුළ සියලුම ආකාරයේ වෙළඳපොළ වරදවල් අන්තර්ගත වන අතර වෙළඳපොළ වරදක් යටතට ගත හැකි සියලුම හැසිරීම් නව පනත තුලින් ඉතා පැහැදිලිව අර්ථ දක්වා ඇත. එමෙන්ම මේ සම්බන්ධ වූ ව්‍යතිරේක සහ විත්තිවාචික ද මෙම පනත තුළ විශේෂයෙන් සඳහන් වේ. වර්තමානයේ වෙළඳපොළ වරදවල් සම්බන්ධයෙන් යම් අපැහැදිලිතාවයක් පවතී නම් මෙමගින් ඒ සියල්ල ඉවත් කරයි. ප්‍රධාන වෙළඳපොළ වැරදි "වෙළඳපොළ විෂමාචාරය" නමින් වෙනම කොටසක් යටතේ පැහැදිලි කර ඇත. මෙය නැවතත් "තහනම් හැසිරීම්" (ව්‍යාජ වෙළඳාම් කිරීම සහ වෙළඳපොළ මිල ගණන් කෘතිම ලෙස උස් පහත් කිරීම, කොටස් වෙළඳපොළ අයුතු ලෙස හැසිරවීම, අසත්‍ය හෝ නොමඟ යවන සුළු ප්‍රකාශ, සුරැකුම්පත් ගනුදෙනු කිරීමට වංචනික ලෙස තැනැත්තන් පෙළඹවීම, අයුතු ලෙස හැසිරවීමේ සහ රැවටිලි සහගත උපක්‍රම භාවිතා කිරීම) සහ "අභ්‍යන්තර වෙළඳාම" යනුවෙන් පරිච්ඡේද දෙකකට වෙන් කර ඇති අතර මෙම කොටස යටතේ සිදු කරන ලද සෑම වරදක්ම මහාධිකරණය විසින් විභාග කරනු ලැබිය යුතුය. මෙම කොටස යටතේ පුද්ගලයෙකු යම් වරදකට වරදකරු කරනු ලැබූ විටදී රුපියල් මිලියන දහයකට නොඅඩු දඩයකට හෝ වසර දහයක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඒ පුද්ගලයා යටත් විය යුතුය.

**විශාල හෝ කුඩා වේවා ආයෝජකයන් සහ නිකුත් කරන්නන් සියලු දෙනාගේම අපේක්ෂාවන් යථාර්තයක් බවට පත්කර ගැනීමට හැකිවන ස්ථානයක් බවට ප්‍රාග්ධන වෙළඳපොළ පත්කිරීමට අපි අදහස් කරන්නෙමු.**

අපරාද නඩු යටතට ගැනෙන වැරදි හා සම්බන්ධව නව පනත යටතේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් ඉහත සඳහන් වන අතර නව පනත මගින් සිවිල් නෛතික සහන සඳහාද පහසුකම් සලසා ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත්වේ. ඇත්ත වශයෙන්ම නව පනත තුලින් හඳුන්වාදීමට නියමිත නව අංගයක් නම් හානියට අදාළ මුදල් ආපසු අයකර ගැනීමට සහ දණ්ඩන පැනවීමට වාණිජ මහාධිකරණයක සිවිල් නඩු කටයුත්තක් පැවරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත අයිතිය ලබා දීමයි. ඉහත සඳහන් කල "වෙළඳපොළ විෂමාචාර" යටතේ යම් පුද්ගලයෙක් එහි ඇති උපවග න්ති කඩ කර ඇති විටක එම පුද්ගලයාට එරෙහිව එවන් නඩු කටයුත්තක් පවරනු ලැබිය හැකිය. එසේ නඩු කටයුත්තක් පැවරිය යුතු බවට වන කොමිෂන් සභාවෙහි තීරණය "එම කඩ කිරීමේ ස්වභාවය සහ ආකාරය, ඉන් වෙළඳපොළට ඇතිවන බලපෑම සහ යම් ආයෝජකයෙකුට ඇති වූ පාඩුවේ ප්‍රමාණය" යන කරුණු මත පදනම් වේ.

නව පනත මගින් හඳුන්වාදී ඇති තවත් වැදගත් අංගයක් වන්නේ පරිපාලනමය දණ්ඩන නියම කිරීමට කොමිෂන් සභාවට බලය හිමිවීමයි. දැනට පවතින නීතිය යටතේ සියලුම කඩකිරීම් වැරදි ලෙස සැලකූවද දඩ මුදලක් අය කර ගැනීමට හෝ වෙනත් පරිපාලනමය දණ්ඩනයක් නියම කිරීමට කොමිෂන් සභාව වෙත පැහැදිලි බලතල ලබාදී නොමැත. කෙසේ නමුත් නව පනත මගින්, කඩකිරීමේ ස්වභාවය සහ ආකාරය, අනුකූලව කටයුතු නොකිරීම හෝ උල්ලංඝනය කිරීම මගින් වෙළඳපොළට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් ඕනෑම පුද්ගලයෙක් මත පරිපාලනමය දණ්ඩන එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පැනවීමට කොමිෂන් සභාවට බලය හිමිව ඇත.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

පරීක්ෂණයක් සිදු කරමින් පවතින හෝ යම් තැනැත්තෙකු විමර්ශනයට ලක් කරමින් පවතින ඕනෑම අවස්ථාවකදී, ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා කොමිෂන් සභාවට ක්‍රියාමාර්ග ගැනීමට ඇති බලය මත අවුරා තැබීමේ නියෝගයක් නිකුත් කිරීමේ හැකියාව (අවුරා තැබීමේ නියෝගයක් වලංගු වන්නේ නිකුත් කළ දින සිට දින හතක කාලසීමාවක් සඳහා පමණි. ඉන් පසුව අධිකරණයෙන් එය ස්ථිර කල යුතු වේ), ආසන්න කඩවීම් අවස්ථාවක ඇතැම් නියෝග ලබාගැනීම සඳහා අධිකරණයට ඉල්ලීමක් කිරීමට කොමිෂන් සභාව සතු බලය (සුරැකුම්පත් ගනුදෙනුවක් බලරහිත බව ප්‍රකාශයට පත් කිරීම, පුද්ගලයෙකුට යම් සුරැකුම්පත් බැහැර කරන ලෙස විධානය කිරීම, සංචාරක බාධකයන් පැනවීම යනාදිය) කොමිෂන් සභාව මත පවරා ඇති වෙනත් බලතල අතරින් කිහිපයක් වේ.

නව නීතිය යටතේ වෙළඳපොළ සංවර්ධනය සඳහා බොහෝ අංගයන් ඉදිරිපත් කිරීමට නියමිතව ඇති අතර නව පනත මගින් හඳුන්වාදෙන අංගයන්ගෙන් කැපීපෙනෙන අංගයන් කිහිපයක් පහතින් දැක්වේ.

- වෙළඳපොළ, වෙළඳපොළ ආයතන (විනිමය ස්ථාන, නිෂ්කාශනාගාර සහ මධ්‍යම තැන්පතුගාර) සහ වෙළඳපොළ අතරමැදියන් පැහැදිලිව හඳුන්වාදී ඇති අතර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා වන නියමයන් සහ සපයන සේවාවන් පිලිබඳව විශේෂයෙන් සඳහන් කර ඇත.
- 'අතිරේක සේවා සපයන්නන්' රැසක් හඳුන්වාදී ඇති අතර එම සේවා සපයන්නන්ට අදාළ ප්‍රතිපාදන ද හඳුන්වා දී ඇත.
- නීති ප්‍රකාරව පිළිගත් වෙළඳපොළ මෙහෙයවන්නෙකු පිහිටුවීම මගින් ශ්‍රී ලංකාව තුළ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් විකිණීම සහ මිලදී ගැනීම සඳහා වේදිකාවක් සැපයීමට පහසුකම් සලසයි.
- දැනට පවතින ඒකක භාර අරමුදල් වලින් ඔබ්බට ගොස් සාමුහික ආයෝජන යෝජනා ක්‍රම (රන් සාමුහික අරමුදල් [Gold Mutual Funds], හෙජ් අරමුදල් [Hedge Funds] වැනි ආයෝජන යෝජනා ක්‍රම) සඳහාද නව නීතිය තුලින් පහසුකම් සලසා ඇත.
- ව්‍යුත්පන්න ගිවිසුම්, කොටස් ණයට ගැනීම සහ කොටස් ණයට විකිණීම, හිඟ වෙළඳාම යනාදිය මගින් වෙළඳපොළ ද්‍රවශීලතාවය සහ වෙළඳපොළ පරිමාව වැඩිදියුණු කෙරෙන අතර එමගින් දිගු කාලීන අයෝජකයින් සඳහා ප්‍රතිලාභ හිමිවේ.
- වෙළඳපොළ සාදන්නන් හඳුන්වාදීම තුලින් සුරැකුම්පත් අඛණ්ඩව සහ කාර්යක්ෂම ලෙස ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර හුවමාරු වීම සහතික කෙරේ. මෙමගින් වෙළඳපොළට ද්‍රවශීලතාවය සහ පරිමාව සපයන අතර එමගින් විනිමය හුවමාරු අරමුදල් (Exchange Traded Funds) පිහිටුවීම දිරිමත් කරයි.

> විශිෂ්ට අදහස් ඇති ව්‍යවසායකයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හෝ සේවා අංශයේ සමාගම් යනාදී සියල්ලටම කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව තුළ ලැයිස්තුගත වීමට සහ ඔවුන්ගේ සැබෑ හැකියාවන් හඳුනාගැනීමට අපි දොරටු විවෘත කර ඇත්තෙමු.

විශාල හෝ කුඩා වේවා ආයෝජකයන් සහ නිකුත් කරන්නන් සියලු දෙනාගේම අපේක්ෂාවන් යථාර්තයක් බවට පත්කර ගැනීමට හැකිවන ස්ථානයක් බවට ප්‍රාග්ධන වෙළඳපොළ පත්කිරීමට අපි අදහස් කරන්නෙමු.

- ප්‍රතීත ආයෝජකයින් නිවැරදිව වෙන්කර හඳුනාගැනීම තුලින්, සංකීර්ණ නොවන ආයෝජකයින් ආරක්ෂා කිරීමට හැකිවන අතර අවදානම් දැරිය හැකි ආයෝජකයින් ඉලක්ක කරමින් වැඩි අවදානමක් සහිත උපකරණ වෙළඳපොළට නිකුත් කිරීම සඳහා මෙමගින් පහසුකම් සැලසේ.
- ආයතන වල අකටයුතුකම් දැනුම් දෙන්නන් ආරක්ෂා කිරීම සඳහා සහ ඔවුන්ගේ හැසිරීම ඇගැයීමයට ලක් කිරීමට අදාළ ප්‍රතිපාදන සලසා ඇති අතර මෙතුලින් වෙළඳපොළ විෂමාචාර අධෛර්යට පත් වේ යැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය ප්‍රවණතා අනුව යමින් ව්‍යාපාර වස්තු හුවමාරුව අසාමුහිකරණය සාක්ෂාත් කරගැනීම අභිමුවට පැමිණ සිටීම තවත් එක් සංධිස්ථානයකි. කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව අසාමුහිකරණය මගින් සාධාරණ වෙළඳපොළක් ඇතිකිරීම අපේක්ෂා කරන අතර උපායමාර්ගික ආයෝජකයෙකු සම්බන්ධ කරගැනීමෙන් රැගෙන එන තාක්ෂණික දැනුම සහ යටිතල පහසුකම් තුලින් වැඩි කාර්යක්ෂමතාවයක් ඇති කර ගැනීමට අපේක්ෂා කෙරේ. එවැනි ව්‍යාපාර වස්තු හුවමාරුවක් නියාමනය කිරීමට ප්‍රතිපාදන සලසා නොතිබීම නව නීතිය යටතේ විශාල අඩුපාඩුවක් වන බැවින් නව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභා පනත යටතේ අසාමුහිකරණය කල ව්‍යාපාර වස්තු හුවමාරුව නියාමනය සඳහා ද පහසුකම් සලසා ඇත.

ඉහත කරුණු වලට අමතරව, වෙළඳපොළ ආයතන, වෙළඳපොළ අතරමැදියන් සහ අතිරේක සේවා සපයන්නන් නියාමනය සඳහා විශේෂිත ප්‍රතිපාදන සැපයීම මගින් ඔවුන් ප්‍රාග්ධන වෙළඳපොල තුළ නිසි භාවිතයන් අනුගමනය කරනු ඇති බවට සහතික කිරීම සහ ඔවුන්ගේ පාර්ශ්වයෙන් සිදුවූ කිසියම් හෝ උල්ලංඝනය කිරීමකදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඔවුන් සම්බන්ධව කටයුතු කල

හැකි ආකාරය දැක්වීම නව පනත තුළ දැකිය හැකි විශේෂිත අංගයක් වේ. නව නීති ප්‍රකාරව මධ්‍යම ප්‍රතිපාර්ශවයක් පිහිටුවීම මගින් විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය තුලින් නිෂ්කාශනය සහ නිරවුල් කිරීම සඳහා වූ සේවාවන් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරයි. තවද දැනට පවතින පනත ප්‍රතිස්ථාපනය වූ වහාම නව/සංශෝධිත නීති හා රෙගුලාසි මාලාවක් හඳුන්වාදීමට නියමිත වේ. අනෙකුත් කාරණා අතරින්, කාලානුරූපීව ඉදිරිපත් කෙරෙන නව පවරාගැනීම් හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය මගින් ප්‍රාග්ධන වෙළඳපොළ සහ එහි සියලුම පාර්ශවකරුවන් නිසැකවම ප්‍රතිලාභ ලබනු ඇත.

වෙනත් වර්ෂයක් මෙන් නොව, 2020 වර්ෂය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට විශේෂ වන්නේ මෙම වසර තුළ සංධිස්ථාන රැසක් පසු කිරීමට හැකි වීම නිසාවෙනි. දේපළ වෙළඳාම් ආයෝජන භාර (REITs) සඳහා හඳුන්වාදුන් නීති ගැසට් කිරීම සහ 2020 ජූලි 31 දින සිට එය බලපැවැත්වීම, නුදුරු අනාගතයේදී වෙළඳපොළ අතරමැදියන් වන ආයෝජන කළමණාකරුවන්, ආන්තික සපයන්නන්, ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන යනාදිය සඳහා නීති හඳුන්වාදීම, ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා කොටස් තැරැව්කරුවන්/වෙළඳුන් සඳහා අනුගමනය කල යුතු නිසි භාවිතයන් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ ප්‍රාග්ධන වෙළඳපොළ ශක්තිමත් කිරීමට සහ සුරැකුම්පත් වෙළඳපොළ අගය සොයා ගැනීමේ ක්‍රියාවලියෙහි විකෘතිතා ඇතිවීම වැලැක්වීමට ස්ථර තුනකින් යුත් පරිපථ බිඳීනය හඳුන්වාදීම පසුගිය වර්ෂය තුළ ලඟා කරගත් ප්‍රධාන සංධිස්ථානයන් අතුරින් කිහිපයකි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අත් කරගත් ප්‍රධාන ජයග්‍රහණයක් නම් එම්පවර් පුවරුව දිරිගැන්වීම සඳහා වඩා ලිහිල් නීති සමගින් ලැයිස්තුගතවීමේ නීති සංශෝධනයයි. මෙය අනුගමනය කරමින් පළමු වතාවට සුළු හා මාධ්‍ය පරිමාණ ආයතනයක් එම්පවර් පුවරුවේ ලැයිස්තුගත විය. ඇත්ත වශයෙන්ම, පුද්ගලික අංශයේ විශාල සමාගම් විසින් ලැයිස්තුගත වීමට සහ ප්‍රාග්ධනය රැස් කිරීමට දක්වන ලද උනන්දුව වෙළඳපොළ විසින් පිළිගන්නා ලදී. විශේෂයෙන්ම නව නිකුත්කිරීම් සියල්ලටම අධික ලෙස දායක වී තිබීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ආයෝජකයින් විසින් වෙළඳපොළ කෙරෙහි තැබූ විශ්වාසයයි. මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විදේශීය අරමුදල් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට අනුමැතිය ලබා ගැනීමට පහසුකම් සැලසීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කර ඇත.

## නවෝත්පාදනයෙන් බලගැන්වෙන වෙනස පිළිගැනීම

ප්‍රධාන පුවරුවේ සහ දිරි සවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා වන සුදුසුකම් නිර්ණායකයන් පුළුල් කිරීම තුලින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නව ව්‍යාපාර ආකෘතීන් සහ ව්‍යාපාර අංශයන්ට ලැයිස්තුගත වීම සඳහා පහසුකම් සලසා ඇත. මානව ප්‍රාග්ධනය මත දැඩිව රඳා පවතින විශිෂ්ට අදහස් ඇති ව්‍යවසායකයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හෝ සේවා අංශයේ සමාගම් යනාදී සියල්ලටම කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව තුළ ලැයිස්තුගත වීමට සහ ඔවුන්ගේ සැබෑ හැකියාවන් හඳුනාගැනීමට අපි දොරටු විවෘත කර ඇත්තෙමු.

සේවා සැපයීම මූලික කරගත් සමාගම් වැනි නව ව්‍යාපාර ආකෘතීන් ප්‍රාග්ධනය රැස් කර ගැනීමට සහ ව්‍යාපාර පරිමාණය වැඩි කරගැනීමට කොටස් වෙළඳපොළ තුළ ලැයිස්තුගත වීමෙන් ප්‍රතිලාභ රැසක් ලබාගෙන ඇත. ඇත්ත වශයෙන්ම බොහෝවිට ගෝලීය දිශානතිය වෙනස් කරමින් වාර්තාගත වර්ධනයක් ලඟාකර ගෙන ඇත්තේ අවම ස්ථාවර වත්කම් ප්‍රමාණයක අවශ්‍යතාවයක් නොවන ව්‍යාපාර ආකෘතීන් වේ. මේ සඳහා හොඳම උදාහරණය නම් ලොව විශාලතම නවාතැන් පහසුකම් සපයන්නා වන Airbnb සමාග මය. මෙම සමාගම සතුව කිසිදු දේපලක් නොමැතිවුවද එහි තක්සේරු අගය ඇමරිකානු ඩොලර් බිලියන 47 කි. Airbnb සමාගම 2020 වර්ෂයේ ඇමරිකානු කොටස් හුවමාරුවක් වන NASDAQ හි ප්‍රාථමික නිකුතුවක් සිදුකල අතර එය ඇමරිකානු ඩොලර් බිලියන 100 ද අභිබවමින් NASDAQ කොටස් හුවමාරුව තුළ සිදුවූ විශාලතම ප්‍රාථමික නිකුතු අතරට එක්වීමට සමත් විය. එලෙසම ලොව විශාලතම කුලී රථ සමාගම වන "Uber" සමාගම සතුව එකදු වාහනයක්වත් නොමැති අතර එහි තක්සේරු අගය ඇමරිකානු ඩොලර් බිලියන 75 කි. අප සහයෝගය දැක්විය යුත්තේ මෙවැනි අදහස් සහ සිහින වර්ධනය කරගැනීමටයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එවැනි සමාගම් වලට සාර්ථකත්වය කරා පියාසර කිරීමට අවැසි සුළඟ වනු ඇත. විශිෂ්ට අදහස් ඇති ව්‍යවසායකයින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හෝ සේවා අංශයේ සමාගම් යනාදී සියල්ලටම කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව තුළ ලැයිස්තුගත වීමට සහ ඔවුන්ගේ සැබෑ හැකියාවන් හඳුනාගැනීමට අපි දොරටු විවෘත කර ඇත්තෙමු. උදාහරණයක් ලෙස ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා සමූහ අරමුදල් වැනි කාලෝචිත විධික්‍රම දැන් වෙළඳපොළට හඳුන්වාදී ඇත. මීට අමතරව හොඳින් ස්ථාපිත ගෝලීය කොටස් හුවමාරු වල ප්‍රමිතීන් අනුව යමින් ඒ හා සමව සංශෝධනය කරන ලද ලැයිස්තුගත කිරීමේ නීති මගින් කොටස් වෙළඳපොළතුළ ලැයිස්තුගත වීමට අපේක්ෂා කරන අලුතින් ආරම්භ කරන ලද සමාගම් වලට නව ජීවයක් ලබාදෙනු ඇති අතර එය ශ්‍රී ලංකාව ආර්ථික සංවර්ධනය කරා යන ගමනේ මුරගල් ලෙස කටයුතු කරනු නොඅනුමානයි. එබැවින් ව්‍යාපාර වස්තු හුවමාරුව තුළ ඇති නව උපකරණ, යෝජනා ක්‍රම සහ වේදිකාවන් භාවිතා කරමින් තරුණ ව්‍යවසායකයින්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට අලුතින් ආරම්භ කරන සහ පවතින ව්‍යාපාර සඳහා පුළුල් වූ දැක්මක් සහිතව කටයුතු කිරීමට අප ආරාධනා කර සිටිමු.

**ලොව පුරා සිදුවන නව වෙළඳපොළ සංවර්ධනයන්ට අනුගත වෙමින් උරෙන් උර ගැටෙමින් රැඳී සිටීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැමවිටම කටයුතු කරයි.**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

**පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම තුලින් ඔවුන්ට යම් ප්‍රතිපත්තියක් හෝ නියාමන කටයුත්තක් පිළිබඳ ඔවුන්ගේ අදහස හෝ ඒ සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්වයන් ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබෙන බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි විශ්වාස කරමු.**

## ඩිජිටල්කරණය: වෙළඳපොළ ඔබ සමීපයේ

ඩිජිටල් තාක්ෂණයත් සමඟ ඒකාබද්ධ වෙමින් සුරැකුම්පත් වෙළඳපොළ නව මුහුණුවරක් ගැනීමේ අභිමුවට පැමිණ සිටී. කොමිෂන් සභා සාමාජිකයින් වන නරේෂ් අබේසේකර මහතා සහ මනිල් ජයසිංහ මහතාගේ නායකත්වයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නියෝජිතයින්ගෙන් සැදුම් ලත් ඒකාබද්ධ කමිටුව විසින් ඩිජිටල්කරණය තුලින් කොටස් වෙළඳපොළ තුළ නව පෙරලියක් ඇති කිරීමට ක්‍රියාකර ඇති අතර මෙම කාර්යයයේදී ඔවුන්ගේ උත්සාහයන් සහ මඟපෙන්වීම් සඳහා ඔවුන්ට මගේ කෘතඥතාව පළකරමි. කොටස් තැරව්කාර ආයතන සදහා වූ නීති, මධ්‍යම තැන්පතු ක්‍රමයේ නීති සහ ලැයිස්තුගත කිරීමේ නීති සංශෝධනය මගින් කොටස් වෙළඳපොළ ගනුදෙනු කඩදාසි භාවිතයේ සිට ඉලෙක්ට්‍රොනික පරිසරයකට සංක්‍රමණය වීමට පහසුකම් සලසා ඇත. කොටස් වෙළඳපොළ සම්පුර්ණයෙන්ම ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියේදී අත් කරගත් ප්‍රධාන ජයග්‍රහණයක් නම් CSE ජංගම දුරකථන යෙදුම හඳුන්වාදීමයි. මෙමගින් ඇසිල්ලක වේගයෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුමක් විවෘත කිරීමේ හැකියාව ලැබී ඇත. CSE ජංගම දුරකථන යෙදුමෙහි තවත් විශේෂාංග නම් ඉලෙක්ට්‍රොනික ගැනුම් සහ විකුණුම් සටහන්, ඉලෙක්ටොනික මාසික ප්‍රකාශයන් භාවිතා කිරීමට ඇති හැකියාව සහ ඉලෙක්ට්‍රොනික බැංකු මුදල් හුවමාරුවක් හරහා ලාභාංශ ගෙවීම් සිදු කිරීමට ඇති හැකියාවයි. මෙම යෙදුම හඳුන්වාදීමත් සමඟ එය මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් ආරම්භ කිරීම 63% කින් ඉහල යාමට දායක වී ඇති අතර ඒ තුලින් ප්‍රත්‍යක්ෂ වන කරුණ නම් ක්‍රියාවලි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට, අනුකූලතාවය සහ ගුණාත්මකබාවය සහතික කිරීමට ඩිජිටල්කරණය කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව තිබූ බවයි.

ඩිජිටල්කරණ ක්‍රියාවලියේ දෙවන අදියර (Phase II) නොබෝ දිනකින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙමගින් ආයෝජකයින්ට ප්‍රතිලාභ රැසක් ලබා දෙනු ඇති බව සහ අවස්ථා රාශියක් විවෘත කරනු ඇති බවට අවිවාදයකින් තොරව පැවසිය හැකිවේ. සන්නිවේදන ජාලය කෙටි වීම සහ පුනරාවර්තනයෙන් ඉවත් වීම තුලින් සුමට සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීමට හැකිවේ. ආයෝජකයින්ට තම මධ්‍යම තැන්පතු ගිණුම් ප්‍රකාශය ඉලෙක්ට්‍රොනිකව ලබා ගැනීමේ හැකියාව ඇති අතර ප්‍රාථමික කොටස් නිකුතු සඳහා සහ හිමිකම් නිකුතු සඳහා දායක වීම ජංගම දුරකථන යෙදුම හරහා සිදු කිරීමේ හැකියාව ඇත. තවද, නුදුරු අනාගතයේදී ඉලෙක්ට්‍රොනික මුදල් පසුම්බිය (e-wallet) හඳුන්වාදීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නියමිත අතර ඒ තුලින් ආයෝජකයින්ට වේගවත්ව ආයෝජන හැසිරවීමේ හැකියාව ලැබීම නිසා ආයෝජන අවස්ථා රැසක් විවෘත වේ.

මීට අමතරව, කඩදාසි භාවිතයෙන් තොර පරිසරකයට සංක්‍රමණය වීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ කොමිෂන් සභාවේ නියාමන සහ පරිපාලන කටයුතු ඩිජිටල්කරණය කිරීම කෙරෙහි අවධානය යොමුව තිබේ. මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශිල්පීය පහසුකම් යෙදවීම සහ ඉන් පසු ස්වයංක්‍රීය ආයතනික පරිසරයකට සංක්‍රමණය වීම ඉතා අසීරු නමුත් කාලීන අවශ්‍යතාවයකි. තත් කාලය තුල ක්‍රියාත්මකවන පරිශීලක හිතකාමී, ප්‍රමිතිගත පද්ධතීන් ඉදිරිකාලයේදී ඔබ සමීපයට ගෙන එනු ඇත.

## ගතික වෙළඳපොළ සඳහා නව ආයෝජන උපකරණ

විවිධාංගීකරණය කරන ලද ආයෝජන කළඹක් තුළ වැදගත් කොටසක් ලෙස රන් (Gold) ආයෝජනයන් සලකනු ලැබේ. තවද වෙළඳපොළ ගැටලුකාරී අවස්ථාවන්හීදී අවදානම අඩු කරගත හැකි මාධ්‍යක් ලෙස ද එය සැලකේ. රන් ආශ්‍රිත නිෂ්පාදන සහ ආයෝජන සඳහා ශ්‍රී ලංකාව තුල පවතින අධික ඉල්ලුම නිරීක්ෂණය කිරීමෙන් පසුව මෙම අවස්ථාව උපයෝගී කරගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව එකාබද්ධව Paper Gold (රන් ආශ්‍රිත සුරැකුම්පතක් හෝ ව්‍යුත්පන්නයක් ලෙස දැනට හැඳින්විය හැක) නමින් ධඹක වේදිකාවක් හරහා වෙළඳාම් කිරීම හඳුන්වාදීමට කටයුතු කරගෙන යන අතර ඒ සඳහා රාමුවක් සකස් කිරීමේ අවසන් අදියරට පැමිණ ඇත. මෙම හඳුන්වාදීම පිළිබඳව වෙළඳපොළ දැඩි අපේක්ෂාවෙන් පසුවේ. Paper Gold නිළ වශයෙන් හඳුන්වාදීම සඳහා අවශ්‍ය රාමුව සකස් කිරීමේ කාර්යය ක්‍රමක් ක්‍රමයෙන් අවසන් අදියරට පැමිණෙන අතර මෙමගින් රජයට නව බදු ආදායම් ප්‍රවාහයක් ගොඩනැගෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලොව පුරා සිදුවන නව වෙළඳපොළ සංවර්ධනයන්ට අනුගත වෙමින් උරෙන් උර ගැටෙමින් රැඳී සිටීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැමවිටම කටයුතු කරයි. වෙළඳපොළ අවධානය දිනාගත් තවත් එක් නව ආයෝජන උපකරණයක් නම් නව ලැයිස්තුගත කිරීමේ කාණ්ඩයක් වන Special Purpose Acquisition Companies (ප්‍රාග්ධනය අත්පත්කරගැනීම සඳහා වන විශේෂිත සමාගම් ලෙස දැනට නම් කල හැක) යටතේ ලැයිස්තුගත කිරීම් සක්‍රිය කිරීමයි. යුරෝපීය රටවල්, විශේෂයෙන් ඇමරිකානු එක්සත් ජනපදය මෙවැනි ලැයිස්තුගත කිරීම් කෙරෙහි නැඹුරු වෙමින් පවතී. මේ සඳහා දැනටමත් රාමුවක් සකස් කොට අවසන් අතර කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව මගින් එය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත. එමගින් ප්‍රාග්ධනය රැස් කිරීමේ නව පෙරළියක් ඇති කරමින් නැගී

එන ව්‍යාවසායකයින්ට නව අවස්ථා රැසකට මංපෙත් විවරවේ.

### බලාත්මක කිරීම තුළින් ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම

පසුගිය වසර පුරාවට ආවේක්ෂණ, අධීක්ෂණ සහ විමර්ශන අංශයන් ශක්තිමත් කල අතර පූර්ව ක්‍රියාකාරීවීම. වැළැක්වීම සහ විචක්ෂණශීලී වීම තුලින් කටයුතු බලාත්මක කරන ලදී. උදාහරණයක් ලෙස ආවේක්ෂණ අංශය මගින් එදිනෙදා වෙළඳපොළ ගනුදෙනු මත සලකුණු කරගත් නිරීක්ෂණයන් 124 ක් බලාත්මක කිරීමට පියවර ගන්නා ලදී. ඒ අතර ආවේක්ෂණ වාර්තා, අනුකූලතා නිලධාරී හෝ ඊට ඉහල අධිකාරී බලයක් ඇති නිළධාරියෙක් දැනුවත් කිරීම, ආයෝජන උපදේශකවරුන්ට අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, අන්තර්ජාලය හරහා ගනුදෙනු කිරීම තහනම් කිරීම, හේතු දැක්වීම සඳහා කැඳවීම, අපරාධ නඩු

> **සහයෝගීතාවය මගින් අප ප්‍රතිලාභ රැසක් ලබා ගෙන ඇති අතර අතර අප උනන්දු වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා මෙම හවුල්කාරීත්වයන් මත ගොඩනැගීමටයි.**

පැවරීම යනාදි බලාත්මක කිරීමේ පියවරයන් අන්තර්ගතවේ. මෙවැනි පූර්ව ක්‍රියාකාරී පියවරයන් වෙළඳපොළ විෂමාචාරයන් සැලකිය යුතු මට්ටමකින් අවම කිරීම සඳහා වඩා ඵලදායී බව ඔප්පුකර ඇත. මීට අමතරව ක්‍රියාවට නැංවූ වැදගත් පියවරක් නම් කොටස් වෙළඳපොළ ගනුදෙනු කිරීමේදී සහ වෙනත් ඕනෑම කොටස් වෙළඳපොළ හා සම්බන්ධව කටයුතු කිරීමකදී කළ යුතු දෑ සහ නොකළ යුතු දෑ සඳහන් කරමින් "ආවේක්ෂණ අත්පොත" හඳුන්වාදීමයි. මෙම එකතුව වෙළඳපොළ සහභාගී වන්නන්ට එම කටයුතු සිදුකිරීමේදී වඩා විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමටත්, වෙළඳපොළ විෂමාචාර වළක්වා ගැනීම සඳහා දැනුවත් තීරණයක් ගැනීමටත් උපකාරී වේ. තවද, විමර්ශන කටයුතු කඩිනම් කිරීම සඳහා විමර්ශන අංශය, ආවේක්ෂණ අංශය හා එක්ව අඛණ්ඩව කටයුතු කරන ලද අතර, ඒ සඳහා එම අංශ දෙක එක්ව එකාබද්ධ කාර්ය සාධන බලකායක් පිහිටුවන ලදී. කෙසේ වෙතත්, වඩාත් අවධානය යොමු කල යුතු කරුණ නම් පෙර වර්ෂයන්හි 3,000 ක් ලෙස ලොව පුරා සිදුවන නව වෙළඳපොළ සංවර්ධනයන්ට අනුගත වෙමින් උරෙන් උර ගැටෙමින් රැඳී සිටීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැමවිටම කටයුතු කරයි.

වාර්තා වූ දෛනික සාමාන්‍ය වෙළඳාම් ප්‍රමාණය 2020 වසරේ එමෙන් 10 ගුණයක් පමණ වීම සහ එම ඉහල ගිය ඉල්ලුමට සරිලන පරිදි අනුවර්තනයවීමට ආවේක්ෂණ අංශයට හැකි වීමයි. දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය 30,000 ට ආසන්න අගයක් වාර්තා කරමින් 2020 න් පසුව සිදුවන විශාල වෙළඳ ගනුදෙනු නිරීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඉතා අඩු කාලයක් තුළ ධාරිතාවය වැඩි කිරීම පද්ධතිමය අවශ්‍යතාවයකි.

ශක්තිමත් සහ ඉක්මනින් වෙනස් වන සුළු වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා නව ආවේක්ෂණ පද්ධතියක් මිළදී ගැනීම අනිවාර්යය විය. මෙපමණකින් නොනැවතී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එහි පාර්ශවකරුවන්ට උසස් සේවාවක් ලබාදීම සඳහා මෙම පද්ධතිය තුල කෘතිම බුද්ධියක් සහ උසස් තත්වයේ විශ්ලේෂණ මෙවලම් ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳවද අවධානය යොමු කරන ලදි. නවීන තාක්ෂණයත් සමඟ වැඩිදියුණු කරන ලද ආවේක්ෂණ පද්ධතිය 2021 වසර තුලදී ස්ථාපිත කරනු ඇත.

### ශක්තිමත් යටිතල පහසුකම් මතින් ගොඩනැගෙන ශක්තිමත් පදනම්

අවදානම අඩු කිරීම සහ නව ආයෝජන උපකරණ /වේදිකාවන් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් හඳුන්වාදුන් නවතම යටිතල පහසුකම නම් කොළඹ කොටස් හුවමාරුවේ ගෙවීම් වලට එදිරිව බේරුම් කිරීමේ පද්ධතිය සක්‍රීය කිරීමයි. මෙමගින් වෙළඳපොළටම ආවේනික වූ පසු වෙළඳාම් අවදානම අඩු කෙරේ. එපමණක් නොව මෙය නැගී එන වෙළඳපොළ තත්වයට උසස් වීම සඳහා සපුරාලිය යුතු එක් අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීමක්ද වේ. මෙමගින් අනාගතයේදී පූර්ණ ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් (Central Counter Party) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පදනම සකස් කරයි.

පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම තුලින් ඔවුන්ට යම් ප්‍රතිපත්තියක් හෝ නියාමන කටයුත්තක් පිළිබඳ ඔවුන්ගේ අදහස හෝ ඒ සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්වයන් ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබෙන බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි විශ්වාස කරමු.

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සමඟ එක්ව සාංගමික ණයකර ප්‍රතිගැනුම් ගිවිසුම් (REPO) ගනුදෙනු ධමන වේදිකාවක් හරහා සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති ව්‍යුහය අවසන් කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පසුකල තවත් එක් සංධිස්ථානයකි. මීට අමතරව කොළඹ කොටස් හුවමාරුවද ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේ ආරම්භය වඩා පහසු හා කාර්යක්ෂම කිරීම සඳහා නියාමනය පුළුල් කිරීමේ අරමුණින් ලැයිස්තුගත කිරීමේ රාමුව සංශෝධනයට ලක් කරමින් පවතී. වෙළඳපොළ ද්‍රවශීලතාවය ඉහල නැංවීමට ස්වයංක්‍රීය වෙළඳාම් පද්ධතියේ Tick Size සංශෝධනය කිරීම සක්‍රීය කරන ලද තවත් එක් යටිතල පහසුකමක් වේ.

### වෙළඳපොළ සංවර්ධනය සඳහා පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ වෙළඳපොළට නව නියාමනයක් ගෙන ඒමේදී එහි පාර්ශවකරුවන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වේ. එලෙසම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දිගින් දිගටම රජයට කරුණු ඉදිරිපත් කරමින් පාර්ශවකරුවන්ගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කළේය. ඒ අනුව කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා නිශ්චල දේපළ ආයෝජන භාර (SL-REITs) ලැයිස්තුගත කිරීම අභිප්‍රේරණය කිරීම සඳහා බදු සහනයක් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කරමින් පවතී. තවද සුරැකුම්පත් වෙළඳපොළට නව ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමේදී සියලුම පාර්ශවකරුවන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම සඳහා

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

විවිධ ක්‍රියාමාර්ග දියත් කල අතර එහිදී විශේෂයෙන් සුරැකුම්පත් වෙළඳපොළ සමගින් තවමත් සම්බන්ධ නොවූ ඉලක්කගත කණ්ඩායම් ආකර්ෂණය කරගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළෙමු.

මෙසේ පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීම තුලින් ඔවුන්ට යම් ප්‍රතිපත්තියක් හෝ නියාමන කටයුත්තක් පිළිබඳ ඔවුන්ගේ අදහස හෝ ඒ සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්වයන් ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබෙන බව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි විශ්වාස කරමු. වෙළඳපොළ සහභාගීවන්නන් සමග අඛණ්ඩ සන්නිවේදනයෙක් පවත්වා ගැනීම තුලින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට වෙළඳපොළෙහි දිශානතිය සහ ප්‍රවණතා හඳුනාගැනීමට උපකාරී වන අතරම එමගින් වෙළඳපොළ සහභාගීවන්නන්ටද වෙළඳපොළ කෙරෙහි බලපාන නව ප්‍රතිපත්ති සහ නව නියාමනයන් පිළිබඳ යාවත්කාලීන වීමේ හැකියාව ලැබේ. මෙම ප්‍රතිපත්ති සහ නියාමනයන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව, කොටස් තැරැව්කරුවන්, ආන්තික සපයන්නන්, ඒකක භාර, ලැයිස්තුගත පොදු සමාගම් යනාදිය සමග නිරන්තරයෙන් සම්බන්ධවෙමින් කටයුතු කරන ලදී. තැරැව්කරුවන් සඳහා වූ යහපත් පිළිවෙත් ඇතුලත් මාර්ගෝපදේශයක් "Stockbroker Best Practice Guideline" හඳුන්වාදීම සහ දැනට සකස් කෙරෙමින් පවතින සාංගමික යහපාලන සංග්‍රහය "Corporate Governance Code" එසේ නිරන්තර සම්බන්ධවීම්හි ප්‍රතිඵලවේ.

### සුරැකුම්පත් වෙළඳපොළ ව්‍යාප්තිය පුළුල් කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් පත්කළ, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කමිටුවක් යටතේ අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව සුරැකුම්පත් වෙළඳපොළ විෂයක් ලෙස 2023 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවට හඳුන්වාදීමට කටයුතු කර ඇත. තවද, කොමිෂන්

**වසංගතය ගෙන ආ සියලු බාධාවන් තුලින් සිදුවූ දේ නම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සුරැ කුම්පත් වෙළඳපොළ දියුණු තාක්ෂණයෙන් යුතු ,තරඟකාරී සහ ආකර්ශණීය වෙළඳපොළක් බවට පත් කිරීමට අප තුළ ගැඹුරටම කිඳා බැසගෙන තිබූ අවශ්‍යතාවය ඉටු කරගනිමින් ක්‍රියාවට නැංවීමට හැකිවීමයි.**

සභාව විසින් නිරන්තරයෙන් කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත වීමට හැකියාව ඇති පෞද්ගලික සමාගම් සමග සංවාදයේ යෙදෙමින් නව ආයෝජකයින් සහ සමාගම් ආකර්ශණය කර ගැනීමට කටයුතු කරයි.

විවිධත්වයෙන් යුතු වෙළඳපොළ සහභාගීවන්නන්ගේ දැනුවත්භාවය ඉහල නැංවීමේ අදහසින් පළමු වරට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් Facebook" Twitter සහ ශඳමඹමතු වැනි සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම, දැනුවත්කිරීම් දියත් කරන ලදී. මෙය මෙහෙවන ලද්දේ ප්‍රාග්ධන වෙළඳපොළ අධ්‍යාපන සහ බාහිර සම්බන්ධතා අංශයයි. ඇස්තමේන්තුකර ඇති පරිදි ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 36% ක් සමාජ මාධ්‍ය ජාල භාවිතා කරන අතර ඒ අතරින් බහුතරය තරුණ පිරිසයි. එම නිසා නව ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා සුදුසුම වේදිකාව සමාජ මාධ්‍ය ලෙස අප විශ්වාස කරන අතර මෙමගින් කුටුම්බයන් තුළ සුරැකුම්පත් වෙළඳපොළ තුළ ආයෝජනය කිරීමේ පුරුද්දක් ඇති කිරීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව එක්ව ක්‍රියාත්මක කල තවත් වැඩසටහනක් නම් විවිධ සේවා සපයන්නන්ට බලයලත් යාන්ත්‍රණයක් යොදා ගනිමින් ලංකාව පුරා සිටින ආයෝජකයින් සුරැකුම්පත් වෙළඳපොළට සම්බන්ධ කිරීමට අවස්ථාව ලබා දීමයි. උදාහරණයක් ලෙස ලංකාව තුළ ප්‍රමුඛ පෙළේ විදුලි සංදේශ සේවා සපයන්නෙකු වන ඩයලොග් ආයතනය මෑතකදී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සමග අත්වැල් බැඳ ගනිමින් විභව ආයෝජකයින් වෙළඳපොළ තුලට අද්දවා ගැනීමට ඇති අවස්ථාවන් පිළිබඳ සහ පොදු මහජනතාව සඳහා වෙළඳපොළ පුළුල් කිරීමට ඇති අවස්ථාවන් පිළිබඳ අධ්‍යනය කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ජපානය, සිංගප්පූරුව වැනි රටවල් වල ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හරහා පිහිටුවා ඇති වේදිකාවන් හරහා එතෙර වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ අනෙකුත් විදේශීය ආයෝජකයින් සමග සම්බන්ධතා පැවැත්වීමට පූර්ව පියවරයන් ගෙන කටයුතු කරයි. රටට විදේශ කළඹ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම, දැනට පවතින ආයෝජකයන්ගේ පදනම පුළුල් කිරීමට සහ වෙළඳපොළ තුළට විවිධත්වය ගෙන ඒමට සපුරාලිය යුතු ප්‍රමුඛතාවයක් ලෙස අප විසින් හඳුනාගෙන ඇත..

### ශක්තිමත් බලපෑමක් සඳහා සහයෝගීතාවය

ද්වී පාර්ශවීය සහ බහු පාර්ශවීය සංවර්ධන පාර්ශවකරුවන් බොහෝ සම්පත්, විශේෂඥතා සහ අවස්ථා රැගෙන එනු ලබයි. ආසියානු සංවර්ධන බැංකුව මගින් ආරම්භ කරන ලද ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ වැඩසටහන (The Capital Market Development Programme - CMDP) යනු ප්‍රතිපත්ති මත පදනම්ව ශ්‍රී ලංකා රජයට ණය සහ

තාක්ෂණික සහය ලබා දෙන වැඩසටහනකි. මෙමගින් සාමූහික ආයෝජන යෝජනා ක්‍රම සංග්‍රය [Collective Investments Schemes (CIS& Code) කෙටුම්පත් කිරීම, කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය කිරීම, ප්‍රාග්ධන වෙළඳපොළ සහතික කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය, ඒකක භාර පුළුල් කිරීම සහ මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම, ඉස්ලාමීය ආයෝජන උපකරණ, ප්‍රාග්ධන සාමූහික අරමුදල් (Equity Crowdfunding), ව්‍යුහාත්මක කොටස් බලපත්‍ර (Structured Warrants) සහ හරිත බැඳුම්කර (Green Bonds) හඳුන්වාදීම, ජාත්‍යන්තර යහපත් පිළිවෙත් හා යමින් පවරාගැනීම් හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දෙන ලදි. ආසියානු සංවර්ධන බැංකුව සමග වූ සහයෝගීතාවයෙහි කැපී පෙනෙන කරුණ නම් නියාමන හා මෙහෙයුම් ඉලක්ක සහ ප්‍රධාන කාර්යය සාධන දර්ශක සමග 2021-2025 කාලය සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ උපායමාර්ගය සකස් කර අවසන් කිරීමයි. මෙම ක්‍රියා සැලසුම මගින් ඉදිරි වසර 5 තුළ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළෙහි ගමන් පථය තීරණය කරනු ලබන අතර ප්‍රතිඵල මත පදනම්ව ප්‍රගතිය මිනිය හැකි මෙට්‍රික් පද්ධතියක් ලෙසද ක්‍රියා කරනු ඇත. තවද ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය සහ, මුදල්, ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ නායකත්වය යටතේ ප්‍රාග්ධන වෙළඳපොළ උපදේශක කවුන්සිලය (Capital Market Advisory Council - CMAC) නැවත රැස් කරන ලදී.

සහයෝගීතාවය මගින් අප ප්‍රතිලාභ රැසක් ලබා ගෙන ඇති අතර අතර අප උනන්දු වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා මෙම හවුල්කාරීත්වයන් මත ගොඩනැගීමටයි.

ප්‍රාග්ධන වෙළඳපොළ උපදේශක කවුන්සිලය, ශ්‍රී ලංකා මහා බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණය මණ්ඩලය, සේවක අර්ථසාධක අරමුදල, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව යනාදී නියාමකයන්ගෙන් සැදුම්ලත් බහු පාර්ශවීය ඉහළ මට්ටමේ එකතුවක් වන අතර මෙමගින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපායමාර්ගික දිශානතිය ලබා දීම සහ

**ඇමරිකාව වැනි ලෝකයේ ධනවත් යැයි හැඳින්වෙන රටවල් විශාල වශයෙන් ආර්ථික අවස්ථාවන් සහ ධනය උත්පාදනය කෙරෙන්නේ ඇයි දැයි ඇසුවහොත්?. නොබෙල් ත්‍යාගලාභී කීර්තිමත් ආර්ථික විද්‍යාඥ ඩග්ලස් නොර්ත් (Douglass North) මෙම ප්‍රශ්නයම පරික්ෂණයට ලක් කළා. ඔහුට අනුව නූතන මිනිසා ගල් යුගයේ මිනිසාගෙන් වෙන් කෙරෙන සාධකය නම් විශ්වාසයයි.**

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙහෙයවනු ලබන දිගු කාලීන ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ වැඩසටහන්හි ප්‍රගතිය මැන බැලීමට අවශ්‍ය අන්තර් ආයතනික සම්බන්ධීකරණයට පහසුකම් සැලසීම සිදු කරනු ලබයි. තවද, වෙළඳපොළ හිදැස් හඳුනාගැනීම සඳහා සමීක්ෂණයන් සිදු කිරීමේදී සහ ව්‍යුත්පන්නවලට ඇති ඉල්ලුම සමීක්ෂණය කිරීම වැනි අවශ්‍යතා තක්සේරුකරණයට ආසියානු සංවර්ධන බැංකුව විසින් සහයෝගය ලබා දී ඇත.

එමෙන්ම, ලෝක බැංකුව විසින් මූල්‍ය වෙළඳපොළ ස්ථායිතාව සහ පරිමාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතියක් සඳහා සහයෝගය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය මගින් විශේෂ අවධානය යොමු කල අංගයන් අතරට මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් නවීකරණය කිරීම, මූල්‍ය අංශයේ නියාමකයන්ගේ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම සහ මූල්‍ය පද්ධතියට ගැලපෙන පරිදි නීතිය සහ නියාමන රාමුව වැඩිදියුණු කිරීම යනාදිය ඇතුළත් වේ. මෙම සන්ධර්භය තුල ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සහයෝගය අවශ්‍ය වන ප්‍රධාන අංශයන් හඳුනාගෙන ඇත. එසේ හඳුනාගත් කරුණු අතරට ආයතනික තොරතුරු තාක්ෂණ උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදේශනය, ආවේක්ෂණ කටයුතු සඳහා උපදේශනය, හැකියාවන් ගොඩනැගීම, පුහුණුව සහ මානව සම්පත් අංශයේ සාමාජිකයින් සංවර්ධනය ද ඇතුළුව ආයතනික මානව සම්පත් උපායමාර්ග යක් ගොඩනැගීම, විමර්ශන සහ බලාත්මක කිරීමේ අංශයේ හැකියාවන් ගොඩනැගීම හා අවදානම පදනම් කරගත් අධීක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශනය ඇතුලත් වේ. සහයෝගීතාවය මගින් අප ප්‍රතිලාභ රැසක් ලබා ගෙන ඇති අතර අතර අප උනන්දු වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා මෙම හවුල්කාරීත්වයන් මත ගොඩනැගීමටයි.

### සේවා බලකාය: අසමසම වත්කම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අපි, අපගේ කාර්යය මණ්ඩලය විස්තීරණ පවුලක් සේ සලකන අතර එය අප සතු වටිනාම වත්කමද වේ. අපගේ පාර්ශවකරුවන්ට ප්‍රශස්ත සේවාවක් සලසන අතරවාරයේ සේවක මණ්ඩලයේ ආරක්ෂාව, සෞඛ්‍ය සහ සුබසාධනය සැලසීම සහතික කිරීමට අපි කැපවී කටයුතු කරන්නෙමු. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමත් සමග අපගේ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව සහතික කිරීමට පූර්ව ආරක්ෂක පියවරයන් රැසක් ක්‍රියාත්මක කළෙමු. කොවිඩ්-19 වසංගතය හමුවේ මුහුණ දීමට සිදුවන අභියෝග ජයගැනීමට සහ මෙහෙයුම් කටයුතු වලදී මුහුණ දීමට සිදුවන අභියෝගාත්මක තත්වයන්ට අනුවර්තනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

වීම සඳහා ප්‍රධානතම සාධකය වන්නේ තෘප්තිමත් සහ අභිප්‍රේරිත කාර්යමණ්ඩලය බව අපි හඳුනාගෙන සිටින්නෙමු. පවසා ඇති පරිදි ඔබ ඔබේ සේවකයන්ට සලකන්නේ යම් සේද එලෙසම ඔවුන් ඔබගේ පාරිභෝගිකයන්ට සලකනු ඇත. මන්ද මිනිසුන් ප්‍රබෝධමත් වන්නේ අගය කිරීම් සහ ප්‍රශංසා තුලිනි. මෙහෙයුම් ධාරිතාවයන් ශක්තිමත් කිරීම සඳහා දීර්ඝ කාලයකට පසු මෙම වසර තුළ කාර්ය මණ්ඩලය සඳහා උසස්වීම් ලබාදුන් බව මම ඉතා සතුටින් දැනුම් දෙමි. තවද ආයතන ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා නව සේවකයන් බඳවා ගන්නා ලදී. මෙවැනි පසුබිමක් තුළ, ගෝලීය වසංගතය මධ්‍යයේ අපගේ පාර්ශවකරුවන්ට බාධාවකින් තොරව අඛණ්ඩව සේවා සැපයීමට අප කටයුතු කල බව මම සතුටින් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. මෙම අසීරු කාලයේහි මුහුණ දීමට සිදුවූ අභියෝග ජයගැනීම සඳහා මාගේ කාර්යමණ්ඩලය දැක්වූ හෘදයාංගම සහයෝගයට ස්තුතිය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

## අනාගතවාදී ආකල්පයන්ගෙන් යුතුව ක්‍රියා කිරීම

කොවිඩ්-19 තවත් දීර්ඝ කාලයක් මුළුල්ලේ ගැටලුවක්ව පවතිනු ඇත. එම නිසා අතීතයේ වෙනත් අවස්ථාවල ක්‍රියා කල ආකාරයට සැලකිය යුතු කාලයකට කොවිඩ්-19 සමඟ ජීවත් වීමට අප ඉගෙන ගත යුතුවේ. ඉතා දීර්ඝ කාලයකට පසුව මනුෂ්‍ය වර්ගයා විසින් මුහුණ දෙන ලද දරුණුතම අර්බුදය මෙය වේ. කොවිඩ්-19 හේතුවෙන් ගෝලීය ආර්ථිකයද එකතැන නතර වී ඇත. ලොව පුරා රටවල්හි රජයයන් විසින් ව්‍යාපාරයන්ට, ආර්ථිකයන්ට සහ රැකියා වෙළඳපොළට සහයෝගය දැක්වීම සඳහා ඩොලර් ට්‍රිලියන ගණන් වියදම් කොට ඇති නමුත් ලක්ෂ ගණනින් රැකියා අහිමිව ගොස් ඇත. කුටුම්භයන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටින අතර අපිද කිසිදා අපේක්ෂා නොකළ තත්වයකට මුහුණ දෙමින් සිටිමු.

මෙමගින් අපගේ ආර්ථිකයටද දැඩි බලපෑම් එල්ල වී ඇත. වර්තමානයේ අප අත්විඳිමින් සිටින්නේ අපේ රට මුහුණ දුන් දරුණුතම ආර්ථික සංකෝචනයයි. අපගේ රට විශාල වශයෙන් රඳා පවතින සංචාරක කර්මාන්තය, විදේශ ප්‍රේෂණ සහ ආයෝජන යන අංශයන් ද මෙම වසංගතය හමුවේ දැඩි බලපෑමකට ලක්ව ඇත. අපේ රටේ ආර්ථිකයට නැවත කොවිඩ්-19 තත්ත්වයට පෙර පැවති සාමාන්‍ය තත්ත්වයට පත්වීමට යම් කාලයක් ගත වනු ඇත. කෙසේවෙතත්, මෙවන් දැවැන්ත අභියෝග මධ්‍යයේ වුවද රටේ ඉදිරි ගමන නතර නොකෙරෙනු ඇත.

පළමුව අප විසින් වෙළඳාම්, ආයෝජන, ප්‍රාග්ධන සහ මානව සම්පත් ගෝලීය ප්‍රවාහයට සම්බන්ධ විය යුතුවේ. ජ්‍යාත්තන්තර වෙළඳාමේ නව සම්මතයන් සහ ආයෝජන මාර්ග විවෘත වනු ඇති අතර ජාත්‍යන්තර හවුල්කාරීත්වයන් සඳහා නව වෙළඳපොළවල් සහ අවස්ථා උදා වනු ඇත. නව ප්‍රවාහයන්ට සහ මාර්ගයන්ට සම්බන්ධවීමට රට දැනටමත් සූදානම් වී සිටින අතර එමඟින් නැතිවී ගිය ව්‍යාපාර සහ රැකියා වලට නව ව්‍යාපාර සහ රැකියා අවස්ථා නිර්මාණය කෙරෙනු ඇත. අප සිදු කල යුත්තේ මෙම ඉලක්ක සපුරාගැනීමට කැපවීමෙන් සහ බුද්ධියෙන් කටයුතු කිරීමයි.

අර්බුධකාරී වාතාවරණයක වෙළඳපොළක් නීතිරීති වලට අනුකූලව ක්‍රියාත්මක වන බවට සහතික වීම ආයෝජකයන් විසින් අගය කරනු ඇත. ගැටලුව හඳුනාගත් මුල් අවස්ථාවේදීම යථාර්ථය මඟ නොහැරමින් සහ අත්තනෝමතික ලෙස ක්‍රියා නොකරමින්, ඵලදායිව සහ වගකීමෙන් යුතුව කොවිඩ්-19 තත්වයට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිචාර දැක්වූ ආකාරය මෙවන් අගය කිරීමක් ලබාගැනීමට හේතු විය. මේ සියල්ල සමඟින් අප වෙළඳපොළ ආසියාවේ සහ ලෝකයේ කැපී පෙනෙන වෙළඳපොළක් බවට පත් විය. කොවිඩ් වසංගතයෙන් පසුව ලෝකය කෙබඳු වේදැයි කිසිවකුටත් අනාවැකි කිව නොහැකි නමුත් ලොව පුරා නව ආර්ථික වර්ධනයන් අපට අවස්ථාවන් රාශියක් ලබා දෙනු ඇත. අප පෙරටත් වඩා ශක්තිමත්ව එම අවස්ථාවන් හඹා යමින් ඒවා ලබාගැනීම අත්‍යවශ්‍ය වේ.

මීළඟට, අපට නැවත ගොඩනැගීමට අවශ්‍ය දක්ෂතා සහ ආයෝජනයන් රඳවා තබා ගැනීමට සහ ආකර්ෂණය කර ගැනීමට අපි දැඩි කැපවීමෙන් කටයුතු කරන්නෙමු. සමහර රටවල් තම ආර්ථිකයන්හි දොරටු වසා තබද්දී අප අපේ දොරටු විවෘතව තැබීමු. මේ තුළින් වර්තමාන වාතාවරණයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගනිමින් අපගේ සේවකයන් සහ කර්මාන්තයන් මෙම අර්බුදය හමුවේ තම පැවැත්ම රඳවා තබා ගනු ඇත. එමෙන්ම ඔවුන් වඩා ශක්තිමත්ව සහ වේගයෙන් නැවත ගොඩනැගෙනු ඇත.

තුන්වෙනුව, අප ඉදිරියෙහි ඇති අභියෝග යන් සාර්ථකව ජයගැනීමට නම් නම්‍යශීලී, කාලෝචිත සහ ඵලදායි සැලැස්මක් අවශ්‍යවේ.

වසංගතය ගෙන ආ සියලු බාධාවන් තුලින් සිදුවූ දේ නම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළඳපොළ දියුණු තාක්ෂණයෙන් යුතු, තරඟකාරී සහ ආකර්ශණීය වෙළඳපොළක් බවට පත් කිරීමට අප තුළ ගැඹුරටම කිඳා බැසගෙන තිබූ අවශ්‍යතාවය ඉටු කරගනිමින් ක්‍රියාවට නැංවීමට හැකිවීමයි.

අපගේ සැලසුම් සාර්ථක වීමට සහ අපගේ බලාපොරොත්තු සහ සිහින යථාර්තයක් වීමට අප සතුව තිබිය යුතු අත්‍යවශ්‍යම ගුණාංගය නම් මිනිසුන්ගේ සමගිය සහ දරා ගැනීමේ හැකියාවයි. අප දැන් අත්දකිමින් සිටින අන්දමින් වරින් වර ජාතින් සහ මිනිසුන් දැඩි ලෙස පරීක්ෂාවට බඳුන් වී ඇත. අර්බුදයන් හමුවේ අයෙක් පීඩනය දරාගෙන සිටින අතර තවත් අයෙක් පරාජයට පත්වේ. අනෙක් අය අසීරු අවස්ථාවන්ට මුහුණ දීමේදී වඩාත් අධිෂ්ඨානශීලීව මෙතෙක් ඔවුන් තුළ ඇති ප්‍රයෝජනයට නොගත් හැකියාවන් සහ ශක්තීන් හඳුනාගනිමින් පරිවර්තනය වීම සහ නැවත ආරම්භ කිරීම තුළින් ඉදිරියට ගමන් කරයි. අපේ කතාව වන්නේ මින් දෙවැන්නයි. ඉදිරි වසර කිහිපය තුලද එය එසේ විය යුතුවේ. අර්බුදය හමුවේ මතුවන අවදානම් තුලින් අවස්ථාවන් ලබාගැනීම සඳහා අපි කිසිදා අසමත්වී නොමැත.

දැන් අපගේ ඉතිහාසයේ තවත් මොහොතක, පරම්පරාවක අර්බුදයට මුහුණ දීමේ අපේ වාරය පැමිණ ඇත. අප දැන් කරන්නාවූ තේරීම් මගින් රටක් වශෙයෙන් අප කවුරුන්ද යන්න සහ අනාගත පරම්පරාවට අප ලබාදෙන සාරධර්ම සහ පරමාදර්ශ මොනවාද යන්න නිර්වචනය කෙරේ. පසුගිය කාල වකවානුව තුළ ආයෝජයකයින්ගේ විශ්වාසය විශාල ලෙස ඉහල ගොස් ඇති අතර රටක් වශයෙන් ආර්ථික ප්‍රතිසංස්කරණය ආරම්භ කරමින් සිටී. එමගින් 2021දී සහ ඉදිරි වසරවලදී අඛණ්ඩ වර්ධනයක් ලබා ගැනීමට අරමුණු කරයි. සෑම කෙනෙකුටම තම සිහින හඹා යා හැකි අයුරින් අපට සුවිශේෂී ලෙස ඉදිරියට යා හැකියැයි මම විශ්වාස කරමි. ශ්‍රී ලංකාවට රටක් ලෙස ළඟා විය හැකි මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීමට ප්‍රාග්ධන වෙළඳපොළ සියලුම

පාර්ශවකරුවන්ගේ සහයෝගය ලබාගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හැකි උපරිමයෙන් කටයුතු කරනු ඇත. සියලු දෙනාම අපත් සමග එක්ව කටයුතු කිරීම අපට අවශ්‍යයයි. අපි එක්ව අපේ රට මෙම අර්බුදය හරහා ආරක්ෂිතව ඉදිරියට රැගෙන යමින් අපගේ සාර්ථකත්වය මුළු ලෝකයටම පෙන්නුම් කරමු.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පසුගිය වසර තුළ සිදුකළ කාර්යයන් සහ ලබාගත් සාර්ථකත්වය දෙස බලන විට තේරුම්ගත හැකි එක් දෙයක් නම් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙනස කරා යන ගමනක නිරත වෙන බවයි. වෙනසක් ඇති කිරීමට කැමැත්තක් නොමැතිව කිසිදු වෙනසක් සිදුකළ නොහැක. යම් දෙයක් සිදුවීමට නම් ඔබ ඒ අනුව ක්‍රියාකළ යුතුයි. වසංගතය ගෙන ආ සියලු බාධාවන් තුලින් සිදුවූ දේ නම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළඳපොළ දියුණු තාක්ෂණයෙන් යුතු ,තරඟකාරී සහ ආකර්ශණීය වෙළඳපොළක් බවට පත් කිරීමට අප තුළ ගැඹුරටම කිඳා බැසගෙන තිබූ අවශ්‍යතාවය ඉටු කරගනිමින් ක්‍රියාවට නැංවීමට හැකිවීමයි. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා සහ රටේ සුරැකුම්පත් වෙළඳපොළ සඳහා අපේක්ෂා කල සියල්ල යථාර්තයක් කරගැනීමට වසංගතය විසින් අපව දිරිමත් කර ඇත. ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම තුලින් දැනට වෙළඳපොල තුළ සිටින සහ විභව දේශීය සහ විදේශීය ආයෝජකයින්ට වඩා යහපත් අපේක්ෂාවන් ලබාදීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කටයුතු කරන බව සහතිකවම පැවසිය හැකිවේ. ස්ථාපිත සමාගම් සහ ඉදිරියට ආරම්භ කිරීමට අපේක්ෂා කරන ආයතන වලට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළ වර්ධනය සහ සංවර්ධනය වීමට වේදිකාවක් ලෙස සැලකිය හැකි වන ආකාරයට සුරැකුම්පත් වෙළඳපොළ නිර්මාණය කිරීමට අපි කටයුතු කරන්නෙමු. විශාල හෝ කුඩා වේවා ආයෝජකයන් සහ නිකුත් කරන්නන් සියලු දෙනාගේම අපේක්ෂාවන් යථාර්තයක් බවට පත්කර ගැනීමට හැකිවන ස්ථානයක් බවට ප්‍රාග්ධන වෙළඳපොළ පත්කිරීමට අපි අදහස් කරන්නෙමු. සුරැකුම්පත් වෙළඳපොළ නියාමකයා ලෙස අධි නියාමනයේ ඇති අන්තරායන් පිළිබඳ අප හඳුනාගෙන ඇති බැවින් අඛණ්ඩව මනා තුලනයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළට තිරසාර බව ඒකාබද්ධ කිරීමට කැපවීමෙන් කටයුතු කරමු. මෙම අවස්ථාවේ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ කණ්ඩායම වෙහස නොබලා දැක්වූ සහයෝගය සතුටින් මතක් කිරීමට කැමති අතර විශේෂයෙන් එහි සභාපති දුමිත් ප්‍රනාන්දු මහතා, ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා සහ ප්‍රධාන නියාමන නිලධාරී රේණුක විජේවර්ධන මහතාට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වෙනුවෙන් ඔවුන් දැක්වූ නායකත්වයට සහ දෙපාර්ශ්වයම මනා සහසම්බන්ධතාවයකින් කටයුතු කිරීම සහතික කිරීම වෙනුවෙන් ස්තූතිය පළ කිරීමට කැමැත්තෙමි. තවද, ඉදිරියටත් අඛණ්ඩව ඔවුන් හා එක්ව කටයුතු කිරීමට මම බලාපොරොත්තු වෙමි.

මා මීත් පෙර පැවැසූ පරිදි, නියාමනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හදවත බඳු වුවත් තවදුරටත් සාම්ප්‍රදායික නියාමකයාගේ භූමිකාවට පමණක් සීමා වී සිටීම ප්‍රමාණවත් යයි අපි විශ්වාස නොකරමු. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා, මුදල්, ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා, ජනාධිපති ලේකම් පී. බී. ජයසුන්දර මහතා, භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල මහතා සහ මුදල්, ප්‍රාග්ධන වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ලේකම් ප්‍රියන්ත රත්නායක මහතා යන අයගේ අඛණ්ඩ මග පෙන්වීම සහ සහයෝගය නොවන්නට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කරගත් කිසිවක් කළ නොහැකිය.

2020 වර්ෂය පහසු වර්ෂයක් වූයේ නැත. ඒ නමුත් මුහුණ දීමට සිදුවූ බාධාවන් හමුවේ කැපවීමෙන් සහ වෙහෙස නොබලා අඛණ්ව කටයුතු කල ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යමණ්ඩල සාමාජිකයින් විනිමය කොමිෂන් සභාවේ දැක්ම ලඟා කරගැනීම කෙරෙහි අපගේ ඇති කැපවීමට සහ අධිෂ්ඨානයට සාක්ෂි දරයි. සෑම අවස්ථාවකදීම ලබාදුන් ඥානවන්ත උපදෙස් සහ නොවරදින සහයෝගයට අපගේ සභාපති, ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතාට මම ස්තූතිවන්ත වෙමි. අප කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් මම ඔහුට ආයතනය වෙනුවෙන් මෙන්ම පෞද්ගලිකවද අවංක ස්තූතිය පිරිනමමි.

ඇමරිකාව වැනි ලෝකයේ ධනවත් යැයි හැඳින්වෙන රටවල් විශාල වශයෙන් ආර්ථික අවස්ථාවන් සහ ධනය උත්පාදනය කෙරෙන්නේ ඇයි දැයි ඇසුවහොත්?. නොබෙල් ත්‍යාගලාභී කීර්තිමත් ආර්ථික විද්‍යාඥ ඩග්ලස් නොර්ත් (Douglass North) මෙම ප්‍රශ්නයම පරීක්ෂණයට ලක් කළා. ඔහුට අනුව නූතන මිනිසා ගල් යුගයේ මිනිසාගෙන් වෙන් කෙරෙන සාධකය නම් විශ්වාසයයි.

එමෙන්ම, කොමිෂන් සභා සාමාජිකයින්ගේ නොසැලෙන සහයෝගය, වටිනා අදහස්, සාමූහික විශේෂඥතාව සහ ඔවුන්ගේ වෘත්තීමය සහ පෞද්ගලික කාලය කැපකිරීම වෙනුවෙන් මම ඔවුන්ට ස්තූතිවන්ත වෙමි.

සුරැකුම්පත් වෙළඳපොළ තුලින් තම ආයතන විවිධ ආකාරයෙන් පරිවර්තනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට හැකියාව ඇති බැවින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයට ශ්‍රී ලංකා සුරැකුම්පත් වෙළඳපොළ සමඟ සම්බන්ධ වන ලෙස මම ඉතා සතුටින් ආරාධනා කරමි. විශාල අභිලාෂයන් සහ ඒවා ඉටු කරගැනීම තුලින් අනාගතය නැවත අර්ථ දැක්වීමට යන ගමනේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමඟ අත්වැල් බැඳ ගැනීමට දැන් තරම් හොඳ කාලයක් උදා නොවනු ඇත. අපගේ මෙන්ම ප්‍රාග්ධන වෙළඳපොළ සියලුම පාර්ශවකරුවන්ගේ ඔරොත්තුදීමේ හැකියාව පරීක්ෂා කරන මෙවන් කාලයක ඔබ ඉදිරියට පැමිණෙන අවිනිශ්චිතතා හමුවේ නොසැලී සිටිමින් එය ඔබගේ සිහින වලට අවහිරයක් වීමට ඉඩ නොදී අවස්ථාවක් බවට පත්කර ගන්න. කවර තත්වයක් යටතේ වුවත් සිහින දැකීමට බිය නොවන්නා කැපීපෙනෙන ජයග්‍රහණයන් කරා ලඟා වනු ඇත.



**චින්තක මෙන්ඩිස්**
**අධ්‍යක්ෂ ජනරාල්**

2021 මැයි 20

# කොමිෂන් සභා සාමාජිකයින්



වමේ සිට දකුණට වාඩිවී :

මනිල් ජයසිංහ මහතා
ජනාධිපති නීතීඥ විරාජ් දයාරත්න මහතා
(සභාපති)

වමේ සිට දකුණට හිටගෙන :

සුනිල් ලංකාතිලක මහතා, ප්‍රියන්ත රත්නායක මහතා, නරේෂ් අබේසේකර මහතා,
සිසිර රත්නායක මහතා, ජනාධිපති නීතීඥ සුහද ගමලත් මහතා
නොපැමිණි: එන් ඩබ්ලිව් ජී ආර් ඩී නානායක්කාර මහතා



# කොමිෂන් සභා සාමාජිකයින්

### ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා

**(සභාපති)**

ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා 2020 ජනවාරි 22 වන දින සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ධුරයට පත්විය. දයාරත්න මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් සහ වේල්ස් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළෙඳ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. 1989 දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වූ ඔහු 1992 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස බඳවා ගන්නා ලදී.

ඔහු 1993 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා නීතිපති දෙපාර්තමේන්තුවට රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස සම්බන්ධ වූ අතර, ඔහු 2018 මැයි මාසයේදී අතිරේක සොලිසිටර් ජනරාල්වරයෙකු ලෙස පත්විය. එම වසරේම ජූනි මාසයේදී අතිගරු ජනාධිපතිතුමා විසින් ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ සිය වෘත්තීය ජීවිතයේ පළමු වසර හය තුළදී, දයාරත්න මහතා අපරාධ අංශයට අනුයුක්තව සිටි අතර මහේස්ත්‍රාත් අධිකරණවල සහ මහාධිකරණවල නඩු පවරා ඇති අතර, ඔහු මහාධිකරණ විසින් නිකුත් කරන ලද තීන්දු වලට අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු සම්බන්ධයෙන් රජය වෙනුවෙන් පෙනී සිටියේය. ඉන්පසුව, ඔහු සිවිල් හා වාණිජ නීති අංශයට යොමු වී, රජය රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතන මෙන්ම මූලික අධිකරණවල සහ අභියාචනාධිකරණ නියෝජනය කරමින් මූලික අයිතිවාසිකම්, පොදු නීතිය, වාණිජ නීතිය, බදු, බැංකු, රේගු සහ කම්කරු නීතියට අදාළ කටයුතුවල නිරතව වී ඇත. ඔහු ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි වාණිජ බේරුම්කරණ කිහිපයකම පෙනී සිටියේය. විවිධාකාර නීතිමය කාරණා සම්බන්ධයෙන් රජය, රාජ්‍ය සංස්ථා සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවලට උපදෙස් දීම ද ඔහුගේ කාර්යයට ඇතුළත් ය.

දයාරත්න මහතා ෆීජි ජනරජයේ අභියාචනාධිකරණයේ බාහිර විනිසුරුවරයෙකු වන අතර මැලේසියාවේ ආසියානු ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයේ (ICPL) විනිශ්චයකාර මණ්ඩලයේ විනිශ්චයකාරවරයෙකි. ඔහු ICLP බේරුම්කරණ මධ්‍යස්ථානයේ පීඨ මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ඉදිකිරීම් බේරුම්කරණය සහ විනිශ්චය පිළිබඳ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කරයි.

බේරුම්කරණ නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ පරිපාලන නීතිය පිළිබඳ පරීක්ෂකවරයෙකු වූ ඔහු ඉන්ෆෝමටික් ඉන්ස්ටිටියුට් ආයතනය විසින් පවත්වන ලන්ඩන් නීතිවේදී උපාධි පාඨමාලාවේ කොන්ත්‍රාත් නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයකු ලෙස ද සේවය කළේය.

දයාරත්න මහතා 2009 සිට 2011 දක්වා වසර දෙකක කාලයක් ඕමාන් සුල්තාන් රාජ්‍යයේ ආරක්ෂක අමාත්‍යාංශයේ කොන්ත්‍රාත් හා නීති කටයුතු අධ්‍යක්ෂ කාර්යාලයේ නීති විශේෂ ඥයෙකු ලෙස සේවය කළේය. ඔහු රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (PERC) මෙන්ම ශ්‍රී ලංකා අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති උපදේශකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනිසුරු නීතිපති ලෙස ද කටයුතු කළේය.

ඔහු මහවැලි මිනි ජල විදුලි ව්‍යාපෘතිය සඳහා BOO / BOOT පදනම මත සහ ව්‍යාපෘති පදනම මත කිලිනොච්චි දිස්ත්‍රික් විදුලිබල ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ගිවිසුම් කෙටුම්පත් කළ ව්‍යාපෘති කමිටුවල සාමාජිකයෙකු වූ අතර ශ්‍රී ලංකාව සහ ඕමානය අතර ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම සම්බන්ධ ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායමේ සාමාජිකයෙක් වශයෙන්ද කටයුතු කර ඇත. ඔහු බොහෝ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී රජය නියෝජනය කර ඇති අතර නීතිය හා සම්බන්ධ විවිධ විෂයයන් පිළිබඳ බොහෝ පලකිරීම්වලට ලිපි සපයමින් දායක වී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් ඔහුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස පත් කර ඇත.

### මනිල් ජයසිංහ මහතා

මනිල් ජයසිංහ මහතා, එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙකු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයෙකු හා රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණය පිළිබඳ වරලත් ආයතනයේ සාමාජිකයෙකි.

ශ්‍රී ලංකා අර්නස්ට් ඇන්ඩ් යන්ග් ආයතනයෙහි සහතික කිරීමේ ප්‍රධානී හා බැංකු හා මූල්‍ය සේවා කටයුතු සම්බන්ධ ප්‍රධානී ලෙස කටයුතු කර වසර 38 කට වැඩි අත්දැකීම් ඇති අයෙකි.

වර්තමානයේදී ඔහු : -

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ලෙස,
- ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස, ව්‍යවස්ථාපිත විගණන කමිටුවේ සාමාජිකයකු සහ තවත් බොහෝ කමිටුවල සාමාජිකයකු ලෙස,
- දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සභාපති ලෙස,
- ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස,
- ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස,
- ලැයිස්තුගත සමාගම්වල විගණන කමිටුවල උපදේශකයෙකු ලෙස සේවය කරයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ විභාග කමිටුවේ සභාපති, ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ විකල්ප සභාපති, ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනයේ, ජාත්‍යන්තර ගිණුම්කරණ අධ්‍යාපන ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයකු සහ මොරටුව විශ්විද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත.

### ජනාධිපති නීතීඥ සුහද ගමලත් මහතා

ගමලත් මහතා හිටපු සොලිසිටර් ජනරාල්වරයකු වන අතර අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙකි.

### ආර්.එම්.පී. රත්නායක මහතා

ආර්.එම්.පී.රත්නායක මහතා ශ්‍රී ලංකා සැලසුම් සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු වන අතර දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහු වසර 25 කට ආසන්න කාලයක් විවිධ තනතුරු දරමින් රාජ්‍ය සේවයේ යෙදී සිටී.

රත්නායක මහතා නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇත.

1994 දී රාජ්‍ය සේවයට බැඳුණු ඔහු මහා භාණ්ඩාගාරයට අනුයුක්තව කටයුතු කරමින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ හා බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD) තනතුරු ගණනාවක් දරා ඇත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ඔහු සංවර්ධන හවුල්කරුවන්, ණය දෙන ආයතන සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සමඟ සම්බන්ධීකරණය කිරීම, සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ මූල්‍ය බලමුලු ගැන්වීම සඳහා ද්විපාර්ශ්වික සාකච්ඡා වල නිරත වීම සහ කාලීන වශයෙන් විදේශ මුදල් සම්පාදනය සඳහා පහසුකම් සැපයීම වැනි කටයුතුවල වගකීම් දරා ඇත.

රත්නායක මහතා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) විකල්ප විධායක අධ්‍යක්ෂක, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපති, මහජන බැංකුවේ අධ්‍යක්ෂ, පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ (PGIM) කළමනාකරණ මණ්ඩලයේ සාමාජික, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාවේ (SPC) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂ සහ ජාතික වෛද්‍ය නියාමන අධිකාරියේ සාමාජික යන තනතුරු රැසක් ද හොබවා ඇත.

රත්නායක මහතා විවිධ අංශයන් / විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ලිපි පළ කර තිබේ.

### සිසිර රත්නායක මහතා

රත්නායක මහතා වසර 35 කට ආසන්න කාලයක් නීති ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව නියැලී සිටින අතර ශ්‍රී ලංකාවේ සිවිල් හා අපරාධ නීතිය පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත. ඔහු එක්සත් රාජධානියේ, ස්කොට්ලන්තයේ ඇබර්ඩීන් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ පැසසුම් ද සමඟ ශාස්ත්‍රපති උපාධියක් (L.L.M.) ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙසද කටයුතු කරයි.

රත්නායක මහතා මහේස්ත්‍රාත්වරයකු, දිසා විනිසුරුවරයෙකු, මහාධිකරණ විනිසුරුවරයෙකු ලෙස සහ සිවිල් අභියාචනාධිකරණ විනිසුරුවරයෙකු ලෙස ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණවල සේවය කර ඇත. ඔහු 2013-2015 කාලය තුළ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස සේවය කර ඇත. ඔහු 2007-2008 කාලය තුළ අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (නීති) ලෙස ද කටයුතු කර ඇත.

ඔහු අධිකරණ සේවා සංගමයේ සභාපති සහ උප සභාපති ලෙසත් සේවය කර ඇත. (JSA - දිවයිනේ සියලුම මහේස්ත්‍රාත්වරුන් හා දිස්ත්‍රික් විනිසුරුවන්ගෙන් සමන්විත සංගමය). ඔහු මහාධිකරණ විනිසුරුවන්ගේ සංගමයේ උප සභාපති සහ සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත. (HCJA - දිවයිනේ සියලුම මහාධිකරණ විනිසුරුවන්ගෙන් සැදුම්ලත් සංගමය)

හොංකොං හි පැවති "සමාගම් නීතියේ නවීන ප්‍රවණතා පිළිබඳ උසස් පුහුණු වැඩසටහන", සිංගප්පූරුවේ පැවති "2007 කලාපීය අධිකරණ සම්මන්ත්‍රණය", "ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ අධිකරණ සාමාජිකයින් සඳහා සිංගප්පූරුවේ පැවති ජාත්‍යන්තර බේරුම්කරණය සහ ඉදිකිරීම් නීතිය පිළිබඳ විධායක පුහුණු වැඩසටහන" ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් රැසකට ඔහු සහභාගී වී තිබේ., "ශ්‍රී ලංකා විනිසුරුවන් සඳහා ඉන්දියාවේ අධ්‍යාපන වැඩසටහන", සිංගප්පූරුවේ සිවිල් සේවා විද්‍යාලයේ පැවති' අධිකරණය සහ විශිෂ්ටත්වය පිළිබඳ අධ්‍යයන චාරිකාව, දකුණු කොරියාවේ පැවති "කොයිකා පුහුණු වැඩසටහන" සහ "එක්සත් රාජධානියේ එඩින්බරෝහී පැවති UKELA වාර්ෂික සමුළුව" ආදී ජාත්‍යන්තර වැඩසටහන් රාශියකට ඔහු සහභාගී වී ඇත. ඔහු ඉන්දියාවේ පැවති අධිකරණ කළමනාකරණය, නඩු කළමනාකරණය, සිවිල් නීති ප්‍රතිසංස්කරණ සහ පවුල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ වැඩසටහන් ආදියට ද සහභාගී වී තිබේ.

දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පැවති "ආසියානු-අප්‍රිකානු නීති උපදේශන සංවිධානයේ 46 වන සැසිය", ඇමරිකා එක්සත් ජනපදයේ වොෂිංටන් හි පැවති "අධිකරණ කොලොකියම් වැඩසටහන", "INSOL / UNCITRAL / ද්‍රවශීලතාව පිළිබඳව ඇමෙරිකාවේ පැවති, ලෝක බැංකු ඒකාබද්ධ බහුජාතික අධිකරණ කොලොකියම් වැඩසටහන ඇතුළු ජාත්‍යන්තර වැඩසටහන් ගණනාවකදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වී ඇත.

### සුනිල් ලංකාතිලක මහතා

සුනිල් ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයෙකි. ඔහු එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇති අතර පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් වානිජ විද්‍යා පළමු පෙළ ගෞරව උපාධියක් ද හිමිකරගෙන ඇත. එමෙන්ම ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයෙන් කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධියක් ද ලබා ඇත.

ලංකාතිලක මහතා, ආර්ථික හා මිල ස්ථායිතාව, මූල්‍ය පද්ධති ස්ථායිතාව සහ නියෝජිතායතන කාර්යයන් යන අංශයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහා බැංකුවේ කටයුතු කර වසර 32 ට වඩා වැඩි අත්දැකීම් ලබා ඇති අයෙකි. 1986 දී මහ බැංකුවට බැඳීමට පෙර ඔහු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙසද සේවය කර ඇත.

ශ්‍රී ලංකා මහා බැංකුවේ වසර 32 ක සිය වෘත්තීය ජීවිතය තුළ, සාර්ව ආර්ථික කළමනාකරණය, සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය, මූල්‍ය වැඩසටහන්කරණය, වෙළෙඳ ප්‍රතිපත්ති, තරඟකාරිත්වය, ව්‍යාපෘති කළමනාකරණය, විදේශ ආයෝජන, උපායමාර්ගික සැළසුම්කරණය සහ කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ සන්නිවේදන ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය

# කොමිෂන් සභා සාමාජිකයින්

ආදී ආයතනවල පිළිගත් පුහුණුකරුවන් විසින් පවත්වනු ලැබූ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී තිබේ. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ හිමිකම් රක්ෂණ අරමුදලෙහි කළමනාකරණ මණ්ඩලයේ, ජාතික කම්කරු උපදේශක කමිටුවේ සහ අනෙකුත් කමිටුවල සාමාජිකයෙකු ලෙස ද ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහා බැංකුව නියෝජනය කරමින් කටයුතු කර ඇත. තවද, ලංකාතිලක මහතා ශ්‍රී ලංකා මහා බැංකුව වෙනුවෙන් රජයේ දූත මණ්ඩල කිහිපයක්ම නියෝජනය කර ඇති අතර විශේෂයෙන්ම බැංකු සබඳතා, ආයෝජන ප්‍රවර්ධනය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා යන අංශයන් සම්බන්ධ කණ්ඩායම් ද නියෝජනය කර ඇත. ලංකාතිලක මහතා විශේෂයෙන්ම ආර්ථික ගැටළු, සුළු පරිමාණ කර්මාන්ත, ජාත්‍යන්තර වෙළෙඳාම, මැණික් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් සම්බන්ධව බොහෝ ලිපි රචනා කර ඇති අතර ඒවා ජාත්‍යන්තර හා දේශීය සඟරා සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ ප්‍රකාශනවල ප්‍රසිද්ධ කර ඇත.

ලංකාතිලක මහතා විවිධ මට්ටමින් සම්මන්ත්‍රණ පවත්වා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපෘති ඇගයීම, සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල කීර්තිමත් සම්පත්දායකයෙකි. ආර්ථිකය සම්බන්ධ පුළුල් මාතෘකා ඔස්සේ විවිධ සම්මන්ත්‍රණවලදී දේශණ ගණනාවක් ද ලංකාතිලක මහතා විසින් පවත්වා ඇත.

### නරේෂ් අබේසේකර මහතා

නරේෂ් අබේසේකර මහතා ව්‍යවසායකයකු, ප්‍රධාන කථිකයකු, SECQUORO හි (වේගවත් වර්ධනයක් සහ ලාභදායීතාවයක් අරමුණු කරගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමඟ කටයුතු කරන මූල්‍ය, ඩිජිටල් සහ ව්‍යාපාර පරිවර්තන උපදේශන සහ හවුල්කාර සමාගම) නිර්මාතෘ / ප්‍රධාන විධායක නිලධාරීවරයෙකු මෙන්ම පරිවර්තන ක්‍රමෝපාය, මූල්‍ය, ඩිජිටල් සහ තාක්ෂණය පිළිබඳ විශේෂයෙකු වශයෙන්ද කටයුතු කරයි.

නරේෂ් අබේසේකර මහතා, ලන්ඩන්, හොංකොං, සිංගප්පූරුව, කැනඩාව, ඉතාලිය, මැලේසියාව, ජොහැන්නස්බර්ග් හා අප්‍රිකානු මහාද්වීපයේ කොටස් හුවමාරුවලින් බහුතරයක ඇතුළු ලොව පුරා කොටස් වෙළඳපොළවල් 40 කට අධික සංඛ්‍යාවක් සවිබලගන්වමින් ලොව වේගවත්ම කොටස් වෙළෙඳ ගණුදෙනු ක්‍රමය හඳුන්වාදුන් ප්‍රාග්ධන වෙළෙඳපොළ තාක්ෂණයේ ලොව ප්‍රමුඛතම ආයතනය වන මිලේනියම් අයි ටී (එල් එස් ඊ ජී ටෙක්නොලොජි) සමාගමේ ප්‍රධාන මුල්‍ය නිළධාරීවරයාද (සමූහ) විය. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව ලොව විශාලතම කොටස් හුවමාරු දෙකෙන් එකක් වන ලන්ඩන් කොටස් හුවමාරු සමූහයේ ගෝලීය නායකත්ව කණ්ඩායමේ ද කටයුතු කළ ඔහු හාවඩ් බිස්නස් රිවීව් සඟරාව විසින් නම් කරන ලොව හොඳම ප්‍රධාන විධායක නිලධාරීන් 100 දෙනා අතරට ද පත් විය. ෆෝබ්ස් විසින් පිළිගත් දකුණු ආසියාවේ විශාලතම නිෂ්පාදන පහසුකම් සපයන්නන් අතර ආසියාවේ හොඳම 200 ගේ ලැයිස්තුවටද ඔහු ඇතුලත් විය.

"දකුණු ආසියාවේ හොඳම වාර්ෂික වාර්තාව" එළිදැක්වීමෙන් පසු සහ ව්‍යාපාර සම්පත් සැළසුම් ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව කලාපීය සම්මාන දිනා ගැනීමට ද ඔහු සමත් වී තිබේ.

ශ්‍රී ලංකාවේ අවදානම් සහ පාලන දැනුම් රාමුව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර විගණන ආයතනයේ සම-නිර්මාතෘවරයා වන ඔහු ජපානයේ නාගෝයා-ටොයොටා නිෂ්පාදන කම්හලේ පුහුණුවීම් පිළිබඳව ද පුහුණුව ලබා ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකයෙක්, වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් (ලන්ඩන්), වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් වන අතර පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.


### එන් ඩබ්ලිව් ජී ආර් ඩී නානායක්කාර මහතා

නානායක්කාර මහතා දැනට ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති ධූරය හොබවනු ලබයි. මහ බැංකුවේ වසර 27 කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු විශේෂයෙන් බැංකු අධීක්ෂණය හා නියාමනය, විදේශ සංචිත කළමනාකරණය සහ ජාත්‍යන්තර මෙහෙයුම්, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ ඒ ආශ්‍රිත දේශීය මෙහෙයුම්, සාර්ව විචක්ෂණ නිරීක්ෂණ, ප්‍රාදේශීය සංවර්ධන සහ රාජ්‍ය ණය කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ඇත.

නානායක්කාර මහතා වොෂිංටන් ඩී.සී. හි ඇමරිකානු විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (FCMA) සාමාජිකයෙක්, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ACA) සහකාර සාමාජිකයෙක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (CFSA) සහතිකලත් මූල්‍ය සේවා විගණකවරයෙකි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මේ වනවිට ක්‍රියාත්මක කරමින් පවතින

# විස්තීරණ, ක්‍රියාව නැඹුරුවූ, ප්‍රායෝගික සහ මිනිය හැකි ප්‍රාග්ධන වෙළඳපොළ උපායමාර්ග



# ප්‍රධාන නියාමන සහ සංවර්ධන උපායමාර්ග

## ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාවට නංවා ඇති


### රටේ ආර්ථික සංවර්ධනය සඳහා පුද්ගලික අංශය දිරිමත් කිරීමට


- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති තක්සේරු කිරීම සහ සංශෝධනය.
- OECD විසින් නියම කරන ලද මූලධර්මයන්ට අනුකූලව සාංගමික යහපාලන සංග්‍රහය සමාලෝචනය කිරීම.
- කොටස් වෙළෙඳපොළ අතරමැදියන් හා සම්බන්ධ වූ සියලුම නීති සමාලෝචනය.
- ඒකක භාර සංග්‍රහය සමාලෝචනය.
- නව පවරා ගැනීම් සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහයේ වැඩකටයුතු අවසන් කිරීම.
- සුරැකුම්පත්කරණයට අදාළ වූ නීතිමය ව්‍යුහය විධිමත් කිරීම.

- කොටස් වෙළඳපොළ ගනුදෙනු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සඳහා ආවේක්ෂණ පද්ධතියේ ක්‍රියාකාරීත්වයන් වැඩිදියුණු කිරීම.
- ලැයිස්තුගත සමාගම්හි මූල්‍ය ආවේක්ෂණ කටයුතු සඳහා පුළුල් විස්තීරණ රාමුවක් සකස්කිරීම.
- වගවීම සහතික කිරීම සඳහා අතිරේක සේවාවන් සපයන්නන් මත රාජකාරී පැවරීම.
- සියලුම ප්‍රාග්ධන වෙළඳපොළ ආයතන සහ අතරමැදියන් සම්බන්ධයෙන් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම.
- කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතා වැළැක්වීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් හඳුන්වාදීම.
- කොටස් වෙළෙඳපොළ වැරදි සම්බන්ධයෙන් කඩිනම් විමර්ශනයන් සිදුකිරීම.

- ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන, අතරමැදියන් සහ ලැයිස්තුගත සමාගම් සඳහා වූ යෝග්‍යතා සහ නිසි ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම.
- වෙළෙඳපොළ සහභාගීවන්නන්ගේ ලිපිගොනු තබාගැනීමේ ක්‍රමවේදය ප්‍රමිතිකරණය කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීවනන්ට අදාළ වූ සුදුසුකම් නිර්ණායක සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ආයෝජනය කල හැකි සියලුම වත්කම් කාණ්ඩ සඳහා පහසුකම් සැලසීම සඳහා බහු ස්ථර බලපත්‍ර රාමුවක් සකස් කිරීම.
- ඒකක භාර කළමනාකරණ සමාගම් සහ ආයෝජන කළමණාකරුවන් සඳහා ගෝලීය ආයෝජන කාර්ය සාධන ප්‍රමිතීන් (Global Investment Performance Standards - GIPS) හඳුන්වාදීමට ඇති හැකියාව පිළිබඳ ශක්‍යතා ඇගයීම.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් නියාමනය වන ආයතනයන්හි ගනුදෙනුකරුවන් හඳුනාගැනීම සඳහා වූ නිර්ණායකයන් (KYC requirements) වැඩිදියුණු කිරීම.
- මූල්‍යමය වශයෙන් අභියෝගයට ලක්වූ සමාගම් වර්ගීකරණය කිරීම සහ අනාවරණය කිරීම.
- නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව කොටස්වල අගය තක්සේරු කිරීමට මාර්ගෝපදේශයන් සකස් කිරීම.

- ගෙවීම්වලට එදිරිව බෙදාහැරීම (Delivery vs Payment) සහ මධ්‍යම ප්‍රතිපාර්ශවීය යාන්ත්‍රණයක් (Central Counter Party) ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අවදානමට බර තබන ලද ප්‍රමාණවත් ප්‍රාග්ධන රාමුවක් සකස් කිරීම.
- නියාමන ආයතන පරිශ්‍ර වෙත ගොස් සිදුකරන අධීක්ෂාණ සඳහා අවදානම මත පදනම් වූ තක්සේරු කිරීමේ රාමුවක් සකස් කිරීම.






- ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශ වීමට අවශ්‍ය විශාලත්වය, පරිමාණය සහ ද්‍රවශීලතාවය සහිත සමාගම් ලැයිස්තුගත කිරීම සඳහා අවකාශයක් නිර්මාණය කිරීම.
- සාංගමික ණය සඳහා වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා යටිතල පහසුකම් සංවර්ධනය මූල්‍යනය කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කරුණු ඇතුලත් රාමුවක් හඳුන්වාදීම.
- නව වෙළඳපොළ කණ්ඩායම් සඳහා පහසුකම් සැපයීම සඳහා විකල්ප ලැයිස්තුගත කිරීමේ පුවරු හඳුන්වාදීම.
- ජාත්‍යන්තර ආයෝජන දර්ශකයක් වන මෝගන් ස්ටැන්ලි (Morgan Stanley Capital International - MCSI) දර්ශකයේ නැගී එන වෙළඳපොළ තත්වයට ඉහළ නැංවීම.

- කුඩා ආයෝජකයින්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ තුලට පිවිසිය හැකි මාර්ගයක් ලෙස ඒකක භාර වැඩිදියුණු කිරීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ විශ්‍රාම වැටුප් අරමුදල් වල සහභාගීත්වය ඉහල නැංවීම.
- විදේශ ආයෝජකයින් ආකර්ෂණය කරගැනීම සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම.
- හිඟ විකුණුම්, සුරැකුම්පත් ණයට ගැනීම සහ ණයට විකිණීම හඳුන්වාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.
- ද්‍රවශීලතාවය වැඩි කිරීම සඳහා මහජන හිමිකාරිත්ව අවශ්‍යතාවය ඉහල මට්ටමකට ගෙන ඒම.

- නියාමන වාර්තා සැකසීම සඳහා විද්‍යුත් ලිපි-ගොනුකිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම.
- සියලු කොටස් තැරව්කාර ආයතන සඳහා එක හා සමාන වූ කාර්යාල දත්ත හා තොරතුරු ආරක්ෂණ පද්ධති සහ ඇණවුම් කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ඩිජිටල් ව්‍යාපාර වාර්තාකරණය සඳහා ප්‍රමිතිගත ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (REITs) සහ විනිමය හුවමාරු අරමුදල් (ETFs) වැනි නව වෙළෙඳපොළ උපකරණ සඳහා ප්‍රතිපත්ති සහ නීති සකස් කිරීම.
- වෙළෙඳපොල අවදානමට ගලපන ලද නව ආයෝජන උපකරණ හඳුන්වාදීම සඳහා අවකාශයක් නිර්මාණය කිරීම.

- කොළඹ කොටස් හුවමාරුවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය.
- කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය.
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු ඵලදායි, කාර්යක්ෂම සහ නියමිත කාල රාමුවක් තුළ ඉටු කිරීම සඳහා කොමිෂන් සභාවේ ප්‍රතිචාරාත්මක බව සහතික කිරීම.
- වෘත්තිමය ප්‍රවීනත්වයෙන් යුතු සේවකයන් බඳවා ගැනීම සහ රඳවා ගැනීම තුලින් නියාමකයාගේ නිපුණතා ගොඩනැගීම.
- ප්‍රාග්ධන වෙළෙඳපොළට හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ගේ මූල්‍ය සාක්ෂරතාව සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම.
- ආයෝජක අධ්‍යාපන වැඩසටහන් සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම.

# කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම සඳහා වූ ඒකාබද්ධ කමිටුව

කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය කිරීමට පියවර ගැනීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති විරාජ් දයාරත්න මහතා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ එහි නිළධාරින් සහ කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ එහි නිළධාරින්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් පත් කරන ලදී.




## වාඩි වී වමේ සිට දකුණට

රජීව බණ්ඩාරනායක මහතා - ප්‍රධාන විධායක නිළධාරී -කොළඹ කොටස් හුවමාරුව, මනිල් ජයසිංහ මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික, නරේෂ් අබේසේකර මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජික හා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව /කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ ඩිජිටල්කරණ කමිටු සභාපති, චින්තක මෙන්ඩිස් - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජයන්ත ප්‍රනාන්දු මහතා - කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ඩිල්ෂාන් විරසේකර මහතා - කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

## පළමු පේළිය වමේ සිට දකුණට:

කෞශල්‍යා විජේසිරි මිය - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ෂාර්මිලා පණ්ඩිතරත්න මිය - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, රන්දික සිල්වා මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, රසික වල්පිටගම මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, ප්‍රභාෂ් වනිගතුංග මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, ආචාර්ය හර්ෂණ පීරිස් සූරියප්පෙරුම මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, චන්ද්‍රකාන්ත් ජයසිංහ මහතා - කොළඹ කොටස් හුවමාරුව, රේණුක විජයවර්ධන මහතා - කොළඹ කොටස් හුවමාරුව , තුෂාර ජයරත්න මහතා - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

## දෙවන පේළිය වමේ සිට දකුණට:

නිරෝෂන් විජේසුන්දර මහතා - කොළඹ කොටස් හුවමාරුව, කෞෂාල් සිරිවර්ධන මහතා - කොළඹ කොටස් හුවමාරුව, ෂෙරාජ් ඔබේසේකර මහතා - කොළඹ කොටස් හුවමාරුව, කෝෂිලා අල්විස් මිය - කොළඹ කොටස් හුවමාරුව, මලික් ඉබ්‍රාහිම් මහතා - කොළඹ කොටස් හුවමාරුව, ඉන්ද්‍රජිත් කරුණාසේන මහතා - කොළඹ කොටස් හුවමාරුව, නදීර අසංග අතුකෝරළ මහතා - කොළඹ කොටස් හුවමාරුව

# ඩිජිටල්කරණය තුළින් සෑම ශ්‍රී ලාංකිකයෙකු වෙතම ළඟාවීම

**සියලු සාම්ප්‍රදායික ක්‍රියාවලීන් ඉවත් කරමින් ආයෝජකයින්ට ඕනෑම ස්ථානයක සිට අන්තර්ජාලය හරහා ශ්‍රී ලාංකික හැඳුනුම්පතක් සහ බැංකු ගිණුමක් සමඟ වඩා ඉක්මනින් ආයෝජනයන් සක්‍රීය කරගැනීමට, ආයෝජන අත්දැකීම් වැඩිදියුණු කිරීමට සහ කොටස් ගනුදෙනු ක්ෂණිකව සිදු කරගැනීමට පහසුකම් සැලසීම.**

සෑම ශ්‍රී ලාංකිකයෙකුටම ඕනෑම ස්ථානයක සිට ක්ෂණිකව කොටස් වෙළඳපොළ තුලට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රාග්ධන වෙළඳපොළ තුල ඩිජිටල් පරිවර්තනයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව ඒකාබද්ධ කමිටුවක් පිහිටුවන ලදී.

මෙම ඒකාබද්ධ කමිටුව විසින් කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණය සක්‍රීය කිරීමට දායක වන ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ ඉතා පුළුල් වැඩසටහනක් සකස් කරන ලදී. එම ප්‍රධාන පාර්ශවකරුවන් මෙම රූප සටහනෙහි දැක්වේ.

පසුගිය මාස තුන (3) තුළ ඒකාබද්ධ කමිටුව විසින් ක්‍රියාත්මක කරන ලද ඩිජිටල්කරණ ක්‍රියාවලියේ පළමු අදියර යටතේ ලඟා කරගත් ප්‍රතිඵල පහත වගුවෙහි දැක්වේ. මෙම ප්‍රතිඵල තුලින් කොටස් වෙළෙඳපොළ වර්ධනය, ප්‍රවේශය, අධ්‍යාපනය සහ තොරතුරු අන්තර්ගතයන් බෙදාහැරීම සහතික කිරීම සඳහා ශක්තිමත් ඩිජිටල් යටිතල පහසුකම් නිර්මාණය කෙරෙන අතර එමගින් ශක්තිමත් සහ කාර්යක්ෂම කොටස් වෙළෙඳපොළ පද්ධතියක් කරා යොමු වීමේ හැකියාව ලැබේ.

නව චින්තනයක් ඇති කිරීමට පහසුකම් සලසමින් සහ ව්‍යවසායකත්වයට සහයෝගය දැක්වීමේ ජාතික වැඩසටහනට සහය වෙමින් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස ව්‍යවසායකයින්ට දිගු කාලීන ප්‍රාග්ධනය රැස් කිරීමට, ව්‍යාපාර වර්ධනයට සහ නවෝත්පාදනයට ප්‍රාග්ධනය රැස් කල හැකි




සියලුම ආකාරයන් ආවරණය කරමින් ඉදිරියටත් අඛණ්ඩව තාක්ෂණික යටිතල පහසුකම් නවෝත්පාදනයන් හඳුන්වාදීමට ඒකාබද්ධ කමිටුව අපේක්ෂා කරයි.

සමස්ත ඩිජිටල්කරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා අනාගතවාදීව නීති වෙනස් කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ පද්ධතියෙහි ඉදිරිය නිර්මාණය කිරීමට ඊළඟ පරම්පරාවට ගැලපෙන පරිදි ප්‍රාග්ධන වෙළෙඳපොළ තාක්ෂණික යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා ඩිජිටල්කරණ කාර්ය සාධන බලකාය මගින් ඉදිරිපත්කල නිර්දේශයන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව විසින් සවිස්තරාත්මකව අධ්‍යනය කරන ලදී.

# ඩිජිටල්කරණය තුළින් සෑම ශ්‍රී ලාංකිකයෙකු වෙතම ළඟාවීම

| | ආයෝජකයා | ලැයිස්තුගත සමාගම |
|---|---|---|
| **විනාඩි 5 කටත් අඩු කාලයකින් අන්තර්ජාලය හරහා මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුමක් විවෘත කිරීම**<br>"සියලු සාම්ප්‍රදායික ක්‍රියාවලීන් ඉවත් කරමින් ආයෝජකයින්ට ඕනෑම ස්ථානයක සිට අන්තර්ජාලය හරහා ශ්‍රී ලාංකික හැඳුනුම්පතක් සහ බැංකු ගිණුමක් සමග වඩා ඉක්මනින් ආයෝජනයන් සක්‍රිය කරගැනීමට, ආයෝජන අත්දැකීම් වැඩිදියුණු කිරීමට සහ කොටස් ගනුදෙනු ක්ෂණිකව සිදු කරගැනීමට පහසුකම් සැලසීම" | පහත අංගයන්ගෙන් සමන්විතව වෙළෙඳපොළ ගනුදෙනු වේගවත් කිරීම සඳහා ආයෝජන අත්දැකීම් වැඩි දියුණු කිරීමට අන්තර්ජාලය හරහා ගිණුම් විවෘත කිරීම.<br>■ **අන්තර්ජාලය හරහා ඕනෑම ස්ථානයක සිට ආයෝජකයා වෙළෙඳපොළට ප්‍රවේශ වීම:** අන්තර්ජාලය හරහා විනාඩි 5 කටත් අඩු කාලයකදී මධ්‍යම තැන්පතු ක්‍රමයේ (CDS) ගිණුම් විවෘත කිරීමට සහ ආයෝජකයා හඳුනාගැනීමේ විද්‍යුත් ක්‍රමය (e-KYC) යටතේ කොටස් වෙළෙඳපොළට ප්‍රවේශවීමේ හැකියාව<br>■ **ජෛවමිතික සත්‍යාපනය:** අන්තර්ජාලය හරහා කොටස් වෙළෙඳපොළට ප්‍රවේශ වීමේදී ආරක්ෂාකාරී බව සහතික කිරීම සඳහා ජෛවමිතික හඳුනාගැනීම යොදා ගැනීම.<br>■ **ශ්‍රී ලංකාවේ පළමු වරට ස්වයංක්‍රීය ජාතික හැඳුනුම්පත් අංක සත්‍යාපනය:** පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා සෘජුවම සම්බන්ධ වෙමින් ස්වයංක්‍රීයව ජාතික හැඳුනුම්පත් අංකය තහවුරු කිරීම.<br>■ **ජංගම දුරකථන කෙටි පණිවිඩ (SMS)** සහ විද්‍යුත් තැපැල් ලිපිනය හරහා පියවරෙන් පියවර ආයෝජකයා සමග සම්බන්ධ වෙමින් ගිණුම් විවෘත කිරීම. | ආයෝජකයා සමග සෘජු සන්නිවේදනයක් ගොඩනගා ගැනීමට අන්තර්ජාලය හරහා ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාවලිය තුල ආයෝජකයාගේ අත්‍යවශ්‍යම තොරතුරු වන ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය වැනි තොරතුරු වල වලංගුභාවය තහවුරු කරනු ලබයි.<br>■ **වාර්ෂික වාර්තා බෙදාහැරීම :** විද්‍යුත් තැපැල් ලිපිනයට වාර්ෂික වාර්තා, කාර්තුමය ගිණුම් වාර්තා සහ අනෙකුත් ලිපි ලේඛන නියම කළ ආකාරයෙන් බෙදා හැරීමට හැකි වීම මගින් ලැයිස්තුගත සමාගම්හි අනුකූලතා පිරිවැය අඩු කරගැනීමට හැකිවීම.<br>■ **ලාභාංශ ගෙවීම විද්‍යුත් ආකරයට සිදු කිරීම:** ලාභාංශ ගෙවූ දිනයේ සිට දින 2 ක් ඇතුලත කොටස් හිමියන්ගේ බැංකු ගිණුම් වලට ලාභාංශ බැර කිරීමට හැකිවීම මගින් අනුකූලතා පිරිවැය අඩු කරගැනීමට හැකිවීම. |
| **විද්‍යුත් අන්තර්ක්‍රියා සහ සන්නිවේදන සේවාව**<br>"සන්නිවේදනය නව මානයකට රැගෙන යමින් කොටස් හිමියන් සහ ආයෝජකයින් සමග බහුවිධ විද්‍යුත් සන්නිවේදන ක්‍රම යොදාගනිමින් එසැණින් සන්නිවේදනය සිදු කිරීම" | කොටස් හිමියන් සහ ආයෝජකයින් සමග බහුවිධ විද්‍යුත් සන්නිවේදන ක්‍රම යොදාගනිමින් ක්ෂනිකව සන්නිවේදනය සිදු කිරීම.<br>■ **ජංගම දුරකථන කෙටි පණිවිඩ (SMS):** මධ්‍යම තැන්පතු ක්‍රමය (CDS) තුලින් දවස අවසානයේ ස්වයංක්‍රීයව ගනුදෙනු සාරාංශය සහිත කෙටි පණිවිඩයක් ජංගම දුරකථනයට යැවීම.<br>■ **කොටස් වෙළෙඳපොළ යෙදුම තුලින් පණිවිඩ යැවීම** (InApp Messaging)**:** සියලුම නිවේදන සහ දැනුම් දීම් යෙදුම හරහා සිදුකිරීම.<br>■ **විද්‍යුත් තැපැල් ලිපිනය:** මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් යවනු ලබන මාසික ප්‍රකාශ, කොටස් තැරව්කාර සමාගම් යවනු ලබන ගිණුම් ප්‍රකාශ සහ අනෙකුත් නිවේදන විද්‍යුත් තැපැල් ලිපිනයට යැවීම.<br>■ **වාර්ෂික වාර්තා:** විද්‍යුත් තැපැල් ලිපිනය හරහා සහ නව කොටස් වෙළෙඳපොළ යෙදුම හරහා වාර්තා යැවීම.<br>■ සිරි (Siri) සහ අලෙක්සා (Alexa) යන කෘතීම බුද්ධියන්හි සහය ලබා ගැනීම: 2020 සැප්තැම්බර් මස අවසානය වන විට, අන්තර් ක්‍රියාකාරී කෘතීම බුද්ධීන් වන සිරි (Siri) සහ අලෙක්සා (Alexa) හඳුන්වාදීම සහ එම කෘතීම බුද්ධීන් දත්ත සමුදාය හා ඒකාබද්ධ කිරීම මගින් වාචික අන්තර්ක්‍රියාකාරීත්වය තුලින් වෙළෙඳපොළ උච්චාවචනයන් පරික්ෂා කිරීම. | අන්තර්ජාලය හරහා ඉක්මනින් වාර්ෂික වාර්තා බෙදාහැරීම.<br>■ ඕනෑම ඉලෙක්ට්‍රොනික් මාධ්‍යක් භාවිතා කරමින් වාර්ෂික වාර්තා යැවීමට පහසුකම් සලසමින් නීතිරීති සංශෝධන කරන ලද අතර එමගින් විනාඩි කිහිපයක් තුළ කොටස් වෙළෙඳපොළ යෙදුම සහ විද්‍යුත් තැපැල් ලිපිනය හරහා කොටස් හිමියන්ට වාර්ෂික වාර්තා බෙදා හැරීමේ හැකියාව.<br>අන්තර්ජාලය හරහා ලැයිස්තුගත සමාගම්හි නිවේදන නිකුත් කිරීමේ හැකියාව<br>■ ලාභාංශ, අධ්‍යක්ෂ මණ්ඩල හා අනෙකුත් ඕනෑම දෙයක් සම්බන්ධ සමාගමෙහි නිවේදන කොටස් වෙළෙඳපොළ යෙදුම හරහා හෝ අන්තර්ජාලය හරහා එසැණින් නිවේදනය කිරීමේ හැකියාව. |
| **තොරතුරු අන්තර්ගතයන් ඩිජිටල් ආකාරයෙන් ලිපි සහ වීඩියෝ ලෙස ඉදිරිපත් කිරීම**<br>"තොරතුරු අන්තර්ගත ලිපි සහ වීඩියෝ ඩිජිටල් ආකාරයෙන් ඉදිරිපත් කිරීම මගින් වෙළඳපොළ දත්ත ද ඇතුලත්ව සියලුම තොරතුරු ආයෝජකයා සමීපයටම රැගෙන ඒමේ හැකියාව" | වඩා හොඳ ආයෝජන තීරණයන් සඳහා තොරතුරු දැනගැනීම<br>නව කොටස් වෙළෙඳපොළ යෙදුම මගින් ආයෝජන තීරණ කෙරෙහි බලපාන ලැයිස්තුගත සමාගම් පිළිබඳව, ආර්ථික සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ පිළිබඳව යාවත්කාලීන තොරතුරු සෘජුවම ආයෝජකයාට සපයන අතර එය වඩා හොඳ දැනුවත්බාවයකින් යුක්තව ආයෝජන තීරණ ගැනීමට ඉවහල් වේ.<br>■ කොටස් වෙළෙඳපොළ නව යෙදුම මගින් සපයන තොරුතුරු නම්;<br>■ ආයෝජන පර්යේෂණ වාර්තා<br>■ ලැයිස්තුගත සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන් සමග පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා<br>■ යාවත්කාලීන ආර්ථික තොරතුරු<br>■ මහා බැංකුව මගින් නිකුත් කරන යාවත්කාලීන තොරතුරු<br>■ අයවැය සහ ප්‍රතිපත්ති පිළිබඳ යාවත්කාලීන තොරතුරු<br>■ ප්‍රාථමික නිකුතු පිළිබඳ තොරතුරු<br>■ **වෙළෙඳපොළ දත්ත:** වෙළෙඳපොළ යෙදුම මගින් අතීත වෙළෙඳපොළ දත්ත ඉක්මනින් ලබා ගැනීමේ හැකියාව නිසා වඩා හොඳ ආයෝජන තීරණ ගැනීමට පහසුකම් සලසයි. | ඩිජිටල් මාධ්‍ය යොදු ගනිමින් අන්තර්ජාලය හරහා ලැයිස්තුගත සමාගම්හි තොරතුරු ඉදිරිපත් කිරීමට හැකියාව ලැබීම.<br>■ වීඩියෝ සහ ලිපි ලෙස සමාගම්හි නව තොරතුරු, ප්‍රධාන විධායක නිලධාරි සම්මුඛ සාකච්ඡා, නව නිෂ්පාදන හඳුන්වාදීම සහ උපායමාර්ගික තොරතුරු කිසිදු පිරිවැයකින් තොරව නව කොටස් වෙළෙඳපොළ යෙදුම භාවිතයෙන් සෘජුවම කෙටස්හිමියන්යට හා ආයෝජකයින්ට එකවිට ලබාදීමට හැකිවීම. මෙමගින් සමාගම්හි අනුකූලතා පිරිවැය සහ ආයෝජක සම්බන්ධතා පිරිවැය අඩු කර රැගැනීමට හැකියාව ලැබෙන ඇත.<br>ලැයිස්තුගත සමාගම්හි කාර්තුමය තොරතුරු යාවත්කාලීන කිරීම<br>■ ලැයිස්තුගත සමාගමක ආයෝජකයෙකු හෝ කොටස්හිමියෙකු සම්බන්ධයෙන යම් තොරතුරක් යාවත්කාලීන කිරීම ඇත්නම් එය ඉතා ඉක්මනින් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වෙත යොමුකර නව කොටස් වෙලෙඳපොළ යෙදුම් තුළ ප්‍රකාශයට පත් කිරීම මගින් එසැණින් ආයෝජනයා දැනුවත කරීම හැකි වීම. |

<table>
<tr><th>කොටස් තැරැව්කරුවන්</th><th>කොළඹ කොටස් හුවමාරුව (CSE)</th></tr>
<tr>
<td>කොටස් තැරැව්කරුවන්ට අන්තර්ජාලය හරහා නව ගිණුම් විවෘත කිරීමට හැකිවීම, අන්තර්ජාලය හරහා තොරතුරු බෙදාහැරීමට හැකිවීම, සහ තම ආයතනයේ වෙබ් අඩවියට හෝ සමාජ මාධ්‍ය පිටු වලට සම්බන්ධ කිරීමේ හැකියාව තුලින් නව ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමට හැකි වීම<br>▪ අතථ්‍ය (Virtual) ශාඛා: ආයතන පරිශ්‍ර වලින් තොරව අන්තර්ජාලය හරහා ශාඛා අතථ්‍යකරණය (Virtualization)<br>▪ අන්තර්ජාලය හරහා තොරතුරු අන්තර්ගතයන් බෙදා හැරීම: පිරිවැයකින් තොරව කොටස් තැරව්කාර පර්යේෂණ වාර්තා සහ ආයෝජකයන් හා සබැඳි තොරතුරු සෘජුවම බෙදාහැරීමේ හැකියාව.<br>▪ සමාජ මාධ්‍ය ඒකාබද්ධකරණය: සමාජ මාධ්‍ය තුලින් විභව ආයෝජකයන් ආකර්ෂණය කරගැනීම සහ ඒසමගම අන්තර්ජාලය හරහා මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුමක් විවෘත කිරීමේ හැකියාව.<br>▪ යෙදුම තුලින් පණිවිඩ හුවමාරුව: කොටස් වෙළඳපොළ නව යෙදුම තුලින් ආයෝජකයන් හා සෘජුවම සම්බන්ධ වීම.</td>
<td>ආයෝජකයන් සමග සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ඉක්මනින් සහ පහසුවෙන් ඉලෙක්ට්‍රොනිකව ගිණුම් වාර්තා බෙදාහැරීම.<br>▪ මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් යවනු ලබන ප්‍රකාශ: දින කිහිපයක් ඇතුලත ගිණුම් හිමියන්ට මාසික ප්‍රකාශ යැවීමට හැකිවීම.<br>▪ අන්තර්ජාලය හරහා ආයෝජකයා හා අන්තර්සම්බන්ධ වීම: කොටස් වෙළෙඳපොළ යෙදුම තුලින් ජංගම දුරකථන කෙටි පණිවිඩ හෝ විද්‍යුත් තැපැල් ලිපිනය වැනි ඩිජිටල් ක්‍රම යොදා ගනිමින් ආයෝජකයින් හා අන්තර්සම්බන්ධ වීම.<br>▪ ආයෝජන කළඹ: ඉදිරි මාස කිහිපය තුළ e-connect හඳුන්වාදීමත් සමග ආයෝජකයන්ට ඉලෙක්ට්‍රොනිකව ආයෝජන කළඹ මාරු කිරීම් ඇතුලු නව අංගයන්ගෙන් යුතුව තම මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම පරික්ෂා කිරීමේ හැකියාව ලැබෙනු ඇත.</td>
</tr>
<tr>
<td>වෙළඳපොළ තොරතුරු යාවත්කාලීන කිරීම්, නීතිරීති වෙනස් වීම් වැනි තොරතුරු බෙදාහැරීම් ද ඇතුළුව කොටස් තැරව්කරු සහ ගනුදෙනුකරු අතර සම්බන්ධතා බහුවිධ සන්නිවේදන මාධ්‍ය යොදා ගනිමින් පහසුවෙන් සහ කාර්යක්ෂමව අන්තර්ජාලය හරහා සිදුකිරීමේ හැකියාව ලැබී ඇත.<br>▪ යෙදුම හරහා කොටස් තැරැව්කරුවන් සමග සන්නිවේදනය කිරීම.<br>▪ ගිණුම් ප්‍රකාශ විද්‍යුත් තැපැල් ලිපිනය හරහා යැවීමේ හැකියාව.<br>▪ ගැනුම් සහ විකුණුම් සටහන් විද්‍යුත් තැපැල් ලිපිනය හරහා යැවීමේ හැකියාව.<br>▪ මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් ගනුදෙනු සඳහා ජංගම දුරකතනයට ස්වයංක්‍රීය කෙටි පණිවිඩයක් යැවීම සිදු කරයි. එමගින් ආයෝජන ක්‍රියාවලිය තුළ මනා පාලනයක් ඇති කරන අතර ස්වාධීන තෙවන පාර්ශ්වයකගේ මෙම සහතික කිරීම ගනුදෙනුකරු සහ තැරව්කරු අතර මනා සම්බන්ධයක් ගොඩනැගීමට ඉවහල් වේ.</td>
<td>මුද්‍රිත ගිණුම් ප්‍රකාශ සහ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම සම්පූර්ණයෙන්ම ඉලෙක්ට්‍රොනික ආකෘතියකට පරිවර්තනය වී ඇත.<br>▪ මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා විද්‍යුත් තැපැල් ලිපිනයට යැවීමේ හැකියාව ලැබී ඇත. එමගින් කඩදාසි සහ ලිපිද්‍රව්‍ය පිරිවැය, මුද්‍රණ පිරිවැය සහ තැපැල් ගාස්තු අඩු වේ.<br>▪ ලියාපදිංචි ගිණුම් සඳහා සුරැකුම්පත් ගිණුම් විවෘත කිරීමේ පෝරමය මෘදු පිටපතක් ලෙස ගබඩා කිරීමේ හැකියාව.</td>
</tr>
<tr>
<td>කොටස් තැරව්කරුවන්ට තම පර්යේෂණ ලිපි හා වාර්තා සහ ආයෝජන පිළිබඳ දැනුවත් කිරීම් ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව ඇත. එමගින් ආයෝජකයන්ට වඩා දැනුවත් ආයෝජන තීරණයන් ගැනීමේ හැකියාව ලැබේ.<br>▪ පර්යේෂණ ලිපි සහ වාර්තා අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කිරීමේ හැකියාව තුලින් ආයෝජකයන්ගේ දැනුවත්භාවය වැඩි කිරීමට හැකිවීම.<br>▪ වත්මන් ආයෝජකයින් සහ විභව ආයෝජකයින් ඉලක්ක කරගනිමින් ඩිජිටල් අවකාශය යොදා ගැනීමේ හැකියාව.</td>
<td>කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව මගින් තොරතුරු සේවාවක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන අතර එමගින් ආයෝජකයාට සක්‍රීයව සහභාගිවීමේ හැකියාව සහ වඩා දැනුවත් ආයෝජන තීරණ ගැනීමට හැකියාව ලැබේ.<br>▪ YouTube සමාජ ජාලයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා අධ්‍යාපනික නාලිකාව: අධ්‍යාපනික ලිපි ප්‍රකාශයට පත් කිරීමට YouTube සමාජ මාධ්‍ය ජාලය සහ අනෙකුත් ඩිජිටල් අවකාශයන් යොදාගැනීම තුලින් ආයෝජකයා දැනුවත් කිරීමට හැකියාව ලැබෙන අතර ආයෝජකයා සමග සම්බන්ධවීමට සහ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සහ අදහස් මත ගැලපෙන පරිදි තොරතුරු අන්තර්ගතයන් වෙනස් කිරීමටද හැකියාව ලැබේ.<br>▪ ලැයිස්තුගත සමාගම්හි ප්‍රධාන විධායක නිළධාරී සම්මුඛ සාකච්ඡා තුලින් ආයෝජකයන්ට වඩා හොඳ දෘශ්‍යතාවයක් ලබාදීම.<br>▪ මූලධර්ම මත පදනම්ව ආයෝජන පිළිබඳ ආර්ථික සහ කර්මාන්ත අංශයන්හි විශේෂඥන්ගේ අදහස් සහ සමාලෝචනයන් ප්‍රකාශයට පත් කිරීම.</td>
</tr>
</table>

# අනාගතයට අඩි පිම්මක්

*කොළඹ කොටස් වෙළෙඳපොළේ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම ආරම්භ කරන ලද්දේ 2020 සැප්තැම්බර් 17 වෙනිදාය. "අනාගතයට අඩි පිම්ම " යන තේමාව යටතේ ඩිජිටල්කරණ වැඩසටහන එළිදැක්වීමේ උත්සවය පැවැත්වූයේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙනි.*





















# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



වමේ සිට දකුණට හිටගෙන :

**මදුගයානි බලපිටිය මෙනවිය** - සහකාර අධ්‍යක්ෂ, මානව සම්පත් හා තොරතුරු තාක්ෂණ

**සුනෙත් පෙරේරා මහතා** - සහකාර අධ්‍යක්ෂ, සුපරීක්ෂණ

**තුෂාර ජයරත්න මහතා** - අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

**අයන්ති අභයවික්‍රම මෙනවිය** - අධ්‍යක්ෂ, නීති සහ බලාත්මක කටයුතු සහ වැඩබලන අධ්‍යක්ෂ, විමර්ශන

**චින්තක මෙන්ඩිස් මහතා** - අධ්‍යක්ෂ ජනරාල්



වමේ සිට දකුණට හිටගෙන :

**ආචාර්ය හර්ෂ පීරිස් සූරියප්පෙරුම** - අධ්‍යක්ෂ, සාංගමික කටයුතු සහ වැඩබලන අධ්‍යක්ෂ, සුපරීක්ෂණ

**ප්‍රභාෂ් වනිගතුංග මහතා** - අධ්‍යක්ෂ, ආවේක්ෂණ කටයුතු සහ වැඩබලන අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන

**ඩී. එම්. ජී ප්‍රියන්ත මහතා** - සහකාර අධ්‍යක්ෂ, විමර්ශන කටයුතු

**මනුරි වීරසිංහ මෙනවිය** - සහකාර අධ්‍යක්ෂ, සාංගමික කටයුතු

**ජී. පී. එන්. දිල්හානි මහත්මිය** - අධ්‍යක්ෂ, මූල්‍ය කටයුතු

නොපැමිණි: **ධම්මික පෙරේරා මහතා** - නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනියන්



සජීවනී බක්මීදෙනිය මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි - ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



රන්මිණි ජයතිලක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි - තොරතුරු තාක්ෂණ



ෂාමිලා පණ්ඩිතරත්න මෙනවිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි - නීති සහ බලාත්මක කටයුතු



සෞමි කොඩිප්පිලි මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි - සුපරීක්ෂණ

# කළමනාකාරුවන් සහ කළමනාකාරිනියන්



**තක්ෂිලා ෆ්රැන්සිස් මහත්මිය**
කළමනාකාරිනි - ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන



**මේබලා ජයපාල මෙනවිය**
කළමනාකාරිනි - සාංගමික කටයුතු



**නිමල් කුමාරසිංහ මහතා**
කළමනාකාරු - බාහිර සම්බන්ධතා



**ෂිනා ගුණරත්න මෙනවිය**
කළමනාකාරිනි - බාහිර සම්බන්ධතා



**ලක්ෂ්මි වික්‍රමනායක මහත්මිය**
කළමනාකාරිනි - මුදල් හා පරිපාලන



**අශෝකා දයාරත්න මහත්මිය**
කළමනාකාරිනි - මානව සම්පත්



**අනුලා විජේසිංහ මහත්මිය**
කළමනාකාරිනි - විමර්ශන කටයුතු



**ප්‍රතිභානී හේරත් මහත්මිය**
කළමනාකාරිනි - සුපරීක්ෂණ

නොපැමිණි: **ඩබ් ආර් කේ වසන්ත සුනිමල් මහතා**, කළමනාකාරු - විමර්ශන කටයුතු, **පී එම් නිරෝෂිකා උදයංගනී මහත්මිය**, කළමනාකාරිනි - නීති සහ බලාත්මක කටයුතු, **මංජුලා චන්ද්‍රරත්න මහත්මිය**, කළමනාකාරිනි - සුපරීක්ෂණ

# කාර්යමණ්ඩලය

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අංශය



ඔලිවි සෝලාංගආරච්චි මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



දසුන් පෙරේරා මහතා
සහකාර කළමනාකරු

### සභාපතිතුමාගේ කාර්යාලය



ෂමිල්කා කරුණානායක මහත්මිය
සහකාර කළමනාකාරිනී



ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රී මහත්මිය
ජ්‍යෙෂ්ඨ විධායක ලේකම්

### සාංගමික කටයුතු අංශය



මේරියන් ජී. සන්දනම් මෙනවිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



සමන්ති ගුණවර්ධන මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



සේමිනි දයනිකා මෙනවිය
සහකාර කළමනාකාරිනී



සරන්‍යා අනුතිනන
සහකාර කළමනාකාරිනී



කේ එම් ශානිකා ගුණසිංහ
සහකාර කළමනාකාරිනී

### අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය



රෝෂිනී පීරිස් මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



රසික වල්පිටගම මහතා
සහකාර කළමනාකරු



අෂාරා සෙනෙවිරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී



නිශෝකා ජයතුංග මහත්මිය
විධායක ලේකම්

### බාහිර සම්බන්ධතා අංශය



එම් ඒ ඉම්රාන්
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු

### ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශය



ජේ කේ ප්‍රියදර්ශනී මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී

### මූල්‍ය හා පරිපාලන අංශය



දුලාරි මුහන්දිරම් මෙනවිය
සහකාර කළමනාකාරිනී



ගයාන් ලොකුගමගේ මහතා
සහකාර කළමනාකරු



ඒ සී ඩයස් මහතා
නිළධාරී

# කාර්යමණ්ඩලය

## මූල්‍ය හා පරිපාලන අංශය



ඈන් ක්‍රිෂාන්ති ප්‍රනාන්දු මෙනවිය
පිළිගැනීමේ නිලධාරිනි සහ දුරකථන ක්‍රියාකාරු



එස් ඩී ධර්මසිරි මහතා



එල් ඩබ් එල් පියතිස්ස මහතා



සී සී නාගෙන්ද්‍රන් මහතා



ඩබ් ආරියරත්න මහතා



පැතුම් නිරෝෂණ මහතා



බුද්ධික බලපිටිය මහතා



සමිත් ප්‍රේමරත්න මහතා



රජිත වරුණ මහතා

## මානව සම්පත් අංශය



**ධනේෂා රාජපුර මහත්මිය**
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී

## තොරතුරු තාක්ෂණ අංශය



**රසංගි දිසානායක මහත්මිය**
සහකාර කළමනාකාරිනී



**රන්දික සිල්වා මහතා**
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



**ජයනාත් ගල්ලන්ග මහතා**
සහකාර කළමනාකරු

## විමර්ශන අංශය



**ප්‍රියන්ත හේරත් මහතා**
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



**බුද්ධිනී එන් හේරත් මහත්මිය**
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී



**රඛිත දිසානායක මහතා**
සහකාර කළමනාකරු



**ඩබ් එම් එස් දුලේන්ද්‍ර විජේවර්ධන මහතා**
සහකාර කළමනාකරු



**පී ජී එන් අශානි ෆොන්සේකා මෙනවිය**
සහකාර කළමනාකාරිනී

# කාර්යමණ්ඩලය

## විමර්ශන අංශය



කලෛයිවානි රාජකුමාරන් මෙනවිය
සහකාර කළමනාකාරිනී



පාරමී රණසිංහ මහත්මිය
සහකාර කළමානාකාරිනී



මනීෂා සෙනරත්නාරච්චි මහත්මිය
සහකාර කළමනාකාරිනී

## නීති සහ බලාත්මක අංශය



සී එන්දතී වෛද්‍යසේකර මහත්මිය
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී

## සුපරීක්ෂණ අංශය



කෞෂල්‍යා විජේවර්ධන මෙනවිය
සහකාර කළමනාකාරිනී



පූර්ණී වීරසේකර මෙනවිය
සහකාර කළමනාකාරිනී



චමිලා කරුණාරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී



සචිත්‍ර වරුසවිතාන මහතා
සහකාර කළමනාකරු

## ආවේක්ෂණ අංශය



ලලින්ද දයාරත්න මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු



දශංක වර්ණකුලසූරිය
සහකාර කළමනාකරු



රුචිකා සේනාරත්න මෙනවිය
සහකාර කළමනාකාරිනී



ඩබ් ඒ ජේ ගංගා ද කොස්තා මෙනවිය
සහකාර කළමනාකාරිනී



නිලංජනා සිවාජි මෙනවිය
සහකාර කළමනාකාරිනී

නොපැමිණි: **එරංගා මන්ත්‍රිරත්න මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී - සාංගමික කටයුතු, **තනිෂ්ක තිලකරත්න මහතා** - සහකාර කළමනාකරු - සාංගමික කටයුතු, **ක්‍රිස්ටොබල් සිල්වා මෙනවිය** - ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් - සාංගමික කටයුතු, **කවීෂා කුඹුකගේ මහත්මිය** - සහකාර කළමනාකාරිනී - අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය, **රාධා ජී. ප්‍රතිභා මහත්මිය** - සහකාර කළමනාකාරිනී - අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ කාර්යාලය, **සචින් වීරසූරිය මහත්මිය** - සහකාර කළමනාකාරිනී - බාහිර සම්බන්ධතා, **ජුලී අලගකොන් මහත්මිය** - රහස්‍ය ලේකම් - බාහිර සම්බන්ධතා, **වයි.ඩී.සඳමාලි මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරිනී, මුදල් හා පරිපාලන, **ප්‍රීනිකා නිලක්ෂ පෙරේරා මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරිනී, මුදල් හා පරිපාලන, **සඳරුවන් විජේරත්න** - ජ්‍යෙෂ්ඨ කාර්යාල කාර්ය සහායක - මුදල් හා පිරිපාලන, **දනූෂි තල්පිට මහත්මිය** - පිළිගැනීමේ නිලධාරිනී සහ දුරකථන ක්‍රියාකාරු - මූල්‍ය හා පරිපාලන, **ජී. ඩී. කපිල කුමාර මහතා** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු - විමර්ශන, **බිෂ්මා එලියාදුර මෙනවිය** - විමර්ශන, **ලක්ෂ්මි අතපත්තු මහත්මිය** - රහස්‍ය ලේකම් - විමර්ශන අංශය, **උදානි වික්‍රමරත්න මහත්මිය** - සහකාර කළමනාකාරිනී - නීති හා බලාත්මක කිරීමේ කටයුතු, **කුමාරි සිරිවර්ධන මහත්මිය** - රහස්‍ය ලේකම් - නීති හා බලාත්මක කිරීමේ කටයුතු, **නොමානි සෙනෙවිරත්න මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී - සුපරීක්ෂණ, **සුදාරා වීරක්කෝඩි මහත්මිය** - ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරිනී - සුපරීක්ෂණ, **සුරේකා ජයසේකර මහත්මිය** - සහකාර කළමනාකාරිනී

# මෙහෙයුම් සමාලෝචනය

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව කොළඹ කොටස් වෙළඳපොළේ අන්තර් ආන්තික මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම උදෙසා සහ ජාතික හදිසි තත්වයකදී කිසිදු බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රගතිශීලී ජාතික මුලපිරීමක් ආරම්භ කරන ලදී.**

## නියාමනය

හොඳින් ක්‍රියාත්මක වන සුරැකුම්පත් වෙළෙඳපොළක් පවත්වා ගෙනයාම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිසම සිය නියාමන කාර්යභාරය ශක්තිමත් කිරීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද අතර එමගින් ව්‍යාපාරික ප්‍රජාවට අවම පිරිවැයකින් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමටත් ආයෝජකයින්ට ධනය උත්පාදනය කර ගැනීමටත් අවස්ථාව උදාවේ.

## බලපත්‍ර සහ ලියාපදිංචිය

නියාමනය කරන ලද ප්‍රාග්ධන වෙළඳපොළ ක්‍රියාකාරකම්වල නියැලීමට, ආයතන නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමක් ලබා ගත යුතුය. වර්ෂය තුළ අළුත් කරන ලද ආයතන සඳහා ලබා දී ඇති බලපත්‍ර සහ ලියාපදිංචිය පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 01)

ඊට අමතරව මෙම අංශය විසින්, කොටස් තැරැව්කරුවන්ගේ/වෙළඳුන්ගේ හා වෙළඳපළ අතරමැදියන්ගේ, පාරිභෝගිකයන් සමග කටයුතු කරන අයවලුන් හා ප්‍රධාන කළමණාකරන අයවලුන්ගේ යෝග්‍යතා හා උචිතභාවයට අදාලව වන දිවුරුම් ප්‍රකාශ සමාලෝචනය කරන ලදී.

**සංඛ්‍යා සටහන 01: බලපත්‍ර ලබාදීම සහ ලියාපදිංචි කිරීම**

| නියාමනය වන ආයතන වර්ගය | 2020 දෙසැම්බර් 31 වන විට බලපත්‍ර ලබාදී ඇති/ ලියාපදිංචි කර ඇති මුළු ආයතන සංඛ්‍යාව |
|---|---|
| කොටස් හුවමාරු | 01 |
| කොටස් තැරැව්කාර සමාගම්* | 29 |
| කොටස් වෙළෙඳ සමාගම් | 11 |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 16 |
| ඒකක භාර අරමුදල් | 75 |
| ආයෝජන කළමනාකරුවන් | 24 |
| ආන්තික ණය සැපයුම්කරුවන් | 24 |
| කොටස් ප්‍රාරක්ෂකයන් | 07 |
| ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන | 02 |
| නිශ්කාශණ ආයතන | 01 |

*කොටස් තැරැව්කාර සමාගම් තුනක් සිය ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡාවෙන් අක්‍රිය කර ඇත.

## ප්‍රතිපත්තිමය මුලපිරීම්

එහි විෂය පථය තුළ ඇති සියලුම නියාමකයින් නියාමනය කිරීම සඳහා සඳහා පවත්නා නීති රාමුව - වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්ති පියවර ගනියි.

### 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම.

2017 වසරේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය පනතේ ප්‍රතිපාදන සම්බන්ධව විවිධ පාර්ශව කරුවන් විසින් අදහස් පළකිරීම හේතු කොටගෙන, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචන ක්‍රියාවලියක් ආරම්භ කරන ලද අතර එහිදී සංශෝධනයට ලක් කළ යුතු ප්‍රතිපාදන කීපයක් හඳුනාගනු ලිබීය. එම සංශෝධන එවකට සිටි කැබිනට් මණ්ඩලය විසින් 2019 වසරේ අප්‍රේල් මාසයේදී අනුමත කරනු ලැබූ අතර, ඒවා අන්තර්ගත කිරීම සඳහා, පනත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යවන ලදී.

2020 වසරේ ජනවාරි මස අග භාගයේදී නව කොමිසම පත්වීමෙන් පසු, පනත් කෙටුම්පතේ අන්තර්ගත ප්‍රතිපාදන වඩාත් අවධානයෙන් නැවත සමාලෝචනය කිරීමට පියවර ගත් අතර, පනතෙහි කාර්යක්ෂම බව තහවුරු කිරීම උදෙසා වැඩිදුර සංශෝධන සිදුකරන ලදී.

ඉන් පසු පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 14 වන දින, කැබිනට් මණ්ඩලය හමුවේ ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාත්‍යංශය වෙත භාරදෙනු ලැබීය.

අනතුරුව පනත් කෙටුම්පත, ගරු අග්‍රාමාත්‍ය වරයා විසින්, මුදල් අමාත්‍ය වරයා ලෙස තමාට පැවරී ඇති බලතල යටතේ, 2020 වසරේ ඔක්තෝම්බර් මස 26 වන දින පැවති කැබිනට් රැස්වීමේදී කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ අතර එහිදී ඒ සඳහා අනුමැතිය ලැබිනි. ඉන්පසුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් යෝජනා කර ඇති සංශෝධන අන්තර්ගත කරමින්, පවතින ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත වෙනුවට නව පනතක් හඳුන්වාදීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වරයාට නියම කිරීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය පළ කළහ.



**අයන්ති අභයවික්‍රම මහත්මිය**
**අධ්‍යක්ෂ, නීති සහ බලාත්මක කටයුතු**



**ෂර්මිලා පණ්ඩිතරත්න මෙනවිය**
**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, නීති සහ බලාත්මක කටයුතු**

## කොළඹ කොටස් වෙළෙඳපොළ අසාමූහිකරණය කිරීම

යෝජිත අසාමූහිකරණය කරන ලද කොළඹ කොටස් වෙළෙඳපොළෙහි කොටස් බෙදීයාමේ අනුපාතනය සම්බන්ධව කොළඹ කොටස් වෙළෙඳපොළ සහ කොටස් තැරැව්කාර සමාගම් සමග පැවති රැස්වීම් මාලාවකට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහභාගී වූ අතර 70:30 අනුපාතයට මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධන අරමුදල හා කොටස් තැරැව්කාර සමාගම් සමග එකඟතාවයකට එළඹෙන ලදී.

එම යෝජිත සංශෝධනයන් සඳහා කැබිනට් මණ්ඩලය හමුවේ ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

## යෝග්‍යතාවය හා උචිතභාවය පිළබඳ මාර්ගොපදේශ

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමිත කාර්යයන් සඳහා මූල්‍ය සේවා සැපයීමේදී සේවාදායකයින් සමග කටයුතු කරන පුද්ගලයින් සහ මූලික කළමණාකාරක අයවලුන් ගේ යෝග්‍යතාවය හා උචිතභාවයට අදාලව රීති හා නියාමන ප්‍රමිතීන් කෙටුම්පත් නීති සහ බලාත්මක කිරීම් අංශය විසින් සකස් කරනු ලැබුවේය.

## කොළඹ කොටස් වෙළෙඳපොළේ මූලික කාර්යයන් ඩිජිටල්කරණය කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව කොළඹ කොටස් වෙළඳපොළේ අන්තර් ආන්තික මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම උදෙසා සහ ජාතික හදිසි තත්වයකදී කිසිදු බාධාවකින් තොරව මෙහෙයුම් පවත්වාගෙන යාමට ඉඩ සැලැස්වීම සඳහා ප්‍රගතිශීලී ජාතික මුලපිරීමක් ආරම්භ කරන ලදී. මෙම මුලපිරීම, පොදු සේවා සපයන ආයතන වල සියළු මූලික ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීමේ රජයේ මුලපිරීම හා අනුකූල වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම (CDS) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකගතාවය, මගපෙන්වීම හා නියාමනය ඇතිව, අනාගතයේ CDS ගිණුම් හිමියන් වීමට බලාපොරොත්තු වන අයට, කොටස් තැරැව්කරුවකුගේ ශාඛා කාර්යාලයකට යාමට හෝ භෞතිකව අයදුම්පත්‍රයක් පිරවීමට නොමැතිව ඩිජිටල් ලෙස කී ගිණුම් විවෘත කිරීම සඳහා වේදිකාවක් හඳුන්වාදෙන ලදී.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ සහ මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගම යන ආයතන විසින් සහ ඒවා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම.

ජාතික හැදුනුම්පත් නිකුත් කරනු ලැබ ඇති සහ ඩිජිටල් ලෙස CDS ගිණුම් විවෘත කිරීමේ පහසුකම හරහා කී ගිණුම් විවෘත කිරීමට බලාපොරොත්තු වන අයගේ තොරතුරුවල අව්‍යාජභාවය තහවුරු කරගැනීමේ කාර්‍යය සදහා කොළඹ කොටස් වෙළෙඳපොළ සහ එහි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගමට, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන "තොරතුරු පද්ධතිය" හරහා ලබාදී ඇති තොරතුරු ලබාගැනීමේ හැකියාව ඇති කිරීමේ අදහස ඇතිව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් තුමා සහ කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් කරගත් අවබෝධතා ගිවිසුමකට එළඹිණි.

මෙම අවබෝධතා ගිවිසුමේ අරමුණ වූයේ කොළඹ කොටස් වෙළෙඳපොළේ සහ මධ්‍යම තැන්පතු ක්‍රමය පුද්ගලික සමාගමේ නම් කරන ලද නිලධාරීන් හට, ඩිජිටල් ලෙස කී ගිණුම් විවෘත කිරීමේ පහසුකම හරහා කී ගිණුම් විවෘත කිරීමට බලාපොරොත්තු වන යම් අයෙකුගේ ජාතික හැදුනුම්පතෙහි විස්තර වල අව්‍යාජභාවය තහවුරු කරගැනීම සදහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අවසරලත් පරිගණක පර්යන්ත, පවතින දත්ත, ලිපිලේඛන, රූප, දෘඩාංග හා මෘදුකාංග භාවිතා කරමින් ඕනෑම අයෙකුගේ ජාතික හැදුනුම්පතට අදාලව ලබාදී ඇති ලිපිලේඛන වල දත්ත හා රූප පරීක්ෂා කිරීමට හැකියාව ලබාදීමයි.

## වෙනත් මුලපිරීම්

## ගිවිසුම් පිළබද සාකච්ඡා

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ බාහිර සේවා සපයන්නන් විසින් සහ ඒවා අතර එළඹීමට නියමිත ගිවිසුම්/එකගතා කිහිපයක් නීති හා බලාත්මක කිරීමේ අංශය විසින් විශ්ලේෂනය කරන ලදී.

ඊට අමතරව නීති හා බලාත්මක කිරීමේ අංශය විසින් "භාරදීමට සාපේක්ෂව ගෙවීමේ" (Delivery vs Payment) රාමුව ක්‍රියාත්මක කිරීමට මාර්ගෝපදේශ සැපයීම සදහා වන ප්‍රවීනතාවය සම්බන්ධව වන ලෝක බැංකු ගිවිසුම විශ්ලේෂණය කර

# මෙහෙයුම් සමාලෝචනය

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 83ක ට ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර නම් වෙනස් කිරීම් 57ක් වාර්තාගත කරනු ලැබ ඇත.**

නිරීක්ෂණ ලබාදීම සහ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියෙහි (Financial Sector Modernization Project) කොටසක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශවයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ප්‍රතිපත්ති රාමුවක් නිර්දේශ කරන ලදී.

### යෝජිත අපරාධ ආදායම් පනතට අදාලව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියෝජන

"ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා" ආයතනය විසින් සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදුකරන ලද "යෝජිත අපරාධ ආදායම් පනත" සම්බන්ධව පැනල් සාමාජිකයෙක් ලෙස නියෝජනය කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආරධනා කර තිබුනි.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින්, බලපත්‍ර/ලියාපදිංචිය වලංගු කාලය තුළ නියාමිතයන් වෙත නිකුත් කරන විරෝධයක් නොමැති බවට වන ලිපි

බලපත්‍ර/ලියාපදිංචිය වලංගු කාලය තුළ නියාමිත ආයතන වල අත්‍යාවශ්‍ය විදේශ සේවකයන් සහ අධ්‍යක්ෂ වරුන් හට නේවාසික වීසා ප්‍රධානය කිරීම සඳහා විරෝධතාවයක් නොමැති බවට ලිපි ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මුදල් අමාත්‍යංශය වෙත යොමුකරනු ලබයි.

ශ්‍රී ලාංකීය ප්‍රාග්ධන වෙළෙඳපොළේ සංවර්ධනය සඳහා සේවාවන් සැපයීමට විදේශීය සහභාගීවන්නන්ට පහසුකම් සැලසීමේ කොටස්ක් වශයෙන් නියාමිත් ආයතන වෙත බලපත්‍ර හා ලියාපදිංචි කිරීම් ලබාදීමෙන් පසු ඒවායේ වලංගු කාලසීමාව දක්වා, ඒවා නියාමිත වීමට හේතුවන කාර්‍යයන් සිදුකිරීමට වැදගත් වනු ඇතැයි සැලකෙන විදේශීය අයවලුන් වෙනුවෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මුදල් අමාත්‍යංශය වෙත විරෝධතාවයක් නොමැති බවට ලිපි යොමුකරනු ලබයි.

### බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තොරතුරු ඉල්ලා සිටීම

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් ලෙස හෝ විධායක කාර්‍යන් සිදුකරනු ලබන නිධාරීන් ලෙස පත් කිරීමට යෝජිත හෝ දැනටමත් පත් කර ඇති අය සම්බන්ධව පසුබිම් පරීක්ෂනය දීර්ඝ කිරීමේ වැදගත්කම සලකා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් යථායෝගී ක්‍රියාවලියට පහසුකම් සලසන ලදී. (විධායක කාර්‍යන් සිදුකරන නිලධාරීන් හා අධ්‍යක්ෂ වරුන්ගේ යෝග්‍යතාවය හා නිසිබව තක්සේරු කිරීම - 2011 අංක 3 දරන නියමය) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව එවැනි අයවලුන් එලෙස බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල අධ්‍යක්ෂවරුන් ලෙස පත්වීම වලක්වා ගැනීමට ඉඩසලස්වන බැවින් සිය නියාමන රාමුව අනුව යම් නිරීක්ෂන/අනිසි බවට සොයාගැනීම් ඇත්නම් දැනුම්දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත.

## අනුමැතිය ලබාදීම

### ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය (පුද්ගලික) සමාග මෙහි නිර්දේශ මත, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම් කොටස් වල ආයෝජනය කිරීමට අනුමැතිය ප්‍රධානය කරනු ලබයි. මෙම අනුමැතියන් ප්‍රධානය කරනු ලබන්නේ විණිමය පාලන රෙගුලාසි, 2006 අංක 05 දරණ මුදල් විශුද්ධීකරණය වැලැක්වීමේ පනත 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත සහ සුරැකුම්පත් වලට අදෙල ශ්‍රී ලංකාවේ නීති වලට අනුකූල වීමට යටත්වයි.

2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෝලීය, කලාපීය සහ දේශීය අරමුදල් 83ක ට ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර නම් වෙනස් කිරීම් 57ක් වාර්තාගත කරනු ලැබ ඇත.

### කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති සහ කොටස් තැරැව්කරුවන් පිළබඳ රීති සමාලෝචනය කිරීම

සලකා බලන වර්ෂය තුලදී පහත ලැයිස්තගත කිරීමේ රීති සමාලෝචනය කරනු ලැබූ අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 24 වන වගන්තිය යටතේ ඒවාට අනුමැතිය ලබා දී ඇත.

- දෙවන පුවරුවේ සිටින සහ අවම මහජන කොටස් හිමිකාරිත්වයට අදාල අවශ්‍යතාවයට අනුකූල නොවන සමාගම් සම්බන්ධව නිවර්තකයක් ලෙස සාමාන්‍ය වාර්ෂික ලැයිස්තුගත කිරීමේ ගාස්තුව මෙන් දෙගුණයක් අයකර ගැනීමට ඉඩ සැලැස්වීම උදෙසා, කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කිරීමේ රීති වල 12 වන රීතියට කොළඹ කොටස් වෙළඳපොළ විසින් යෝජනා කරන ලද සංශෝධන.

- අවම මහජන කොටස් හිමිකාරිත්වයට අදාල අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා කාලය දීර්ඝ කරගැනීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති ඉල්ලීම්, එක් එක් ලැයිස්තුගත සමාග මට අදාලව ඒ ඒ අවස්ථා මත පදනම්ව සලකා බලා ඒ වෙනුවට අත්හැරීමක් ලෙස සාධාරණ පදනමකින් සහනයක් ලබාදෙන මෙන් කොමිසම විසින් කොළඹ කොටස් වෙළෙඳපොළට උපදෙස් දෙන ලදී.
- එක් එක් අවස්ථා මත පදනම්ව සලකා බලා, ලැයිස්තුගත කිරීමේ රීති වල 5 වන රීතිය ප්‍රකාරව වැඩිදුර කොටස් නිකුතුවන් සම්බන්ධව ලැයිස්තුගත සමාගම් විසින් මුහුණ දෙනු ලබන අභියෝග හඳුනාගන්නා ලෙස කොමිසම විසින් කොළඹ කොටස් වෙළෙඳපොළට උපදෙස් දෙන ලදී.

### ලැයිස්තුගත ලේඛනයෙන් ඉවත් කිරීම්

- සලකා බලන කාලය තුළදී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 4(2) සහ 4(3) රීතින් අනුව ද ෆිනෑන්ස් කම්පැනි පී.එල්.සී., කොළඹ කොටස් වෙළෙඳපොලේ නිල ලයිස්තුවෙන් අනිවාර්ය ඉවත් කිරීමට ලක් කෙරිණි.
- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතීන්හි 5 වන රීතිය ප්‍රකාරව තම කොටස් කොළඹ කොටස් වෙළෙඳපොලේ නිල ලයිස්තුවෙන් ස්වේච්ඡාවෙන් ඉවත් කරගැනීමට මොරිසන් පී.එල්.සී සහ හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) පී.එල්.සී වෙත අනුමැතිය ලබාදෙන ලදී.

### කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සමාගම් ලැයිස්තුගත කිරීමේ රීති වල 5.4 (ආ) රීතිය යටතේ ලබාදෙන නිදහස් කිරීම්

කොටස් නිකුතුවක් සිදුකළ වහාම එම නිකුත් කළ කොටස් වලින් 20%ක් ඉක්මවන සේ පුද්ගලික ස්ථානගත කිරීමක් මගින් කොටස් නිකුත් කිරීමට බලාපොරොත්තු වන ලැයිස්තුගත පොදු සමාගම් වලට නිදහස් කිරීම් ප්‍රධානය කිරීමට අදාළ අයදුම්පත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කාමිෂන් සභාව විසින් සළකා බලනු ලබයි. සළකා බලන වර්ෂය තුළ එක සමාගමක් සඳහා කොළම කොටස් වෙළෙඳපොළෙහි සමාගම් ලැයිස්තුගත කිරීමේ රීතිවල 5.4 (ආ) රීතිය යටතේ නිදහස් කිරීම් ලබා දෙන ලදි.

### සමාගම් පවරා ගැනීම් හා ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

තක්සේරු කිරීමේ ක්‍රමවේදයන්හී සාධාරණ සහ අදාළ පොදුවේ පිළිගත් පරිචයන් සඳහා අනුගත වී ඇත්දැයි හඳුනාගැනීම සඳහා, මෙම ඒකාබද්ධ කිරීම් පරිපාලනය කිරීමට පෙර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ස්වාධීන උපදේශකයන් විසින් පිළියෙළ කරන ලද වාර්තාවෙහි අන්තර්ගතය සහ ඒ සඳහා පදනම් කරගත් උපකල්පනයන් ඇතුළුව තක්සේරු කිරීමේ ක්‍රමවේදයන් සමාලෝචනය කරන ලදි. එය තුළින් ලැයිස්තුගත සමාගම්වලින් කරන ලද හෙළිදරව් කිරීම් වල පැහැදිළි බව වැඩි කිරීම බලාපොරොත්තු වේ. (සංඛ්‍යා සටහන 02)

2020 වසරේ දෙසැම්බර් 31 දින වන විට පහත පවරාගැනීමේ අර්පණ ක්‍රියාත්මක වීම ආරම්භ වී තිබිනි.

**සංඛ්‍යා සටහන 02 : සමාගම් අත්පත් කරගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ/සංග්‍රහය යටතේ සිදු කළ අර්පන**

| අර්පණකරු | අර්පණලාභියා | අර්පණයේ ස්වභාවය | පවතින තත්වය |
|---|---|---|---|
| ඊඩන් ලංකා හොටෙල් පී.එල්.සී | සෙරන්ඩිබ් හොටෙල්ස් පී.එල්.සී | අනිවාර්ය අර්පණයක් | අවසන් වී නැත |
| ජෝජ් ස්ටුවර්ට් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | එච්.වී.ඒ. ෆුඩ්ස් පී. එල්. සී. | ස්වේච්ඡාමය අර්පණයක් | අවසන් වී නැත |
| ලංකා රියැල්ටි ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී | ඔනලි හෝල්ඩිංග්ස් පී. එල්. සී. | අනිවාර්ය අර්පණයක් | අවසන් වී නැත |

### අතිවිශේෂ පසු තත්වයන් හේතුවෙන් අවම මහජන කොටස් හිමිකාරිත්වය සමග අනුකූල වීමට සමාගම් සඳහා කාල දිගුවක් ලබාදීම

ලැයිස්තුගත කිරීමේ රීති වල 7.13.3 (සසස) රීතියෙහි දක්වා ඇති පරිදි අතිවිශේෂ පසු තත්වයන් හේතුවෙන් අවම මහජන කොටස් හිමිකාරිත්වය සම්බන්ධ අවශ්‍යතා සමග අනුකූල වීමට විශේෂයෙන් කොවිඩ් 19 ව්‍යසන තත්වය යටතේ අපොහොසත් වීම නිසා ලැයිස්තුගත සමාගම් (11) වලට කාල දිගුවක් ලබාදීමට කොළඹ කොටස් වෙළෙඳපොළට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ එකඟතාව ලබාදෙන ලදී.

### කොළඹ කොටස් වෙළෙඳපොළේ සාංගමික ව්‍යවස්ථාවලියට සංශෝධන හඳුන්වා දීම

ශ්‍රව්‍ය හෝ ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය භාවිත කරමින් රැස්වීම් පැවැත්වීමේ ක්‍රමවේදය ඇතිකිරීමට පහසුකම් සැලැස්වීම සඳහා වන කොළඹ කොටස් වෙළෙඳපොළේ සාංගමික ව්‍යවස්ථාවලියට හඳුන්වා දුන් සංශෝධන සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමැතිය ලබාදෙන ලදී.

ගෝලීය තලයේ අනෙකුත් කොටස හුවමාරු විසින් ව්‍යාපාර මෙහෙයුම් පවත්වාගෙන යන තත්වයට ලඟාවීමට හැකිවන ලෙස තම යටිතල පහසුකම් හා මෙහෙයුම් පුළුල් කිරීමේ අරමුණ ඇතිව, විද්‍යුත් සමුළු මගින් රැස්වීම් පැවැත්වීමට අදාල ක්‍රමවේදය පිළබඳ ප්‍රතිපාදන ඇතුලත් වන 55අ නව වගන්තිය ඇතුළත් කරමින් කොළඹ කොටස් වෙළෙඳපොළේ සාංගමික ව්‍යවස්ථාවලියට සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදෙන ලදී.

මෙම සේවාව මගින්, ව්‍යසනකාරී තත්වයක් වැනි ජාතික/ජාත්‍යන්තර හදිසි තත්වයක් පවතින විටක කොටස් හුවමාරුවේ සුමට ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාමට කටයුතු සැලැස්වීම සහ කොළඹ කොටස් වෙළෙඳපොළ මගින් ලබාදෙන වාණිජ සේවාවන්ගේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම අරමුණු කෙරේ.

### කොටස් තැරැව්කාර සමාගමක ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡාවෙන් අක්‍රිය කිරීම

කොවිඩ් 19 ව්‍යසන තත්වය හේතුවෙන් කොටස් වෙළෙඳපොළට ඇති වී තිබෙන බලපෑම හේතුවෙන් තම ව්‍යාපාර මෙහෙයුම් නැවත සක්‍රිය කිරීමට මාස තුනක (03)

# මෙහෙයුම් සමාලෝචනය

අතිරේක කාල දිගුවක් ලබාදෙන ලදී. ඒ අනුව අදාල සමාගමට තම ව්‍යාපාර මෙහෙයුම් නැවත සක්‍රිය කිරීමට 2021 මැයි 25 වන දින තෙක් කාලය ලබා දෙනු ලැබීය.

### කොටස් තැරැව්කරුවන්ගේ රීති සංශෝධනය කිරීම

තැරැව්කරුවන් සහ සේවාදායකයන් අතර සම්බන්ධතා වල කාර්යක්ෂම භාවය වැඩිදියුණු කිරීම මෙන්ම, තම වත්මන් ආයෝජන උපදේශකවරයා විසින් සිය සේවානියුක්තිය වෙනස් කරනු ලබන අවස්ථාවකදී, ආයෝජන උපදේශකවරයා වෙනස් කිරීම සඳහා පහසුකම් සැලසීම හා වාර්තා පවත්වාගෙන යාම වඩාත් හොදින් කරගෙන යාම සඳහා , කොටස් තැරැ ව්කරුවන්ගේ රීති කිපයක්ම සංශෝධනය කිරීමට කොමිෂන් සභාව විසින් සලකා බලන වර්ෂය තුළදී අනුමැතිය ලබාදෙන ලදී.අනුකූලතා නිලධාරියාගේ භූමිකාව වඩාත් උසස් කිරීමට කොටස් තැරැව්කරුවන්ගේ රීතින්හි 3.9 වන රීතිය සංශෝධනය කරන ලද අතර වඩාත් කාලීන හා කාර්යක්ෂම අයුරකින් කොළඹ කොටස් වෙළෙඳපොළේ පරීක්ෂණ හා විමර්ෂණ කරගෙන යාමට අවශ්‍ය තොරතුරු සැපයීම වැඩිදියුණු කිරීමට 9 වන රීතිය සංශෝධනය කෙරිනි.

### කොළඹ කොටස් වෙළඳපොළේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් තෝරාපත් කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ උපලේඛනයේ ෂ (උ) කොටස සහ කොළඹ කොටස් වෙළඳපොළේ සාංග මික ව්‍යවස්ථාවලියේ 50 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, කොළඹ කොටස් වෙළෙඳපොළේ අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් නැවත තෝරා පත් කිරීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනි මය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

### ශ්‍රී ලංකා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර සඳහා ඒකක භාර සංග්‍රහය [(SL-REITS) – Sri Lanka Real Estate Investment Trusts]

විකල්ප ආයෝජන තෝරාගැනීමක් ලෙස ආයෝජකයින්ට මූලික වශයෙන් ආදායම් උත්පාදනය කෙරෙන දේපළ වෙළෙඳාම් වල ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා දේපළ වෙළඳාම් ආයෝජන භාර (SL-REITS) සම්බන්ධයෙන් ඒකක භාර සංග්‍රහයට අදාලව රීති නිකුත් කරනු ලැබීය. දේපළ සම්බන්ධ අධික මිළ ගණ න් හේතුවෙන් සීමා සහිත වන නමුත් ඒසේ නොවන්නට වර්ධනය වෙමින් පවතින දේපළ වෙළෙඳාම් ක්ෂේත්‍රයේ ප්‍රතිලාභ සඳහා සාමාන්‍ය ජනතාවට ප්‍රවේශයක් ලබා දීමට මෙම නව උපකරණය මගින් ඉඩ සලස්වනු ලැබේ.

ශ්‍රී ලංකා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (SL-REITS) යනු සාමූහික ආයෝජන වාහන ලෙස ක්‍රියා කරනු ලබන ඒකක භාර වල අනු වර්ගයකි. ශ්‍රී ලංකා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර මගින් ආයෝජකයන්ගෙන් මුදල් ඒකරාශී කරනු ලබන අතර නේවාසික හා වාණිජ දේපළ, සිල්ලර හෝ කාර්මික දේපළ, යටිතල පහසුකම් හෝ වෙනත් දේපළ වෙළෙඳාම් හා බැඳුනු වත්කම් අත්කර ගැනීමට එම මුදල් භාවිතා කළ හැකිය. දේපළ වෙළෙඳාම් ආයෝජන භාර වල ආයෝජනය කරන ආයෝජකයින්හට ඒවැනි දේපළ වල ආදායමෙන් සහ වටිනාකම ඉහළයාම්වලින් ප්‍රතිලාභ ලබාගැනීමට හැකියාව ලැබේ.

ආසියානු කලාපය ඇතුළුව බොහෝ රටවල, දේපළ වෙළෙඳාම් ආයෝජන භාර ජනප්‍රිය විකල්ප ආයෝජන තෝරාගැනීමක් වන අතර ඒවා දශක ගණනාවක් තිස්සේ පැවත ඇත. ශ්‍රී ලංකා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර සඳහා පහසුකම් සලසා ඇත්තේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන බලපත්‍රයක් මගින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත දේපළ වෙළෙඳාම් ආයෝජන භාරයක් ලෙස පමණි.

ශ්‍රී ලංකා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර (SL-REITS) සම්බන්ධයෙන් ඒකක භාර සංග්‍රහයට අදාලව මෙම රීති සකස් කර, ඒවා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 53 වන වගන්තිය ප්‍රකාරව රජයේ ගැසට් ප්‍රයේ එල කරනු ලැබීය.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 28 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්

කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත වීමට අපේක්ෂා කරනු ලබන පොදු සමාග මක් ලැයිස්තුගත වන දිනට පෙර වසරක කාලසීමාවක් තුළදී, යම් පුද්ගලයෙකු හට කොටස් විභජනය කර ඇත්නම් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එම සමාග මේ කොටස් හෝ කොටස්වල පරිවර්තනය කළ හැකි සුරැකුම්පත්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කළ නොහැක. අදාළ වසර තුළදී සීමාසහිත ඉවොක් ඉන්ටර්නැෂන් පුද්ගලික සමාගම සහ ක්‍රිස්වර්ල්ඩ් පුද්ගලික සමාගම විසින් යොමු කරන ලද අයදුම්පත් අනුමත කරන ලදි.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනැමැතීන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරැකුම් පත් නිකුත් කිරීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් ආයතන වලට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි. (සංඛ්‍යා සටහන 03)

**සංඛ්‍යා සටහන 03 : ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29(අ) වගන්තිය යටතේ පිරිනමනු ලැබූ අනුමැතීන්**

| නිකුත් කරන්නාගේ නම | නිකුත්වේ ස්වභාවය | අනුමත කරන ලද මුදල | කාල සීමාව |
|---|---|---|---|
| පෑන් ඒෂියා බැංකුව | බාසල් III අනුකූල, ස්ථර 2, ලැයිස්තුගත නොකළ, වගකීම් රහිත, නිදහස්කළ හැකි, ශක්‍ය නොවන විට කපා හළ හැකි ලක්ෂණ සහිත ණයකර | රුපියල් මිලියන 1,250 | අවුරුදු 5 |
| ලංකා බැංකුව | බාසල් III අනුකූල, ලැයිස්තුගත නොකළ, වගකීම් රහිත. අප්‍රධාන, සදාකාලික, අමතර ප්‍රාග්ධන ස්ථර 1 බැඳුම්කර | රුපියල් බිලියන 5 | අවුරුදු 5 |
| ඩී එෆ් සී සී බැංකුව | ප්‍රධාන ලැයිස්තුගත නොකළ, ශ්‍රේණිගත කළ වගකීම් රහිත නිදහස් කළ හැකි ණයකර | රුපියල් බිලියන 5 | අවුරුදු 5 |
| අමානා ටකාෆුල් පී එල් සී | ශ්‍රේණිගත නොකළ. ලයිස්තුගත නොකළ, වගකීම් රහිත, පරිවර්තනය කළ හැකි, නිදහස් කළ හැකි ණයකර | රුපියල් මිලියන 300 | අවුරුදු 5 |
| ජනශක්ති පී එල් සී | ප්‍රදාන, ලැයිස්තුගත නොකළ, වගකීම් රහිත, නිදහස් කළ හැකි ණයකර | රුපියල් බිලියන 2 | අවුරුදු 3 |
| ලංකා බැංකුව | බාසල් III අනුකූල, ශ්‍රේණිගත නොකළ, වගකීම් රහිත, අප්‍රධාන, සදාකාලික, අමතර ප්‍රාග්ධන ස්ථර 1 බැඳුම්කර | රුපියල් බිලියන 10 | අවුරුදු 5 |
| ජනශක්ති පී එල් සී | ප්‍රධාන, ලැයිස්තුගත නොකළ, වගකීම් රහිත, නිදහස් කළ හැකි ණයකර | රුපියල් බිලියන 1 | ඒ වර්ගය අවුරුදු 2<br>බී වර්ගය අවුරුදු 3<br>(සමාගමේ ආශ්‍රිත සමාගමක් 2020 දෙසැම්බර් 04 වන දින සිට නිර්ලැයිස්තුගත වීම හේතුවෙන් (විසින්) ඔවුන් විසින් මෙම අයදුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදි) |

# මෙහෙයුම් සමාලෝචනය

### කොළඹ කොටස් වෙළෙඳපොළේ බලාත්මක රීති සඳහා තාවකාලිකව කල් තබා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළේ බලාත්මක රීති සම්බන්ධව තාවකාලිකව කල් තබා ගැනීම උදෙසා වන එක් අයදුම්පතක් සමාලෝචනය කරන ලදි. මෙම තාවකාලික කල් තබා දීම මල්ටි ෆිනෑන්ස් පි එල් සී ආයතනය වෙත කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති 7.5 (සී) (ii) අනුව ලබා දෙන ලදි.

### වෙළෙඳ භූමියෙන් බැහැර සිදුවන කොටස් ගණුදෙනු

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (1) වගන්තිය ප්‍රකාරව "බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත කර ඇති පොදු සමාගමක කොටස් දරන කිසියම් තැනැත්තෙකු විසින් බලපත්‍ර ලාභී කොටස් වෙළෙඳපොළක් විසින් යොදා ගනු ලබන කාර්ය පටිපාටිය ට අනුකූල නොවන ලෙස එකී කොටස් මිලදී ගැනීම, විකිණීම හෝ ගණුදෙනු කිරීමේ කාර්යයන් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව නොකළ යුතුය.

මෙහෙයුම් වර්ෂය තුළදී, විශේෂිත පැවරීම් 590ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර කොටස් ත්‍යාග කිරීම් 85 කොමිෂන් සභාවේ අවධානය පිනිස යොමුකරන ලදි. ආන්තික ගණුදෙනු, තනි පුද්ගල ගිණුම් හවුල් ගිණුම් බවට හැරවීම්, හවුල් ගිණුම් වෙනත් හවුල් ගිණුම් බවට හැරවීම්, හවුල් ගිණුම් තනි පුද්ගල ගිණුම් බවට හැරවීම්, මූල්‍ය පහසුකම් ලබා ගැනීම්, විශේෂිත ත්‍යාග පැවරීම්, භාරකාරීත්වය වෙනස් කිරීම්, ස්වේච්ඡා අර්පණ.අනිවාර්ය අර්පණ, බැංකුවේ භාරයේ තැබීම්, තැරැව්කරුගේ භාරයේ තැබීම්, රක්ෂණ ව්‍යාපාරවලට අදාළ නියෝග වලට අනුකූලවීම්, පුද්ගලයෙකුගෙන් විදේශ රටක භාරකරුවෙකු වෙත වත්කම් පැවරීම සහ ගිණුම් දෙකක් අතර හුවමාරු කිරීම් ආදිය සඳහා විශේෂිත පැවරීම් සිදු කෙරිණි.

### අත්හැරීම් සහ ප්‍රතිව්‍යුහගත කිරීම් සම්බන්ධ කරුණු

#### ඉවෝක් ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම

මූලික ලැයිස්තුගත කිරීමේ අයදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස 18 කට වඩා අඩු කාලයක් එම කොටස් දරා සිටි කොටස් හිමියන්ගේ කොටස් (මූලික කොටස් නිකුතුවක්) බෙදා හැරීම පහසු කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ නීති සීමාකිරීම් සම්බන්ධයෙන් ඉවෝක් ඉන්ටර්නැෂනල්



ආචාර්ය හර්ෂන සූරියප්පෙරුම
අධ්‍යක්ෂ, සාංගමික කටයුතු



මනූරි වීරසිංහ මෙනවිය
සහකාර අධ්‍යක්ෂ, සාංගමික කටයුතු

(පුද්ගලික) සමාගම නිදහස් කිරීමට අවසර ලබාදීම සඳහා කොළඹ කොටස් හුවමාරුව යෝජනා කර තිබේ. විස්තර ඇගයීමෙන් පසුව, සුරැකුම්පත් සහ විනිමය කොමිසම ඒ සඳහා පහසුකම් සැළසීය.

#### LOLC සමූහය

විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම ඇතුළු ආයතනික අරමුණු සපුරාලීම සඳහා බධබක හෝල්ඩින්ග්ස් පීඑල්සී විසින් ප්‍රතිව්‍යුහගත කිරීමේ අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී. විස්තර ඇගයීමෙන් පසුව, සුරැකුම්පත් සහ විනිමය කොමිසම ඒ සඳහා පහසුකම් සැළසීය.

#### ලංකා විදුලි බල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය (කැ/) ලැයිස්තුගත කිරීමේ අයදුම්පතට අදාළව, සංස්ථා ප්‍රකාශයෙහි ඇතුළත් කළ යුතු ලැයිස්තුගත කිරීමේ අයදුම්පත ඉදිරිපත් කළ දින සිට මාස 12 කට නොඅඩු දිනයක් දක්වා සකස් කළ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, මාස 3 කට නොවැඩි දිනයක් දක්වා සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන, සාරාංශගත ලාභ හා අලාභ ගිණුම සහ ශේෂ පත්‍රය ලැයිස්තුගත කිරීමේ නීතිවලින් අත්හැරීම පිළිබඳව කොළඹ කොටස් හුවමාරුව සොයා බලන ලදී.

තවද, වැටුප් කමිටුව සහ විගණන කමිටුව සම්බන්ධව සාංගමික පාලන අවශ්‍යතා ලිහිල් කිරීම සම්බන්ධයෙන් කොළඹ කොටස් හුවමාරුව විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් අදහස් විමසා සිටියේය. විස්තර ඇගයීමෙන් පසු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒ සඳහා පහසුකම් සැළසීය.

### අධීක්ෂණය සහ අනුකූල වීම

ආයෝජකයින්ට කාලීන , නිවැරදි හා අදාළ තොරතුරු ලබා දීමෙන් සාධාරණ, විධිමත්, කාර්‍යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් වෙළෙඳපොළක් ක්‍රියාත්මක කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිසම සහාය වේ. තොරතුරු අසමාන බව අඩු කිරීම සඳහා, ලැයිස්තුගත සමාගම් වෙළෙඳපොළට බෙදා හරිනු ලබන තොරතුරු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරයි. වෙළෙඳපොළ අතරමැදියන්ගේ අධීක්ෂණයෙන් අපේක්ෂා කරනුයේ බංකොලොත් භාවයෙන් ගනුදෙනුකරුවන්ගේ වත්කම් ආරක්ෂා කිරීම, පැහැර හැරීම් වලින් සහ වෙළෙඳපොළේ ඇති විය හැකි හදිසි බාධා වලින් ආරක්ෂා වීම සහ නියාමනය වන්නාවූ ආයතන තම සේවාදායකයින් සමඟ කටයුතු කිරීමේදී සාධාරණ හා කාර්යක්ෂමතාවය සහතික කිරීමයි. නියාමනය මඟින් බලපත්‍ර ප්‍රමිති, විචක්ෂණශීලී ප්‍රමිතීන්, ව්‍යාපාරික හැසිරීම් නීති සහ අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ප්‍රමිති නියම කිරීම් සිදු කරනු ලබයි.

### ලැයිස්තුගත සමාගම්

මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5ක් ඇතුළත සියළුම ලැයිස්තුගත සමාගම් විසින් ඒවායේ වාර්ෂික වාර්තා කොටස් හිමියන්ට සහ කොළඹ කොටස් වෙළෙඳපොළට ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් වල වාර්ෂික වාර්තා විමර්ශනය කරනු ලබන අතර, අදාළ නීති රීති වලට අනුගත නොවීම් පිළිබඳ තොරතුරු සමාගම්වලට දැනුම් දෙනු ලැබේ. මෙම කාර්යභාරය සඳහා අදාළ ලැයිස්තුගත සමාගම් වලින් ඉතා යහපත් ප්‍රතිචාර ලැබී ඇත.

මෙම කාර්යයේ අරමුණ වන්නේ ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය වාර්තාකරනයේ සහ තොරතුරු ප්‍රකාශයට කිරීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය

**සමාගම්වල සාපේක්ෂ අවදානම් තත්ත්වයන් මැන බැලෙන අවදානම් තක්සේරුකරණ රාමුවක් මත කොටස් තැරැව්කාර සමාගම් අධීක්ෂණය කිරීමේ ප්‍රවේශය පදනම් වී ඇති අතර එමගින් එක් එක් කොටස් තැරැව්කාර සමාග මකට අදාළ අවදානම් සිදුවීමේ බලපෑම සහ සම්භාවිතාව යන දෙකම සැළකිල්ලට ගනී.**

වර්ධනය කිරීම වේ.
සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විනිවිදභාවය සහ වගකිවයුතුභාවය ස්ථාපිත කිරීමත්, වෘත්තිය ප්‍රමිතීන් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සඳහා ලැයිස්තුගත සමාගම් විසින් ප්‍රමාණාත්මක තොරතුරු කඩිනමින් නිකුත් කිරීම අවශ්‍ය වේ.

වාර්ෂික වාර්තා විමර්ශනය කිරීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත කරුනු පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

- කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත රීතීන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ සමාගම් පනතෙහි අදාළ විධිවිධාන
- සාගමික පාලනය සම්බන්ධ භාවිතයන්
- මුල්‍යමය අවධාරණයන්
- සභාපතිතුමාගේ වාර්තාව
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව
- ස්වාධීන විගණන්යේ වාර්තාව
- කොටස් හිමියන් සහ ආයෝජකයන් පිළිබඳ තොරතුරු
- මූල්‍ය දත්ත
- අධ්‍යක්ෂවරුනගේ උප කමිටු වල වාර්තා

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත රීතීන් සහ අදාළ විධිවිධාන වලට අනුකූලව වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ ඉදිරිපත් කිරීමට පැවරී ඇති වගකීම පිළිබඳව සමාගම්වල දැනුවත්භාවය වර්ධනය කිරීමට දායකවීමේ අරමුණින් මෙම ක්‍රියාවලිය පවත්වාගෙන යනු ලැබේ.

මෙහෙයුම් වර්ෂය තුළදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මූල්‍ය වාර්තා 108ක් විමර්ශනය කර ඇති අතර එකී සමාගම්හී අදාළ නීතිරීති සහ විධිවිධානවලට අනුකූල වීම වර්ධනවය කිරීම සහ හෙළිදරව් කිරීම් දියුණු කිරීම උදෙසා අවශ්‍ය උපදෙස් සහිත ලිපි 81ක් නිකුත් කර ඇත.

මෙයට අමතරව, මෙහෙයුම් වර්ෂය තුළදී ණය නිකුතු සංස්ථා ප්‍රකාශන 07ක් සහ හිමිකම් නිකුතු සංස්ථා ප්‍රාකාශන 1ක් විමර්ශනය කර ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සමාගම් 12ක් දැනට සිටින කොටස් හිමියන්ගෙන් අතිරේක අරමුදල් රැස්කිරීමේදී නිකුත් කරන ලද කොටස් හිමි ව්‍යවස්ථා ප්‍රකාශන විමර්ශනය කර ඇති අතර ඒවායේ හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම සඳහා අදාළ ප්‍රතිපෝෂණයන් සපයා ඇත.

වාර්ෂික වාර්තා විමර්ශනය තුළින් වැඩිදුර කරුනු විමසීමට අදාළ වන ආමාන්‍ය ගණුදෙනු සහ අනුගත නොවීම් 14ක් හඳුනාගන්නා ලදි.

ලැයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම් සහ ආයතනික කටයුතු සම්බන්ධයෙන් ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග පහත දක්වේ. (සංඛ්‍යා සටහන 04)

**සංඛ්‍යා සටහන 04 : ලැයිස්තුගත සමාගම් වල නිවේදන සහ සාංගමික කටයුතු සම්බන්ධව ගත් නියාමන ක්‍රියාමාර්ග**

| නිවේදන/සාංගමික කටයුතු | අවස්ථා ගණන/ ලැයිස්තුගත සමාගම් ගණන |
|---|---|
| පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන ලෙස කරන ලද දැනුම් දීම<br>(ලැයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම්වල වලංගුභවාය තහවුරු කිරීම පිණිස) | 103 |

මෙහෙයුම් වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගම් විසින් සිදු කළ වෙළෙඳපොළ දැනුම්දීම් විමර්ශනයට ලක් කොට, අවස්ථා 103ක් සඳහා ලැයිස්තුගත සමාග මෙන් හෝ කොළඹ කොටස් වෙළෙඳපොළෙන් පැහැදිළි කිරීම් කැඳවන ලදි. එම පැහැදිළි කිරීම් දෙවන සමාගම් ලැයිස්තුවේ (Second Board) තිබියදී අධ්‍යක්ෂවරුන් කරන ලද ගණුදෙනු (02), අධ්‍යක්ෂවරුන් කරන ලද ගණුදෙනු ප්‍රමාද වී හෙළිදරව් කිරීම (35), අවසර ලබා නොදුන් (ඊකදජන දමළු වැරසදා) කාලසීමාවේ අධ්‍යක්ෂවරුන් කරන ලද ගණුදෙනු (බ.සෑ. 8.6) (14), අධ්‍යක්ෂක ධූරයන්ගේ වෙනස්කම් (41), සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනු (03), සහ අනෙකුත් සාංගමික හෙළිදරව් කිරීම් (08).

### අනෙකුත් නියාමන ආයතන වෙතයොමුකරන ලද කාරණා

පහත සඳහන් කාරණා ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය (SLASMB) වෙත හඳුනාගැනීම, මිනුම් හා හෙළිදරව් කිරීම් වලට අදාළ ප්‍රමිතීන්ට අනුකූලද යන්න පිළිබඳ පැහැදිළි කිරීම් ලබාගැනීම පිණිස යොමුකරන ලදි. (සංඛ්‍යා සටහන 05)

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 05 : අනෙකුත් නියාමන ආයතන වෙත යොමු කරන ලද කාරණා

| නියාමන ආයතන | ඉදිරිපත් කරන ලද කාරණා සංඛ්‍යාව | කාරනාව සම්බන්ධ විස්තරය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය (SLAASMB) | 03 | **හැටන් නැෂනල් බැංකුව:** විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හී ඇතුළත් ලියාපදිංචි නොකරන ලද කොටස් නිසා අදාළ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට වන බලපෑම සමාලෝචනය කිරීම |
| | | **මහවැලි කොකනට් ප්ලාන්ටේෂන් ලිමිටඩ්:** විගණකවරුන් ලැයිස්තුගත නොකරන ලද සමාග ම්වලට ප්‍රධාන විගණන කරුණු (Key Audit matters) සම්බන්ධ විස්තර විගණක වාර්තාවේ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේද යන්න පිළිබඳ පැහැදිළි කිරීම් ලබා ගැනීම |
| | | **රක්ෂණ සමාගම්:** LKAS 07 මුදල් ප්‍රවාහ ප්‍රකාශ ප්‍රමිතිය අරමුණු කරගෙන රක්ෂණ ආයතනයක් මූල්‍ය සමාගමක් ලෙස සැළකිය හැකිද යන්න පිළිබඳව පැහැදිළි කිරීම් ලබා ගැනීම සහ එසේ මූල්‍ය ආයතනයක් ලෙස නොසළකන අවස්ථාවකදී ආයෝජන සම්බන්ධ මූල්‍ය ප්‍රවාහ ශුද්ධ කිරීම සඳහා ඉඩදෙනවාද සහ ශුද්ධ අගයන් වාර්තා කිරීමට ඉඩ දෙන වාද යන්න පිළිබඳ පැහැදිළි කිරීම් ලබා ගැනීම |

## බලපත්‍රලාභී /ලියාපදිංචි ආයතන සුපරීක්ෂණය

### කොටස් තැරැව්කාර සමාගම්

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ (සංශෝධිත) දක්වා ඇති පරිදි සහ එහි නීති රීති යටතේ දක්වා ඇති පරිදි, කොටස් තැරැව්කාර සමාග ම්වලට බලපත්‍ර ලබා දීම සහ අධීක්ෂණය කිරීමේ කාර්යය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පැවරී ඇත. අධීක්ෂණයේ මූලික පරමාර්ථය වන්නේ කොටස් තැරැව්කාර සමාගම්වල මූල්‍ය ස්ථායිතාව සහ මෙහෙයුම් ශක්‍යතාව සහතික කිරීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ආයෝජකයින්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමයි.

සමාගම්වල සාපේක්ෂ අවදානම් තත්ත්වයන් මැන බැලෙන අවදානම් තක්සේරුකරණ රාමුවක් මත කොටස් තැරැව්කාර සමාගම් අධීක්ෂණය කිරීමේ ප්‍රවේශය පදනම් වී ඇති අතර එමගින් එක් එක් කොටස් තැරැව්කාර සමාගමකට අදාළ අවදානම් සිදුවීමේ බලපෑම සහ සම්භාවිතාව යන දෙකම සැළකිල්ලට ගනී. කොටස් තැරැව්කාර සමාගම්වලට මුහුණදීමට සිදුවන අවදානම විචක්ෂණශීලී, ද්‍රවශීලතා, ප්‍රති පාර්ශ්වික, මූල්‍ය, ණය, මෙහෙයුම්, තත්ත්වය සහ නෛතික අවදානම් ලෙස හඳුනාගත හැකිය.

විතැන් පරීක්ෂාවන්ට අයත් වන්නේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම, ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ, විද්‍යුත් ලිපි ගොනු පවත්වා ගැනීමේ පද්ධතියට වාර්තා ඇතුළත් කිරීම සහ බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් වාර්තාවන්ය. විතැන් පරීක්ෂාවන් සිදුකිරීමේදී කිසියම් අඩුපාඩුවක් හෝ අනුකූල නොවීමක් නිරීක්ෂණය වුවහොත් ඒවා නිවැරදි කිරීම සඳහා සමාගමට දැනුම් දේ.

2020 වර්ෂයේදී කෝවිඩ් -19 වසංගතය පැතිරී තිබියදී වුවද, මූල්‍යමය තොරතුරු ඉදිරිපත් කිරීම් සහ අනෙකුත් ප්‍රතිලාභ වඩාත් දැඩි ලෙස සෝදිසි කර බලා ඒවායේ අනුකූලතාවය සහතික කිරීම සඳහා ක්‍රියාකාරී පසු විපරම් කිරීම තුළින් ඵලදායී බලාත්මක කිරීමක් වෙත ළඟාවීම සඳහා අපගේ කැපවීම අපි පෙන්නුම් කළෙමු.

වසංගතය හේතුවෙන් කොටස් තැරැව්කාර කර්මාන්තය මුහුණ දී ඇති දුෂ්කරතා සැළකිල්ලට ගනිමින්, සමාලෝචනය කරන ලද වර්ෂය තුළ බලපත්‍රලාභී / ලියාපදිංචි ආයතන සඳහා ඇතැම් සහන ක්‍රියාමාර්ග ලබා දෙන ලදී. එවැනි ක්‍රියාමාර්ග අතරට මූල්‍යමය තොරතුරු ඉදිරිපත් කිරීම් සඳහා කාලය දීර්ඝ කිරීම සහ එවැනි ආයතනවල ඉල්ලීම පරිදි 2020 වර්ෂය සඳහා අදාළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික බලපත්‍ර / ලියාපදිංචි ගාස්තු ගෙවීම වසරක කාලයක් සඳහා කල් දැමීම සිදු විය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, කොළඹ කොටස් හුවමාරුවේ කොටස් තැරැව්කාර සඳහා අදාළ නීතිරීතිවල 12 වන වගන්තිය ප්‍රකාරව එක් කොටස් තැරැව්කාර සමාගමක ව්‍යාපාර කටයුතු වසර දෙකක කාලයක් සඳහා අක්‍රිය කරන ලදි. කොළඹ කොටස් හුවමාරුවේ කොටස් තැරැව්කාර නීතිවල 12 වන වගන්තියට අනුකූලව එම සමාගම අක්‍රිය කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සම්පූර්ණ කර ඇති බව කොළඹ කොටස් හුවමාරුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කිරීම මත සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අවසාන අනුමැතියෙන් පසුව එම කොටස් තැරැව්කාර සමාගමේ ව්‍යාපාර කටයුතු අක්‍රිය කර ඇත.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, කොටස් තැරැව්කාර කර්මාන්තයේ සමස්ත පිරිවැටුම 2019 වසරට සාපේක්ෂව 159% කින් ඉහළ ගොස් තිබේ. 2019 දී රු. මිලියන 37 ක අලාභයට සාපේක්ෂව 2020 වර්ෂයේ බදුවලට පසු ශුද්ධ ලාභය රු. මිලියන 1,751 ක් පෙන්නුම් කරමින් කර්මාන්තයේ ලාභදායීතාවය 4821% කින් ඉහළ ගොස් තිබේ. මෙයට බොහෝ දුරට හේතු වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වර්ෂය තුළ බැංකු පොලී අනුපාත පහළ දැමීම සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමට රජය විසින් ගන්නා ලද අනෙකුත් ප්‍රගතිශීලී පියවර හේතුවෙන් කොටස් වෙළෙඳපොළ බොහෝ ආයෝජකයින් සඳහා වඩාත් කැමති තේරීමක් වීමයි. මීට අමතරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිතුමන් විසින් පත් කරන ලද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුවේ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කමිටුව විසින් කොළඹ කොටස්

හුවමාරුව ඩිජිටල්කරණය කිරීමේ මෙහෙයුම් කඩිනම් කිරීමද කර්මාන්තයේ පිරිවැටුමේ සහ ලාභදායිතාවයේ මෙම වර්ධනයට දායක විය. කොටස් තැරැව්කාර කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යාලේඛනයක් පහත දැක්වේ. (සංඛ්‍යා සටහන 06)

**සංඛ්‍යා සටහන 06: කොටස් තැරැව්කාර කර්මාන්තයේ මූල්‍ය දැක්වීම්**

| | 2020 (රු. '000) | 2019 (රු. '000) | % වෙනස |
|---|---|---|---|
| පිරිවැටුම | 4,303,668 | 1,663,045 | 158.8 |
| ශුද්ධ තැරැව්කාර ගාස්තු | 3,929,094 | 1,440,766 | 172.7 |
| අනෙකුත් ආදායම් | 851,656 | 707,329 | 20.4 |
| මෙහෙයුම් ලාභය/අලාභය | 2,113,479 | 40,483 | 5120.7 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය/අලාභය | 1,905,233 | (79,453) | 2497.9 |
| බදුවලට පසු ශුද්ධ ලාභය/අලාභය | 1,751,330 | (37,096) | 4821.1 |
| මුළු වත්කම්* | 19,893,383 | 9,726,649 | 104.5 |
| මුළු වගකීම්* | 12,943,874 | 4,571,124 | 183.2 |
| කොටස් හිමියන්ගේ අරමුදල්* | 6,949,509 | 5,155,525 | 34.8 |

*දෙසැම්බර් 31 වන දිනට

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත කොටස් තැරැව්කාර ආයතන විසින් ඉදිරිපත් කරන ලද විගණනය නොකළ මූල්‍ය වාර්තා.

### වෙළෙඳපොළ අතරමැදියන්

ආන්තික ණය සැපයුම්කරුවන්, ආයෝජන කළමණාකරුවන්, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන, ප්‍රාරක්ෂණ සහ නිශ්කාෂණ ආයතන ඇතුළත් වෙළෙඳපොළ අතරමැදියන් කාණ්ඩ පහක් සඳහා ලියාපදිංචි කිරීම් ලබා දීමට සහ ඔවුන් සම්බන්ධ නියාමනයන් අධීක්ෂණය කිරීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය ඇත.

සියලුම ලියාපදිංචි ආයතන මූල්‍යමය වශයෙන් ස්ථාවර, මෙහෙයුම් ශක්‍යතාවකින් යුත් සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ මිනුම් වලින් සමන්විත බව සහතික කිරීම සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කාර්යභාරයයි.

වෙළෙඳපොළ අතරමැදියන්ට අදාළ අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම, අවම කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා යොදාගන්නා එතැන් සහ විතැන් පරීක්ෂා සඳහා ඵලදායී හා ශක්තිමත් රාමුවක් අනුගමනය කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ් -19 වසංගතය ආරම්භ වීමත්, රට සම්පූර්ණයෙන් වසාදැමීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳපොළ අතරමැදියන් සඳහා අදාළ වන නිශ්චිත ප්‍රමිතීන්ට අනුකූල වීම් දැඩි විතැන් පරීක්ෂා මගින් පමණක් තක්සේරු කරන ලදී.

කොවිඩ්-19 වසංගතය ආරම්භයේදීම වෙළෙඳපොළ පසුබෑම හේතුවෙන් ආයෝජකයින්ට ඇති වූ බලපෑම සැළකිල්ලට ගනිමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආන්තික සැපයුම්කරුවන්ගේ සේවාදායකයින්ට (ගණුදෙනුකරුවන්ට) ආන්තික ණය සඳහා පොළිය ගෙවීම සම්බන්ධයෙන් සහනකාලයක් ලබා දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තීරණ වලින් ලැබෙන සහනයන් තම සේවාදායකයින්ට ලබා දෙන ලෙස ලියාපදිංචි ආන්තික සැපයුම්කරුවන්ට නියම කරන ලදී. තවද, 2020 ජුනි 30 දක්වා ණය ලබාදීම් සඳහා පොළිය අය කිරීම සහ අයකර ගැනීමෙන් වළකින ලෙස ඔවුන්ට නියම කරන ලදී.

2020 වර්ෂය තුළදී, නව ආයෝජන කළමණාකරුවන් ලියාපදිංචි කිරීම් දෙකක් (2) ලබා දී ඇති අතර, තම මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට අකමැති ආන්තික සැපයුම්කරුවන් දෙදෙනෙකු (2) ස්වේච්ඡාවෙන් සිය ලියාපදිංචියට ඉවත්කර ගන්නා ලදී. (සංඛ්‍යා සටහන 07)

***සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, කොටස් තැරැව්කාර කර්මාන්තයේ සමස්ත පිරිවැටුම 2019 වසරට සාපේක්ෂව 159% කින් ඉහළ ගොස් තිබේ.***

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 07 : වෙළෙඳපොළ අතරමැදි ආයතන පිළිබඳ මූල්‍ය තොරතුරු විශේෂ දැක්වීම් (රු.මි.)

| වෙළෙඳපොළ අතරමැදි ආයතන වර්ගය | 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | | 2020 දෙසැම්බර් 31 | |
|---|---|---|---|---|
| | මුළු පිරිවැටුම | බදුවලට පෙර ශුද්ධ ලාභය | මුළු වත්කම් | මුළු වගකීම් |
| ආන්තික ණය සැපයුම්කරුවන් | 137,507 | 41,628 | 2,133,811 | 1,882,494 |
| ආයෝජන කළමනාකරුවන් | 1,733 | 322 | 10,893 | 5,095 |
| කොටස් ප්‍රාරක්ෂකයින් | 649 | 570 | 2,571 | 272 |
| ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන | 181 | 75 | 325 | 83 |
| බහුකාර්ය ආයතන* | 212,884 | 105,436 | 7,633,634 | 7,008,833 |
| නිෂ්කාශන ආයතන | 236 | 137 | 853 | 120 |

*ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන කාර්යයන් කිහිපයක නිරතවීම සඳහා ලියාපදිංචි ආයතන.

### ඒකක භාර කර්මාන්තය

පෙර අත්විඳීමට නොලැබුණු කොවිඩ් -19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සැළකිල්ලට ගනිමින්, ඒකක භාර කළමනාකරණ සමාගම් විතැන් පරීක්ෂා ක්‍රමය මත සුපරීක්ෂණය කිරීම වඩාත් ශක්තිමත් කරවන ලදි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඒකක භාර කළමනාකරණ සමාගම් විතැන් ලෙස පරීක්ෂා කිරීමේදී අභ්‍යන්තර පාලනයන් සමඟ අනුගතවීම්, නීති රීති සහ නියාමන ක්‍රමවේද අවශ්‍යතා හා ඔවුන්ගේ මූල්‍ය ශක්තියේ ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සඳහා වඩා දූරදර්ශී, ක්‍රියාකාරී හා කළමනාකරණ ප්‍රතිපත්ති යටතේ ප්‍රධාන අවදානම් පැති ආවරණය වන පරිදි සළකා බලන ලදි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූලව ඒකක භාර කළමනාකරණ සමාගම්වල මූල්‍ය තත්ත්වය ස්ථාවරව පවත්වාගෙන යන බව සහ ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා, මාසික විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන සහ ආපසු ලබා දෙන තොරතුරු විශ්ලේෂණය කිරීම මගින්, ඒකක භාර කළමනාකරණ සමාගම් සම්බන්ධයෙන් විතැන් පරීක්ෂාවන් සිදුකරන ලදී. මීට අමතරව, ඒකක භාර නීති සංග්‍රහය, භාරක ඔප්පුව හා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නියෝග වල දක්වා ඇති පරිදි පිළිගත හැකි සීමාවන් තුළ එම අරමුදල් පවතිනවාද යන්න තහවුරු කර ගැනීම සඳහා ඒකක භාර අරමුදල්වල නිරාවරණ මට්ටම් සහ ද්‍රවශීලතා මට්ටම් පිළිබඳව සොයාබලන ලදි.

තවද, පෙර දක්නට නොලැබුණු කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් ඇතැම් නියාමන අවශ්‍යතාවයන්ට අනුගතවීම සම්බන්ධයෙන් ඒකක භාර කළමානාකරණ සමාගම්වලට මුහුණ දීමට සිදු වී ඇති බාධක සහ පරිපාලනමය අභියෝග සළකා බලමින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඒකක භාර අරමුදල් සම්බන්ධ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික හා කාර්තුමය වාර්තා භාරදීම සඳහා සහන කාලයක් ලබාදෙන ලදි.

කෙසේ වෙතත්, ඉහත සඳහන් කාලය දීර්ඝ කිරීම් නොසළකා, ආයතනවලට ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපාන හෝ අහිතකර ලෙස බලපානු ලැබිය හැකි සුවිශේෂී කරුණු පිළිබඳව වහාම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම අවශ්‍ය විය.

2020 දෙසැම්බර් 31 වන විට ඒකක භාර අරමුදල්වල ශුද්ධ වත්කම් වටිනාකම රු. බිලියන 201 (දළ වශයෙන්) ක් වූ අතර ඒකක හිමියන්ගේ සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව 12.7% කින් ඉහළ ගොස් තිබේ. (සංඛ්‍යා සටහන 08, රූප සටහන 01)



සුනෙත් පෙරේරා මහතා

සහකාර අධ්‍යක්ෂ, සුපරීක්ෂණ



සයුමි කොඩිප්පිලි මහත්මිය


ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, සුපරීක්ෂණ

සංඛ්‍යා ලේඛන 08 : ඒකක භාර අරමුදල්වල සමස්ත තත්ත්වය

| | 2020.12.31 දිනට | 2019.12.31 දිනට | % වෙනස |
|---|---|---|---|
| අනුමත ඒකක භාර අරමුදල් සංඛ්‍යාව | **75** | 71 | 5.6 |
| ඒකක භාර ශුද්ධ වත්කම් වටිනාකම (දළ වශයෙන් රු.බි) | **201.00** | 104.79 | 91.8 |
| ඒකක හිමියන් සංඛ්‍යාව | **52,402** | 46,481 | 12.7 |
| නිකුත් කළ ඒකක සංඛ්‍යාව (දළ වශයෙන් මිලියන) | **8,014** | 4,769 | 68.0 |
| කොටස්වල ආයෝජනය (දළ වශයෙන් රු.මි) | **14,019** | 9,841 | 42.5 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (දළ වශයෙන් රු.මි) | **28,803** | 9,150 | 214.8 |
| අනෙකුත් ආයෝජන උපකරණවල ආයෝජනය *(දළ වශයෙන් රු.මි) | **158,656** | 84,542 | 87.6 |

*වාණිජ පත්‍රිකා, තැන්පතු සහතික, ණයකර, බැංකු තැන්පතු යනාදිය
මූලාශ්‍රය: ඒකක භාර කළමණාකරන සමාගම් විසින් ඉදිරිපත් කළ නියාමන තොරතුරු

රූප සටහන 01 : 2020 දෙසැම්බර් 31 වන විට ඒකක භාර කළමනාකරණ සමා.ම් විසින් සමස්ත වෙළෙඳපොළින් අත්කරගෙන තිබූ වෙළෙඳපොළ කොටස් ප්‍රමාණයන්




## ආවේක්ෂණ, විමර්ශන හා බලාත්මක කිරීම්

වෙළෙඳපොළ නිරවද්‍යභාවය ඕනෑම ප්‍රාග්ධන වෙළෙඳපොළක් තුළ ප්‍රධාන භූමිකාවක් හොබවයි. එම නිසා වෙළෙඳපොළ ආවේක්ෂණයේ මූලික කාර්යභාරය වන්නේ සුරැකුම්පත් නිකුත් කර ගණුදෙනු කල හැකි වෙළෙඳපොළක් නිසි පරිදි සහ සාධාරණව පවත්වාගැනීම වේ. මේ සඳහා වෙළෙඳපොළ නියාමනය සහ වෙළෙඳපොළ විචලතාවයන් අතර සමබරතාවය රැකගනිමින් බුද්ධි තොරතුරු සහ නිරීක්ෂණ තුළින් වෙළෙඳපොළ වැරදි මැඩපැවැත්වීම සඳහා සුදුසු උපායමාර්ග ක්‍රියාත්මක කෙරේ.

### ආවේක්ෂණය

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සුරැකුම්පත් ගණුදෙනු කිරීමේදී සිදුවන අසාමාන්‍ය මිල හා ප්‍රමාණ විචලනයන් හඳුනාගැනීමට සහ එමගින් සිදුවිය හැකි නීති උල්ලංඝණය කිරීම් වැලැක්වීම සඳහා තත්කාලීන දත්ත භාවිතා කරනු ලබන ස්වයංක්‍රීය ආවේක්ෂණ පද්ධතියක් යොදාගෙන ඇත. සැක කටයුතු ගණුදෙනු කටයුතු හඳුනාගත් පසු ඒවා සිතා මතා ඇතිකල ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයන්ද නැතහොත් අව්‍යාජ සමපේක්ෂණ තත්ත්වයන්ද යන්න වෙන්කර හඳුනාගැනීම සඳහා ගැඹුරු විශ්ලේෂණයක් සිදුකරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවන්හිද අවේක්ෂණ වාර්තා හෝ සටහන් සකස් කර සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ හා විමර්ෂණ කමිටුව වෙත යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. වෙළෙඳපොළ අවභාවිතයන් හඳුනාගැනීම සඳහා අදාළ සුරැකුම්පත් ගණුදෙනු සමඟ සාංගමික අනාවරණයන් සමීපව විශ්ලේෂණය කරනු ලබයි.

2020 වසරේ ජනවාරි 01 වන දා සිට 2020 වසරේ මාර්තු මස 19 වන දා දක්වා සුරැකුම්පත් ගණුදෙනු සඳහා වෙළෙඳපොළ විවෘතව පැවැති අතර එම වසරේ මාර්තු මස 20 වන දා සිට මැයි මස 11 වන දා දක්වා වෙළෙඳපොළ විවෘත කිරීමට නොහැකි වූ බැවින් වෙළෙඳපොළ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. කොවිඩ් 19 තත්ත්වයන් හමුවේ මෙහෙයුම් සහ ගණුදෙනු කටයුතු අධීක්ෂණයේ දී සුවිශේෂී අභියෝග වලට මුහුණ පෑමට සිදුවුවද වෙළෙඳපොළ නැවත විවෘත කිරීමත් සමඟ වෙළෙඳපොළ තුළ වේගවත් ප්‍රවනතාවයක් දැක ගැනීමට හැකි විය. 2020 වසරේ පසු භාගයේදී ගණුදෙනු කටයුතු ඩිජිටල්කරණය වීමත් සමඟ නව ගිණුම් විවෘත කිරීමේ සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් ගණුදෙනු කටයුතු ශක්තිමත් වීම වෙළෙඳපොළ වර්ධනයට පාදක විය.

### පූර්ව ක්‍රියාකාරි ආවේක්ෂණය

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, වෙළෙඳපොලේ ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා වෙළෙඳපොළ වැරදි සහ අකටයුතුකම් හඳුනාගැනීමට ආයෝජකයින්, තැරැව්කරුවන් සහ වෙනත් පාර්ශවයන්ගේ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයන් සහ ප්‍රවනතාවයන් පූර්ව ක්‍රියාකාරිව නිරීක්ෂණය කරනු ලබයි. 2020 වසරේදී සිද්ධීන් 37 ක් සම්බන්ධයෙන්, අසාමාන්‍ය ගණුදෙනු කටයුතු පිළිබඳ පුළුල් විශ්ලේෂණයකින් පසු, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජන උපදේශකවරුන්ගෙන්, අනුකූලතා නිලධාරීන්ගෙන් සහ ආයෝජකයින්ගෙන් දුරකථන ඇමතුම් ඔස්සේ වහාම පැහැදිලි කිරීම් ලබාගත් අතර ලිපි 13 ක් මඟින් ආයෝජකයින්ගෙන් සහ සමාගම් අධ්‍යක්ෂවරුන්ගෙන් පැහැදිලි කිරීම් ලබාගන්නා ලදී. වෙළෙඳපොළ අවභාවිතයන් මනා ලෙස වලක්වා ගැනීම ප්‍රවර්ධනය කිරීමට සහ ආයෝජන ප්‍රජාවගේ විශ්වාසය යළි තහවුරු කිරීමට මෙවැනි ක්‍රියාමාර්ග උපකාරි වනු ඇතැයි සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විශ්වාස කරයි.

# මෙහෙයුම් සමාලෝචනය

## ආවේක්ෂණ වාර්තා සහ සටහන්

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ සොයාගැනීම්, කොළඹ කොටස් හුවමාරුවෙන් යොමු කරනු ලබන ආවේක්ෂණ වාර්තා සහ බාහිර පාර්ශවයන් විසින් යොමු කරනු ලබන පැමිණිලි මත පදනම් වෙමින් බරපතල සැක සහිත වෙළෙඳපොළ අක්‍රමිකතා හඳුනාගන්නා අතර ඒවා සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා එම ආවේක්ෂණ වාර්තා සහ සටහන්, ආවේක්ෂණ හා විමර්ෂණ කමිටුවට (SIC) පහත සඳහන් ආකෘතිය යටතේ ඉදිරිපත් කරනු ලැබේ.:

01. සමාගමක අභ්‍යන්තර තැනැත්තන් විසින් එම සමාගමේ සුරැකුම්පත් සම්බන්ධයෙන් පත් නොකළ මිල සංවේදී තොරතුරු මත පදනම්ව එහි කොටස්වල ගණුදෙනු කිරීම. (සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 32 වන වගන්තිය)

02 සක්‍රිය ගණුදෙනු කිරීමේ හා වෙළෙඳපොළේ ව්‍යාජ හෝ නොමඟ යවන සුළු තත්ත්වයක් නිර්මාණය කිරීම හෝ නිර්මාණය වීම සඳහා හේතුවිය හැකි මොනයම් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීම.

2020 වර්ෂය තුළදි ආවේක්ෂණ වාර්තා 05 ක් සහ ආවේක්ෂණ සටහන් 02 ක් සම්පූර්ණ කර ආවේක්ෂණ හා විමර්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ආවේක්ෂණ වාර්තා



ප්‍රභාෂ් වනිගතුංග මහතා
**අධ්‍යක්ෂ, ආවේක්ෂණ කටයුතු**

අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදුකරන ගණුදෙනු සම්බන්ධ අවස්ථා 03 කින්ද, වෙළෙඳපොළ මිල කෘතිමව හැසිරවීම හා සම්බන්ධ අවස්ථා 04 කින් ද සමන්විත වේ.

## ඉදිරි මාර්ගය

නවීන අනතුරු ඇගවීම් ක්‍රමවලින් නීතියට පටහැනි වෙළෙඳපොළ හැසිරීම් හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් මෙවලම් වලින් සමන්විත නව ආවේක්ෂණ මෘදුකාංග පද්ධතියක් ලබාගැනීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව කටයුතු කරමින් සිටී. වෙළෙඳපොළෙහි ඇති ප්‍රධාන විශ්ලේෂණ සහ දෘෂ්‍යකරණ මෙවලම් වල ආධාරයෙන් ශක්තිමත් හා නම්‍යශීලි ක්‍රියාවලීන් මෙම පද්ධතිය තුලට ඇතුලත් වනු ඇතැයි අපේක්ෂා කර ඇත. වේගවත් වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය නිසා ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඇති වී ඇති සක්‍රිය ප්‍රවනතාවන් හමුවේ කටයුතු කිරීමට කෘතීම බුද්ධිය වැනි වැඩි දියුණු කල තාක්‍ෂණය උපයෝගි කරගැනීම සම්බන්ධව පරීක්‍ෂණ කිරීමට ආවේක්‍ෂණ අංශය යොමු වී ඇත. නව යාන්ත්‍රික ඉගෙනීම් සමඟ දියුණු මෙවලම් මගින් ආවේක්‍ෂණ ක්‍රියාවලිය සඳහා ඵලදායී තාක්‍ෂණය ලබා දීමෙන් වෙළෙඳපොළ විචලනයන් සහ ප්‍රවනතාවන් පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට අපේක්‍ෂා කරයි.

ආවේක්‍ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා ධාරිතාවන් ඉහළ දැමීම සහ පවතින ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහතික කිරීම සඳහා ලබන වසර තුළදී ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතියක් වන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ පළපුරුදු උපදේශකයකුගේ සහය ලබාගැනීමට සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අපේක්‍ෂා කරනු ලබයි.

## විමර්ශන කටයුතු

යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සඳහන් නියෝග, නීති සහ රීති කඩකිරීමක් හෝ උල්ලංගනය කිරීමක් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශන පැවත්වීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වගකීම වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශයෙන් යොමු කරණ ලද ආවේක්ෂණ වාර්තාවක් හෝ ලැබුණු පැමිණිල්ලක් පදනම් කරගනිමින් සාමාන්‍යයෙන් විමර්ශනයක් ආරම්භ කරයි. එලෙස ආවේක්ෂණ වාර්තාවක් යොමු වූ විට ඒ වෙනුවෙන් විමර්ශනයක් අවශ්‍යවේද යන්න තීරණය කිරීම සඳහා එකී ආවේක්ෂණ වාර්තාව "ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට" (Surveillance and investigation Committee) භාර දෙයි. විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව එකී විමර්ශන වාර්තාව අධ්‍යයනය කිරීම සඳහා මෙන්ම කොමිසම වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට භාර දෙයි. සොයා ගනු ලැබූ සාධක සහ සාක්ෂි සම්බන්ධයෙන් අවසාන ඇගයීමේදී ඒ වෙනුවෙන් කමිටුවට සහාය දැක්වීම සඳහා උපදේශකයින් ලෙස කටයුතු කරන නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටද ආරාධනා කරයි. පසුව ආවේක්ෂණ හා විමර්ශන කමිටුවේ නිර්දේශ සමඟ අදාළ විමර්ශන වාර්තාව කොමිසම වෙත භාර දේ. එකී වාර්තාව සහ නිර්දේශ ප්‍රබලව සාකච්ඡා කිරීමෙන් පසුව කොමිසමේ සාමාජිකයින් විසින් ආවේක්ෂණ හා විමර්ශන කමිටුව විසින් ලබා දුන් නිර්දේශ පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම සිදු කරනු ලබයි. ඉන් පසුව කොමිසම විසින් ලබාදුන් තීරණය ක්‍රියාත්මක කරනු ලබයි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධි විධාන අනුව යම් වරදක් කර



අයන්ති අභයවික්‍රම මහත්මිය
**වැඩබලන අධ්‍යක්ෂ, විමර්ශන කටයුතු**



ඩී. එම්. ජී. ප්‍රියන්ත මහතා
**සහකාර අධ්‍යක්ෂ, විමර්ශන කටයුතු**

ඇති බැව් අනාවරණය වූ විට එකී වරද සිදු කළ පාර්ශවයට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන්නේ අදාළ විමර්ශන වාර්තාව මත කොමිෂම විසින් ගනු ලැබූ තීරණ පරිදිය. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ පවතින අභියෝග කාරී වාතාවරණය යටතේ පවා, 2020 වසර තුළදී ශ්‍රී ලකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශන 11ක් අවසන් කරන ලදී. අවසන් කරන ලද විමර්ශන අතුරින් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සහ / හෝ වෙනත් නියාමක ආයතන සඳහා යොමු කිරීමට කොමිසම විසින් තීරණය කරන ලද විමර්ශන සංඛ්‍යාව 7කි. විමර්ශනයට ලක් වූ පුද්ගලයින් විසින් වරදක් කර ඇති බැව් සොයාගනු ලැබූ සාක්ෂි මගින් සනාථ කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉතිරි විමර්ශන හතර බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග නොමැතිව අවසන් කරන ලදී. සළකා බලන වසර තුළ පහත සඳහන් ක්‍රියා මාර්ගද ගන්නා ලදී. ව්‍යාජ සහ

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ සඳහන් නියෝග, නීති සහ රීති කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වන චෝදනා කෙරෙහි විමර්ශන පැවත්වීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වගකීම වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ආවේක්ෂණ අංශයෙන් යොමු කරණ ලද ආවේක්ෂණ වාර්තාවක් හෝ ලැබුණු පැමිණිල්ලක් පදනම් කරගනිමින් සාමාන්‍යයෙන් විමර්ශනයක් ආරම්භ කරයි.**

නොමඟ යවන සුළු වෙළෙඳපොළක් (Market Manipulation) ඇති කිරීම සම්බන්ධයෙන් වු චෝදනාවක් වෙනුවෙන් පවත්වන ලද විමර්ශනයක් පාදකව නියමිත බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට පෙරාතුව අදාළ පුද්ගලයින් 5 දෙනෙකුට හේතු දැක්වීමේ නිවේදන (Show Cause Notice) යොමු කරන ලදී.

විමර්ශනයක් සම්බන්ධයෙන් සාක්ෂි ලබාදීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉදිරියේ පෙනී නොසිටි පුද්ගලයින් දෙදෙනෙකුට එරෙහිව නඩු කටයුතු ගොනු කරන ලදී. තවද, මහ බැංකුව යටතේ පවතින මුල්‍ය බුද්ධි ඒකකය වෙත යම් විමර්ශනයකට අදාළ නිරීක්ෂණ යොමු කරන ලද්දේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහායි. එසේම, නියමිත පරීක්ෂණයකින් පසුව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා තැරැව්කරුවන් දෙදෙනෙකු සම්බන්ධ නිරීක්ෂණ කොළඹ කොටස් හුවමාරුව වෙත යොමු කරන ලදී. ඊට අමතරව, පෙර විකුණුම් (Front Running) නැමති චෝදනාව මත සිදු කරන ලද විමර්ශනයක් පාදකව යම් ආයෝජකයෙකුට ඔහුගේ ආචාර සම්පන්න නොවන හැසිරීම සම්බන්ධයෙන් අනතුරු හඟවන (Cautioned) ලදී. එසේ සිදු කරන ලද්දේ ඔහුගේ විශ්වසනීය යුතුකම (Fiduciary Duties) උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන අතර, ඔහුගේ සේවයෝජකයාවද ඒ සම්බන්ධයෙන් දැනුවත් කරන ලදී.

ලැයිස්තුගත පොදු සමාගමක ලැයිස්තුගත ණයකර සම්බන්ධව ලබාදෙන ශ්‍රේණිගත කිරීම් වල ශ්‍රේණිගත කිරීම් සංශෝධන පිළිබඳව වහාම අනාවරනය නොකිරීම හා වෙළෙඳපොළට නොමග යවනසුළු අනාවරනයක් සිදුකිරීම.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51 A වගන්තිය යටතේ ඔවුන් විසින් සිදුකරන ලද යම් වරදවල් සමථයකට පත්කිරීම සදහා එම්.ටී.ඩී. වෝකර්ස් පීඑල්සී හි අතීත සහ වත්මන් අධ්‍යක්ෂ වරුන් කීපදෙනෙක් විසින් රුපියල් තිස්හය මිලියන තුන් ලක්ෂයක මුදලක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ගෙවන ලදී. එම මුදල ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කරන ලද අතර එම මුදල සමථයකට පත්කිරීමේ වන්දියක් ලෙස මේ දක්වා එම අරමුදලට ගෙවා ඇති වැඩිම ඒකාබද්ධ මුදල වේ.

කොළඹ කොටස් වෙළෙඳපොළ රීති කඩ කරමින් සහ 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 53 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ 2001 දෙසැම්බර් මස 18 දිනැති 1215/2 අංක දරණ ගැසට් පත්‍රයේ එලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති උල්ලංඝණය කරමින්, විවිධ අවස්ථා හතරකදී එම්.ටී.ඩී. වෝකර්ස් පීඑල්සී හි ලැයිස්තුගත ණයකර සම්බන්ධව ලබාදී ඇති ශ්‍රේණිගත කිරීම් වල පහලයාම් පිළිබඳව වහාම අනාවරණය නොකිරීම හේතුවෙන්, 2016 මැයි මස සිට 2018 මැයි මස දක්වා වන කාල සීමාව තුළ අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර ඇති අධ්‍යක්ෂ වරුන් වෙත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නඩුකර පැවරීමේ දැන්වීම් නිකුත් කරනු ලැබිනි.

1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 51 වන වගන්තිය උල්ලංඝණය කරමින් 2019 ජනවාරි මස 17 වන දිනයේදී වෙළෙඳපොළ වෙත නොමග යවනසුළු අනාවරනයක් සිදුකිරීම සම්බන්ධව 2019 ජනවාරි මාසය තුළදී එම්.ටී.ඩී. වෝකර්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ අධ්‍යක්ෂ වරුන් වෙත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තවත් නඩුකර පැවරීමේ දැන්වීම් නිකුත් කරනු ලැබීය.

අදාල කාල සීමාවන් තුළ එම්.ටී.ඩී. වෝකර්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කළ අධ්‍යක්ෂ වරුන් විසින් තම නීතීඥයන් මාර්ගයෙන් අදාල වැරදි සම්බන්ධයෙන් සමථයකට පත් කිරීමේ ඉල්ලුම්පත්‍රයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. පළමු නඩුකර පැවරීමේ දැන්වීමේ දක්වනු ලැබූ වැරදි සදහා රුපියල් තිස් මිලියන අට ලක්ෂයක සමස්ථ මුදලක් (මිලියන 30.8) සමථයකට පත් කිරීමේ වන්දියක් ලෙස ගෙවීමට යටත්ව අධ්‍යක්ෂවරු 11 දෙනෙකුගේ වැරදි හා දෙවන නඩුකර පැවරීමේ දැන්වීමේ දක්වනු ලැබූ වැරදි සදහා රුපියල් පස් මිලියන පන්ලක්ෂයක සමස්ථ මුදලක් (මිලියන 5.5) සමථයකට පත් කිරීමේ වන්දියක් ලෙස ගෙවීමට යටත්ව අධ්‍යක්ෂවරු 5 දෙනෙකුගේ වැරදිද සමථයකට පත්කිරීම සදහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

එම්.ටී.ඩී. වෝකර්ස් පීඑල්සී හි අධ්‍යක්ෂ වරුන් විසින් ගෙවිය යුතු වූ රුපියල් තිස්හය මිලියන තුන්ලක්ෂයක මුළු මුදල සම්පූර්ණ සහ අවසන් ගෙවීමක් වශයෙන් ලබාගැනීමෙන් පසු අදාල නඩුකර පැවරීමේ දැන්වීම් වල අන්තර්ගත වූ වැරදි සමථයකට පත්කෙරුන අතර එසේ ලැබුන මුදල් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කරන ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ යම් යම් නියෝග පිළිබඳව කඩිනමින් වෙළෙඳපොළ වෙත අනාවරනය නොකිරීමට සම්බන්ධව අදාල සමාගමට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ක්‍රියාමාර්ග ගැනීම නොකළ යුත්තේ මන්දැයි විස්තර කරන මෙන්, ලැයිස්තුගත පොදු මූල්‍ය සමාගමක් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හේතු දැක්වීම් ලිපි නිකුත් කරනු ලැබීය.

### ලැයිස්තුගත සමාගම් තුනක් අනිවාර්‍ය ලෙස ලැයිස්තුගතභාවයෙන් ඉවත් කිරීම වෙනස් කිරීමට ප්‍රතික්ෂේප කිරීම

තම සමාගම් වල වාර්ෂික වාර්තා සහ අතුරු මූල්‍ය ප්‍රකාශන වෙළෙඳපොළට මුදාහැරීමට පිට පිටම අසමත් වීම හේතුවෙන් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති අනුව ලැයිස්තුගත සමාගම් තුනකට අදාලව අනිවාර්ය ලෙස ලැයිස්තුගතභාවයෙන් ඉවත් කිරීම වෙනස් කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී. විශේෂයෙන් එම සමාගම් විසින් කරුණු නිවැරදි කරගැනීමට ප්‍රයෝජනයට නොගත් දීර්ඝ කාල සීමාවන් ද 20021 දෙසැම්බර් මස 18 වන දිනැති අංක 1215/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින්හි 3(1) හා 17 රීතීන් මගින් නියම කර ඇති පිරිදි කොළඹ කොටස් වෙළඳපොළේ ලයිස්තුගත කිරීමේ රීති වලට අනුකූල වීමට සමාගමට ඇති නෛතික හා ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමෙන් තම වගකීම් සහගත බව ප්‍රදර්ශනය කිරීමට අසමත් වීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල වෙත අනතුරු ඇඟවීම සිදු කෙරිනි.

### නීති කෘත්‍ය

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව එම්. අයි. සම්සුදීන් සහ එම්. බී. නිසාර්

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොළ/මිළ හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ වෙළෙඳපොළ/මිළ හැසිරවීමට ක්‍රියා කිරීම සම්බන්ධව එම්.

> ආවේක්ෂණ වාර්තාවක් යොමු වූ විට ඒ වෙනුවෙන් විමර්ශනයක් අවශ්‍යවේද යන්න තීරණය කිරීම සඳහා එකී ආවේක්ෂණ වාර්තාව "ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට" *(Surveillance and investigation Committee)* භාර දෙයි. විමර්ශනයක් සිදු කිරීමෙන් අනතුරුව එකී විමර්ශන වාර්තාව අධ්‍යයනය කිරීම සඳහා මෙන්ම කොමිසම වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ආවේක්ෂණ හා විමර්ශන කමිටුවට භාර දෙයි.

ඉම්තියාස් සම්සුදීන් සහ බාහික් නිසාර් යන අයට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී.

### තාලිබ් තවුෆික් අල් නකීබ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළට එරෙහිව තාලිබ් තවුෆික් අල් නකීබ් විසින් පවරන ලද DSP/20/2016 අංක දරණ නඩුවට අදාලව ගරු කොළඹ දිසා විනිසුරු තුමා විසින් ලබාදුන් තීන්දුවට එරෙහිව පෙත්සම්කරු විසින් මහාධිකරණයේ අභියාචනයක් ගොනුකරන ලදී.

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලයිස්තුගත සමාගමක් වන "හන්ටර් ඇන්ඩ් කොම්පැනි පීඑල්සී" හි ලයිස්තුගත නොවූ උප සමාගමක් වන "හීත් ඇන්ඩ් කොම්පැනි (ලංකා) ලිමිටඩ්" හි කටයුතු සම්බන්ධව විමර්ශනය කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළ සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බැඳී සිටින බවට ප්‍රකාශනයක් ලබා දෙන ලෙස ඉල්ලමින් DSP/20/2016 අංක දරණ නඩුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළට එරෙහිව තාලිබ් තවුෆික් අල් නකීබ් යන අය විසින් කොළඹ දිසා අධිකරණයේ පවරා ඇත. ගරු දිසා විනිසුරු විසින් පැමිණිලිකරු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළට එරෙහිව ගොනු කර ඇති නඩුව නිෂ්ප්‍රභා කරමින් නියෝග යක් ලබාදෙන ලදී.

නඩුව නිෂ්ප්‍රභා කරමින් දිසා අධිකරණය ලබාදුන් තීන්දුවට එරෙහිව පැමිණිලිකරු විසින් මහාධිකරණයට අභියාචනා කර ඇති අතර එය මේ වන විට කොළඹ මහාධිකරණයේ (සිවිල් අභියාචනා) විභාග වෙමින් පවතී.

### මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති උල්ලංඝනය කරමින් යම් වැදගත් කරුණු වහාම හෙළි නොකිරීම සම්බන්ධව වරදකරුවන් කෙරුන මෙම නඩුවේ චූදිතයන්ගෙන් හතර දෙනෙක් ගරු මහේස්ත්‍රාත් වරයා විසින් ලබාදුන් තීන්දුව සහ සිරදඬුවමට එරෙහිව පළාත්බද මහාධිකරණයට අභියාචනා කර ඇත. අභියාචනයේදී, චූදිතයන් තුන්දෙනෙකුට අදාලව අධිකරණය විසින් ලබාදී තිබූ

තීන්දු නැවත තහවුරු කෙරූ නමුත් දණ්ඩනය ලිහිල් කරන ලදී. හයවන චූදිත අභියාචනාකරු වරදකරු කිරීම සහ දඬුවමට ට එරෙහිව අභියාචනය කොළඹ මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සේන යද්දෙහිගේ සහ එස්. තිනාමනි

දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 36 දරණ සංශෝධිත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 32 වන වගන්තිය උල්ලංඝණය කරමින් අභ්‍යන්තරික වෙළෙඳාම සිදුකිරීම සහ එයට ආධාර සහ අනුබල දීම සම්බන්ධයෙන් පිළිවෙලින් ආචාර්ය සේන යද්දෙහිගේ හා සුබ්‍රමණියම් තිනාමනි යන අයට එරෙහිව 2019 මාර්තු 7 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු බවරනු ලැබිනි. ගරු මහේස්ත්‍රාත් වරයා විසින් එකී පුද්ගලයන් වෙත සිතාසි නිකුත් කරන ලදී. කෙසේ වෙතත් SC/SPL/LA 100/19 දරන නඩුවෙහි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලැබෙන තෙක් මෙම නඩුව අත්හිටවනු ලැබීය.

### සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

අනෙකුත් කරුණු අතර, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්ත අත්හිටුවන ලෙස ඉල්ලමින් 2017 දී ආචාර්ය සේන යද්දෙහිගේ විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව අභියාචනාධිකරණයෙහි මෙම රිට් අයදුම්පත ගොනුකර ඇත. 2017 මාර්තු මාසයේදී කොටුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඔහුට එරෙහිව නඩු පවරනු ලැබූ විට රිට් අයදුම්පතට සහය දැක්වීමට ඔහු පියවර ගත්තේය.

අභියාචනාධිකරණය 2019 මාර්තු 22 දින නියෝගය ලබා දෙමින් මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ පැවැත්වෙන නඩු කටයුත්ත අත්හිටුවීම ප්‍රතික්ෂේප කළ අතර නොතීසි නිකුත් කිරීම මත ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය. සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව SC/SPL/LA 100/19 නඩුවේ තීන්දුව තවමත් ලැබීමට ඇති නිසා මෙම කාරණය තාවකාලිකව අත්හිටවනු ලැබීය.

### සේන යද්දෙහිගේ එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

CA/රිට්/417/2017 නඩුවට අදාලව අභියාචනාධිකරණය ගත් තීරණය අභියෝග යට ලක් කරමින් අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා වන විශේෂ අවසරයක් මගින්, CA/රිට්/417/2017 හි මෙම නියෝගයෙන් අගතියට පත් වූ ආචාර්ය යද්දෙහිගේ විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළේය. විශේෂයෙන්ම එම ආඥා පනතේ 12 වන වගන්තිය අනුව සහ දිවුරුම් සහ තහවුරු කිරීමේ ආඥා පනත අනුව ආචාර්ය යද්දෙහිගේ විසින් වලංගු දිවුරුම් ප්‍රකාශයක් අධිකරණයට ගොනු කර නැති බවට වන විරෝධතාවය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දක්වන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් තවදුරටත් පෙන්වා සිටියේ අදාල දිවුරුම් ප්‍රකාශය 1981 කොන්සල් කාර්‍යයන් පිළිබඳ පනතට අනුකූල නොවන බවයි. ඒ අනුව ඉදිරිපත් කෙරුනේ අදාල අවසරය ලබාදීමට අධිකරණය හමුවේ නිසි අයදුම්පතක් ගොනුවී නොමැති බවයි.

ඒ අනුව ශේෂ්ඨාධිකරණය විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් මතුකරන ලද මූලික විරෝධතාවය පිළිබඳ තීන්දුවක් ලබාදීමට මෙම කරුණ 2019 මැයි 3 වන දින නියම කළ අතර, මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ඇති MC/කොටුව/12639/2018 හා අභියාචනාධිකරණය හමුවේ ඇති CA/ රිට්/417/2017 යන නඩු කටයුතු තාවකාලිකව අත්හිටවනු ලැබීය. අදාල මූලික විරෝධතාවය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව තවදුරටත් ලැබීමට නියමිතව ඇත.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව ලංකා කන්නංගර, කපිල සෙනරත්, ෆාරික් ෆුර්කාන් හා රවීන්ද්‍ර මල්ලවආරච්චි

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොල හැසිරවීම, වෙළෙඳපොල හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව ආයෝජන උපදේශකවරුන් හතර දෙනෙකුට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2019 ජූලි මස 25 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව ඩබ්.කේ.එච්. වැගපිටිය, තිලක් ද සිල්වා හා තක්ෂිල හුලන්ගමුව

1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතෙහි 51(1)(අ) වගන්තියට අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) සහ 102 වගන්ති සමග කියවිය යුතු 2001 දෙසැම්බර් 18 දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලවූ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 12 රීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වෙළෙඳපොල හැසිරවීම, වෙළඳපොල හැසිරවීමට කුමන්ත්‍රණය කිරීම සහ ආධාර හා අනුබල දීම සම්බන්ධව 2020 ජූලි මස 16 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව දනුශ්‍යා ගුලාම්හුසෙයින්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 46ඒ(4) වගන්තිය උල්ලංඝනය කිරීමක් වන ප්‍රකාශයක් වාර්තා කරගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හමුවේ පෙනී නොසිටීම හේතුවෙන් දනුශ්‍යා ගුලාම්හුසෙයින් මහත්මියට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් මස 11 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. ගුලාම්හුසෙයින් මහත්මිය කැඳවා තිබුනේ යම් වෙනත් අයවලුන් විසින් සිදුකරන ලද බවට සැක කෙරෙන පවරාගැනීම් හා ඒකාබද්ධකිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීම් වලට අදාලව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ලද පැමිණිල්ලක් සම්බන්ධව පවත්වාගෙ නයන විමර්ශණයකට අදාලව ප්‍රකාශයක් වාර්තා කරගැනීම සඳහාය. මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එරෙහිව සන්දනම් රාජු

ඒකාබද්ධකිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීමක් සම්බන්ධව වන විමර්ශණයකට අදාලව ප්‍රකාශයක් වාර්තා කරගැනීම සඳහා කැඳවූ අවස්ථාවක ශ්‍රී ලංකා සුරැකුම්පත්

# මෙහෙයුම් සමාලෝචනය

හා විණිමය කොමිෂන් සභාව හමුවේ පෙනී නොසිටීම හේතුවෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 46ඒ(4) වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධව සන්දනම් රාජු මහතාට එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2020 සැප්තැම්බර් මස 11 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදී. මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.

### පැමිණිලි විසඳීමේ ක්‍රමය

ලැයිස්තුගත සමාගම් සම්බන්ධයෙන් ලද පැමිණිලි සහ එයට ලබා දුන් විසඳුම් පහත දක්වා ඇත. (සංඛ්‍යා සටහන 09)

**සංඛ්‍යා සටහන 09 : ලැයිස්තුගත සමාගම්වලට අදාළ පැමිණිලි සහ කාරණා පිළිබඳ කටයුතු**

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි ගණන | ගනු ලැබූ පියවර/වත්මන් තත්ත්වය |
|---|---|---|
| ලැයිස්තුගත පොදු සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලය සම්බන්ධයෙන් | 2 | කාරණා දෙකක් යෝග්‍ය පරිදි විසඳන ලදි. |
| ලැයිස්තුගත සමාගම් සම්බන්ධව | 5 | කාරණා පහක් යෝග්‍ය පරිදි විසඳන ලදි. |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි නීති/රීතීන්ට අනුකූල නොවීම | 1 | එක් කාරනාවක් යෝග්‍ය පරිදි විසඳන ලදි. |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හෝ සාංගමික කටයුතු අංශයෙහි විෂය පථය තුළ නොමැති වෙනත් පරිපාලනමය කටයුතු | 7 | කාරනා 7ක් යෝග්‍ය පරිදි විසඳන ලදි. |
| වෙනත් අංශ වලට යොමු කර ඇති | 1 | එක් කාරනාවක් නීති බලාත්මක අංශය වෙත යොමු කරන ලදි. |
| **එකතුව** | 16 | |

### වන්දි කමිටුව පත් කිරීම

යම් බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවෙකු හෝ කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට නුසුදුසු බවට සොයාගැනීමෙහි ප්‍රතිඵලයක් ලෙස යම් මූල්‍යමය පාඩුවක් ලබන ඕනෑම ආයෝජකයෙකුට වන්දි ලබාදීමේ කාර්‍ය සඳහා වන්දි අරමුදලක් ස්ථාපනය කර පවත්වාගෙන යාම 1987 අංක 36 දරණ (සංශෝධිත) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විණිමය කොමිෂන් සභා පනතෙහි 38(1) උප වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත වගකීමකි.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විණිමය කොමිෂන් සභා පනතෙහි 39(1) උප වගන්තියට අනුව, එම පනතෙහි 40 වගන්තිය යටතේ වන්දි සඳහා කරන ඉල්ලීමකදී ඇගයීම සහ වන්දි ප්‍රධානය කිරීම පිළබඳ වගකිවයුතු වන, කොමිසමේ සාමාජිකයන් අතරින් තුන් දෙනෙකුගෙන් යුත් කොමිසමේ වන්දි කමිටුව අමාත්‍යවරයා විසින් පත්කළ යුතුවේ.

ඒ අනුව, වන්දි කමිටුවේ සාමාජිකයින් ලෙස කොමිසමේ සාමාජිකයින් තුන්දෙනෙක් පත්කිරීමට මුදල් පිළිබඳ විෂය භාර ගරු අමාත්‍යවරයා වෙත කොමිසම විසින් නිර්දේශ කරන ලදී.

මෙම කරුණ මුදල් අමාත්‍යංශය හමුවේ පවතී.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය

ප්‍රාග්ධන වෙළෙඳපොළවල් රටක ආර්ථික වර්ධනය හා ධනය උත්පාදනය කිරීමේ ප්‍රබලතම හස්තයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ දී වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් සඳහා මෙන්ම වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීමට පහසුකම් සැළසීම තුළින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන දායකත්වයක් ලබාදේ. සමාලෝචනයට භාජනය වූ කාල කාලපරිච්ඡේදය තුළ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහසුකම් ලබාදෙන ලද ප්‍රධාන වෙළෙඳපොළ සංවර්ධන කාර්යයන් පහත දක්වා ඇත.

### කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණය

කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණය කිරීම යනු කොටස් වෙළෙඳපොළ කාර්යසාධනයේ කැපී පෙනෙන වර්ධනයක් ඇතිකළ ශ්‍රී ලංකා සුරැනකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධව 2020 වර්ෂයේදී දිත් කළ වෙළෙඳපොළ ප්‍රධානතම වෙළෙඳපොළ සංවර්ධන කර්තව්‍යයකි. කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් පූර්ණ වශයෙන් ඩිජිටල්කරණය කිරීම තුළින් මූලිකවම අපේක්ෂා කළේ ආයෝජකයින්ට පූර්ණ ඩිජිටල්කරණ අත්දැකීමක් ලබා දීමටත්, බාධාවකින් තොරව පශ්චාත්-ගණුදෙනු සහ බේරුම් කිරීමේ ක්‍රියාවලිය සක්‍රීය කිරීමටත්, කොළඹ කොටස් හුවමාරුව කලාපයේ වඩාත්ම තාක්ෂණික දැනුම ඇති කොටස් වෙළෙඳපොළක් බවට පත් කර ගැනීමට සහ එය ලෝකයේ අනෙකුත් සංවර්ධිත වෙළෙඳපොළවල් හා සමාන මට්ටමට ගෙන ඒමයි.

කොටස් වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු පූර්ණ වශයෙන් ඩිජිටල්කරණයට ලක් කිරීමේ කටයුතු ආරම්භ කර ඉදිරියට රැගෙනයාම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කළ අතර එය අදියර තුනකින් නිම කිරීමට බලාපොරොත්තු වේ.

### 1 වන අදියර සම්පූර්ණ කිරීම: "අනාගතයට අඩි පිම්ම"

"අනාගතයට අඩි පිම්ම" යන තේමාව යටතේ ඩිජිටල්කරණ වැඩසටහනේ 1 වන අදියර සාර්ථකව නිම කර 2020 සැප්තැම්බර් 17 දින ගරු අග්‍රාමාත්‍ය තුමාගේ අනුග්‍රාහකත්වයෙන් ආරම්භ කරන ලදී. එමගින් හඳුන්වා දුන් ප්‍රධාන ඩිජිටල් පහසුකම් අතර කොළඹ කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් පහසුකම,

කොටස් වෙළෙඳපොළ නව වෙබ් අඩවිය, මධ්‍ය තැන්පතු පද්ධති (CDS) වෙබ් අඩවිය, අළුතින් ප්‍රතිනිර්මාණය කළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නව වෙබ් අඩවිය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ යූ ටියුබ් නාලිකාව සහ විද්‍යුත් ගැණුම් හා විකුනුම් සටහන්, විද්‍යුත් ප්‍රකාශන සහ විද්‍යුත් ලාභාංශ ඇතුළත් වේ.

## කොළඹ කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් පහසුකම

කොටස් වෙළෙඳපොළ මොබයිල් ඇප් පහසුකම මඟින් ආයෝජකයෙකුට කොටස් තැරැව්කාර ආයතනයකට නොගොස් කී ගිණුමක් විවෘත කිරීමට හැකියාව ලැබෙන අතර එමගින් කොටස් වෙළෙඳපොළ පරිශීලකයින්ට කොටස් වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු සඳහා වැඩි ප්‍රවේශයක් සහ පුද්ගලික භාවය ආරක්ෂා කර ගැනීමට වැඩි අවකාශයක් ලබා දෙයි. එමෙන්ම නව මොබයිල් ඇප් පහසුකම සමඟ ආයෝජකයින්ට කෙටි දැනුම්දීම්, විශ්ලේෂණාත්මක මෙවලම්, අධ්‍යාපනික අන්තර්ගතයන්, කොටස් මිල දර්ශකවල සහ කොටස්වල වෙනස්වීම් පිළිබඳ ඓතිහාසික තොරතුරු ලබාගැනිමට හැකියාව ලැබෙන අතර ආයෝජනය කිරීමේදී ආයෝජකයින්ට තම CDS ගිණුම කළමනාකරණය කිරීමේ අංගයක් ද එහි අන්තර්ගතව ඇත. මෙම නව ඇප් පහසුකම සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා වලින් ලබා ගත හැකි අතර ගනුදෙනු කරන වේලාවන්හිදී සජීවී දත්ත එමගින් ඉදිරිපත් කරන අතර කොටස් වෙළෙඳපොළ පරිශීලකයන්ට තොරතුරු ලබාගැනීමේදී තොරතුරු මූලාශ්‍ර කිහිපයක් වෙත ප්‍රවේශ වීමේ අවශ්‍යතාවක් නොමැත. නව මොබයිල් ඇප් පහසුකම දියත් කිරීමෙන් පසුව, වෙළෙඳපොළ ලාභදායී වර්ධනයක් පෙන්නුම් කළ අතර එයට ප්‍රධාන වශයෙන් විවෘත කරන ලද නව කී ගිණුම් හරහා සිදුකළ නව ගණුදෙනු හේතු වී ඇත. මධ්‍යම තැන්පතු ක්‍රමයේ වාර්තාවන්ට අනුව CDS ජංගම යෙදුම හරහා නව සීඩීඑස් ගිණුම් වලින් 90% කට වඩා විවෘත කර ඇත.

තවද පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ වීමෙන් ජාතික හැඳුනුම්පතෙහි සත්‍යතාව තහවුරු කර ගැනීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින් (MOU) මධ්‍යම තැන්පතු ක්‍රමයේ නව (CDS) ගිණුම් විවෘත කිරීමේ ඇප් පහසුකමට අනන්‍යතා කළමනාකරණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය.

## කොළඹ කොටස් හුවමාරුවේ ගෙවීම්වලට එදිරිව පියවීම් ක්‍රමයට (DVP) සහ ආන්තික පද්ධතිය පුළුල් කර ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම

වෙළෙඳපොලේ පවතින පශ්චාත් වෙළෙඳඅවදානම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමේ අරමුණින්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ගෙවීම්වලට එදිරිව පියවීම් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසයි. සීඑස්ඊ සමඟ ඒකාබද්ධව යෝජිත මාදිලියේ ව්‍යාපාර සහ මෙහෙයුම් පිරිවිතරයන් අවසන් කිරීමෙන් පසු ඩීවීපී සහ වැඩි දියුණු කළ ආන්තික ආකෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවසන් ආකෘතිය සඳහා කොමිසමේ අනුමැතිය ලබා ගන්නා ලදී. පසුව, යෝජිත ආකෘතිය ක්‍රියාත්මක කරන ලෙස සීඑස්ඊ වෙත උපදෙස් දුන් අතර එය 22021 වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම මුලපිරීමේ ඉහළ තාක්ෂණික ස්වභාවය සැලකිල්ලට ගෙන, ඩීවීඩී ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා උපදේශන සේවා සැපයීම සහ ඒකාබද්ධ මධ්‍යම ප්‍රති පක්ෂ (සීසීපී) යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම සඳහා ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ විශේෂඥයෙකු පත් කරන ලදී. සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම තුළින් කෙටි විකිණීම ආවරණය කෙරේ. සීඑම්ඩී ඒ සම්බන්ධව ප්‍රවීණයා සහ සීඑස්ඊ සමඟ සම්බන්ධීකරණය කරයි.

ඩීවීඩී යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මඟින් එම්එස්සීඅයිඅයි විසින් සීඑස්ඊ සඳහා නැගී එන වෙළඳපල තත්වයට උසස්වීම සඳහා නියම කර ඇති අවශ්‍යතා අර්ධ වශයෙන් සපුරාලීමට සහ රටට විදේශීය ගලා ඒම ඉහළ නැංවීමට දායක වනු ඇත.

## කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම් තවදුරටත් ඉහළ නැංවීම සඳහා ලැයිස්තුගත කිරීමේ රාමුව පුළුල් කරන ලදි

විවිධ පරිමාණයන්ගෙන් යුත් විවිධ සමාගම් වලට ලැයිස්තු ගත වීමට පහසුකම් සැලසීම සඳහා, මුල් ලැයිස්තුගත ආයතන පාලනය කරන නියාමන රාමුව පුළුල් කිරීම සඳහා එස්ඊසී සහ සීඑස්ඊ එක්ව ප්‍රතිපත්තිය අවසන් කළ අතර ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්‍යක්ෂම කිරීමට යෝජනා කර තිබේ. ඒ අනුව ලැයිස්තුගත කිරීමේ නීති වල සංශෝධන ද සිදු කෙරිණි.

## කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් ගණුදෙනු කිරීම සඳහා ස්ථාපිත කර ඇති පුවරුවේ (OTC) සාංගමික ණය සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් (REPO) ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම

කොළඹ කොටස් හුවමාරුව හරහා සාංගමික ණය වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා ඒකක භාරකාර සංගමය සහ වාණිජ බැංකු කිහිපයක් සහ ප්‍රාථමික අලෙවි නියෝජිතයින් සමඟ එක්ව සාංගමික ණය සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම් (REPO) ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් ගණුදෙනු කෙරෙන යාන්ත්‍රණයක් (ධඹක) සකස් කරන ලෙස ඉල්ලීමක් කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කරන ලදි. ඒ අනුව, එවැනි රිපෝ ගනුදෙනු ප්‍රවර්ධනය කිරීමේ අවසාන ප්‍රතිපත්තිය කොළඹ කොටස් හුවමාරුව සමඟ ඒකාබද්ධව අවසන් කරන ලද අතර එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ කොටස් හුවමාරුව වෙත ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.

## කොළඹ කොටස් හුවමාරුවේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමය (ATS) යටතේ ඇණවුමක් ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන කොටසක මිල හෙවත් ටික් ප්‍රමාණය (Tick Size) සංශෝධන සඳහා පහසුකම් සැළසීම

වෙළෙඳපොළ ක්ෂුද්‍ර ව්‍යුහය වැඩිදියුණු කිරීම් තක්සේරු කරන ලද අතර මිල කාර්යක්ෂමතාව, ද්‍රවශීලතාවය සහ කොටස් වල අස්ථාවරත්වය අවම කිරීමේ අරමුණින්, කොළඹ කොටස් හුවමාරුවේ ස්වයංක්‍රීය වෙළෙඳ ක්‍රමයයෙහි ටික් ප්‍රමාණයේ සංශෝධන හඳුන්වාදීමට පහසුකම් සළසන ලදී. ඒ අනුව රුපියල් 100ට සමාන හෝ ඊට අඩු වටිනාකමකින් යුත් කොටස් සඳහා ටික් ප්‍රමාණය ශත 10ක් ලෙසත් රුපියල් 100ට වැඩි වටිනාකමකින් යුත් කොටස් සඳහා ටික් ප්‍රමාණය ශත 25ක් ලෙසත් සංශෝධනය කරන ලදි.

## ශ්‍රී ලංකා දේපල ආයෝජන භාර සඳහා (SL-REIT) සහ සමාගම් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීම සඳහා බදු සහන ලබා දීම සඳහා රජය නියෝජනය කරන ලදි.

අලුතින් හඳුන්වා දුන් ශ්‍රී ලංකා දේපල ආයෝජන භාර සඳහා (SL-REIT) සහ සමාගම් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමට පෙළෙඹවීම සඳහා බදු සහන ලබා දීම පිළිබඳ අයවැය යෝජනා සහ අනෙකුත් කරුණු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

# මෙහෙයුම් සමාලෝචනය

විසින් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදි. තවද, ලැයිස්තුගත සමාගම් සහ වෙළෙඳපොළ සහභාගීවන්නන්ගෙන් ඔවුන් විසින් බලාපොරොත්තු වන සහ විශේෂ සැළකිල්ලක් දැක්විය යුතු ජාතික අයවැයට ඇතුළත් කිරීමට කැමති යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව ලැබුණු එවැනි යෝජනා හා නිර්දේශයන්ගේ එකතුවක් ද සමග ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ යෝජනා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරිණි.

## ප්‍රධානයන් ලබාදෙන නියෝජිතායතන විසින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති:

### ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන (CMDP)

ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන යනු ආසියානු සංවර්ධන බැංකුව මගින් ශ්‍රී ලංකා රජයට ලබා දෙන ප්‍රතිපත්ති පදනම් කරගත් ණය සහ තාක්ෂණ ආධාර සපයනු ලබන වැඩසටහනකි. ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන යටතේ, සාමූහික ආයෝජන යෝජනා ක්‍රම (CIS) සකස් කිරීම, කොටස් වෙළෙඳපොළ අසාමූහීකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය අළුත් කිරීම, මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සහ ඒකක භාර වෙළෙඳපොළ සංවර්ධනය වැනි පියවර ගණනාවක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට තාක්ෂණික ආධාර ලැබී ඇත.

ක්‍රියාත්මක කරන ආයතන විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහනෙහි 1 වන කොටස සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවසන් කිරීමෙන් පසු ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වැඩසටහන තුළින් එකඟ වූ නියමයන් සහ කොන්දේසි අනුව රජයට ඇමරිකානු ඩොලර් මිලියන 120 ක් ලැබුණි. දැනට, 2 වන කොටස යටතේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක වෙමින් පවතී.

### ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය

**ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) යටතේ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රධාන නියාමන හා ප්‍රතිපත්ති සංවර්ධන පියවර කිහිපයක් සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. එනිසා හඳුනාගත් භාණ්ඩ හා උපදේශන සම්පාදනය සඳහා අරමුදල් වෙන් කරන ලදි.**

### තාක්ෂණ විශේෂඥ දැනුම

ඒ. ඒ අනුව, 2020 වර්ෂයේදී පහත සඳහන් උපදේශන ලබාගැනීම් සඳහා අවස්ථාව සළසා දෙන ලදී:

- ගෙවීම් කළ පසු බෙරුම් කිරීමේ ක්‍රමය (DVP) ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහයෝගය සහ මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනය ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුව (තනි පුද්ගලික උපදේශක)
- අධ්‍යාපනය සහ දැනුවත්භාවය ලබාදීමේ ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා තාන්ෂණික සහයෝගය - සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ/ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන හා පුහුණු අංශයේ (CMET)/ ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය (CMIC) යන වෙබ් අඩවි සංවර්ධනය කිරීම

බී. ප්‍රධාන තාක්ෂණික විශේෂඥයින් කිහිප දෙනෙකු ලබා ගැනීම සඳහා කටයුතු ද මේ වන විට සිදු වෙමින් පවතී:



ප්‍රභාෂ් වනිගතුංග මහතා
සහකාර අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන



තක්ෂිලා ප්‍රැන්සිස් මහත්මිය
කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන

- තොරතුරු තාක්ෂණ උපාය මාර්ග සංවර්ධනය කිරීම /ස්ථාපිත කිරීම් අධීක්ෂණය කිරීම සඳහා විශේෂඥයින්
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ආවේක්ෂණ විශේෂඥයින්
- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණ රාමුව සංවර්ධනය කිරීම සඳහා විශේෂඥයින්

### භාණ්ඩ සම්පාදනය

- තොරතුරු තාක්ෂණ උපායමාර්ග උපදේශකගේ නිර්දේශ මත පදනම්ව හඳුනාගත් තොරතුරු තාක්ෂණ භාණ්ඩ සැපයීමට පියවර ගනු ඇත.
- ආවේක්ෂණ අංශයේ උපදේශකගේ නිර්දේශ මත පදනම්ව ආවේක්ෂණ පද්ධතියක් සපයා ගැනීම සඳහා අරමුදල් වෙන් කෙරේ

### සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ කාර්යමණ්ඩලය සඳහා පුහුණු කිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සම්පාදනය

ලෝක බැංකුවට කරන ලද ඉල්ලීම් වලට අනුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සකස් කරන ලද පුහුණු සැළැස්මක් මත පදනම්ව එහි කාර්ය මණ්ඩලයේ ධාරිතාවය ගොඩනැගීම සඳහා අරමුදල් වෙන් කර ඇත.

### ව්‍යුත්පන් සුරැකුම්පත් සඳහා වෙළෙඳපොළ තක්සේරු සමීක්ෂණය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආසියානු සංවර්ධන බැංකුව විසින් සපයනු ලැබූ තාක්ෂණික ආධාර සමඟ, හඳුනාගත් පාර්ශවකරුවන් අතර ව්‍යුත්පන්න සුරැකුම්පත් අවශ්‍යතා සහ වෙළෙඳපොළේ ව්‍යුත්පන්න සුරැකම්පත් සඳහා ඇති ඉල්ලුම තක්සේරු කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්විය.

වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

- ලැයිස්තුගත සමාගම් වලට අදාළ සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය, ලැයිස්තුගත කිරීම් සහ ලැයිස්තුගත ලේඛණයෙන් ඉවත් කිරීම වැනි නියාමන අවශ්‍යතා සම්බන්ධයෙන් ලැයිස්තුගත ආයතන වල කොටස් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.

- සාංගමික පරිපාලන සඳහා වූ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන ආයතනයේ මූලධර්ම, ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලධර්ම සහ ජාත්‍යන්තර විශේෂ ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි සාංගමික පරිපාලන සංග්‍රහයක් ක්‍රියාත්මක කිරීම.
- නව ලැයිස්තුගත කිරීමේ වේදිකා හඳුන්වාදීම සඳහා මෙහෙයුම් රාමුවක්, අවදානම් හඳුනාගැනීම නීති උපදේශන සහ මිනුම් සළකුනු පිළිබඳ පුළුල් සමාලෝචනයක් පැවැත්වීමත්
  - විවිධ විදේශ මුදල් වල ණය දේශීය ආයතන වලට ලැයිස්තුගත කිරීමේ හැකියාව ලබා දීම.
  - කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ණය ලැයිස්තුගත කිරීමේ හැකියාව ලබාදීම.
- අඛණ්ඩත්වය වැඩි දියුණු කිරීම සඳහා ලයිස්තුගත සමාගම්වල විගණකවරුන්ට අදාළ වන පුළුල් මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ විශ්වාසය ආරක්ෂ කිරීම සඳහා රාමුවක් නිර්මාණය කිරීමේ හැකියාව සහ පවත්නා අවශ්‍යතා ශක්තිමත් කිරීම
- ලැයිස්තුගත නොකළ ආයතන විසින් මහජන දීමනා සඳහා නව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සබා පනතේ 75 (1) වග්නතිය යටතේ අවශ්‍ය අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය සංවර්ධනය කිරීම.
- අවදානම මත පදනම් වූ මූල්‍ය අපෙක්ෂා කිරීමේ ප්‍රවේශයක් සහ අභ්‍යන්තර ධාරිතා වර්ධනය සඳහා මූල්‍ය සමීක්ෂණ රාමුවක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ප්‍රමිතිගත මූල්‍ය වාර්තාකරන ක්‍රමයක් හඳුන්වාදීමේ හැකියාව ඇගයීමට ලක් කිරීම.

### විගණන කමිටුවේ සාමාජිකයන් සඳහා අයිතමයන් යොමුකිරීම

කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගම්වල හෙළිදරව් කිරීම සම්බන්ධ ආවේක්ෂණය කිරීමේ ප්‍රවේශයක් ආයතනය අභ්‍යන්තරවම සංවර්ධනය කිරීම.

**ලෝක බැංකුවේ ඩුයින් බිස්නස් දර්ශකය - 2020 ට අනුව**

ලෝක බැංකුවේ ඩුයින් බිස්නස් මුල් පිරීමේදී හුවා දැක් වූ සමාගම් පනත හා කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත රීතීන් අනුසාරයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පිළියෙළ කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආකෘතිය, ඇගයුම්කරුවන්ගේ පිළිගැනීමට ලක්ව ඇත. ජගත් ශ්‍රේණිගත කිරීම් වලට අනුව ශ්‍රී ලංකාව 99 වන ස්ථානයට පත්ව ඇති අතර ප්‍රොටෙක්ෂන් මයිනොරිටි දර්ශකය (Protection Minority Index) අනුව රටවල් 199ක් අතුරින් 28 ව ස්ථානය හිමි කර ගෙන ඇත.

### ඉදිරි ගමන

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ඊළඟ අදියරේ සංවර්ධනය කරා ගෙන යාමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන මුලපිරීම් කිහිපයක් පහත පරිදි වේ:

**ඒ. ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ 2 සහ 3 අදියරවල කොටසක් ලෙස පහත මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීමට නියමිතය**

- ඉලෙක්ට්‍රොනික ගනුදෙනු ක්‍රම (ඊ-ගනුදෙනු): ඉලෙක්ට්‍රොනික ආයෝජන ක්‍රම/අරමුදල් රැස් කිරීම යනාදිය
- ඉලෙක්ට්‍රොනික මූලික ප්‍රසිද්ධ නිකුතු (ඊ-අයිපීඕ)
- ඉලෙක්ට්‍රොනික මූලික ප්‍රසිද්ධ නිකුතු සඳහා දායකත්වය
- ඉලෙක්ට්‍රොනික ද්වාර (ඊ-ද්වාරය): සේවාලාභීන්ට ඔහුගේ/ඇයගේ සීඩීඑස් ගිණුමට සෘජුවම ප්‍රවේශ වී අවශ්‍ය විස්තර ලබා ගැනීමේ ක්‍රමවේදය
- වෙනත් රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල වල වෙබ් ද්වාර - ඇතුළත් වීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ රටට වැඩි විදේශ විනිමය ගලා ඒමක් ඇති කිරීමේ අරමුණින් වෙනත් රටවල්වල පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වල වෙබ් ද්වාර පිහිටුවනු ඇත.

### බී. කොළඹ කොටස් හුවමාරුවෙහි OTC ගනුදෙනු වේදිකාව හරහා කඩදාසි රත්තරන් (PG) හඳුන්වා දීමට පහසුකම් සැළසීම

රත්තරන් ආරක්ෂිතම ආයෝජන වත්කම් පන්තියක් ලෙස සැළකෙන අතර කඩදාසි රත්තරන් වෙළෙඳාම පහසු කිරීම සඳහා පාර්ශවකරුවන්ගෙන් යෝජනා ලැබී ඇත. ධඔක වේදිකාව හඳුන්වා දීමේ රාමුව සකස් කර අවසන් අදියරෙහි පවතින අතර එමගින් වෙළෙඳපොළ සඳහා නව ආයෝජන වත්කම් පන්තියක් ලබා දීමට සහ රජයට නව බදු ආදායම් මාර්ගයක් උත්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

### සී. විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් (SPAC) හරහා විකල්ප ලැයිස්තුගත කිරීමේ මාර්ගයක් හඳුන්වා දීමට පහසුකම්

විශේෂ අරමුණු මත අත්පත් කර ගැනීමේ සමාගම් යනු අලුතින් සංස්ථාපිත සමාගමක් වන අතර දැනට පවතින මෙහෙයුම් හෝ ඒ යටතේ ගැනෙන ව්‍යාපාර කිසිවක් නොමැති අනුග්‍රාහකයකු විසින් (හෝ කණ්ඩායමක්) ආරම්භ කරන ලද, ප්‍රසිද්ධ ව්‍යවසායකයින්, පුද්ගලික කොටස් හෝ කර්මාන්තයේ ප්‍රවීණයන් විසින් අත්පත් කර ගැනීම් එකක් හෝ කිහිපයක් සිදු කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද්දකි. එම අරමුදල් රැස් කරගනු ලබන්නේ කොටස් හුවමාරුවක් තුළ සිදු කරන කොටස්/ඒකක මූලික ප්‍රසිද්ධ නිකුතුවක් මගින් වන අතර එම අරමුදල් නව අත්පත් කරගැනීමට යොදා ගැනේ. මේ වන විට කොළඹ කොටස් හුවමාරුවත් සමඟ එක්ව SPACs ලැයිස්තුගත කිරීම් සක්‍රිය කිරීමේ ප්‍රතිපත්තිය සකස් වෙමින් පවතී.

### ඩී. සමූහ අරමුදල් සම්පාදන වැනි මාර්ගගත ක්‍රමවේද හරහා අරමුදල් රැස් කිරීමට පහසුකම් සැළසීම

සමූහ අරමුදල් සම්පාදන යනු නිශ්චිත ව්‍යාපෘතියක්, ව්‍යාපාරික කටයුතු යනාදිය සඳහා වෙබ් අඩවිය පදනම් කරගත් හෝ සමාජ ජාල වෙබ් අඩවියක් මගින් ආයෝජකයින් විශාල සංඛ්‍යාවකගෙන් අරමුදල් (සුළු ප්‍රමාණයන්) ඉල්ලා සිටීමේ ක්‍රමයකි.

වර්තමානයේදී, ඩිජිටල්කරණ වැඩසටහනේ දෙවන අදියරේ කොටසක් ලෙස හඳුන්වා දෙනු ඇතැයි අපේක්ෂා කරන ඊ-ගණුදෙනු හරහා කොටස්/ණය සමූහ අරමුදල් සම්පාදන ක්‍රම හඳුන්වා දීම සහ සම මට්ටමේ පුද්ගලයන් සඳහා ණය දීම හඳුන්වා දීමේ හැකියාව කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව ඇගයීමට ලක් කෙරෙන අතර එමගින් ප්‍රාග්ධනයේ පිරිවැය සහ අනෙකුත් අතරමැදි පිරිවැය පිරිවැය අවම කිරීමක් ද බලාපොරොත්තු වේ.

### ඊ. සුරැකුම්පත් ණයට ගැනීම හා ණය දීම තුළින් ආවරණය කරන ලද හිඟ විකුණුම් හඳුන්වා දීමට පහසුකම් සැළසීම

කොළඹ කොටස් හුවමාරුව තුළ ගෙවීම් කළ පසු බේරුම් කිරීමේ පද්ධතියක් (DVP) සහ වැඩි දියුණු කළ ආන්තික පද්ධතියක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව, සුරැකුම්පත් ණය ගැනීම සහ ණය දීම තුළින් ආවරණය වන් හිඟ විකුණුම් ක්‍රමය හඳුන්වාදීමට හැකි වන අතර එමගින් සාධාරණ මිලක් සොයා

# මෙහෙයුම් සමාලෝචනය

ගැනීම, ඉහළ වෙළෙඳපොළ ද්‍රවශීලතාවය සහ ඉහළ කේවල් කිරීමේ අවස්ථාවන් ද උදා කරයි. වර්තමානයේදී, ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ තාක්ෂණික යෙදවුම් සමග සුරැකුම්පත් ණයට ගැනීම සහ ණය දීම තුළින් හිඟ විකුණුම් හඳුන්වාදීමට අදාළ ප්‍රතිපත්තිය සකස් කර අවසන් කර ඇත.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපනය

2019 වර්ෂයේදී හඳුන්වා දුන් සංශෝධිත ප්‍රාග්ධන වෙළෙඳපොළ සුදුසුකම් රාමුව 2020 වසරේදී දී සාර්ථකව ක්‍රියාත්මක කරන ලද අතර එය වත්කම් පන්ති එකක් හෝ වැඩි ගණනක් සඳහා සහතිකලත් ආයෝජන උපදේශකයින්ගෙන් සමන්විත වේ. හිමිකම් සුරැකුම්පත්, ණය සුරැකුම්පත්, ව්‍යුත්පන්න සුරැකුම්පත් සහ ඒකක භාර එම වත්කම් පන්තිවලට උදාහරණ වේ. ලියාපදිංචි ආයෝජන උපදේශකයින් (RIA) සඳහා වන සුදුසුකම් රාමුව දැනට පවත්නා තත්ත්වයේ සිට සුරැකුම්පත් කර්මාන්තයේ සියලුම වත්කම් පංති ඇතුළත් කර පුළුල් සුදුසුකම් රාමුවක් දක්වා ඉහළ නංවා ඇති අතර, ආයෝජන උපදේශකයින් සඳහා වන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා අවශ්‍යතා සංශෝධනයවීමක් සිදු නොවිය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යභාරයේ කොටසක් ලෙස, බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකයෙකු ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා අනිවාර්ය අංගයන් වන ලියාපදිංචි ආයෝජන උපදේශකයින් (RIA) සහ සහතික ලත් හිමිකම් සුරැකුම්පත් උපදේශකයින් (CESA) සඳහා සහතිකපත්‍ර ලබාදීම්වල නිරත විය.


තවද, සංශෝධිත සුදුසුකම් රාමුව යටතේ කොටස් තැරැව්කාර සමාගම්වල ආයෝජන උපදේශකයින් සඳහා දැනට පවතින රාමුවට සමාන ව්‍යුහාත්මක සුදුසුකම් රාමුවක් ඒකක භාර කර්මාන්තයේ නිරතවූවන් සඳහා ද හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලදී. මෙම අනිවාර්ය අවශ්‍යතාවය සඳහන් කරමින් මේ හා සම්බන්ධ නියෝගයක් 2020 අගෝස්තු 14 වන දින ඒකක භාර කර්මාන්තයට බෙදා හරින ලදී. ඒ අනුව කිසියම් අපේක්ෂකයෙකු සහතිකලත් ඒකක භාර උපදේශක (CUTA) සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් අනිවාර්ය විෂයයන් හතරක් සමත් විය යුතුය. සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ (අදියර 1), ඒකක භාර (අදියර 5), මූල්‍ය සැලසුම්, උපදේශන සහ අලෙවිකරණ (අදියර 6) සහ සුරැකුම්පත් නියාමනය සහ ආචාර ධර්ම (අදියර 7) යනු එම අනිවාර්ය විෂය ඒකක 4යි. මෙම සහතිකය සම්පූර්ණ කිරීමෙන් පසු මාස 6 ක අදාළ කර්මාන්තයේ පළපුරුද්ද සහිත අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට (VIVA VOCE) මුහුණ දිය යුතු අතර සුදුසුකම් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ සංවර්ධන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට අවම වශයෙන් වසරකට CPD සම්මන්ත්‍රණ ලකුණු 4ක් වත් ලබා ගත යුතුය.

මීට අමතරව, බලපත්‍ර අහෝසි වී ඇති ආයෝජන උපදේශකයින් (RIA) නැවත ස්ථාපනය කිරීම සඳහා වාර්ෂික CPD අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම සහ ඔවුන්ගේ ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය අළුත් කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් වෙත තවත් නියෝගයක් 2020 ජූලි 10 වන දින යවනු ලැබීය. ඒ අනුව වසර පහකට නොඅඩු කර්මාන්ත පළපුරුද්දක් ඇති ආයෝජන උපදේශකයින් නැවත බලපත්‍ර ලබා ගැනීමේ විභාගය සහ ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය ලැබා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය (VIVA VOCE) යන විභාග දෙකම සමත් විය යුතුය. අවුරුදු 5-10 අතර කර්මාන්ත පළපුරුද්දක් ඇති ආයෝජන උපදේශකයින් පළමුව RIA තත්ත්වය අළුත් කිරීම සඳහා RIA VIVA VOCE විභාගයට මුහුණ දිය යුතු අතර වසර 1 ක කාලයක් තුළ නැවත බලපත්‍ර ලබා ගැනීමේ විභාගය සමත් විය යුතුය. වසර 10 කට වැඩි කර්මාන්ත පළපුරුද්දක් ඇති ආයෝජන උපදේශකයින්ට RIA VIVA VOCE විභාගයකට පමණක් මුහුණ දීමෙන් ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය නැවත ස්ථාපනය කළ හැකිය.

තවද, COVID-19 වසංගතයෙන් පසු පෙර නොවූ විරූ තත්ත්වය හේතුවෙන් බලපත්‍රලාභී / ලියාපදිංචි ආයතන මුහුණ දී ඇති යම් යම් නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලවීමට ඇති බාධක සහ පරිපාලනමය අභියෝගයන් සැලකිල්ලට ගෙන, CPD අවශ්‍යතාවය සපුරාලීමේ අනිවාර්ය කොන්දේසිය සැපිරීම සඳහා සියලුම ආයෝජන උපදේශකයින් පෙර සුදුසුකම් රාමුවට මාරු කළ අතර නව සුදුසුකම් රාමුව 2021 ජුනි 30 දක්වා මාස හයකින් දීර්ඝ කරන ලදී. මේ සම්බන්ධයෙන් 2020 අප්‍රේල් 30 දින නියෝගයක් නිකුත් කරන ලදී.

රජය විසින් පනවනු ලැබූ රට වසා දැමීමේ (Lockdown) කාල සීමාව අවසන් වීමෙන් පසු, පාඨමාලා හතරම, එනම් ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතිකය (CCM), ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමාව (DCM), ආයෝජන පාඨමාලාව (PI), ආයෝජන පිළිබඳ උසස් පාඨමාලාව (API) සහ RIA VIVA VOCE විභාග බාධාවකින් තොරව ඔන්ලයින් ක්‍රමයට Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD) ද එම ක්‍රමයටම Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. තවද, 2020 වර්ෂයේ ආරම්භයේදී මෙන්ම අවසාන කාලසීමාව තුළ සාමාන්‍ය පරිදි පන්ති කාමර තුළ දේශන පැවැත්වීමත්, ප්‍රශ්ණ පත්‍රවලට පිළිතුරු ලිවීම පදනම් කරගත් විභාග සහ VIVA VOCE විභාග ද පවත්වන ලදී. (රූප සටහන 02)

රූප සටහන 02: වත්මන් සුදුසුකම් රාමුව




### ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව (CCM), හිමිකම් සුරැකුම්පත් සහතිකය (CES), ණය සුරැකුම්පත් සහතිකය (CDS), හා ඒකක භාර සහතිකය (CUT)

ප්‍රාග්ධන ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයින්ට අමතරව කර්මාන්තයේ නොවන පුද්ගලයින්, විශේෂයෙන්ම පාසල් හැරගිය අය, උපාධි අපේක්ෂකයින් ඇතුළු වෙනත් අංශවල වෘත්තිකයන් CCM පාඨමාලාව හැදෑරීම සඳහා අඛණ්ඩ උනන්දුවක් පෙන්නුම් කළ අතර පාඨමාලා සඳහා බඳවා ගැනීම් ද සිදු කළෙමු. (සංඛ්‍යා සටහන 10, 11)

සංඛ්‍යා සටහන 10: සංඛ්‍යා දත්ත කාර්ය සාධනය

| ලියාපදිංචි මුළු ගණන | සුරැකුම්පත් වෙළෙඳපොළවල් සහ උපකරණ සම්පූර්ණ කළ සංඛ්‍යාව | අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | ඒකක භාර අදියර සම්පූර්ණ කළ සංඛ්‍යාව | මූල්‍ය සැළසුම්කරණය, උපදේශනය හා අලෙවිකරණය අදියර | සුරැකුම්පත් නියාමනය හා ආචාරධර්ම අදියර |
|---|---|---|---|---|---|---|
| 54 | 18 | 16 | 2020 වර්ෂය තුළ විභාග නොපවත්වන ලදි | 2020 වර්ෂය තුළ විභාග නොපවත්වන ලදි | 11 | 13 |

# මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා සටහන 11: VIVA VOCE විභාග සංඛ්‍යා දත්ත කාර්ය සාධනය

| පාඨමාලාව | සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
|---|---|---|
| ලියාපදිංචි ආයෝජන උපදේශක | 16 | 62.5 |
| සහතිකලත් හිමිකම් සුරැකුම්පත් උපදේශක | 2 | 100 |
| නැවත ප්‍රතිස්ථාපන කළ සංඛ්‍යාව | 5 | 60 |

### ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා (DCM)

මෙම වසරේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, එක්සත් රාජධානියේ සුරැකුම්පත් සහ ආයෝජන සඳහා වරලත් ආයතනය (CISI) සමඟ ඒකාබද්ධව ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන ගියේය. 13 වන කණ්ඩායමේ දේශන සියල්ල අවසන් කර



තුෂාර ජයරත්න මහතා
අධ්‍යක්ෂ, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන



සජීවනී බක්මීදෙණිය මහත්මිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන

2020 පෙබරවාරි මාසයේදී නව කණ්ඩායමක් (කණ්ඩායම 14) ආරම්භ කරන ලද අතර සිසුන් 17 දෙනෙකු මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වී සිටියේය.

### අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, දේශීය හා ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළවල නවතම ප්‍රවණතා සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදීමට සහ තොරතුරු යාවත්කාලීන කිරීමට හැකිවන පරිදි කොටස් තැරැව්කාර සමාගම්වල දැනට සිටින ආයෝජන උපදේශකයින් සඳහා CPD වැඩසටහන් හයක් පවත්වන ලදී. වැඩසටහන් හයෙන් තුනක්ම පැරණි සුදුසුකම් රාමුවෙන් සංශෝධිත සුදුසුකම් රාමුවට මාරුවන ආයෝජන උපදේශකයින්ට අනිවාර්ය ඒවා විය. මෙම වැඩසටහන් සඳහා 900 කට අධික පිරිසක් සහභාගී වූ අතර එයට කොටස් තැරැව්කාර සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකයින් සහ විශ්ලේෂකයින් ද ඇතුළත් විය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දැනට සිටින ආයෝජන උපදේශකයින්ට ඊළඟ වසර සඳහා ඔවුන්ගේ RIA තත්ත්වය අළුත් කිරීම සඳහා අවම වශයෙන් වසරකට CPD සම්මන්ත්‍රණ ලකුණු 4 ක් ලබා ගැනීම අනිවාර්ය කර ඇත.

COVID-19 නිසා, භෞතිකව සිදු කරන ලද එක් CPD වැඩසටහනක් හැර සෙසු සියලුම CPD වැඩසටහන් ඔන්ලයින් ක්‍රමයට Zoom තාක්ෂණය හරහා සිදු කරන ලදී. (සංඛ්‍යා සටහන 12)

සංඛ්‍යා සටහන 12: CPD වැඩසටහන් වල සාරාංශය: 2020 වර්ෂය

| වැඩසටහනේ මාතෘකාව | සහභාගීකරුවන් සංඛ්‍යාව |
|---|---|
| සුරැකුම්පත් වෙළෙඳපොළ සහ උපකරණ | 99 |
| යෝජිත DVP ව්‍යාපාර සහ මෙහෙයුම් ආකෘතිය විශේෂ ලක්ෂණ සමඟ හඳුන්වාදීම | 200 |
| ඩිජිටල්කරණය | 212 |
| දේපොළ ආයෝජන භාර | 151 |
| යෝජිත DVP ව්‍යාපාර සහ මෙහෙයුම් ආකෘතිය විශේෂ ලක්ෂණ සමඟ හඳුන්වාදීම (නැවත) | 55 |
| සුරැකුම්පත් වෙළෙඳපොළ උපකරණ | 188 |
| ශ්‍රී ලංකාවේ ඒකක භාර කර්මාන්තය පිළිබඳ හඳුන්වාදීම සහ එහි දැක්ම | 231 |

### ආයෝජක පාඨමාලාව

කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයින් සඳහා කොටස් ගණුදෙනු පිළිබඳව මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමේ අරමුණින් සති හයක් පුරා වසර තුළ ඉංග්‍රීසි මාධ්‍ය වැඩසටහන් දෙකක් පවත්වන ලදී. මෙම පාඨමාලාවේ 24 වන සහ 25 වන කණ්ඩායම් පිළිවෙලින් 2020 පෙබරවාරි සහ අගෝස්තු මාසවලදී ආරම්භ කරන ලදී. වර්ෂය තුළ මෙම වැඩසටහන් සඳහා සහභාගිවන්නන් 47 දෙනෙකු ලියාපදිංචි කර ඇත.

### උසස් ආයෝජක පාඨමාලාව

දැනට ආයෝජනයෙහි නිරතවන්නන් සඳහා කොටස් වෙළෙඳපොළ ආයෝජනය හා සම්බන්ධ උසස් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දීමේ අරමුණින් ඉහත වැඩසටහන ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ලදී. වර්ෂය තුළ මෙම වැඩසටහන සඳහා සහභාගිවන්නන් 49 දෙනෙකු ලියාපදිංචි කර ඇත.

### රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ලබාදීමේ ව්‍යාපෘතිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ අප රන් පදක්කම් සහ මුදල් ත්‍යාග ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන ගිය අතර, විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිත විෂයයන් හැදෑරීමට උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීම සඳහා එය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ ක්ෂේත්‍රයේ දක්ෂතා දක්වන උපාධි අපේක්ෂකයින්ට රන් පදක්කමක් සහ මුදල් ත්‍යාගයක් පිරිනමනු ලැබේ. ඉහත ව්‍යාපෘතියට අදාළව ජාතික විශ්ව විද්‍යාල එකොළහක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.

පවත්නා COVID-19 වසංගතය හේතුවෙන් ඇති වූ සීමාවන් හේතුවෙන් බොහෝ ජාතික විශ්ව විද්‍යාල වලට සාර්ථකව විභාග පැවැත්වීමට නොහැකි වූ අතර 2020 වර්ෂය තුළ රන් පදක්කම සහ මුදල් ත්‍යාගයක් හිමි වූයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පමණි.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය

දැනුම මත පදනම් වූ දැනුම පදනම් කරගත් ආයෝජක ප්‍රජාවක් නිර්මාණය කිරීම ප්‍රාග ්ධන වෙළෙඳපොළක තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බව අප තරයේ විශ්වාස කරන බැවින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ නියාමකයා ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සෑම විටම උත්සාහ කරන්නේ රටේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමටය. එහි ප්‍රතිඵලයක් ලෙස 2008 දී ශ්‍රී ලංකාවේ සියළුම ජාතික විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන දියත් කරන ලද අතර එය අඛණ්ඩව යාවත්කාලීන කරමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු, දත්ත සහ වෙනත් අධ්‍යාපන මෙවලම් අපේක්ෂා කරන අධ්‍යයන කාර්යමණ්ඩලවලට මෙන්ම උපාධි අපේක්ෂකයින්ට විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් ලබාදීමට කටයුතු කරන ලදි. ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සිදුකරන පර්යේෂණ මෙන්ම අධ්‍යයන සඳහා අවශ්‍ය දැනුම මෙන්ම ආයෝජනය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම මෙම ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථානය පිහිටුවීමේ මූලික අරමුණයි. වර්තමානයේදී අප එහි වෙබ් අඩවිය වැඩිදියුණු කිරීම් සිදුකරමින් පසුවේ.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත්භාවය සහ බාහිර සම්බන්ධතා

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලික මෙහෙවර ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමයි. උගත් ආයෝජකයෙකුට දැනුවත් ආයෝජන තීරණ ගැනීම පහසු වන අතර සුරැකුම්පත් වංචාවන්ට ගොදුරු වීමේ අවදානම ද අඩු වනු ඇතැයි අපගේ අදහසයි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඥානවත්ව ආයෝජනය කරන්නේ කෙසේද සහ ඔවුන්ගේ ආයෝජන ආරක්ෂා කරගන්නේ කෙසේද යන්න පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීමට විවිධ ක්‍රමවේද භාවිතා කළ අතර සම්මන්ත්‍රණ, වැඩමුළු, අධ්‍යාපනික ලිපි ලේඛණ බෙදාහැරීම, ඩිජිටල් සහ මුද්‍රිත මාධ්‍ය ඇතුළු විවිධ අංශ හරහා එම ක්‍රමවේද දියත් කරන ලදී.

### කෙටි සජීවිකරණ වීඩියෝ දර්ශන මාලාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හා කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාලයන් වන ෆේස්බුක්, යූටියුබ්, ට්විටර් යනාදිය හරහා බෙදා හැරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව භාෂා ත්‍රිත්වයෙන්ම කෙටි සජීවිකරණ වීඩියෝ දර්ශන හතරක් නිෂ්පාදනය කරන ලදී. මෙම ශ්‍රව්‍ය දෘශ්‍ය සම්පත් හරහා දුර, භාෂාව සහ සංස්කෘතියේ ඇති බාධක ජය ගනිමින් දැනුම ලබා දීම සඳහා ඕනෑම වේලාවක, ඕනෑම තැනකට පිවිසිය හැකි අතර එය වඩා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමයකි. මීට අමතරව, මෙම වීඩියෝ දර්ශන බහුකාර්ය සහ අන්තර්ක්‍රියාකාරී බැවින් එහි අවසාන පරිශීලකයින්ට එය ඉතා ඵලදායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කොළඹ කොටස් හුවමාරුවේ විවිධ පුවරුවල ලැයිස්තුගත කිරීමේ ප්‍රතිලාභ, ක්‍රම සහ ක්‍රියාවලිය පිළිබඳව ලැයිස්තුගත කිරීමට හැකියාවක් ඇති සමාගම් දැනුවත් කිරීම සඳහා, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් "ඔබේ සමාගමේ වටිනාකම පෙන්නුම් කරන්න" යන තේමාව යටතේ පැහැදිලි කිරීමේ වීඩියෝවක් ඉංග්‍රීසි භාෂාවෙන් නිෂ්පාදනය කරන ලදී.

### කෙටි සජීවිකරණ වීඩියෝ දර්ශන මාලාව



Meet Your Stockbroker - Hear it from Your Registered Investment Advisor



[illegible]

# මෙහෙයුම් සමාලෝචනය

## කෙටි සජීවීකරණ වීඩියෝ දර්ශන මාලාව




Invest at Every Age - Hear it from Supun and Tharindu..




ආයෝජනය ඕනෑම අයෙකුට වැදගත් බව ඔබ දන්නවාද?




முதலீடு எல்லா வயதினருக்கும் பொருந்தும்




பங்குத்தரகரை சந்தித்தல்




ඔබගේ කොටස් තැරැව්කරු හමුවන්න



Unlock the Value of Your Company

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ ලෝක බැංකු අරමුදල් සමඟ භාෂා තුනෙන්ම වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කළේය. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන (CME) අංශයේ වෙබ් අඩවිය, ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන (CMIC) සහ ආයෝජකයින්ට තොරතුරු ලබාගැනීම සඳහාම වෙන්වූ වෙබ් පිටු (URL) දෙකකින් එම වෙබ් අඩවි සමන්විත වේ. "ඉන්වෙස්ටර් කෝනර්" යනු දැනුවත් ආයෝජන තීරණ ගැනීමට සහාය වීම සඳහා දැනට ආයෝජනයෙහි නිරත සහ අනාගතයේදී ආයෝජනය කිරීමට කැමැත්තෙන් පසුවන ආයෝජකයින් සඳහා වැදගත් තොරතුරු අන්තර්ගත විශේෂිත වෙබ් පිටුවකි. (URL).

ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය ප්‍රචලිත කිරීම සහ ඒ සම්බන්ධයෙන් සිදුකෙරෙන සමීක්ෂණ දිරිගැන්වීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ජාතික විශ්ව විද්‍යාලවල ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන (CMIC) පිහිටුවා ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ සමීක්ෂණයන් පිළිබඳ වැඩිදුර අවබෝධයක් ලබා ගැනීමට මෙන්ම ආයෝජනය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන අධ්‍යයන කාර්යමණ්ඩලවලට සහ උපාධි අපේක්ෂකයින්ට ප්‍රාග්ධන වෙළඳපොළ තොරතුරු, දත්ත සහ වෙනත් අධ්‍යාපන මෙවලම් ලබා දෙන විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු මධ්‍යස්ථාන හරහා ලබාදීමට අපේක්ෂා කරයි. මෙම වෙබ් පිටුව (URL) මගින් විශ්ව විද්‍යාල සිසුන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා සම්පත් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ඉංග්‍රීසි වෙබ් අඩවිය 2020 සැප්තැම්බර් 17 වන දින කොළඹ කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණ වැඩසටහනට සමගාමීව දියත් කරන ලදී. තවද සිංහල සහ දෙමළ වෙබ් අඩවි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් සිටී.

## සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත සමාජ මාධ්‍යය පැමිණීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය තුළ දී "ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය හා දැනුවත්භාවය" නමින් සමාජ මාධ්‍යය ගිණුමක් සාර්ථකව දියත් කරන ලදී. එමගින් අපට වැදගත් නියාමන හා ආයෝජක අධ්‍යාපන තොරතුරු බෙදා හැරීමටත් මෙන්ම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ශක්තිමත් වෙළෙඳ නාම ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමටත් හැකි වී තිබේ. මෙම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සමාජ මාධ්‍යය ජාලයට ෆේස් බුක් පිටුවක්, ට්විටර් ගිණුමක් සහ යූ ටියුබ් චැනලයක් ඇතුළත් වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමාජ මාධ්‍ය ජාලය දියත් කර මාස 3 ක් ඇතුළත අනුගාමිකයින් විශාල සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සමත් විය.

## වෙළෙඳපොළ පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සඳහා පහසුකම් සැපයීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් කොමිෂන් සභා සාමාජිකයින්, ලංකා වාණිජ මණ්ඩලය, නීති සමාගම් සහ කොටස් තැරැව්කාර සමාගම්වල නියෝජිතයින් හමුවිය. අන්‍යෝන්‍ය සහයෝගීතාවය සම්බන්ධයෙන් වන ගැටළු සාකච්ඡා කිරීම සඳහා පවත්වනු ලබන රැස්වීම් මාලාවේ කොටසක් ලෙස මෙම සාකච්ඡාව පැවැත්විණි. මෙම රැස්වීම් අතරතුර, සහභාගිවන්නන්ට වෙළෙඳපොළ සංවර්ධනය සම්බන්ධයෙන් මතුවන විමසීම් සහ යෝජනා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ද හැකි විය.

## මාධ්‍යය භාවිතය

### මුද්‍රිත මාධ්‍යය

කොළඹ කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සමගාමීව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කොළඹ කොටස් හුවමාරුව සමඟ එක්ව ඩේලි මිරර්, ඩේලි එෆ්. ටී සහ සන්ඩේ ටයිම්ස් සහ ද මෝනිං යන පුවත්පත්වල, පුවත්පත් අතිරේකයන් ප්‍රකාශයට පත් කරන ලදී. කොටස් වෙළෙඳපොළ ඩිජිටල්කරණයේ ප්‍රතිඵලයක් ලෙස ආයෝජකයින්ට, ලයිස්තුගත සමාගම්වලට, කොටස් තැරැව්කරුවන්ට සහ කොටස් හුවමාරුවට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් එම ප්‍රකාශනවල අඩංගු විය.



තුෂාර ජයරත්න මහතා
අධ්‍යක්ෂ, බාහිර සම්බන්ධතා



මීනා ගුණරත්න මෙනවිය
කළමනාකාරිනී, බාහිර සම්බන්ධතා

කොළඹ කොටස් වෙළෙඳපොළ අළුතින් හඳුන්වාදුන් මොබයිල් ඇප් පහසුකම හරහා ආයෝජකයින්ට ලබා ගත හැකි ප්‍රතිලාභ පැහැදිලි කිරීම සඳහා "අනාගතයට දැවැන්ත පිම්මක්" යන තේමාව යටතේ චිත්‍රකථාවක් පුවත්පත්වල භාෂා තුනම ආවරණය වන පරිදි පළකරන ලදී.

වර්ෂය තුළදී, නියාමන ක්‍රියාකාරකම්, බලාත්මක පියවරයන්, මහජනතාව දැනුවත් කිරීමේ ගැටළු පිළිබඳ දැන්වීම් සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන කටයුතු පිළිබඳව අප මාධ්‍ය නිවේදන මගින් ප්‍රසිද්ධියට පත් කළෙමු.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම

මේ වන විට 9 වන ශ්‍රේණියේ සිට ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය පාසල් විෂය මාලාවට ඇතුළත් කර ඇත. ආයෝජනය යනු ධනය ගොඩනගා ගැනීමට සහ අනාගතය සඳහා ඉතිරි කිරීමට වැදගත් ක්‍රමයකි. කුඩා අවධියේදී ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය ඇතුළත් කිරීම ඔවුන්ට වඩා හොඳ මූල්‍ය තීරණ ගැනීමට ඉවහල්වන අතර වැඩිහිටියන් ලෙස ජීවිතයේ පසුකාලීනව වඩා හොඳ මූල්‍ය ප්‍රතිඵලයන් ලබා ගැනීමටද එමගින් හැකියාව ලැබේ.

# මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාග්ධන වෙළෙඳපොළ විෂය 2023 සිට 6 වන ශ්‍රේණියේ සිට පාසල් විෂය මාලාවට සහ ජාතික විශ්ව විද්‍යාල විෂය මාලාවට ඇතුළත් කිරීම සඳහා ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල සහ දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සමඟ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සාකච්ඡා පවත්වන ලදි.

## සම්මන්ත්‍රණ සහ වැඩමුළු හරහා සිදු කළ දැනුවත් කිරීම

මූල්‍ය දැනුවත්භාවය ව්‍යාප්ත කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගුරුවරුන්, සිසුන්, උපාධි අපේක්ෂකයින් සහ සමාජයේ විවිධ කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කරන ලදී. (සංඛ්‍යා සටහන 13)

සංඛ්‍යා සටහන 13: දැනුවත් කිරීමේ වැඩසටහන්

| වැඩසටහනේ නම | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ගුරුභවතුන් සඳහා පැවැති වැඩසටහන් (භාෂා ත්‍රිත්වයෙන්ම) | 08 |
| පාසල් සිසුන් සඳහා පැවැති වැඩසටහන් (භාෂා ත්‍රිත්වයෙන්ම) | 04 |
| උපාධි අපේක්ෂකයන් සඳහා පැවැති වැඩසටහන් (භාෂා ත්‍රිත්වයෙන්ම) | 02 |
| අනෙකුත් | 01 |





## Core (Coherent, Open Responsive and Effective) Justice වැඩසටහන


නීති හා බලාත්මක කිරීමේ අංශය විසින්, ශ්‍රී ලාංකීය නීති වෘත්තියේ පාලනය, සුදුසුකම් හා විවිධත්වය වැඩිදියුණු කිරීම උදෙසා රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ තෝරාගත් සිසුවියන් සඳහා දේශීයකරණය කළ අධ්‍යයන චාරිකා දෙකක් සඳහා පහසුකම් සලසන ලදී. USAID සමග එකතුව සිදුකෙරුණ මෙම වැඩසටහන පැවැත්වුනේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වැනි ආයතන (මෙම අධ්‍යයනයේ අවධානය යොමු කෙරෙන ප්‍රධාන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තෝරාගෙන තිබීම නිසා) වල කාර්යයන් දැකබලාගෙන ඒවායේ නීති ක්ෂේත්‍රයේ ඇති රැකියා අවස්ථා පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට සිසුන් බලගැන්වීම සඳහායි.

## ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO) සමඟ සම්බන්ධ වීම

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO හි සාමාන්‍ය සාමාජිකයෙකු වන අතර වර්ධනය හා නැගී එන වෙළෙඳපොළ කමිටුවේ (GEMC) සහ ආසියා පැසිෆික් කලාපීය කමිටුවේ (APRC) සාමාජිකයෙකි. IOSCO හි බොහෝ කාර්යයන් සිදුවන්නේ එහි ප්‍රතිපත්ති කමිටුවල වන අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒවායින් සමහරක් සඳහා සහභාගී වේ. බලාත්මක සහ තොරතුරු හුවමාරු කමිටුව (4 වන කමිටුව) හා සුළු පරිමාණ ආයෝජකයන් සඳහා වන කමිටුව (8 වන කමිටුව) ඉන් ප්‍රධාන වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව IOSCO අවබෝධතා ගිවිසුමට ද අත්සන් කළ සාමාජිකයෙකි. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙම ප්‍රතිපත්ති කමිටු දෙකේ රැස්වීම්වලට ක්‍රියාකාරීව සහභාගී වන අතර එමගින් පවත්වනු ලබන සමීක්ෂණ සහ ප්‍රශ්නාවලිවලට ප්‍රතිචාර දැක්වීම තුළින් විවිධ වැඩ කටයුතුවලට දායක වේ.


## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජ මාධ්‍ය තුළින් දැනුවත් කිරීම
















# මෙහෙයුම් සමාලෝචනය

## ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමාජ මාධ්‍ය තුළින් දැනුවත් කිරීම






















කොටස් වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ලබා ගැනීමේදී..
SEC


සමාජ මාධ්‍ය
Social Networks
SEC


எப்பொழுதும் விழிப்புடன் இருங்கள்
SEC
SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA


11 Important Things to Analyze in an Annual Report
1. Vision and mission statements of the company
2. Corporate information
3. Chairman's report
4. Products/services overview and financial highlights in last 5 to 10 years
5. Auditors report
6. Income statement and Balance sheet
7. Cash flows statement
8. Contingent liabilities and auditor qualifications, if any
9. Management discussion and analysis (MDA)
10. Report on Corporate governance
11. Information on shares of the company
SEC


ඒකක භාර (යුනිට් ට්‍රස්ට්) ආයෝජනයේ මූලික ලක්ෂණ
SEC
costs


இலங்கை பிணையங்கள்
DID YOU KNOW?
SEC
SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA


Top EIGHT Factors to Avoid When Investing
No trading plan
Not doing due diligence
Blindly following the crowd
Holding on to losses
Lack of knowledge
Trying to get rich quick
Taking profits early
Going YOLO
#YOLO

# මෙහෙයුම් සමාලෝචනය

## මානව සම්පත්

පැවරී ඇති කාර්යභාරය විශිෂ්ට අයුරින් ඉටුකිරීමේ අරමුණ ඇතිව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සෑම විටම උත්සාහ දරණුයේ නිසි වේලාවට නිවැරදි තනතුරු සඳහා නිවැරදි පුද්ගලයින් බඳවා ගැනීමට ය. සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ මානව ප්‍රාග්ධනයට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීම හා නියාමනය කිරීම භාර දී ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී දැනුම, කුසලතා සහ නිපුණතා ඇති ජවසම්පන්න, ඉහළ දක්ෂතා ඇති වෘත්තිකයින්ට සැළකිය යුතු කාර්යභාරයක් පැවරී ඇත.

## කාර්ය මණ්ඩලය

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිය සේවකයින්ට වඩා ආරක්ෂිත, සහ හිතකර පරිසරයක් සපයන අතර අභියෝගාත්මක අවස්ථාවන්හිදී අත්දැකීම් ලබා ගැනීමට, සේවා තෘප්තිය වැඩි කිරීමට සහ සමබර ජීවිතයක් ගත කිරීමට සේවකයින්ට හිතකර රැකියා ස්ථාන සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ, අධ්‍යක්ෂ - අධීක්ෂණ තනතුර පිරවීම සඳහා සුදුසුකම් ලත් පළපුරුද්දක් ඇති සේවකයෙකු බඳවා ගැනීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සමත් විය. එමෙන්ම සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සහකාර කළමනාකරුවන් තිදෙනෙකු ද බඳවා ගන්නා ලදී. තවද, බාහිර අධ්‍යක්ෂවරුන් සමඟ තරඟ කළ අභ්‍යන්තර අපේක්ෂකයින් තිදෙනෙකු මුදල් අංශයේ අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ මානව සම්පත් සහ සහකාර අධ්‍යක්ෂ විමර්ශන යන තනතුරු සඳහා පත් කරන ලදී.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සෑම අංශයකින්ම මනා විනයකින් යුත් කණ්ඩායමකින් සමන්විත වන අතර අපගේ උපාය මාර්ග සහ ප්‍රතිපත්ති තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට අපි උත්සාහ කරමු. එපමණක් නොව, කාර්ය මණ්ඩලය තුළ ඔවුන්ගේ ඇති කැපවීම සහ වෘත්තීයමයභාවය අගය කිරීමටත්, ඊට ගෞරව කිරීමටත්, ඔවුන් රැකබලා ගැනීමටත් අප සෑම විටම කටයුතු කරන්නෙමු.

## සේවක තෘප්තිය සහ චිත්ත ධෛර්යය වැඩි දියුණු කිරීම

ආයතනයේ වසර ගණනාවක සේවාව මෙන්ම ඔවුන්ගේ කාර්යසාධනය හේතුවෙන් නිසි ලෙස පිළිගත් සේවකයින්ට රැකියා තෘප්තියක් ලැබෙන අතර වඩා හොඳින් ක්‍රියා කිරීමට පෙළඹවීමක් ද ඇති කරයි.

සමාලෝචනයට ලක් කළ වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද මානව සම්පත් කමිටුවක් සේවක පැතිකඩයන් පරීක්ෂා කළ අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ විවිධ විෂය ක්ෂේත්‍රයන්හි පළපුරුද්ද ලැබූ වෘත්තිකයින් කිහිප දෙනෙකුගේ දීර්ඝ සේවා කාලය හේතුවෙන් උසස් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීය.


## විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

2020 මාර්තු මාසයේදී හිටපු අධ්‍යක්ෂ ජනරාල් වජිර විජේගුණවර්ධන මහතා මුදල් අමාත්‍යාංශයට මාරු කරන ලද අතර මුදල් අමාත්‍යතුමා විසින් එවකට සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ නඩු කටයුතු අංශයේ අධ්‍යක්ෂ නීතිඥ චින්තක මෙන්ඩිස් මහතා අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කරන ලදී.


තවද, 2020 අප්‍රේල් මාසයේදී, විශ්‍රාම යාමෙන් පසු කොන්ත්‍රාත් පදනම මත සේවය කළ හිටපු මුදල් හා පරිපාලන අධ්‍යක්ෂක තුමියගේ කොන්ත්‍රාත්තුව අවසන් විය. ස්ථාවර කාලීන කොන්ත්‍රාත්තුවක් මත ලේකම් කාර්යාලයේ සේවය කළ සහ වයස අවුරුදු 60 ට වැඩි කාර්යාල සහායක නිළධාරිනියක් වෙනුවට නව කාර්යාල සහායකවරියක් පත් කරන ලදී.

2020 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ සහකාර කළමණාකරුවෙකු සහ සහකාර කළමණාකරුවෙකු ද වසර 6 ක් තුළ කාර්ය මණ්ඩල අස්වීම 6% ක් සහ කාර්ය මණ්ඩලය රැඳීම 94% ක් වශයෙන් තබා ගනිමින් ඉල්ලා අස්වීය. (රූප සටහන් 3, 4, 5, 6, 7), (සංඛ්‍යා සටහන 14)


රූපසටහන 3: ස්ත්‍රී/පුරුෂ සංයුතිය





රූපසටහන 4: සුදුසුකම් රාමුව




රූපසටහන 5: සේවා කාලය




රූපසටහන 6: වයස් විශ්ලේෂණය



රූපසටහන 7: පවත්නා ස්ථිර තනතුරුවල සංයුතිය




සංඛ්‍යා සටහන 14: 2019 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය

| තනතුරු | අමාත්‍යාංශය විසින් නියමිත දිනට අනුමත කරන ලද කාර්ය මණ්ඩලය | 2017 පෙබරවාරි 14 දින හා 2018 ජනවාරි 22 දින පැවති කොමිෂන් සභා රැස්වීම්වල තීරණ මත පදනම්ව ඉහළ නංවන ලද කාර්ය මණ්ඩලය | 2020.12.31 දිනට සමස්ත කාර්ය මණ්ඩලය | පවත්නා කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | | | ස්ථිර | තාවකාලික | |
| **විධායක කාර්ය මණ්ඩලය** | | | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | | 1 | 1 | | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 2 | 1 | | 1 |
| අධ්‍යක්ෂක | 11 | | 11 | 6 | | 5 |
| සහකාර අධ්‍යක්ෂ | 5 | 5 | 10 | 4 | | 6 |
| කළමනාකරුවන් | 8 | 10 | 18 | 7 | | 11 |
| ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරුවන් | | | | 19 | | |
| සහකාර කළමනාකරුවන් | 43 | 20 | 63 | 21 | | 20 |
| ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් | | | | 2 | | |
| විධායක ලේකම් | | | | 1 | | |
| විධායක/නිලධාරීන් | 11 | | 11 | 6 | | 5 |
| **විධායක නොවන** | | | | | | |
| රහස්‍ය ලේකම් | 6 | | 6 | 3 | | 1 |
| දුරකථන ක්‍රියාකරුවන් | | | | 2 | | |
| විධායක නොවන (අවශ්‍යතාව මත නම් කිරීමට නියමිත) | | 3 | 3 | - | | 3 |
| **සහාය කාර්ය මණ්ඩලය** | | | | | | |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | | | | 4 | | |
| කාර්යාල සහකාර | 10 | | 12 | 1 | | 2 |
| කාර්යාල සහායක/රියදුරු | | 2 | | 4 | 1 | |
| එකතුව | 96 | 41 | 137 | 82 | 1 | 54 |

# මෙහෙයුම් සමාලෝචනය

## සේවක සුබසාධක

2020 අගෝස්තු මාසයේදී, පශ්චාත් කොවිඩ් -19 මාස තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ලේකම් කාර්යාලය සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද සාමූහික උත්සාහය අගය කිරීම සඳහා කාර්ය මණ්ඩලය සඳහා උත්සවයක් සංවිධානය කරන ලද අතර එමගින් කාර්ය මණ්ඩලයට තම සගයින් සමග මිත්‍ර සබඳතා ඇති කර ගැනීමට සහ සුහදතාවය වර්ධනය කර ගැනීමට හැකි විය.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ මානව සම්පත් අංශය දැනට පවතින ශල්‍යකර්ම සහ රෝහල් ගත කිරීමේ රක්ෂණ ආවරණ සීමා වැඩි කිරීමට උත්සාහ කළේය. තවද, ඇතැම් බරපතල රෝගාබාධ සඳහා ජීවිත රක්ෂණ ආවරණයක් සහ රක්ෂණ ආවරණයක් ද කාර්ය මණ්ඩලය වෙත හඳුන්වා දෙන ලදී.

## පුහුණු හා සංවර්ධන

කාර්ය මණ්ඩලය ඕනෑම ආයතනයක ධනය වන හෙයින්, ජාත්‍යන්තර තලයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමේ නව ප්‍රවනතාවයන් හා ඉදිරියට යාම සඳහා අඛණ්ඩව සේවකයින් පුහුණු කිරීම හා වැඩිදියුණු කිරීම කෙරෙහි සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවධානය යොමු කරනු ලැබීය.

පුහුණුව තුළින් හිතකර රැකියා ස්ථානයක් නිර්මාණය කරන අතර කාර්ය මණ්ඩලයට අඛණ්ඩව ලබා දෙන පුහුණු පහසුකම් වල ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට තනිව සොයාගත නොහැකි පුහුණු සඳහා ප්‍රවේශය ලබා ගත හැකිය.

වසරේ පළමු මාස දෙක තුළදී, ජාත්‍යන්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සංවිධානය (IOSCO) විසින් ස්පාඤ්ඤයේ සහ මාලදිවයිනේ පැවැත්වූ වැඩසටහන් 2 කට කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙක් සහභාගී වූහ. ලොව පුරා ව්‍යාප්ත වූ COVID -19 වසංගතය හේතුවෙන් IOSCO, ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා (APEC) කමිටුව සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන විසින් 2020 වර්ෂය සඳහා සැළසුම් කර තිබූ අනෙකුත් සියලුම විදේශ පුහුණු වැඩසටහන් නොපැවැත්වුණි.

2020 වර්ෂය සඳහා සේවකයින් හට විදේශ පුහුණු ලබාදීමට රු. මිලියන 25 ක් අයවැයෙන් වෙන් කළද, එයින් වැය කර තිබුණේ රු. මිලියන 2.31 ක් පමණි.

කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළදී, දේශීයව සංවිධානය කරන ලද 2020 ආර්ථික සමුළුව සහ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාතික සමුළුව සඳහා කාර්ය මණ්ඩලයට සැබවින්ම සහභාගී වීමට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවස්ථා සළසා දුන්නේය. කෙසේ වෙතත් 2020 වර්ෂය තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දේශීය පුහුණුව සඳහා දළ වශයෙන් වැය කර තිබුණේ රුපියල් මිලියන 0.4 කි.

කෙසේ වෙතත්, පෙර වසරවල දී ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, රුසියාව යනාදී රටවල ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය හා සංවර්ධනය සම්බන්ධව පැවැත් වූ විවිධ වැඩසටහන් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවකයින් පුහුණුව ලබා ගන්නා ලදී. ඉහත සඳහන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම වෙනුවෙන් IOSCO, APEC සහ අනෙකුත් ජාත්‍යන්තර ආයතන වෙත අපගේ ප්‍රණාමය පුද කරමු. එවැනි වැඩ සටහන් හා වැඩමුළු සඳහා සහභාගී වීමට හැකි වීම තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දක්නට ලැබෙන වර්තමාන ප්‍රවනතාවයන්ට අනුකූලව කාර්ය මණ්ඩලයට තම දැනුම යාවත්කාලීන කර ගැනීමට හැකියාව ලැබුණි.

කාර්යමණ්ඩලයේ අධ්‍යාපනය සඳහා වූ කැපවීම විදහා දක්වමින් සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ පුහුණු අංශය, ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ පුළුල් පරාසයක දැනුම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අධ්‍යයන පාඨමාලා හැදෑරීමට අඛණ්ඩව අවස්ථා සළසයි. වරලත් මූල්‍ය විශ්ලේෂක ආයතනය ද කාර්ය මණ්ඩලයට වට්ටම් සහිත මිල ගණන් යටතේ පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්වයන් ප්‍රදානය කරන ලදී. එසේම සේවකයින්ට පශ්චාත් උපාධි ඇතුළු උසස් අධ්‍යයන කටයුතු සඳහා අනුග්‍රහය දක්වන අතර සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව උසස් අධ්‍යාපනය සඳහා සහ සාමාජික ගාස්තු වශයෙන් අනුග්‍රහකත්ව මත රු. මිලියන 2.2 ක් වැය කරන ලදී.

## සීමාවාසික පුහුණුව

2020 වර්ෂයේදී ද සුරැකුම්පත් සහ කොමිෂන් සභාව ජාතික විශ්ව විද්‍යාල වල උපාධි අපේක්ෂකයින් සඳහා සීමාවාසික පුහුණු අවස්ථා ප්‍රදානය කිරීමේ කාර්යය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. තවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සිසුන්ට සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි නියාමන කාර්‍යයන්ට අදාළ අත්දැකීම් ලබා දීම සඳහා අපි සීමාවාසික පුහුණුව ද ලබා දුන්නෙමු.



**මදුගයානි බලපිටිය මෙනවිය**

**සහකාර අධ්‍යක්ෂ, මානව සම්පත් සහ තොරතුරු තාක්ෂණ**



**රන්මිණි ජයතිලක මහත්මිය**

**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, තොරතුරු තාක්ෂණ**



**අසෝකා දයාරත්න මහත්මිය**

**කළමනාකාරිනී, මානව සම්පත්**

## තොරතුරු තාක්ෂණය

මාර්තු මැද සිට මැයි දක්වා කාලය තුළ රට පුරා අගුලු දැමීම හේතුවෙන් මෙන්ම ඔක්තෝම්බර් මාසයේ සිට ආරම්භ වන දෙවන කොවිඩ් -19 රැල්ලේ බලපෑම හේතුවෙන් ද සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ තොරතුරු තාක්ෂණ කාර්‍යයන්හි

නියුක්ත වූ කාර්ය මණ්ඩලයට වසර අවසානය ඉතා අභියෝගාත්මක කාල පරිච්ඡේදයක් විය. කෙසේ වෙතත්, දෙවන රැල්ල තුළදී "ගෙදර සිට වැඩ කරන" විසඳුම ක්‍රියාත්මක කිරීමට තොරතුරු තාක්ෂණ කණ්ඩායම සමත් විය.

ප්‍රාග්ධන වෙළෙඳපොළ තොරතුරු පුළුල් වශයෙන් ජනතාවට බෙදා හැරීම සඳහා තොරතුරු හා තාක්ෂණික වශයෙන් උසස් තත්ත්වයේ පරිශීලක හිතකාමී වෙබ් අඩවියක් ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සාර්ථකව දියත් කළේය.

තවද, වර්ෂය තුළදී, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන කාර්යයන් ඩිජිටල්කරණය කිරීමට මූලික පියවර ගනු ලැබිය.

## ව්‍යවස්ථාපිත අරමුදල්

### සෙස් අරමුදල

1991 අංක 26, 2003 අංක 18 , 2009 අංක 47 දරන පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14 ඒ සහ 14 බී යන වගන්තිවලට අනුව පහත ආකාරයෙන් සඳහන් කොට ඇත.

14 ඒ (1) බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සටහන් වී ඇති හෝ එහි නීතිරීති යටතේ දැනුම් දෙන ලද ගැනුම්කරු සහ විකුණුම්කරු යන දෙදෙනාම විසින් සිදුකරනු ලබන සෑම සුරැකුම්පත් මිලදීග නීමක් සහ විකිණීමක් සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනුපාතයකට අනුව වූ සෙස් බද්දක් නියම කිරීම, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් පන්ති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ඕනෑම ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

14 බී (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර 14 ඒ වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කල යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලින් පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට හැකියාව ඇත.



ජේ. පී. එන්. දිල්හානි මහත්මිය

**අධ්‍යක්ෂ, මූල්‍ය කටයුතු**



ලක්ෂ්මි වික්‍රමනායක මහත්මිය

**කළමනාකාරිනී, මූල්‍ය කටයුතු සහ පරිපාලන**

(ඒ) සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම

(බී) 38 වන වගන්තිය යටතේ ස්ථාපිත කොට ඇති වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා සහ

(සී) කොමිෂන් සභාවේ අරමුණු කරා ළඟාවීමේදී ඊට අවශ්‍ය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට

(3) සෙස් අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් ,කොමිෂන් සභාව තීරණය කරන ආකාරයකට ආයෝජනක කළ හැකිය.

### හිමිකම් සුරැකුම්පත් සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බදු ගෙවීම

කොළඹ කොටස් වෙළෙඳපොළ මාර්ගෝපදේශයන්ට අනුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හිමිකම් සුරැකුම්පත් සඳහා අය කරන ලද සෙස් බද්ද දෙවන වරටත් 2010 අගෝස්තු 1 දින සිට බලපැවැත්වෙන පරිදි එක් ගනුදෙනුවකට 0.09% සිට 0.072% දක්වා අඩු කර ඇත. පසුව අඩු කිරීම 2003 දෙසැම්බර් 1 දින සිට ක්‍රියාත්මක වූ අතර ඒ අනුව ගනුදෙනුවකට අදාළ සෙස් බද්ද 0.1% සිට 0.09% දක්වා අඩු ලරන ලදී.

තවද, 2017 ජුනි 27 දින සිට බලපැවැත්වෙන පරිදි එම ගනුදෙනු පරාසය රු. මිලියන 100ක් දක්වා වන ගනුදෙනු වලට අදාළ වන ලෙස වෙනස් විය. මීට පෙර එය පැවතියේ , 2011 ජනවාරි 01 දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50 ක් හා රුපියල් මිලියන 50 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු ලෙස වන අතර අයකරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය. අනතුරුව , 2017 ජුනි 27න් පසුව රු.මිලියන 100ක් දක්වා සහ රු. මිලියන 100 ට වඩා වැඩි වටිනාකමකින් යුත් ගනුදෙනු පරාසයන් සඳහා අයකරනු ලබන සෙස් බද්ද පිළිවෙලින් 0.072%ක, හා 0.045% ක විය.

ඊට අමතරව, ගනුදෙනුකරුවෙකු විසින් එකම තැරැව්කරුවකු හරහා එකම සුරැකුම්පත (හෝ ඊට පටහැනිව) මිලදී ගෙන විකුණන එක්දින දින වෙළෙඳාමේදී සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාවට ගෙවිය යුතු ගනුදෙනු ගාස්තුව 2006 පෙබරවාරි 15 සිට බලපැවැත්වෙන පරිදි ගනුදෙනුවේ එක් පැත්තකින් අය නොකෙරේ.

මිලදී ගත් මුළු කොටස් ප්‍රමාණය විකුණන ලද මුළු කොටස් ප්‍රමාණයට සමාන නොවන්නේ නම්, ඉහත විස්තර කර ඇති පරිදි ගනුදෙනු ගාස්තු මිලදී ගත් හෝ විකුණන ලද අඩු කොටස් ප්‍රමාණයෙන් අය නොකෙරේ. මිලදී ගත් මුළු ප්‍රමාණය විකුණන ලද මුළු ප්‍රමාණයට සමාන වන අවස්ථාවක දී, විකුණුම් ගනුදෙනුවෙන් ගාස්තු අය නොකෙරේ. එසේම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ගනුදෙනු ගාස්තුවෙන් නිදහස් කිරීම තීරණය කිරීම සඳහා එකම සුරැකුම්පත මත ගනුදෙනුකරුවෙකුගේ මුළු මිලදී ගැනීම් සහ විකිණීම් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, ගණුදෙනු වල දෙපැත්තෙන්ම 0.30% ක රජයේ කොටස් ගනුදෙනු බද්ද අය කෙරේ.

### සෙස් අරමුදලේ හැසිරීම

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් එයට බැර කරන ලදී. එමෙන්ම


# මෙහෙයුම් සමාලෝචනය

2009 සහ 2010 වසරවලදී වසරකට රු.මි.50 බැගින් සෙස් අරමුදලින් රුපියල් මිලියන 100ක් පියවීම් සහතික කිරීමේ අරමුදලට පවරන ලදී.

තවද රු.මිලියන 276ක්, රු.මිලියන 380ක්, රු.මිලියන 94ක්, රු.මිලියන 52ක් හා රු. මිලියන 312ක් වශයෙන් අවස්ථා 5 දී පිළිවෙලින් 2010, 2012 ,2013, 2019 හා 2020 යන වර්ෂයන්හි දී ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී. 2020 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 2,800.3/- ක් වන අතර එයින් රු. මිලියන 204.1ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. 969.9ක් මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. මිලියන 1425.8 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් (රිපෝ්හි) ආයෝජනය කර ඇත.

2010 වසරේ සිට 2020 වසර දක්වා සෙස් අරමුදලෙහි වර්ධනය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. (රූප සටහන 8)

රූපසටහන 08: සෙස් අරමුදල




### වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමඟම වන්දි අරමුදල ආරම්භ කරන ලදී. 1987 අංක 36 දරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 වැනි වගන්තිය යටතේ (සංශෝධනය කළ පරිදි) වන්දි අරමුදලක් පිහිටුවීම හා නඩත්තු කිරීම සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ව්‍යවස්ථාපිත වගකීමකි. ඒ අනුව වන්දි අරමුදල පවත්වාගෙන යාම සඳහා වන අරමුණු සහ මාර්ගෝපදේශ පහත පරිදි වේ.

38. (1) බලපත්‍රලාභී කොටස් තරව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයකුට වන්දි ප්‍රදානය කිරීම සඳහා මෙම වන්දි අරමුදල පිහිටුවන ලදී.

(2) එම වන්දි අරමුදලෙහි මෙසේ සඳහන් වේ;

(a) වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්.

(b) 51 අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබූ මුදල් (51 අ වගන්තිය යනු වරද සමතයකට පත් කිරීම සම්බන්ධයෙන් වූවකි)

(c) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් පනතේ 14ඕ වගන්තිය යටතේ සෙස් අරමුදලින් බැර කරන මුදල්

*2020 දෙසැම්බර් 31 දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් මිලියන 2,800.3/- ක් වන අතර එයින් රු. මිලියන 204.1 ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. 969.9ක් මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද රු. මිලියන 1425.8 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම් (රිපෝ්හි) ආයෝජනය කර ඇත.*

(3) වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට කොමිෂන් සභාව විසින් ආයෝජනය කළ හැකිය.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 39 (1) වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතු අතර එවැනි තක්සේරු කිරීමක් සම්බන්ධයෙන් කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය මෙන්ම මෙම පනතේ අරමුණු සඳහා තීරණාත්මක වේ.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධි විධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුවෙකු විසින් හිමිකම් පෑමට සහාය වන පරිදි ඉදිරිපත් කරන ලද ලේඛන සහ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසු හෝ එවැනි නඩු විභාගයක නිගමනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වූ ඕනෑම අවස්ථාවක කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීමට ඉඩ ඇත. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

## වන්දි අරමුදලෙහි හැසිරීම


වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේදී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50ක් වන්දි අරමුදලට බැර කරන ලදී.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී දඩ මුදල් ලෙස රු.මිලියන 36.3 ක මුදලක් වන්දි අරමුදල වෙත ලැබිණි.

2020 වර්ෂය අවසානය වන විට වන්දි අරමුදලේ ශේෂය රුපියල් මිලියන 540.6 ක් වූ අතර එයින් රු. මිලියන 39.6 ක් මාස දොළහක් තුළ කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල ද මාස 12 කට පසු කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල රුපියල් මිලියන 242.8 ක් ද ආයෝජනය කර ඇති අතර මිලියන 248.7 ක් සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල (රිපෝ හි) ආයෝජනය කර ඇත.

2010 සිට 2020 දක්වා කාලය තුළ අරමුදලේ සංචලනය පහත දැක්වේ. (රූප සටහන 9)

රූපසටහන 09: වන්දි අරමුදල




## පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස 22 ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගිකරුවන් අතර ගනුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.


(1) කොටස් ගනුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීම කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී, එනම් ගැනුම්කරු විසින් ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් සිදු කළ යුතු අතර විකුණුම්කරුට ඔ+3 පදනම මත එනම් ගනුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළඹෙන සිව්වන දිනයේදී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් කොටස් අයිතිය පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන් සුරක්ෂිත නොවන පියවීම් අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව ඇතිවිය.

(2) මෙම අරමුදලේ භාරකරුවන් නිළ බලයෙන් ඊට පත් වන අතර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති , කොළඹ කොටස් හුවමාරුවෙහි සභාපති , මහා භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි ප්‍රධාන විධායක නිලධාරී යන අය ඊට ඇතුළත් වේ.

(3) ශ්‍රී ලංකා රජය මෙම අරමුදල ස්ථාපිත කිරීම සඳහා රුපියල් මිලියන 50ක මුදලක් ප්‍රදානය කර ඇත. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූරක වශයෙන් පරිත්‍යාග තෑගී සහ ප්‍රදානයක් ලබාගත හැකි වේ. වර්තමානයේදී කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවක් නොමැත. (රූප සටහන 10)

# මෙහෙයුම් සමාලෝචනය

රූප සටහන 10: පියවීම් සහතික කිරීමේ අරමුදල




(4) කෙසේ වෙතත්, පියවීම් සහතික කිරීමේ අරමුදල, පියවීම් අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා පියවර ගෙන තිබේ. පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා ලැබී නොමැත.

## පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි හැසිරීම

අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වර්ෂයන්හිදී රුපියල් මිලියන 50 බැගින් වූ සමාන ප්‍රමාණ දෙකකින් රු. මිලියන 100 ක් සෙස් අරමුදලෙන් පියවීම් සහතික කිරීමේ අරමුදලට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාර ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් ද අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් ලබා දෙන ලදී.

2020 දෙසැම්බර් අවසානය වන විට පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි ශේෂය රුපියල් මිලියන 987.7 ක් වූ අතර එයින් රු. මිලියන 155.1 ක් මාස දොළහක් ඇතුළත කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති ඇත. මාස දොළහකට පසු කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 473.6 කි. රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු සඳහා රුපියල් මිලියන 300 ක් ආයෝජනය කර ඇති අතර සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජනය කර ඇති මුදල රු. මිලියන 30.4 කි.

2010 සහ 2020 කාලය තුළ අරමුදලේ සංචලනය පහත දැක්වෙන ප්‍රස්ථාරයේ දක්වා ඇත.

# අතිරේක තොරතුරු

2020 දෙසැම්බර් 31 දිනට බලපත්‍රලාභී සහ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන

## බලපත්‍රලාභී කොටස් වෙළෙඳපොළවල්

සීමාසහිත කොළඹ ව්‍යාපාරවස්තු හුවමාරුව

## බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්

1. ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්ගලික) ලිමිටඩ්
2. ආශා ෆිලිප් සෙකියුරිටීස් ලිමිටඩ්
3. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
4. ඇසෙට්ලයින් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
5. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
6. කැන්ඩර් ඉක්විටීස් ලිමිටඩ්
7. කැපිටල් එලායන්ස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)
8. කැපිටල් එලායන්ස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
9. කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
10. සීටී සී එල් එස් ඒ සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
11. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්) සමාගම
12. ෆස්ට් කැපිටල් ඉක්විටීස් (පුද්ගලික) සමාගම
13. ෆස්ට් ගාඩියන් කොටස් (පුද්ගලික) සමාගම
14. ජේබී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
15. ජෝන් කීල්ස් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
16. ලංකා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
17. LOLC සෙකියුරිටීස් සමාගම
18. නේෂන් ලංකා ඉක්විටීස් (පුද්ගලික) සමාගම
19. නවාරා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම*
20. NDB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
21. NSB අරමුදල් කළමනාකරණ සමාගම (ණය සුරැකුම්පත්)
22. රිචඩ් පීරිස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
23. SC සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
24. SMB සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
25. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
26. සමර්විල් කොටස් තැරැව්කාර (පුද්ගලික) සමාගම
27. තැප්‍රොබේන් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
28. ටී.කේ.එස් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
29. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය සුරැකුම්පත්)

* ව්‍යාපාර මෙහෙයුම් ස්වේච්ඡාවෙන් අක්‍රිය කිරීම

## බලපත්‍රලාභී කොටස් වෙළෙඳුන්

1. ඒෂියා සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
2. බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම (ණය)
3. කැපිටල් එලායන්ස් ලිමිටඩ් (ණය)
4. එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පුද්ගලික) සමාගම
5. ජේබී සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම
6. සීමාසහිත භීර් අරමුදල් කළමනාකරණ සමාගම (ණය)
7. සෙලාන් බැන්ක් පීඑල්සී (ණය)
8. SMB සුරැකුම්පත් (පුද්ගලික) සීමිත (ණය)
9. සොෆ්ට්ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්) සමාගම
10. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් (ණය)
11. සී ටී සී එල් එස් ඒ සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම

## 2020 දෙසැම්බර් 31 වන විට බලපත්‍රලාභී ඒකක භාර කළමනාකරණ සමාගම්

1. සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
   - සිලෝන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   - සිලෝන් ඉන්කම් ෆන්ඩ්
   - සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   - සිලෝන් අයි පී ඕ ෆන්ඩ්
   - සිලෝන් මනි මාර්කට් ෆන්ඩ්
   - සිලෝන් ටුවරිසම් ෆන්ඩ්
   - සිලෝන් ට්‍රෂෙරි ඉන්කම් ෆන්ඩ්
2. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - කොම්ට්‍රස්ට් ඒ ඕ එල් මුදරබා ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ්
3. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - එන් ඩී බී වෙල්ත් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ග්‍රෝත් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉන්කම් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉන්කම් ප්ලස් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් මනි ෆන්ඩ්
   - එන් ඩී බී වෙල්ත් මනි ප්ලස් ෆන්ඩ්
4. සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - සීබෑන්ක් සෙන්චරි ග්‍රෝත් ෆන්ඩ්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (A සීරීස්)
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ඊ සීරීස්)
   - සීබෑන්ක් හයියීල්ඩ් ෆන්ඩ්
   - සීබෑන්ක් සේවින්ග්ස් ප්ලස් ෆන්ඩ් මනි මාර්කට් ෆන්ඩ්
   - සීබෑන්ක් සුරැකුම් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ්
5. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - නාමල් ග්‍රෝත් ෆන්ඩ්
   - නාමල් හයියීල්ඩ් ෆන්ඩ්
   - නාමල් ඉන්කම් ෆන්ඩ්
   - නාමල් මනි මාර්කට් ෆන්ඩ්
   - නැෂනල් ඉක්විටි ෆන්ඩ්
   - නාමල් ගිල්ට් ෆන්ඩ්
   - නාමල් බැන්ක් ෆන්ඩ්

# අතිරේක තොරතුරු

6. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ෆස්ට් කැපිටල් ඉක්විටි ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් මනි මාර්කට් ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්

7. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
   - ජේ බී වැන්ටේජ් ෂෝර්ට් ටර්ම් ගිල්ට් ෆන්ඩ්
   - ජේ බී වැන්ටේජ් වැල්‍යූ ඉක්විටි ෆන්ඩ්

8. ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්
   - ගාර්ඩියන් ඇක්විටි මනි මාර්කට් ෆන්ඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ඉන්කම් ෆන්ඩ්

9. සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - සෙන්ෆින් ග්‍රෝත් ෆන්ඩ්
   - සෙන්ෆින් මනි මාර්කට් ෆන්ඩ්
   - සෙන්ෆින් ෂාරියා ඉන්කම් ෆන්ඩ්
   - සෙන්ෆින් ෂාරියා බැලන්ස්ඩ් ෆන්ඩ්
   - සෙන්ෆින් ඩයනමික් ඉන්කම් ෆන්ඩ්

10. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ඇස්ට්‍රා ඇල්ෆා ෆන්ඩ්
    - ඇස්ට්‍රා ඇක්ටිව් ඉන්කම් ෆන්ඩ්

11. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ්
    - කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කෝපරේට් ඩෙබ්ට් ඇන්ඩ් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෂෙරි ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් හයියිල්ඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ග්‍රේඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් මීඩියම් රිස්ක් ඩෙබ්ට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කොන්ට්‍රෙට්ටිවූ ඉක්විටි ෆන්ඩ්

12. ආර්පිකෝ අටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
    - ආර්පිකෝ අටරාසියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් (සී එම් ටී)
    - ආර්පිකෝ අටරාසියා ඉක්විටි ඉන්කම් ෆන්ඩ්
    - ආර්පිකෝ අටරාසියා රිපෝ ඉන්වෙස්ට්මන්ට්
    - ආර්පිකෝ අටරාසියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ්

13. ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
    - ප්‍රිමියර් ග්‍රෝත් ෆන්ඩ්
    - ප්‍රිමියර් මනි මාර්කට් ෆන්ඩ්

14. ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ඇසෙට්ලයින් ඉන්කම් ෆන්ඩ්
    - ඇසෙට්ලයින් ඉන්කම් ප්ලස් ග්‍රෝත් ෆන්ඩ්

15. සොෆ්ට්ලොජික් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - සොෆ්ට්ලොජික් ඉක්විටිය් ෆන්ඩ්
    - සොෆ්ට්ලොජික් මනි මාර්කට් ෆන්ඩ්

16. ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ඒෂියා සෙකියුරිටීස් මනි මාර්කට් ෆන්ඩ්

### ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන

ආයෝජන කළමනාකරුවන් ,ආන්තික ණය සැපයුම්කරුවන් සහ කොටස් ප්‍රාරක්ෂණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන.

| සමාගම | ආයෝජන කළමනාකරුවන් | ආන්තික ණය සැපයුම්කරුවන් | කොටස් ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| අක්විටි පාර්ට්නර්ස් (පුද්ගලික) සමාගම | | ✓ | |
| ADL ඉක්විටීස් ලිමිටඩ් | | ✓ | |
| අමානා ඇසෙට් ලිමිටඩ්** | ✓ | | |
| ඒෂියා සෙකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| ආශා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | | ✓ | |
| ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| අසෙට්ලයින් කැපිටල් (පුද්ගලික) සමාගම | ✓ | | |
| අසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් | | ✓ | |
| ලංකා බැංකුව | ✓ | | ✓ |
| බෙන්සෙයි සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම | | ✓ | |
| බාර්ට්ලීට් ඇසෙට් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (පුද්ගලික) සමාගම | | ✓ | |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| සිටිසන් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී | | ✓ | |
| ඩයලොග් ෆයිනෑන්ස් පී එල් සී (පෙර කලම්බු ට්‍රස්ට් ෆයිනෑන්ස් පී එල් සී) | | ✓ | |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී | | ✓ | ✓ |
| කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී | | ✓ | ✓ |
| ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| ගාර්ඩියන් අක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| හැටන් නැෂනල් බැන්ක් පී එල් සී | | ✓ | ✓ |
| හෙලිඔස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | ✓ | | |
| ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| ජේ බී ක්‍රෙඩිට් (පුද්ගලික) සමාගම | | ✓ | |
| ජේබී ෆිනෑන්ෂල් (පුද්ගලික) ලිමිටඩ් | ✓ | | |
| එල් බී ෆිනෑන්ස් පීඑල්සී | | ✓ | |
| LOLC ෆිනෑන්ස් පී එල් සී | | ✓ | |
| ලීනියර් වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | ✓ | ✓ | ✓ |
| නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ් | | ✓ | |
| නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී | | ✓ | |
| එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගම | ✓ | | |
| එන් ඩී බී කැපිටල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් | | | ✓ |
| ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී | | ✓ | |

# අතිරේක තොරතුරු

| සමාගම | ආයෝජන කළමනාකරුවන් | ආන්තික ණය සැපයුම්කරුවන් | කොටස් ප්‍රාරක්ෂකයින් |
|---|---|---|---|
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී | | ✓ | |
| ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පී එල් සී | | ✓ | |
| රිච්ඩ් පීරිස් ෆයිනෑන්ස් සර්විසස් (පුද්ගලික) සමාගම | | ✓ | |
| සම්පත් බැන්ක් පී එල් සී | | ✓ | ✓ |
| සෙන්ෆින් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ✓ | | |
| සෙලාන් බැන්ක් පී එල් සී | | ✓ | |
| සොෆ්ට්ලොජික් කැපිටල් පී එල් සී | ✓ | | |
| යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී | | ✓ | |
| වෝල්ඩොක් මැකෙන්සි ලිමිටඩ් | ✓ | ✓ | |

** අමානා ඇසෙට් සමාගමෙ ලියාපදිංචිය අලුත් කර ඇත්තේ ආයෝජකයන්ගේ බේරුම් කරණයන් ඉටු කිරීම පිණිස වේ. නව ගනුදෙනුකරුවන් හෝ ආයෝජන භාර ගැනීමට අවසර නැත.

**සුරැකුම්පත් නිශ්කාෂණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්:**

සීමා සහිත මධ්‍යම තැන්පතු ක්‍රම (පුද්ගලික) සමාගම

**ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්:**

1. ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්
2. ඉක්රා ලංකා ලිමිටඩ් (ICRA)

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| වාර්ෂික කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 253,251.0 | 176,935 | 220,591 | 200,069 | 171,408 | **396,882** |
| දේශීය (රුපියල් මිලියන) | 166,151.5 | 102,544 | 117,135 | 111,378 | 109,003 | **318,354** |
| විදේශීය (රුපියල් මිලියන) | 87,099.5 | 74,391 | 103,456 | 88,691 | 62,405 | **78,527** |
| වෙළෙඳපොළ දින (සංඛ්‍යාව) | 239 | 240 | 241 | 240 | 241 | **209** |
| දෛනික සාමාන්‍ය කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 1,059.6 | 737.2 | 915.3 | 834 | 711 | **3,217** |
| ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (සංඛ්‍යාව මිලියන) | 9,414 | 7,196 | 8,468 | 6,001 | 9,855 | **21,349** |
| දේශීය (රුපියල් මිලියන) | 7,693 | 5,776 | 6,529 | 4,821 | 7,091 | **19,808** |
| විදේශීය (රුපියල් මිලියන) | 1,721 | 1,420 | 1,939 | 1,180 | 2,764 | **1,541** |
| කොටස් ගනුදෙනු සංඛ්‍යාව | 1,506,790 | 1,056,849 | 981,977 | 885,657 | 1,197,205 | **3,070,021** |
| දේශීය (සංඛ්‍යාව) | 1,431,750 | 1,002,476 | 928,276 | 838,784 | 1,150,486 | **2,968,092** |
| විදේශීය (සංඛ්‍යාව) | 75,040 | 54,373 | 53,701 | 46,873 | 46,719 | **101,929** |
| නව ලැයිස්තුගත සමාගම් (සංඛ්‍යාව) | 5 | 4 | 3 | 3 | 2 | **1** |
| ලේඛනයෙන් බැහැරවීම් (සංඛ්‍යාව) | 3 | 2 | 2 | 2 | 10 | **7** |
| ලැයිස්තුගත සමාගම් (සංඛ්‍යාව) | 294 | 295 | 296 | 297 | 289 | **283** |
| ගනුදෙනුවූ සමාගම් (සංඛ්‍යාව) | 278 | 240 | 279 | 279 | 279 | **266** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන) | 2938.0 | 2,745.41 | 2,899.29 | 2,839.45 | 2,851.31 | **2,960.65** |
| වසර අවසානයේ වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතය (වාර ගණන) | 18.0 | 12.37 | 10.60 | 9.65 | 10.83 | **11.3** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම (%) | 8.6 | 6.2 | 7.6 | 7.0 | 6.01 | **13.4** |
| වසර අවසානයේ ලාභාංශ ඵලදාව (%) | 2.18 | 2.75 | 3.19 | 3.09 | 3.17 | **2.7** |
| වසර අවසානයේ මිල පොත් අගය (වාර ගණන) | 1.99 | 1.42 | 1.31 | 1.18 | 1.14 | **1.1** |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (%) | 30 | 25 | 25 | 21 | 22 | **20** |
| මිල දර්ශක | | | | | | |
| සියලු කොටස් මිල දර්ශකය (ASPI) | 6894.5 | 6,228.26 | 6,369.26 | 6,052.37 | 6,129.21 | **6,774.22** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (5.5) | (9.7) | 2.3 | (5.0) | 1.27 | **10.52** |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S & P Sri Lanka 20) | 3625.7 | 3,496.44 | 3,671.72 | 3,135.18 | 2,936.96 | **2,638.10** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (11.3) | (3.6) | 5.0 | (14.6) | (6.32) | **(10.18)** |
| මුළු ප්‍රතිලාභ දර්ශක | | | | | | |
| සියලු කොටස් මුළු ප්‍රතිලාභ මිල දර්ශකය (ASTRI) | 9079.9 | 8,232.66 | 8,457.09 | 8,066.97 | 8,203.82 | **9,078.65** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (5.2) | (9.3) | 2.7 | (4.6) | 1.70 | **10.7** |
| මිලංකා මුළු මිල දර්ශකය (MTRI) | - | - | | | | |

# අතිරේක තොරතුරු

| වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | - | - | | | | |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය (S & P Sri Lanka 20 TRI) | 4861.5 | 4,843.17 | 5,259.85 | 4,686.71 | 4,603.57 | **4,332.84** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | (8.8) | (0.4) | 8.6 | (10.9) | (1.77) | **(5.9)** |
| **විදේශීය ක්‍රියාකාරකම්** | | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 87,099.50 | 74,391 | 103,456 | 88,691 | 62,405 | **78,527** |
| මිලදී ගැනුම් (රුපියල් මිලියන) | 84,414.56 | 74,583 | 112,285 | 77,067 | 56,537 | **52,889** |
| විකුණුම් (රුපියල් මිලියන) | 89,784.44 | 74,199 | 94,627 | 100,315 | 68,272 | **104,165** |
| ශුද්ධ විදේශීය ගලා ඒම | (5,369.9) | 383.5 | 17,657.4 | (23,247.5) | (11,735) | **(51,276)** |
| ගනුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 1,721.50 | 1,420 | 1,939 | 1,180 | 2,764 | **1,541** |
| මිලදී ගැනුම් (මිලියන) | 1,730.72 | 1,572 | 2,062 | 1,060 | 3,896 | **928** |
| විකිණුම් (මිලියන) | 1,712.27 | 1,267 | 1,817 | 1,299 | 1,631 | **2,154** |
| ගනුදෙනු සංඛ්‍යාව | 75,040 | 54,373 | 53,701 | 46,873 | 46,719 | **101,929** |
| මිලදී ගැනුම් (සංඛ්‍යාව) | 65,932 | 51,656 | 56,643 | 37,855 | 25,759 | **42,134** |
| විකිණුම් (සංඛ්‍යාව) | 84,149 | 57,091 | 50,760 | 55,892 | 67,680 | **161,725** |
| **ණයකර වෙළෙඳපොළ** | | | | | | |
| **සාංගමික ණයකර** | | | | | | |
| මුළු පිරිවැටුම (රුපියල් 000) | 4,714,012.7 | 2,932,154.0 | 3,592,905.5 | 4,540,599 | 5,677,080 | **5,856,002** |
| ගනුදෙනු සංඛ්‍යාව | 220 | 291 | 529 | 293 | 234 | **243** |
| ගනුදෙනු වූ ණයකර ප්‍රමාණය (000) | 42,201 | 28,335 | 35,696 | 44,024 | 55,643 | **54,230** |
| **ඒකක භාර** | | | | | | |
| ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් මිලියන) | 129,844 | 103,890 | 128,804 | 64.22 | 104.79 | **200.94** |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 38,140 | 41,154 | 41,037 | 42,093 | 46,481 | **51,707** |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව | 8,812 | 7,142 | 7,639 | 3,368 | 4,769 | **8,210** |
| කොටස් වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 14,376 | 13,786 | 12,466 | 9,416 | 9,841 | **14,019** |
| භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 28,294 | 49,299 | 24,386 | 3,379 | 9,150 | **28,613** |
| අනෙකුත් උපකරණවල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රු. මිලියන ) | 87,272 | 40,553 | 91,732 | 50,601 | 84,542 | **158,725** |

තොරතුරු: කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් සිදුකරනු ලබන නියාමන ඉදිරිපත් කිරීම්.
වාණිජ පත්‍ර, තැන්පතු සහතික,ණයකර සහ බැංකු තැන්පතු.

# වර්ධන
# **කතාවක්**



## මූල්‍ය වාර්තා


ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - **81** විගණකාධිපති වාර්තාව | **84** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | **85** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
**86** සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | **87** මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **89** මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - **103** විගණනකාධිපති වාර්තාව | **106** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
**107** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **108** සෙස් අරමුදලේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | **109** මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **110** මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව- **114** විගණකාධිපති වාර්තාව | **117** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
**118** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | **119** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **120** මුදල් ප්‍රවාහ ප්‍රකාශය
**121** මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්| පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - **125** විගණකාධිපති වාර්තාව
**127** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | **128** මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | **129** ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
**130** මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **131** මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } BAF/H/SEC/COM/1/20/5 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජූනි 21

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම වංචාවක් ඇතිවීමට හේතු වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව**

**2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.**

**2.1.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂනයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාවේ පවත්වා ගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

**2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.**

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව

අත්සන් කළේ:

**ඩබ්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 7 | **75,447,839** | 87,921,497 |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 8 | **2,033,967** | 1,480,653 |
| ලැබිය යුතු දෑ | 9 | **47,203,119** | 7,906,073 |
| ස්ථාවර තැන්පතු ආයෝජන | 10 | **639,895** | 66,843 |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 11 | **64,695,096** | 15,454,932 |
| මුදල් හා මුදල් සමාන දෑ | 12 | **103,007,105** | 168,713,075 |
| **මුළු වත්කම්** | | **293,027,021** | 281,543,073 |
| | | | |
| **අරමුදල් හා වගකීම්** | | | |
| **යෙදවූ අරමුදල් සහ සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | 13 | **-** | - |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන - ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | 14 | **69,195,940** | 81,571,796 |
| සේවක ප්‍රතිලාභ වගකීම | 15 | **50,378,208** | 43,464,269 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | **23,339,815** | 33,316,205 |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 16 | **145,547,211** | 119,841,708 |
| උපචිත වියදම් - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති | 17 | **558,060** | - |
| පූර්ව ලැබීම් | | **4,007,787** | 3,349,095 |
| **මුළු අරමුදල් හා වගකීම්** | | **293,027,021** | 281,543,073 |

97 සිට 110 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්:

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජෙනරාල්
සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**විරාජ් දයාරත්න - ජනාධිපති නීතිඥ**
සභාපති
සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ජී. පී. එන්. දිල්හානි**
මූල්‍ය අධ්‍යක්ෂ
සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹදී
2021 මැයි 11 වන දින දීය

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **අදායම්** | | | |
| තැරව්කාර බලපත්‍ර ගාස්තු | | 3,610,706 | 3,171,963 |
| පරිපාලන බදු | | 1,172,909 | 1,531,065 |
| අධ්‍යාපන වැඩසටහන් | | 3,480,239 | 4,033,843 |
| පොලී ආදායම් | | 5,360,805 | 3,728,019 |
| අනෙකුත් ආදායම් | | 78,755 | 2,015,176 |
| කාර්ය මණ්ඩල ණය පොලී අදායම් | | 738,471 | - |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | | (44,525) | - |
| රාජ්‍ය ප්‍රදාන - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති | 17 | 11,720,560 | 81,124,254 |
| ප්‍රදාන හඳුනා ගැනීම | 14 | 23,631,788 | 16,513,523 |
| **මුළු අදායම** | | 49,749,708 | 112,117,843 |
| | | | |
| **වියදම** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 18 | (236,519,212) | (233,214,148) |
| පරිපාලන හා ආයතනික පිරිවැය | 19 | (166,024,494) | (167,180,480) |
| ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන පිරිවැය | 20 | (32,367,005) | (53,736,624) |
| මූල්‍ය ගාස්තු | 21 | (40,887) | (64,525) |
| **මුළු වියදම** | | (434,951,598) | (454,195,777) |
| | | | |
| ආදායම් බදු වියදම් | | - | (33,316,205) |
| **වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම** | | (385,201,890) | (375,394,139) |
| | | | |
| **ආදයමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරුකිරීම්** | | 385,201,890 | 375,394,139 |

97 සිට 110 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සමුච්චිත අරමුදල<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | - | - |
| වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම | (375,394,139) | (375,394,139) |
| ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | 375,394,139 | 375,394,139 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | - |
| | | |
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | - | - |
| වර්ෂය තුල ආදායමට වැඩි අතිරික්ත වියදම | (385,201,890) | (385,201,890) |
| ආදායමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | 385,201,890 | 385,201,890 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | - |

97 සිට 110 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| සෙස් අරමුදලෙන් මාරුකිරීමෙන් පසු ශුද්ධ අඩු වීම/(වැඩි වීම) | | - | - |
| | | | |
| ගැලපීම්: | | | |
| ක්ෂයවීම් | 7 | 23,631,788 | 16,513,523 |
| දේපල, පිරියත හා උපකරණ විකිනීමෙන් ලද ලාභ/(අලාභ) | | 44,525 | - |
| ප්‍රදානයන් හඳුනාගැනීම | 14 | (23,631,788) | (16,513,523) |
| පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන | 15 | 11,027,205 | 5,558,515 |
| කාරක ප්‍රාග්ධයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 11,071,730 | 5,558,515 |
| | | | |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම** | | | |
| තොග (වැඩිවීම)/අඩුවීම | | (553,314) | (156,492) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (39,297,046) | 13,703,665 |
| තැන්පතු අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | | (49,240,164) | (175,087) |
| පූර්ව ලැබීම් වැඩිවීම/(අඩුවීම) | | 658,691 | 405,111 |
| ගෙවිය යුතු අදායම් බදු වැඩිවීම/(අඩුවීම) | | (9,976,390) | - |
| ණය හිමියන් හා උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | | 25,705,503 | 81,860,967 |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | 558,060 | 33,316,205 |
| කාරක ප්‍රාග්ධයේ ශුද්ධ වෙනස්වීම වැඩිවීම/(අඩුවීම) | | (72,144,660) | 128,954,369 |
| | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලට භාවිත වූ මුදල් | | (61,072,930) | 134,512,884 |
| | | | |
| වර්ෂය තුල ගෙවූ පාරිතෝෂිත | | (4,113,265) | (6,441,900) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (65,186,195) | 128,070,984 |
| | | | |
| **ආයෝජ්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | 7 | (11,255,932) | (30,601,826) |
| ස්ථාවර තැන්පතු ආයෝජන | | (573,052) | - |
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල් | | 53,277 | - |
| ආයෝජ්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (11,775,707) | (30,601,826) |

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| ප්‍රාග්ධන අරමුදල සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | 14 | **11,255,932** | 41,956,746 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ වලින් ජනනය වූ/(භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | **11,255,932** | 41,956,746 |
| | | | |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **(65,705,970)** | 139,425,904 |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | | **168,713,075** | 29,287,171 |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)** | | **103,007,105** | 168,713,075 |
| | | | |
| **සටහන අ** | | | |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ | | | |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජන | | **167,595,925** | 40,000,000 |
| බැංකුවේ ඇති මුදල් | | **1,077,150** | (10,752,829) |
| අතැති මුදල් | | **40,000** | 40,000 |
| එකතුව | | **168,713,075** | 29,287,171 |
| | | | |
| **සටහන ආ** | | | |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ | | | |
| ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජන | 12 | **64,610,002** | 167,595,925 |
| බැංකුවේ ඇති මුදල් | 12 | **38,357,103** | 1,077,150 |
| අතැති මුදල් | 12 | **40,000** | 40,000 |
| එකතුව | | **103,007,105** | 168,713,075 |

97 සිට 110 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශවල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (ශ්‍රී.ල.සු.වි.කො.ස) ලාභ නොලබන ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 1987 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපිත කර ඇත. ශ්‍රී.ල.සු.වි.කො.ස. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 12 වන වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකා සු.වි.කො.ස හි අරමුණු වන්නේ:

(අ) පිළිවෙලට සහ සාධාරණ ආකාරයට සුරැකුම්පත් නිකුත් කිරීම හා වෙළඳාම් කිරීම කළහැකි වෙළඳපොලක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ආ) ආයෝජකයන්ගේ උනන්දුව ආරක්ෂා කර ගැනීම;

(ඇ) බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් හා වෙළෙන්දන් විසින් ගිවිසුම්ගත වගකීම් ඉටුකිරීමට නොහැකිවීම හේතුවෙන් සිදුවන මූල්‍යමය අලාභයන්ගෙන් ආයෝජකයන් ආරක්ෂා කර ගැනීම සඳහා වන්දි අරමුදලක් පවත්වාගෙන යාම;

(ඈ) සුරැකුම්පත් වෙළඳපොල නියාමනය කිරීම සහ එම වෙළඳපොල තුල වෘත්තීමය තත්වයන් පවත්වාගෙන යාම සහතික කිරීම;

සලකාබලන මූල්‍යමය කාලපරිච්ඡේදය තුල ශ්‍රී.ල.සු.වි.කො.ස හි අරමුණු වල වෙනසක් වී නොමැත.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සංචිත වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් වලින් සමන්විත වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල හා වන්දි අරමුදල සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී.

එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, සංචිත වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

වර්තමාන අගය මත පදනම් වූ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම හැරුණුකොට, මූල්‍ය ප්‍රකාශන, උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

වර්ෂය අවසානයේ නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී පොලී පිරිවැය, ප්‍රවර්තන සේවා පිරිවැය, ආයු ගණක (ලාභ)/අලාභ, වර්ෂය තුල ගෙවීම් සඳහා නියමිත ගැලපීම් කර ඇත. එමෙන්ම ඒ හා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් මගින් හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළයෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපතීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරිව අනුගමනය කර ඇත.

1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බලපැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගත් අගයන් වලට වඩාත් ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන විනිශ්චයන් පිළිබඳ තොරතුරු නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමට අදාළ සටහනේ පැහැදිලි කර ඇත.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

නිශ්චිත සේවක ප්‍රතිලාභ වගකීමෙහි පිරිවැය නිර්ණය කරනුයේ ආයුගණක තක්සේරුව භාවිතා කිරීමෙනි. ආයු ගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කරගැනේ. මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. ආයුගණක තක්සේරුව සඳහා යොදාගන්න උපකල්පනයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 15 හි හෙළිදරව් කර ඇත.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

### 1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

## 2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ

**හිමිකම් සහිත දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්**

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් හා ඒ හා සම්බන්ධ අනුශාංගික වියදම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ඵලදායී ජීව කාලය පුරා ක්ෂය/ක්‍රම ක්ෂය සිදු කරයි. ප්‍රදානයන් ලෙස ලැබුණු වත්කම් පිරිවැයට වාර්තා කරන අතර ඒවායෙහි ක්ෂය/ක්‍රම ක්ෂය අදාළ සංචිත ගිණුම් වලට අය කරනු ලැබේ. ක්ෂය/ක්‍රම ක්ෂය වීම සරල රේඛීය පදනම යොදා ගනිමින් සිදු කරනු ලැබේ. මෝටර් වාහන, ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ, කාර්යාල උපකරණ හා මෘදුකාංග ඇතුළු විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ සහ පුහුණු කිරීමේ උපකරණ වල ක්ෂය/ක්‍රම ක්ෂය ඒවායෙහි ඵලදායී ජීව කාලය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අනුපාතිකයන් යොදා ගනිමින් සිදු කර ඇත.

| | |
|---|---|
| මෝටර් වාහන | 10.00% |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | 12.50% |
| පුහුණු කිරීමේ උපකරණ | 20.00% |
| විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ (මෘදුකාංග ඇතුළුව)* | |
| විද්‍යුත් දත්ත සැකසුම් - දෘඩාංග | 20.00% |
| විද්‍යුත් දත්ත සැකසුම් - මෘදුකාංග | 20.00 - 33.33% |
| විද්‍යුත් දත්ත සැකසුම් - ජංගම දුරකථන | 33.33% |
| විද්‍යුත් දත්ත සැකසුම් - අනෙකුත් | 20.00 - 25.00% |

මිලදී ගත් සියලුම වත්කම් සඳහා, භාවිතා කිරීමට අපේක්ෂිත දිනයේ සිට ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලැබේ. වත්කම විකුණන වර්ෂයේදී එය විකුණන දිනය දක්වා ක්ෂය/ ක්‍රම ක්ෂය වෙන් කිරීම සිදු කරනු ලබයි.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සඳහා වන පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය සම්බන්ධිත වත්කමෙහි අනාගත ඵලදායි ප්‍රතිලාභ ඉහල යන්නේ නම් පමණි. අනෙකුත් සියලුම වියදම් ඒවා දරනු ලබන අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

* පරිගණක දෘඩාංග වලට අන්තර්ගත නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස පෙන්වන අතර එය පිරිවැයට හඳුනා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව මෙම අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්ෂය අඩු කර ඉදිරියට ගෙන යනු ලැබේ.

### 2.2 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන, පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.3 තොග

තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු අගය යටතේය. තොග පිරිවැය ගණනය කිරීම පෙර පිවිසුම් පෙර නිකුතු පදනම මත සිදු කෙරේ.

ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළඳපොල තත්වයන් හේතුකොටගෙන ප්‍රාග්ධන වෙළඳපොළට අදාළ නීති රීති ද වේගයෙන් වෙනස්වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත්වලට අදාළ අගයන් කපා හැර තිබේ.

### 2.4 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 සේවක ප්‍රතිලාභ

#### 3.1.1 නිශ්චිත දායකත්ව සැලසුම සේවක අර්ථ සාධක අරමුදල

ආයතනයේ සියලුම සේවකයින් සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සේවකයාගේ වාහන හා ඉන්ධන දීමනාව හැර වේතනයෙන් 12% හා 3% ක් මේ සඳහා දායක කරනු ලැබේ.

#### 3.1.2 නිශ්චිත ප්‍රතිලාභ වගකීම පාරිතෝෂිත

පාරිතෝෂිත යනු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ එහි සේවකයන් හට ගෙවිය යුතු පසු සේවා නියුක්ති ප්‍රතිලාභයකි. ආයතනය හට මෙම වගකීම සේවකයෙකු වෙත පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි. කෙසේ වුවද 2018 ජනවාරි 01 වන දින සිට බලාත්මක වූ ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්දේශයන්ට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීමෙන් නිරූපනය වනුයේ, වාර්තා කරන දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගය වේ. එම වගකීම බාහිර ලෙස මූල්‍යනය කර නැත. හඳුනා නොගත් ආයු ගණන ලාභ හෝ අලාභ, හඳුනා නොගත් අතීත හා ප්‍රවර්තන සේවා පිරිවැය මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයෙහි එසැනින්ම හඳුනා ගනු ලැබේ.

2020 දෙසැම්බර් 31 දිනට නිශ්චිත ප්‍රතිලාභ වගකීමට අදාළ ශුද්ධ වගකීම්, ශ්‍රී.ල.රා.ගි.ප්‍ර. 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි නිර්ණායකයන්ට අනුකූලව, සුදුසුකම්ලත් ආයුගණකඥයෙකු විසින් "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිත කර නිර්ණය කර ඇත.

### 3.2 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

### 3.3 ප්‍රදාන

සෙස් අරමුදලෙන් මාරු කරනු ලැබූ ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාළ වත්කමෙහි ඵලදායී ආයු කාලය පුරා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ආදායම තැරැව්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු, පරිපාලන අයබදු, ප්‍රකාශන අලෙවි කිරීම්, අධ්‍යාපන වැඩසටහන් වලට අදාළ සම්මන්ත්‍රණ ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ගාස්තු වලින් වන ආදායම අදාල සේවාවන් ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුලදීම හඳුනා ගැනේ.

### 4.2 පොලී ආදායම හා වියදම

ආයෝජන වල පොලී අදායම හා පොලී වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.4 දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ හෝ අලාභ

දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනා ගනු ලබන්නේ අදාළ විකුණුමෙන් ලැබෙන මුදලෙන් අදාළ වත්කමෙහි ධාරණ අගය හා එම විකුණුම් වියදම් අඩු කිරීමෙනි.

## 5. වියදම් හඳුනා ගැනීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 7. දේපළ, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන<br>රු. | ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ<br>රු. | කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ<br>රු. | පුහුණු කිරීමේ උපකරණ<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 45,165,785 | 43,005,962 | 158,057,689 | 4,351,098 | 250,580,535 |
| වර්ෂය තුල මාරු කිරීම් | - | 2,332,896 | (2,332,896) | - | - |
| වර්ෂය තුල එකතුවීම් | - | 2,960,411 | 8,295,521 | - | 11,255,932 |
| වර්ෂය තුල විකුණුම් | - | (324,374) | (5,654,500) | (24,750) | (6,003,624) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 45,165,785 | 47,974,894 | 158,365,815 | 4,326,348 | 255,832,843 |
| | | | | | |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2020 ජනවාරි 01 දිනට ශේෂය | 24,360,575 | 30,299,647 | 104,063,444 | 3,935,371 | 162,659,038 |
| වර්ෂය තුල මාරු කිරීම් | - | 2,264,589 | (2,264,589) | - | - |
| වර්ෂය සඳහා ක්ෂය | 4,531,139 | 2,972,299 | 15,978,237 | 150,113 | 23,631,788 |
| විකුණන ලද වත්කම් වල සමුච්චිත ක්ෂය | - | (318,695) | (5,562,377) | (24,750) | (5,905,821) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 28,891,714 | 35,217,840 | 112,214,715 | 4,060,735 | 180,385,004 |
| | | | | | |
| **2020 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය** | 16,274,072 | 12,757,054 | 46,151,099 | 265,614 | 75,447,839 |
| | | | | | |
| **2019 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය** | 20,805,211 | 12,706,315 | 53,994,245 | 415,727 | 87,921,497 |
| | | | | | |
| **2020 දෙසම්බර් 31 වන විට පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් (ඉහත සඳහන් පිරිවැයේ අඩංගු වී ඇති)** | 9,870,000 | 22,483,071 | 78,388,627 | 3,575,783 | 114,317,480 |
| | | | | | |
| **ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන) - 2020** | 10 | 8 | 3-5 | 5 | |
| **ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන) - 2019** | 10 | 8 | 5 | 5 | |

| | | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|---|
| 8 | තොග | | | |
| | ලිපි ද්‍රව්‍ය, මුද්දර සහ විද්‍යුත් දත්ත සැකසුම් | | 2,033,967 | 1,480,653 |
| | එකතුව | | 2,033,967 | 1,480,653 |
| | | | | |
| 9 | ලැබිය යුතු දෑ | | | |
| | විවිධ ණයගැතියෝ | | 329,601 | 391,268 |
| | උත්සව අත්තිකාරම් | | 2,100,000 | 2,200,000 |
| | ප්‍රතිමිලදී ගැනීම් මත ලැබිය යුතු පොලී | | 7,719 | 71,114 |
| | කාර්යමණ්ඩල ණය* | | 20,437,628 | - |
| | දුරකථන අත්තිකාරම් | | 208,367 | 2,500 |
| | ලැබියයුතු රක්ෂණ වන්දි | | 16,375 | 16,375 |
| | වන්දි අරමුදලෙන් ලැබිය යුතු දෑ | | 18,890,614 | - |
| | සේවක අර්ථසාධක අරමුදලෙන් ලැබිය යුතු දෑ | | - | 12,000 |
| | වැඩ තහනම් කෙරූ සේවකයෙකුගෙන් ලැබිය යුතු දෑ | | 5,212,815 | 5,212,816 |
| | එකතුව | | 47,203,119 | 7,906,073 |

* සෙස් අරමුදලෙහි වාර්තා වූ ශේෂයන් වර්ෂය තුලදී සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට මාරු කරන ලදී.

10 ස්ථාවර තැන්පතු ආයෝජන

ස්ථාවර තැන්පත් ආයෝජන තුලින් නිරූපනය වන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් මෙහෙයුම් කටයුතු සඳහා ලංකා බැංකුවෙහි ඇපයට තබනා ලද ස්ථාවර තැනපතු හි අගය වේ.

| | | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|---|
| 11 | තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | | | |
| | ඉන්ධන තැන්පතු | | 78,000 | 78,000 |
| | මොබිටෙල් - ආයතනික දත්ත පැකේජ | | 15,000 | - |
| | මොබිටෙල් - පසු ගෙවුම් විත්ගල්ස් | | 12,000 | - |
| | ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු | | 23,125 | 23,125 |
| | ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු | | 8,500 | 8,500 |
| | ෆ්‍රොස්ටි - උණු සහ ශීත ජලය ලැබෙන ස්වංක්‍රීය යන්ත්‍රය | | 12,899 | 12,899 |
| | උසස් අධ්‍යාපන කටයුතු සඳහා අනුග්‍රාහකත්ව ලබාදීම් - කොළඹ විශ්ව විද්‍යාලය | | 10,000 | 10,000 |
| | ශ්‍රී ලංකා සේවා යෝජකයන්ගේ සංගමය | | 62,500 | 62,500 |
| | ඕවර්සීස් රියල්ටි සමාගම - කළමනාකරණ සංස්ථා සභාධිපත්‍ය සැලසුම් 1824* | | 44,522,736 | - |
| | සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | | 19,950,336 | 15,259,908 |
| | එකතුව | | 64,695,096 | 15,454,932 |

* සෙස් අරමුදලෙහි වාර්තා වූ ශේෂයන් වර්ෂය තුලදී සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට මාරු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|---|
| 12 | මුදල් හා මුදල් සමාන දෑ | | | |
| | ප්‍රති මිලදීගැනීම් මත ආයෝජන | | 64,610,002 | 167,595,925 |
| | බැංකුවේ ඇති මුදල් | | 38,357,103 | 1,077,150 |
| | අතැති මුදල් | | 40,000 | 40,000 |
| | එකතුව | | 103,007,105 | 168,713,075 |
| | | | | |
| 13 | සමුච්චිත අරමුදල | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | - | - |
| | වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම | | (385,201,890) | (375,394,139) |
| | වර්ෂය සඳහා ආදයමට වැඩි අතිරික්ත වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | 385,201,890 | 375,394,139 |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | - | - |
| | | | | |
| 14 | ප්‍රදානයන් - සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | 81,571,796 | 56,128,573 |
| | වර්ෂය තුල සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරුකිරීම් | | 11,255,932 | 41,956,746 |
| | ප්‍රදානයන් හඳුනා ගැනීම් | | (23,631,788) | (16,513,523) |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | 69,195,940 | 81,571,796 |
| | | | | |
| | **සටහන:** | | | |
| | **ප්‍රදානයන් හඳුනා ගැනීම** | | | |
| | පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන් හඳුනා ගැනේ. | | | |
| | මෝටර් වාහන | | 10.00% | 10.00% |
| | ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ | | 12.50% | 12.50% |
| | කාර්යාල උපකරණ සහ විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ | | 20.00% සිට 33.33% | 20.00% |
| | පුහුණු කිරීමේ උපකරණ | | 20.00% | 20.00% |
| | | | | |
| 15 | සේවක ප්‍රතිලාභ වගකීම | | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | | 43,464,268 | 44,347,652 |
| | පොලී පිරිවැය | | 4,346,427 | 4,878,242 |
| | ප්‍රවර්තන සේවා පිරිවැය | | 4,365,013 | 3,863,868 |
| | ආයු ගණක (ලාභ)/අලාභ | | 2,315,765 | (3,183,594) |
| | වර්ෂය තුල ගෙවීම් | | (4,113,265) | (6,441,899) |
| | **වර්ෂය අවසානයේ ශේෂය** | | 50,378,208 | 43,464,269 |

සේවක ප්‍රතිලාභ වගකීම, ස්වාධීන ආයුගණකඥයෙකු විසින් සිදු කරන ලද ආයුගණක තක්සේරුව මත පදනම්ව ඇත. ආයු ගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාතිකය, අනාගත වැටුප් වර්ධක අනුපාතිකය, මරණ අනුපාතිකය ආදී උපකල්පනයන් උපයෝගී කරගැනේ. මෙම සැලැස්මේ ඇති දිගුකාලීන ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් උපකල්පනයන් සැලකියයුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. මෙම සියලුම උපකල්පනයන් සෑම වාර්තාකරණ දිනකදීම සමාලෝචනය කරනු ලැබේ.

සේවක ප්‍රතිලාභ පිරිවැය නිර්ණය කිරීමේදී යොදාගනු ලැබූ මූලික උපකල්පනයන් වනුයේ:

| | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| වට්ටම් අනුපාතිකය | | 8% p.a. | 10% p.a. |
| අනාගත වැටුප් වර්ධක අනුපාතිකය | | 7% p.a. | 8% p.a. |

15.1 යොදාගත් උපකල්පන වල සංවේදීතාවය

උපකල්පනයන්ගේ 1% ක් වෙනස්වීමෙන් ඇති වනු ලබන බලපෑම:

| | වට්ටම් අනුපාතිකය<br>රු. | අනාගත වැටුප් වර්ධක අනුපාතිකය<br>රු. |
|---|---|---|
| 1% වැඩි වීම | 46,817,094 | 54,215,411 |
| 1% අඩු වීම | 54,418,744 | 46,951,006 |

2020 දෙසැම්බර් 31 දිනට, සේවක ප්‍රතිලාභ වගකීමෙහි ආයුගණක තක්සේරුව වෘත්තීමය ආයුගණකයෙකු වන ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් සිදු කරන ලදී. ආයුගණකයන් විසින් සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ හි නිර්දේශයන්ට අනුකූලව "ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය" භාවිතා කර ඇත.

| | | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|---|
| 16 | ණයහිමියන් සහ උපචිත වියදම් | | | |
| | දුරකථන, අන්තර්ජාල වියදම් | | 818,428 | 630,661 |
| | විදුලිය | | 325,327 | 324,872 |
| | කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය | | 1,037,439 | 664,249 |
| | නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | 2,912,175 | 2,533,700 |
| | විශේෂ ගෙවීම් | | - | 8,068,275 |
| | අතිකාල | | 118,583 | 120,604 |
| | බාහිර විගණන ගාස්තු | | 1,060,000 | 1,450,000 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | | 1,500,000 | 650,000 |
| | වෘත්තීය ගාස්තු | | 165,000 | 1,519,430 |
| | මහජන දැනුවත් කිරීම් | | 51,773 | 5,900,127 |
| | කුරියර් ගාස්තු | | 9,860 | 12,290 |
| | ගෙවිය යුතු මුද්දර ගාස්තු | | 59,000 | 65,700 |
| | තැපැල් හා මුද්දර | | - | 575 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | | - | 1,219 |
| | ගමන් වියදම් - දේශීය | | 20,100 | - |
| | විධායක යැපුම | | 12,500 | 42,500 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | | 102,914 | 153,130 |
| | නඩත්තු වියදම් - කාර්යාලයීය විද්‍යුත් සැකසුම් උපකරණ සහ අනෙකුත් | | - | 160,460 |
| | ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධනය | | 915,833 | 1,583,333 |
| | වෙළඳපොළ ආවේක්ෂණය | | 1,670,625 | - |
| | අනෙකුත් ගෙවිය යුතු දෑ | | 50,794 | 27,794 |
| | ගෙවිය යුතු කුලී තැන්පතු | | 1,536,792 | - |

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 16. ණයහිමියන් සහ උපචිත වියදම්

| | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| පොදු වියදම් - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති | | 216,945 | - |
| සෙස් අරමුදලෙන් මාරු කල වත්කම්/වගකීම් සඳහා සෙස් අරමුදලට ගෙවිය යුතු ගෙවීම් | | 64,224,567 | - |
| අතිරික්ත මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලට ගෙවිය යුතු ගෙවීම් | | 66,107,394 | 84,150,977 |
| දේපල, පිරියත හා උපකරණ | | - | 11,354,920 |
| සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු ගෙවීම් | | 2,217,897 | - |
| වෙළඳ බදු | | - | 5,000 |
| පුවත්පත් හා වාර ප්‍රකාශන | | 23,680 | - |
| නත්තල් උත්සව වියදම් | | - | 12,600 |
| බඳවා ගැනීම් වියදම් | | 323,163 | - |
| ණය පොලී සහනාධාර | | - | 31,627 |
| මෝටර් වාහන ඉන්ධන | | 66,422 | - |
| නීති වියදම් | | - | 377,665 |
| එකතුව | | 145,547,211 | 119,841,708 |

## 17 ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති

| | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| උපචිත වියදම් - මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘති | | 558,060 | - |
| එකතුව | | 558,060 | - |

ලෝක බැංකුවේ මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතින්හී, ව්‍යාපෘති සංවර්ධන අරමුණු ඉටු කරගැනීම සඳහා මූල්‍ය වෙළඳපොල යටිතල පහසුකම් නවීකරණය, මූල්‍ය වෙළඳපොල හා අදාළ නීතිමය හා නියාමන රාමුව වැඩි දියුණු කිරීම සහ ප්‍රධාන මූල්‍ය වෙළඳපොල නියාමන ආයතන වන ශ්‍රී ලංකා මහා බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම යන ආයතන වල ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම යන ක්‍රමවේදයන් යොදා ගනු ලැබේ. මීට අමතරව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් පිහිටුවා ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා සහාය වනු ලැබේ. එමෙන්ම මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිහි ඇතුලත් අංගයක් ලෙස සු.වි.කො.ස. විසින් ප්‍රධාන මුල පිරීම් කිහිපයක් සඳහාම අවශ්‍ය තාක්ෂණික සහ ආයෝජන අරමුදල් සහය සහතික කර ඇත. ඒ අනුව සු.වි.කො.ස. වෙත ඇමරිකානු ඩොලර් මිලියන 10ක් ලැබීමට නියමිත අතර, එයින් ඇ.ඩො. මිලියන 2ක් ප්‍රතිඵල පාදක මූල්‍ය සංරචකය යටතේ සහ ඇ.ඩො. මිලියන 8ක් ආයෝජන පාදක මූල්‍ය සංරචක යටතේ හඳුනාගත් භාණ්ඩ හා උපදේශන ප්‍රතිසම්පාදන 13ක් සඳහා වේ.

2020 දෙසම්බෙර් 31 දිනට, සු .වි.කො.ස. වෙත මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතියේ ප්‍රතිඵල පාදක මූල්‍ය සංරචකය යටතේ රු. 92,844,814/- ක මුදලක් ලැබී ඇත. ඊට අමතරව ඇ.ඩො. 367,000ක් (රු.66,659,678/- ට සමාන මුදලක්) ලෝක බැංකුව විසින් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙත ආයෝජන පාදක මූල්‍ය සංරචකය යටතේ ලබා දී ඇති අතර එයින් 2020 දෙසැම්බර් 31 දින වන විට සු .වි.කො.ස. විසින් ඇ.ඩො. 3000ක (රු. 558,060/- ට සමාන) මුදලක් ඉවත් කරගෙන ඇත.

| | | සටහන් | 2020 | 2019 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 18 | කාර්ය මණ්ඩල පිරිවැය | | | |
| | කාර්ය මණ්ඩල වැටුප් | | 132,419,676 | 128,380,689 |
| | සභාපතිවරයාගේ දීමනා | | 1,030,000 | 1,110,000 |
| | ප්‍රතිපූර්ණ පිරිවැය - නීතිපති දෙපාර්තමේන්තුව | | 5,814,518 | - |
| | අතිකාල දීමනා | | 1,669,163 | 2,500,861 |
| | සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල | | 20,241,694 | 19,625,808 |
| | කාර්යමණ්ඩල පාරිතෝෂිත | 16 | 11,027,205 | 5,558,516 |
| | විශේෂ ගෙවීම් | | 16,606,045 | 16,812,135 |
| | නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | 2,767,429 | 3,076,896 |
| | කාර්යමණ්ඩල වෛද්‍ය වියදම් හා රක්ෂණ | | 7,914,882 | 6,962,971 |
| | කාර්යමණ්ඩල හදිසි අනතුරු රක්ෂණ ආවරණ | | 667,100 | 753,949 |
| | කාර්යමණ්ඩල නිවාස ණය පොලී සහනාධාර | | 2,341,631 | 1,650,315 |
| | කාර්යමණ්ඩල සුභසාධන වියදම් | | 4,052,758 | 5,896,137 |
| | විධායක යැපුම් | | 137,500 | 497,500 |
| | කාර්යමණ්ඩල වාහන දීමනා | | 23,298,500 | 22,344,097 |
| | විදෙස් ගමන් වියදම් හා පුහුණුවීම් වියදම් | | 2,309,872 | 13,547,075 |
| | කාර්යමණ්ඩල පුහුණු වීම් වියදම් | | 397,250 | 1,530,890 |
| | සාමාජිකත්ව දායක වියදම් | | 1,410,345 | 1,610,956 |
| | අධ්‍යයන සඳහා අනුග්‍රාහකත්වයන් | | 795,545 | 526,342 |
| | බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | 1,343,099 | 786,936 |
| | ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | 275,000 | 42,075 |
| | එකතුව | | 236,519,212 | 233,214,148 |

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/- ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධාන වලට යටත්ව ලබාදෙන අතර, එසේ ලබාගත් සේවකයින් අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කල පසු අවුරුදු 2ක කාලයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයින් සම්පූර්ණ කල යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| | | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|---|
| 19 | පරිපාලන හා ආයතනික වියදම් | | | |
| | කුලී හා රථවාහන ගාල් කුලී | | 96,216,435 | 88,188,786 |
| | විදුලි ගාස්තු | | 3,688,801 | 4,572,278 |
| | කාර්යාල නඩත්තු | | 501,455 | 306,062 |
| | කාර්යාල උපකරණ නඩත්තු හා රක්ෂණ | | 11,365,646 | 9,481,932 |
| | දුරකථන, අන්තර්ජාල, ඊ-මේල් සහ වෙබ් | | 697,283 | 883,451 |
| | විද්‍යුත් සන්නිවේදන හා දත්ත සැකසුම් | | 7,894,251 | 7,045,516 |
| | මෝටර් වාහන ඉන්ධන, නඩත්තු, බලපත්‍ර හා රක්ෂණ | | 3,002,346 | 4,112,084 |
| | වෘත්තීමය ගාස්තු | | 2,015,000 | 3,654,797 |
| | රැස්වීම් ගාස්තු | | 1,532,000 | 830,000 |
| | රැස්වීම් වියදම් | | 964,110 | 709,885 |
| | විනෝදාස්වාද වියදම් | | - | 12,097 |
| | පුස්තකාල පොත් | | 9,600 | 36,500 |
| | පුවත්පත් හා වාරප්‍රකාශන | | 360,964 | 666,920 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | 3,582,116 | 3,711,000 |
| | දේශීය ගමන් වියදම් | | 3,176,561 | 1,452,830 |
| | රක්ෂණ - සියලු අවදානම්, පොදු වගකීම්, මාර්ගස්ථ මුදල් සහ ගිනි | | 1,653,300 | 254,844 |
| | තැපැල් හා මුද්දර ගාස්තු | | 688,711 | 727,653 |
| | කුරියර් ගාස්තු | | 97,225 | 179,589 |
| | නීති ගාස්තු | | 1,643,885 | 561,165 |
| | විගණන ගාස්තු - අභ්‍යන්තර | | 1,539,580 | 1,330,830 |
| | විගණන ගාස්තු - බාහිර | | 1,290,000 | 2,008,900 |
| | පොදු වියදම් | | 445,040 | 1,618,519 |
| | වෙළඳ බදු | | 5,000 | 5,000 |
| | එකතු කල අගය මත බදු | | 23,397 | 18,147,438 |
| | ජාතිය ගොඩනැගීමේ බදු | | - | 168,881 |
| | ක්ෂය වීම් | 7 | 23,631,788 | 16,513,523 |
| | එකතුව | | 166,024,494 | 167,180,480 |

| | | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|---|
| 20 | ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධන වියදම් | | | |
| | ප්‍රාග්ධන වෙළඳපල සහ නිෂ්පාදිත සංවර්ධන | | 16,920,166 | 24,669,537 |
| | මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් | | 1,354,648 | 13,407,274 |
| | අධ්‍යාපන වැඩසටහන් | | 1,609,193 | 3,480,812 |
| | අන්තර්ජාතික සමාජික ගාස්තු - IOSCO | | 3,684,862 | 3,730,324 |
| | ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු | | - | 482,114 |
| | වෙළඳපොල ආවේක්ෂණ පිරිවැය | | 8,795,002 | 7,878,105 |
| | විමර්ශන හා පරීක්ෂණ වියදම් | | 3,134 | 88,458 |
| | එකතුව | | 32,367,005 | 53,736,624 |

| | | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|---|
| 21 | මූල්‍ය වියදම් | | | |
| | බැංකු ගාස්තු | | 40,887 | 64,525 |
| | එකතුව | | 40,887 | 64,525 |

| | | තත්‍ය 2020 රු. | අයවැය 2020 රු. | විචලනය රු. |
|---|---|---|---|---|
| 22 | තත්‍ය ආදායම හා වියදම අයවැය ලේඛනය සමග සැසඳීම | | | |
| | ආදායම | | | |
| | තැරව්කාර බලපත්‍ර ගාස්තු | 3,610,706 | 3,400,000 | 210,706 |
| | පරිපාලන බදු | 1,172,909 | 2,500,000 | (1,327,091) |
| | අධ්‍යාපන වැඩසටහන් | 3,480,239 | 4,138,000 | (657,761) |
| | පොලී ආදායම් | 5,360,805 | - | 5,360,805 |
| | අනෙකුත් ආදායම් | 78,755 | 4,441,664 | (4,362,909) |
| | කාර්යමණ්ඩල ණය පොලී ආදායම් | 738,471 | - | 738,471 |
| | රාජ්‍ය ප්‍රදාන - මු.අ.න.ව්‍යා. | 11,720,560 | - | 11,720,560 |
| | දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | (44,525) | - | (44,525) |
| | ශ්‍රී.සු.වි.කො.ස. මගින් උපයාගත් මුළු ආදායම | 26,117,920 | 14,479,664 | 11,638,256 |
| | | | | |
| | අඩු කළාः වියදම් | | | |
| | කාර්යමණ්ඩල පිරිවැය | (236,519,212) | (246,088,213) | (9,569,001) |
| | පරිපාලන හා ආයතනික පිරිවැය | (142,392,706) | (179,791,779) | (37,399,073) |
| | ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන පිරිවැය | (32,367,005) | (97,151,860) | (64,784,855) |
| | මූල්‍ය ගාස්තු | (40,887) | (70,978) | (30,091) |
| | මුළු අයභාර වියදම | (411,319,810) | (523,102,830) | (111,783,020) |
| | | | | |
| | අඩු කළාः ආදායම් බදු වියදම | - | - | - |
| | ආදායමට වැඩි අයභාර වියදම | (385,201,890) | (508,623,166) | (123,421,276) |

23. ප්‍රාග්ධන බැඳීම්

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නැත.

24. අසම්භාව්‍ය වගකීම්

2020 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

25. වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය කරනු ලබන ආකාරයේ සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදු වී නොමැත.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

26. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

2020 ජනවාරි 08 වන දින සිට බල පැවැත්වෙන පරිදි, ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස පත්කරන ලද අතර, එම මහතා 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2020 වර්ෂය තුළදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- මනිල් ජයසිංහ මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2020 ජනවාරි 07 වන දින සිට බල පැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හෙබවීම් හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික
- ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුළදී පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින්ගේ ධුරකාලය අවසන් කරන ලදී.

- එච්.ඒ. කරුණාරත්න මහතා - 2018 නොවැම්බර් 23 වන දින සිට බල පැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර, 2020 සැප්තැම්බර් 08 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා - 2020 සැප්තැම්බර් 15 වන දින සිට බල පැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය හෙබවීම හේතුවෙන් නිල බලයෙන් පත් වූ අතර, 2020 දෙසැම්බර් 31 වන දින ධුර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළදී දරන ලද සන්බන්ධතාවන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 08 වන දින සිට බල පැවැත්වෙන පරිදි භාරකරුවකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී. |
| මනිල් ජයසිංහ මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | 2020 ජනවාරි 07 වන දින සිට බල පැවැත්වෙන පරිදි සභාපති ධුරයට පත්වන ලදී. |
| | අර්න්ස්ට් අන්ඩ් යන්ග් | හවුල්කරු |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සාමාජික |

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් |
| | ලංකා බැංකුව | 2020 අප්‍රේල් 28 වන දින සිට බල පැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |
| | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත | 2020 අගෝස්තු 24 වන දින සිට බල පැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |
| | දේශීය ණය සහ සංවර්ධන අරමුදල | 2020 සැප්තැම්බර් 14 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සමාජික සහ සභාපති |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි භාරකරු ලෙස පත් කරන ලදී. |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | 2021 ජනවාරි 03 වන දින සිට වර්ෂ තුනක් (03) ක් සඳහා මණ්ඩල සාමාජික (2017 අංක 12 දරණ විදේශ විනිමය පනත අනුව පරීක්ෂණ මණ්ඩල සාමාජික) |
| සිසිර රත්නායක මහතා | නැත | නැත |
| නරේෂ් අබේසේකර මහතා | නැත | නැත |

කොමිෂන් සභාවේ ධුර කාලය අවසන් කල කොමිෂන් සභා සාමාජිකයින් විසින් වසර තුලදී දරණ ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| එච්.ඒ. කරුණාරත්න මහතා | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | සභාපති - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | සභාපති - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| | ශ්‍රී ලංකා වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම | සභාපති - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | අධ්‍යක්ෂ - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| | කලම්බු ඩොක්යාර්ඩ් පී.එල්.සී. | අධ්‍යක්ෂ - 2020 සැප්තැම්බර් 05 වන දින දක්වා |
| කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා මහා බැංකුව | නියෝජ්‍ය අධිපති |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | සභාපති - 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | සභාපති - 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා |
| | ආරක්ෂක අමාත්‍යාංශය - 'අපි වෙනුවෙන් අපි' අරමුදල කළමනාකරණ මණ්ඩලය | සාමාජික - 2020 මාර්තු 02 දින සිට බලපැවෙත්වෙන පරිදි |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම | සාමාජික - 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිඳු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් ලංකා බැංකුවේ හි පහත සඳහන් ජංගම ගිනුම් පවත්වාගෙන යන අතර ඒ එක් එක්හි බැංකු ශේෂයන් පහත දක්වා ඇත.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට ශේෂය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---:|---:|
| ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 0000001694 | 32,730,612 | (15,714,817) |
| | 0009919753 | 4,777,980 | 1,869,016 |
| | 83810081 | 856,470 | 14,922,951 |

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

2020 වර්ෂය තුළදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදුවිය.

| ආයෝජන වර්ගය | වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 396,000,000 | 50,000,000 |
| **මුළු එකතුව** | 396,000,000 | 50,000,000 |

මීට අමතරව, කොමිෂන් සභා සාමාජිකයින් විසින් පාලක මණ්ඩලහි සාමාජිකත්වය දරණ ආයතන සමග සලකා බලන වර්ෂය තුල සිදු වූ ගනුදෙනු පහත සඳහන් වගුවේ සඳහන් කර ඇත.

| ආදායකයාගේ නම | ගෙවීම පිළිබඳ විස්තරය | ගෙවූ දිනය | ගෙවූ අගය (රු.) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | පුහුණු ආයතනයක් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සමාජිකත්වය 2015 සිට 2020 දක්වා අලුත්කිරීම | 10/8/2020 | 77,500.00 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ 2020 වාර්ෂික ජාතික සමුළුව වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින් එකොලොස් දෙනෙකු (11) සහභාගී කිරීම නිමිත්තෙන් කරන ලද ගෙවීම | 11/19/2020 | 166,000.00 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සාමාජිකත්වය දරන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් 2021 වර්ෂය සඳහා සමාජිකත්ව අලුත් කිරීම සඳහා කරන ලද ගෙවීම් | 12/31/2020 | 156,000.00 |
| මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය විසින් පවත්වන ලද සමීක්ෂණ මණ්ඩල වැඩ මුළු වෙනුවෙන් කරන ලද ලියාපදිංචි කිරීමේ ගාස්තු | 9/16/2020 | 13,000.00 |
| මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය විසින් පවත්වන ලද ප්‍රසම්පාදන නිර්දේශ වැඩ මුළු වෙනුවෙන් කරන ලද ලියාපදිංචි කිරීමේ ගාස්තු | 9/22/2020 | 18,000.00 |
| මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය විසින් පවත්වන ලද විද්‍යුත් ප්‍රසම්පාදන පුහුණු වැඩ මුළු වෙනුවෙන් කරන ලද ලියාපදිංචි කිරීමේ ගාස්තු | 11/19/2020 | 4,000.00 |

සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. BAF/H/SEC/COM/1/20/5 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021 ජූනි 21

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලේ ("අරමුදල") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට හේතු වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂනයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදලේ පවත්වා ගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

අත්සන් කළේ:

**ඩබ්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනට | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | **969,902,655** | 1,174,059,197 |
| ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | - | 16,257,393 |
| කුලී තැන්පතු | - | 42,985,944 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| ඉදිරි මාස 12 තුල ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | - | 5,089,937 |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදල | - | 306,607,487 |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | **204,156,542** | 738,949,681 |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | **46,794,137** | 63,504,429 |
| ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | **183,599** | 371,575 |
| ලැබියයුතු සෙස් මුදල් | **11,266,847** | 3,231,075 |
| ලැබිය යුතු දෑ - ශ්‍රී.සු.වි.කො.ස. | **130,331,961** | 84,150,977 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | **1,425,824,301** | 350,000,000 |
| බැංකුවේ ඇති මුදල් | **11,855,751** | 4,555,986 |
| **මුළු වත්කම්** | **2,800,315,793** | 2,789,763,682 |
| | | |
| **අරමුදල් සහ වගකීම්** | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | |
| සමුච්චිත අරමුදල | **2,800,315,793** | 2,789,763,682 |
| | | |
| **මුළු අරමුදල් හා වගකීම්** | **2,800,315,793** | 2,789,763,682 |

118 සිට 121 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිලිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන්;

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න**
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ජී.පී.එන්. දිල්හානි**
මූල්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹ දී
2021 මැයි 11 දින දී ය.

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| වර්ෂය තුල ලද සෙස් මුදල් | | 528,483,025 | 223,020,518 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 167,565,413 | 223,049,955 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | | 5,724,385 | 31,259,631 |
| පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 46,017,563 | 10,656,817 |
| පොලී ආදායම - කාර්ය මණ්ඩල ණය | | - | 849,384 |
| **මුළු ආදායම** | | **747,790,386** | 488,836,305 |
| | | | |
| **වියදම** | | | |
| මෙහෙයුම් වියදම් සඳහා ශ්‍රී.සු.වි.කො.ස.ට මාරු කල අරමුදල | | (396,457,822) | (417,350,886) |
| බැංකු ගාස්තු | | (13,796) | (50,175) |
| **මුළු වියදම** | | **(396,471,618)** | (417,401,061) |
| | | | |
| ආදායම් බදු වියදම | 7 | (28,434,785) | - |
| | | | |
| **වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම** | | **322,883,983** | 71,435,244 |

118 සිට 121 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# සෙස් අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 2,789,763,682 | 2,770,944,811 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 322,883,983 | 71,435,244 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල් | (312,331,872) | (52,616,373) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 2,800,315,793 | 2,789,763,682 |

118 සිට 121 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 322,883,983 | 71,435,244 |
| කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 322,883,983 | 71,435,244 |
| | | |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | |
| කාර්ය මණ්ඩල ණය (වැඩි වීම)/අඩුවීම | 21,347,330 | 713,208 |
| ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩි වීම)/අඩු වීම | (8,035,772) | (1,822,794) |
| සම්පත් බැංකුවෙන් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩු වීම | - | 4,611 |
| ශ්‍රී.සු.වි.කො.ස.න් ලැබිය යුතු දෑ (වැඩි වීම)/අඩු වීම | (46,180,984) | (84,150,977) |
| භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 16,710,292 | (31,291,094) |
| භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | - | 1,904,008 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 187,976 | (318,424 |
| කල්බදු කුලී තැන්පතු (වැඩි වීම)/අඩු වීම | 42,985,944 | (2,475,444) |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | - | (23,756,398) |
| | 27,014,786 | (141,193,304) |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 349,898,769 | (69,758,060) |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජන | 306,607,487 | (18,055,738) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කල අරමුදල් | (312,331,872) | (52,616,373) |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 738,949,681 | 295,456,865 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | - | 134,892,100 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | 733,225,296 | 359,676,854 |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 1,083,124,065 | 289,918,794 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ) | 354,555,986 | 64,637,192 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ)** | 1,437,680,052 | 354,555,986 |
| | | |
| **සටහන (ඇ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 350,000,000 | 57,420,000 |
| බැංකුවේ ඇති මුදල් | 4,555,986 | 7,217,192 |
| එකතුව | 354,555,986 | 64,637,192 |
| | | |
| **සටහන (ඇ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 1,425,824,301 | 350,000,000 |
| බැංකුවේ ඇති මුදල් | 11,855,751 | 4,555,986 |
| එකතුව | 1,437,680,052 | 354,555,986 |

118 සිට 121 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14(ආ)(1) වගන්ති ප්‍රකාරව 'සෙස් බදු අරමුදල' යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටවනු ලැබිය යුතු අතර 14(අ) වගන්තිය යටතේ අයකරන ලද සෙස් බද්දෙන් ලැබෙන මුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුය' යන්න යටතේ පිහිටුවා ඇත.

සෙස් අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 14(ආ)(2) වන වගන්තියට අනුකූලව, කොමිෂන් සභාව විසින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාන සෙස් බදු අරමුදලෙන් පහත දැක්වෙන කාර්යන් සඳහා ගෙවිය යුතුය:

(අ) සුරැකුම්පත් වෙළඳපොල දියුණු කිරීම

(ආ) 38 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම; සහ

(ඇ) කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සඳහා එහි බලතල, කාර්ය හා කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම.

තව දුරටත්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14(ආ)(3) වගන්තිය යටතේ, සෙස් බදු අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයට, ආයෝජනය කල හැකිය.

සලකාබලන මූල්‍යමය කාලපරිච්ඡේදය තුල සෙස් අරමුදලෙහි අරමුණු වල වෙනසක් වී නොමැත.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සෙස් අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තින් හා සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා සෙස් අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස සෙස් අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් සෙස් අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව සෙස් අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට, සෙස් අරමුදල සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරකුපත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදලෙහි මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, සෙස් අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තින් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන, උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළයෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපතීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරිව අනුගමනය කර ඇත

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළයෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බල පැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තුවලට සිදුකරන ඉදිරිකාලීනව ව්‍යවහාර කරනු ලැබේ.

### 1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ සෙස් අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිඳු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

### 1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

### 1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

### 1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

### 1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

### 1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

## 2. වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

## 4. මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

### 4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5. වියදම් හඳුනා ගැනීම

සෙස් අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

## 6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

## 7. ආදායම් බදු වියදම්

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු වියදම | 14,315,868 | - |
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | 14,118,917 | - |
| එකතුව | 28,434,785 | - |

## 8. ප්‍රාග්ධන බැඳීම්

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

## 9. අසම්භාව්‍ය වගකීම්

2020 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

## 10. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි. ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස 2020 ජනවාරි 08 වන දින සිට බලපවත්වන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

**සෙස් අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2020 වර්ෂය තුලදී පහත පරිදි ධූරයන් හොබවන ලදී.

- මනිල් ජයසිංහ මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධූරය හෙබවීම හේතුවෙන්, 2020 ජනවාරි 07 වන දින සිට බලපවත්වන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධූරය හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික
- ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත්වූ කොමිෂන් සභා සාමාජිකයින් ධූර කාලය අවසන් කරන ලදී.

- එච්.ඒ. කරුණාරත්න මහතා, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධූරය දැරීම හේතුවෙන්, 2018 නොවැම්බර් 23 වන දින සිට පත්කරන ලද අතර, 2020 සැප්තැම්බර් 08 වන දින ධූර කාලය අවසන් කරන ලදී.
- කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධූරය දැරීම හේතුවෙන්, 2020 සැප්තැම්බර් 15 වන දින සිට පත්කරන ලද අතර, 2020 දෙසැම්බර් 31 වන දින ධූර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 08 වන දින සිට භාරකරුවෙකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්න ලදී. |
| මනිල් ජයසිංහ මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | 2020 ජනවාරි 07 වන දින සිට සභාපති ලෙස පත් කරන ලදී |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් | හවුල්කරු |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සාමාජික |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් |
| | ලංකා බැංකුව | 2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |
| | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන් සීමිත) | 2020 අගෝස්තු 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |
| | දේශීය ණය සංවර්ධන අරමුදල | 2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජික සහ සභාපති |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරු |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | මණ්ඩල සාමාජික (2021 ජනවාරි 03 වන දින සිට වර්ෂ තුනක කාලයක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය සභා පනතෙහි විමර්ශන මණ්ඩල සාමාජික) |
| සිසිර රත්නායක මහතා | නැත | නැත |
| නරේෂ් අබේසේකර මහතා | නැත | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත්වූ ධුර කාලය අවසන් කරන ලද කොමිෂන් සභා සාමාජිකයින්ගේ සම්බන්ධතාවයන් පහත වගුවෙන් දැක්වේ.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| එච්.ඒ. කරුණාරත්න මහතා | ශ්‍රී ලංකා මහ බැංකුව | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් නියෝජ්‍ය අධිපති |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා වෙස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගම | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් අධ්‍යක්ෂ |
| | කලම්බු ඩොක්යාර්ඩ් පී.එල්.සී. | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් අධ්‍යක්ෂ |
| කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා මහ බැංකුව | නියෝජ්‍ය අධිපති |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා සභාපති |
| | ආරක්ෂක අමාත්‍යාංශයේ - අපි වෙනුවෙන් අපි අරමුදලෙහි කළමනාකරණ මණ්ඩලය | 2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි සාමාජික |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දක්වා කාලය තුල සාමාජික |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම් පවත්වාගෙන යන අතර ඒවායෙහි ශේෂයන් පහත දැක්වෙන පරිදි වේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට ශේෂය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල | 0009834430 | 1,862,994 | 1,576,566 |

2020 වර්ෂය තුලදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී

| ආයෝජන වර්ගය | වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | නැත | 776,677,247 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 585,000,000 | නැත |
| එකතුව | 585,000,000 | 776,677,247 |

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සෙස් අරමුදල විසින්, ලංකා බැංකුව අරමුදල් කළමනාකරුවෙකු ලෙස කටයුතු කරන රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි රු. 312,331,872/- ක්, 2020 අප්‍රේල් 01 වන දින දක්වා ආයෝජනය කර තිබුන අතර, මෙම ආයෝජනය මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට එම දිනයේදීම අවශෝෂණය කරගන්නා ලදී.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } BAF/H/SEC/COM/1/20/5 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2021 ජූනි 21 |

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලේ ("අරමුදල") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය, වන්දි අරමුදලේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට හේතු වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

### 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂනයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදලේ පවත්වා ගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරුප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

### 2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඍ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

අත්සන් කළේ:

**ඩබ්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනට | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 242,875,161 | 282,481,909 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 39,606,748 | 98,973,250 |
| ලැබිය යුතු පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | 9,308,709 | 10,399,835 |
| ලැබිය යුතු පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | 32,027 | 73,489 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 248,721,328 | 69,852,733 |
| බැංකුවේ ඇති මුදල් | 99,580 | 182,728 |
| **මුළු වත්කම්** | 540,643,553 | 461,963,944 |
| | | |
| **අරමුදල් සහ වගකීම්** | | |
| **යොදවා ඇති අරමුදල් සහ සංචිත** | | |
| සමුච්චිත අරමුදල | 521,752,939 | 461,963,944 |
| | | |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු දෑ - ශ්‍රී.සු.වි.කො.ස. | 18,890,614 | - |
| | | |
| **මුළු අරමුදල් හා වගකීම්** | 540,643,553 | 461,963,944 |

129 සිට 132 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිලිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන්;

**චින්තක මෙන්ඩිස්**
අධ්‍යක්ෂ ජෙනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න**
සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ජී.පී.එන්. දිල්හානි**
මූල්‍ය අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

කොළඹ දී
2021 මැයි 11 වන දින දී ය.

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| පොලී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර | | 33,778,140 | 42,191,522 |
| පොලී ආදායම - ප්‍රතිමිලදී ගැනුම් | | 8,602,751 | 2,345,856 |
| වර්ෂය තුලදී වැරදි සමතයකට පත්කිරීමෙන් ලද වන්දි | | 36,300,000 | - |
| මුළු ආදායම | | 78,680,891 | 44,537,378 |
| | | | |
| වියදම | | | |
| බැංකු ගාස්තු | | (1,282) | (15,990) |
| මුළු වියදම | | (1,282) | (15,990) |
| | | | |
| ආදායම් බදු වියදම | 7 | (18,890,614) | - |
| | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | | 59,788,995 | 44,521,388 |

129 සිට 132 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# වන්දි අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 461,963,944 | 417,442,556 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 59,788,995 | 44,521,388 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 521,752,939 | 461,963,944 |

129 සිට 132 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මුල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 59,788,995 | 44,521,389 |
| කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 59,788,995 | 44,521,389 |
| | | |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | |
| භාණ්ඩාගාර බැඳුම්කරවලින් ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 1,091,126 | (5,026,281) |
| ප්‍රතිමිලදී ගැනුම් මත ලැබිය යුතු පොලී ආදායම් (වැඩි වීම)/අඩු වීම | 41,462 | (71,939) |
| ශ්‍රී.සු.වි.කො.ස.ට ගෙවිය යුතු දෑ වැඩි වීම/(අඩු වීම) | 18,890,614 | - |
| | 20,023,201 | (5,098,220) |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 79,812,197 | 39,423,169 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 98,973,250 | 29,045,670 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | 98,973,250 | 29,045,670 |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 178,785,447 | 68,468,839 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඉ ) | 70,035,461 | 1,566,623 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඊ)** | 248,820,908 | 70,035,461 |
| | | |
| **සටහන (ඉ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 69,852,733 | 1,458,573 |
| බැංකුවේ ඇති මුදල් | 182,728 | 108,050 |
| එකතුව | 70,035,461 | 1,566,623 |
| | | |
| **සටහන (ඊ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 248,721,328 | 69,852,733 |
| බැංකුවේ ඇති මුදල් | 99,580 | 182,728 |
| එකතුව | 248,820,908 | 70,035,461 |

129 සිට 132 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

## 1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 1.1 වාර්තා කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල, 1991 අංක 26, 2003 අංක 18 සහ 2009 අංක 47 යන පනත් මගින් සංශෝධිත, 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂ සභා පනතේ 38 (1) වගන්ති ප්‍රකාරව 'බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දෙකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්ය සඳහා වන්දි අරමුදල නම් වූ අරමුදලක් පිහිටවිය යුතුය' යන්න යටතේ පිහිටුවා ඇත.

වන්දි අරමුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුල ස්ථාපිත කර ඇති අතර, කොළඹ 01, එච්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි 28 හා 29 වන මහලයන් හි පිහිටා ඇත.

### 1.2 මෙහෙයුම් වල ස්වභාවය සහ ප්‍රධාන කාර්යන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි 38 (1) වන වගන්තියට අනුකූලව, වන්දි අරමුදල පිහිටුවීමේ අරමුණ වන්නේ, බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු වෙළෙන්දෙකු හෝ බලපත්‍ර ලත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවෙකු සිය ගිවිසුම් බැඳීම් ඉටු කිරීමට අසමත් වීම හේතුකොටගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමයි.

තවද, ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 38(2) වගන්තියට අනුව වන්දි අරමුදල සමන්විත වන්නේ;

(අ) අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන මුදල් ප්‍රමාන වලින්

(ආ) 51(අ) වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලබන මුදල් ප්‍රමාන වලින්;

(ඇ) 14(ආ) වගන්තිය යටතේ සෙස් බදු අරමුදලින් බැර කරනු ලැබිය හැකි මුදල් ගණන්

එමෙන්ම ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 38 (3) වගන්තියට අනුව වන්දි අරමුදල අයත් මුදල් කොමිෂන් සභාව විසින් තමන් තීරණය කරන ආකාරයට ආයෝජනය කරනු ලැබිය හැකිය.

සලකාබලන මූල්‍යමය කාලපරිච්චේදය තුල වන්දි අරමුදලෙහි අරමුණු වල වෙනසක් වී නොමැත.

### 1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකසා තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වන්දි අරමුදලේ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සටහන් වලින් සමන්විත වේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාවේ සාමාජිකයින් සතු වේ.

### 1.5 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා වන්දි අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස වන්දි අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් වන්දි අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වෙක්ෂණය නොකරයි. ඒ අනුව වන්දි අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

### 1.6 පිළියෙළ කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත්ප්‍රකාරව, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ විගණන කමිටුවේ නිර්දේශයක් පරිදි 2020 ජනවාරි 01 වන දින සිට වන්දි අරමුදල සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට තීරණය කරන ලදී. එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලෙහි මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිලිබඳ ප්‍රකාශය, වන්දි අරමුදලේ වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ඒවාට අදාළ සටහන් වලින් පමණක් සමන්විත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත. උචිත අවස්ථාවන්හිදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන්වල හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළයෙල කර ඇති අතර සහ ගිණුම්කරණ ප්‍රතිපතීන් කාලපරිච්ඡේදය පුරා ඒකාකාරිව අනුගමනය කර ඇත

### 1.7 ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි වාර්තාගත ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් වලට බලපාන ලෙස විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතා කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙලෙස භාවිතා කරන උපකල්පන සහ ඇස්තමේන්තු වල ඇති අවිනිශ්චිතතාවයෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත කාලයට බල පැවැත්වෙන ලෙස අදාළ වත්කම් හා වගකීම් වල ධාරණ අගයන් හි ප්‍රමාණාත්මක ගැලපීම් ඇති විය හැක. ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කිරීම සිදුවේ. ඇස්තමේන්තුවලට සිදුකරන සංශෝධන ඉදිරිකාලීනව ව්‍යවහාර කරනු ලැබේ.

වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1.8 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන වාර්තා කරනු ලබන්නේ වන්දි අරමුදලේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සලකා බලන වර්ෂය තුලදී ආයතනයේ වාර්තා කරන හා ක්‍රියාකාරී මුදල් ඒකකයෙහි කිසිදු වෙනසක් සිදු වී නැත. විදේශ මුදල් හුවමාරු ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලබන්නේ, අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පවතින විදේශ විනිමය හුවමාරු අනුපාතයට අනුවය.

1.9 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

එක් එක් කාණ්ඩයන්ට අයත් ප්‍රමාණාත්මක හා සමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ. ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර, ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතමයන් මූල්‍ය ප්‍රකාශන වල වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

1.10 හිලව් කිරීම

වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් අවශ්‍ය කර හෝ අවසර දී ඇති විටදී හෝ හිලව් කිරීම මගින් පරිශීලකයන් හට අවබෝධ කර ගැනීමට අපහසු වූ ගනුදෙනුවක්, යම්කිසි සිද්ධියක්, තත්වයක් පිලිබඳ හරය පිළිබිඹු වේ නම් හෝ ශ්‍රී.ල.සු.වි.කො.ස. හි අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමට පිටිවහල් වේනම් හෝ පමණි.

1.11 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

1.12 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.13 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

2 වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු වල හා කෙටි කාලීන ආයෝජන වලත්, රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වලත් ආයෝජන සිදු කර ඇත. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

3 වගකීම් හා ප්‍රතිපාදන

3.1 වගකීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනුයේ, වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් තුල හෝ ඉල්ලූ විට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට පසු ගෙවිය යුතු වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම හඳුනාගත් වගකීම් පිරිවැය යටතේ ගිණුම්ගත කර ඇත.

4 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

4.1 පොලී ආදායම

ආයෝජන වල පොලී අදායම මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙහි උපචිත පදනම මත හඳුනා ගැනේ.

4.2 වන්දි මුදල් ලැබීම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව වන්දි අරමුදලට ලැබෙන වන්දි මුදල්, 'මුදල් පදනම' මත හඳුනා ගනු ලැබේ.

4.3 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

5 වියදම් හඳුනා ගැනීම

වන්දි අරමුදල පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලුම වියදම් උපචිත පදනම මත හඳුනා ගන්න අතර එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ මාස තුනට අඩු කාලයකින් කල් පිරෙන ප්‍රතිමිලදී ගැනීම් මත ආයෝජනවලින් සමන්විත වේ.

7 ආදායම් බදු වියදම්

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | 18,890,614 | - |
| | 18,890,614 | - |

### 8 ප්‍රාග්ධන බැඳීම්

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

### 9 අසම්භාව්‍ය වගකීම්

2020 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

### 10 සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජිකයින් විසිනි. ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති ලෙස 2020 ජනවාරි 08 වන දින සිට බල පැවැත්වෙන පරිදි, පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී.

පහත සඳහන් කොමිෂන් සභා සාමාජිකයින් 2020 වර්ෂය තුලදී පහත පරිදි ධුරයන් හොබවන ලදී.

- මනිල් ජයසිංහ මහතා - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපති ධුරය හෙබවීම හේතුවෙන්, 2020 ජනවාරි 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික.
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - සමාගම් රෙජිස්ට්‍රාර් ධුරය හේතුවෙන් නිල බලයෙන් පත් වූ සාමාජික
- ආර්.එම්.පී. රත්නායක මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේඛම් ධුරය දැරීම හේතුවෙන් 2020 ජනවාරි 16 වන දින සිට නිල බලයෙන් පත්වූ සාමාජික
- ජනාධිපති නීතිඥ සුහද ගම්ලත් මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සිසිර රත්නායක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- සුනිල් ලංකාතිලක මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.
- නරේෂ් අබේසේකර මහතා - 2020 ජනවාරි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

වර්ෂය තුලදී පහත සඳහන් නිල බලයෙන් පත්වූ කොමිෂන් සභා සාමාජිකයින් ධුර කාලය අවසන් කරන ලදී.

- එච්.ඒ. කරුණාරත්න මහතා, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දැරීම හේතුවෙන්, 2018 නොවැම්බර් 23 වන දින සිට පත්කරන ලද අතර, 2020 සැප්තැම්බර් 08 වන දින ධුර කාලය අවසන් කරන ලදී.
- කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා, ශ්‍රී ලංකා මහා බැංකුවේ නියෝජ්‍ය අධිපති ධුරය දැරීම හේතුවෙන්, 2020 සැප්තැම්බර් 15 වන දින සිට පත්කරන ලද අතර, 2020 දෙසැම්බර් 31 වන දින ධුර කාලය අවසන් කරන ලදී.

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 08 වන දින සිට භාරකරුවෙකු ලෙස පත් කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්න ලදී. |
| මනිල් ජයසිංහ මහතා | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | 2020 ජනවාරි 07 වන දින සිට සභාපති ලෙස පත් කරන ලදී |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් | හවුල්කරු |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | නිල බලයෙන් පත් වූ සාමාජික |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | සාමාජික |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් |
| | ලංකා බැංකුව | 2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |

**වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආර්.එම්.පී. රත්නායක මහතා | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන් සීමිත) | 2020 අගෝස්තු 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිල බලයෙන් පත් වූ සාමාජික |
| | දේශීය ණය සංවර්ධන අරමුදල | 2020 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභා සාමාජික සහ සභාපති |
| | පියවීම් සහතික කිරීමේ අරමුදල | 2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකරු |
| සුනිල් ලංකාතිලක මහතා | මුදල් අමාත්‍යාංශය | මණ්ඩල සාමාජික (2021 ජනවාරි 03 වන දින සිට වර්ෂ තුනක කාලයක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය සභා පනතෙහි විමර්ශන මණ්ඩල සාමාජික) |
| සිසිර රත්නායක මහතා | නැත | නැත |
| නරේෂ් අබේසේකර මහතා | නැත | නැත |

වර්ෂය තුළදී පහත සඳහන් නිල බලයෙන් පත්වූ ධුර කාලය අවසන් කරන ලද කොමිෂන් සභා සාමාජිකයින්ගේ සම්බන්ධතාවයන් පහත වගුවෙන් දැක්වේ.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| එච්.ඒ. කරුණාරත්න මහතා | ශ්‍රී ලංකා මහ බැංකුව | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් නියෝජ්‍ය අධිපති |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා වෙස්ට් කෝස්ට් පවර් (පුද්) සමාගම | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් සභාපති |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් අධ්‍යක්ෂ |
| | කලම්බු ඩොක්යාර්ඩ් පී.එල්.සී. | 2020 සැප්තැම්බර් 05 වන දින තෙක් අධ්‍යක්ෂ |
| කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා මහ බැංකුව | නියෝජ්‍ය අධිපති |
| | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා සභාපති |
| | ආරක්ෂක අමාත්‍යාංශයේ - අපි වෙනුවෙන් අපි අරමුදලෙහි කළමණාකරණ මණ්ඩලය | 2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි සාමාජික |
| | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව | 2020 සැප්තැම්බර් 05 වන දින සිට 2020 දෙසැම්බර් 31 වන දක්වා කාලය තුළ සාමාජික |

වෙළඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශ්වයන් අතර වර්ෂය තුළදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම් පවත්වාගෙන යන අතර ඒවායෙහි ශේෂයන් පහත දැක්වෙන පරිදි වේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට ශේෂය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදල | 75433985 | 99,580 | 182,728 |

2020 වර්ෂය තුළදී පහත සඳහන් ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු කරන ලදී

| ආයෝජන වර්ගය | වර්ෂය තුළදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | නැත | 158,799,420 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 171,000,000 | නැත |
| **එකතුව** | 171,000,000 | 158,799,420 |

පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } BAF/H/SEC/COM/1/20/5   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2021 ජූනි 21

සභාපති
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ ("අරමුදල") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1998 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවක් ලෙස අරමුදල පිහිටුවීමට සම්බන්ධ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන හාර ඔප්පුවේ 11 (ඩී) ඡේදයෙහි විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය යි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙළ කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

**පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# විගණකාධිපති වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්ති ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිලිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගත යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි වල තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීමය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මග හැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් අභිබවා යාම, වංචාවක් ඇතිවීමට හේතු වන බැවින්, වංචාවක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් ඇති විය හැකි අවදානම, වැරද්දක් නිසා සිදු වූ ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් අනාවරණය කර නොගැනීමෙන් වන අවදානමට වඩා ප්‍රබල වේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනයන් සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිලිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශන වල ඒ සබන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කල යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කල යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

### 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

### 2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

අත්සන් කළේ:

**ඩබ්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනට | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | **473,635,565** | 628,786,625 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | | **300,000,000** | - |
| | | | |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | | **155,151,060** | 217,524,480 |
| ලැබිය යුතු පොලී ආදායම් | 5 | **28,265,386** | 21,994,314 |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | | **30,486,575** | 75,100,000 |
| බැංකුවේ ඇති මුදල් | | **238,938** | 430,853 |
| **මුළු වත්කම්** | | **987,777,524** | 943,836,272 |
| | | | |
| **සංචිත සහ වගකීම්** | | | |
| **සංචිත** | | | |
| ප්‍රදාන - මහා භාණ්ඩාගාරය | | **50,000,000** | 50,000,000 |
| ප්‍රදාන - සෙස් අරමුදල | | **100,000,000** | 100,000,000 |
| ප්‍රදාන - කොළඹ කොටස් හුවමාරුව | | **100,000,000** | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | **732,213,570** | 657,864,112 |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ආදායම් බදු | | **5,453,954** | 35,822,160 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 6 | **110,000** | 150,000 |
| | | | |
| **මුළු සංචිත හා වගකීම්** | | **987,777,524** | 943,836,272 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල සඳහා සහ ඒ වෙනුවෙන්,

**චින්තක මෙන්ඩිස්**
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

**ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න**
භාරකරු - පියවීම් සහතික කිරීමේ අරමුදල

කොළඹ දී
2021 මැයි 11 වන දින දී ය.

**පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ආයෝජන මත පොලී ආදායම් - ප්‍රතිමිලදී ගැනීම් | | 6,316,460 | 4,728,020 |
| ආයෝජන මත පොලී ආදායම් - භාණ්ඩාගාර බැඳුම්කර | | 75,022,727 | 86,456,671 |
| ආයෝජන මත පොලී ආදායම් - ස්ථාවර තැන්පතු | | 9,780,823 | - |
| මුළු ආදායම | | 91,120,010 | 91,184,691 |
| | | | |
| **වියදම්** | | | |
| විගණන ගාස්තු | | (176,000) | (166,370) |
| බැංකු ගාස්තු | | (750) | (15,870) |
| මුළු වියදම | | (176,750) | (182,240) |
| | | | |
| ආදායම් බදු වියදම | 7 | (16,593,802) | (35,822,160) |
| | | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | | 74,349,458 | 55,180,291 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 657,864,112 | 602,683,822 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 74,349,458 | 55,180,291 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 732,213,570 | 657,864,112 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

**පියවීම් සහතික කිරීමේ  අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | 74,349,458 | 55,180,292 |
| කාරක ප්‍රග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 74,349,458 | 55,180,292 |
| | | |
| **කාරක ප්‍රග්ධනයේ වෙනස්වීම** | | |
| අනෙකුත් ලැබියයුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (6,271,072 | (4,548,001) |
| ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (30,408,206) | 35,662,160 |
| | (36,679,278) | 31,114,159 |
| | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් | 37,670,180 | 86,294,451 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන | 217,524,480 | (40,243,085) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන | (300,000,000) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (82,475,520) | (40,243,085 |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | (44,805,340) | 46,051,366 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | 75,530,853 | 29,479,487 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ)** | 30,725,513 | 75,530,853 |
| | | |
| **සටහන (අ)** | | |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 75,100,000 | 29,000,000 |
| බැංකුවේ ඇති මුදල් | 430,853 | 479,487 |
| එකතුව | 75,530,853 | 29,479,487 |
| | | |
| **සටහන (ආ)** | | |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | | |
| ප්‍රතිමිලදී ගැනුම් මත ආයෝජන | 30,486,575 | 75,100,000 |
| බැංකුවේ ඇති මුදල් | 238,938 | 430,853 |
| එකතුව | 30,725,513 | 75,530,853 |

139 සිට 142 දක්වා පිටු අංක වල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංගත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල යනු ලාභ නොලබන භාරයකි. එහි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළ කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම පියවීම සහතික කිරීමේ අරමුදලේ භාරකාර මණ්ඩලය සතු වේ.

1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සැලකියයුතු අනාගත කාලයක් සඳහා පියවීම් සහතික කිරීමේ අරමුදල පවත්වාගෙන යාමට ඇති හැකියාව භාරකාර මණ්ඩලය විසින් තක්සේරු කර ඇත. පුරෝකථනය කල හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස පියවීම් සහතික කිරීමේ අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට භාරකාර මණ්ඩල සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් පියවීම් සහතික කිරීමේ අරමුදල මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව පියවීම් සහතික කිරීමේ අරමුදල එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කිරීම සිදු කරයි.

1.4 පිළියෙළ කිරීමේ පදනම

පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. එම මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත ඓතිහාසික පිරිවැයට පිළියෙළ කර ඇත. එමෙන්ම උචිත අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඉදිරි සටහන් වල දක්වා ඇත.

1.5 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම්.

සියලුම ප්‍රමාණාත්මක වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදුවීම් සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි අදාල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර ඇත.

1.6 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සංගත වේ.

1.7 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ වාර්තා කිරීමේ යම් වෙනස් කමක් සිදු වී ඇති නම් ඒ හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු වෙනස් කොට ඇත.

2. වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

2.1 ආයෝජන

අරමුදලේ ආයෝජන සිදු කරනු ලබන්නේ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතුවල හා බලපත්‍රලාභී රාජ්‍ය ආයතනවල ප්‍රතිමිලදී ගැනුම් ආයෝජනවලය. මෙම ආයෝජන පිරිවැය යටතේ දක්වා ඇති අතර, කාලච්ඡේදය අවසානය තෙක් ලැබිය යුතු පොලිය උපචිත පදනමින් සටහන් කර ඇත.

2.2 ලැබියයුතු දෑ

ලැබිය යුතු දෑ ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට දක්වා ඇත.

3. වගකීම් සහ ප්‍රතිපාදන

3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

අරමුදලෙහි සියලුම කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණ කාලීන සේවකයින් නොමැති බැවින් 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත් ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

3.2 ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ පිරිවැය යටතේ දක්වා ඇත.

4. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොලී ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

4.2 වියදම් හඳුනාගැනීම

පියවීම් සහතික කිරීමේ අරමුදල පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම ගෙවීම් උපචිත පදනම මත හඳුනා ගනු ලබන අතර මූල්‍ය කාර්යසාධනය ඇගයීමේදී ඒවා ආදායමට අය කරනු ලැබේ.

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, මුදල් හා මුදල් සමාන දෑ, අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් හා බැංකුවේ ඇති මාස තුනට අඩු කල් පිරීමක් ඇති ප්‍රතිමිලදී ගැනුම් ආයෝජන වලින් සමන්විත වේ.

**පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

### 5. ලැබිය යුතු දෑ

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| ලැබියයුතු පොලී ආදායම් | | |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 18,480,637 | 21,915,304 |
| - ස්ථාවර තැන්පතු | 9,780,823 | - |
| - ප්‍රති මිලදී ගැනීම් | 3,926 | 79,010 |
| එකතුව | 28,265,386 | 21,994,314 |

### 6. ගෙවිය යුතු දෑ

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| විගණන ගාස්තු | 110,000 | 150,000 |
| එකතුව | 110,000 | 150,000 |

### 7. ආදායම් බදු වියදම්

2017 අංක 24 දරන සංශෝධිත දේශීය ආදායම් බදු පනත් ප්‍රකාරව ආදායම් බදු වගකීම් ගණනය කර ඇත.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| තක්සේරු වර්ෂ 2018/2019 සඳහා ආදායම් බදු වියදම | - | 14,205,587 |
| තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු වියදම | 224,015 | 21,616,573 |
| තක්සේරු වර්ෂ 2020/2021 සඳහා ආදායම් බදු වියදම | 16,369,787 | - |
| එකතුව | 16,593,802 | 35,822,160 |

### 8. ප්‍රාග්ධන බැඳීම්

2020 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවීය.

### 9. අසම්භාව්‍ය වගකීම්

2020 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නැත.

### 10. වාර්තාකරණ දිනට පසු සිදුවීම්

භාරකරුවන් විසින් සිද්ධීන් ඉතා සමීපව අධ්‍යයනය කරන අතර, අවශ්‍යවිටදී ප්‍රමාණාත්මක සිදුවීම් සම්බන්ධයෙන් අදළ ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශනයන්හි සිදු කරනු ලැබේ.

### 11. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

අරමුදලේ භාරකරුවන් ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්වරයාත්, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාත් ක්‍රියා කරනු ලැබේ.

2020 වර්ෂය තුලදී පහත නම් සඳහන් භාරකරුවන් පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස ධුරයන් දරන ලදී.

- ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපති (2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත් කරන ලද අතර 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී)
- දුමිත් ප්‍රනාන්දු මහතා - කොළඹ කොටස් හුවමාරුවේ සභාපති (2020 ජුලි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පත්කරන ලදී.)
- රජීව බණ්ඩාරනායක මහතා - කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරි
- ආර්.එම්.පී. රත්නායක මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ, කොමිෂන් සභා සාමාජික සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් (2020 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)
- චින්තක මෙන්ඩිස් මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල් (2020 මාර්තු 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.)
- රේ අබේවර්ධන මහතා - කොළඹ කොටස් හුවමාරුවේ හිටපු සභාපති (2020 ජුනි 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකාර ධුරය අවසාන කරන ලදී)
- වජිර විජේගුණවර්ධන මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් (2020 පෙබරවාරි 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි භාරකාර ධුරය අවසාන කරන ලදී)

අරමුදලේ භාරකරුවන් විසින් වර්ෂය තුලදී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරීත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| ජනාධිපති නීතිඥ විරාජ් දයාරත්න මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 2020 ජනවාරි 08 වන දින සිට බලපැවැත්වෙන පරිදි සභාපති ලෙස පත්කරන ලද අතර, 2020 ජනවාරි 22 වන දින සිට වැඩ බාරගන්නා ලදී. | නැත |
| දුමිත් ප්‍රනාන්දු මහතා | කොළඹ කොටස් හුවමාරුව | සභාපති - 2020 ජුලි 01 වන දින සිට | නැත |
| | පන්තේරා වෙන්චර්ස් පුද්ගලිග සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | පී.වී.ගෝල් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | පී.වී. හිල්ටොප් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | ඔමැක් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම | සභාපති | <10% |
| | ටෙකිටෙස් පුද්ගලික සමාගම | සභාපති/අධ්‍යක්ෂ | 10.34% |
| | වන් සීසන් ප්‍රොපර්ටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 48.6% |
| | ඩිවූ පැරඩයිස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 48.6% |
| | අනීවා පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | <11.8% |
| | ජෙනරේටර් සොලියුෂන්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 48.6% |
| | ජුවෙලෙක්ස් ඇග්‍රි කුමාරගම පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 15% |
| | ඒෂියා සිකියුරිටීස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 76.7% |
| | ඒෂියා සිකියුරිටීස් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 27.64% |
| | ඒෂියා සිකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 27.64% |
| | ඒ-සෙක් කැපිටල් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 100% |
| | ඒෂියා සිකියුරිටීස් ඇඩ්වයිසර්ස් පුද්ගලික සමාගම | අධ්‍යක්ෂ | 27.64% |
| | සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| රජීව බණ්ඩාරනායක මහතා | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරි | නැත |
| | ලංකා මූල්‍ය සේවා කාර්යාංශය (LFSBL) | අධ්‍යක්ෂ | නැත |
| ආර්.එම්.පී. රත්නායක මහතා | මහා භාණ්ඩාගාරය | නියෝජ්‍ය ලේකම් | නැත |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2020 ජනවාරි 16 වන දින සිට | නැත |
| | ලංකා බැංකුව | නිල බලයෙන් පත් වූ සාමාජික - 2020 අප්‍රේල් 28 වන දින සිට | නැත |
| | මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රාලය (ඇපයෙන්) සීමිත සමාගම | නිල බලයෙන් පත් වූ සාමාජික - 2020 අගෝස්තු 24 වන දින සිට | නැත |
| | දේශීය ණය සංවර්ධන අරමුදල (LLDF) | කොමිෂන් සභා සාමාජික හා සභාපති - 2020 සැප්තැම්බර් 14 වන දින සිට | නැත |
| චින්තක මෙන්ඩිස් මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ ජෙනරාල් - 2020 මාර්තු 02 වන දින සිට | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2020 මාර්තු 02 වන දින සිට | නැත |
| | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | භාරකරු - 2020 මාර්තු 02 වන දින සිට | නැත |

**පියවීම් සහතික කිරීමේ වන්දි අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව**

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

| නම | සම්බන්ධිත ආයතනයේ නම | සම්බන්ධතාවය | කොටස් හිමිකාරීත්වය (අදාළ නම්) |
|---|---|---|---|
| රේ අබේවර්ධන මහතා | කොළඹ කොටස් හුවමාරුව | සභාපති - 2020 ජූනි 30 දක්වා සහ ඉන්පසු අධ්‍යක්ෂක ලෙස | නැත |
| | ඇක්විටි පාර්ට්නර්ස් පුද්ගලික සමාගම | කළමනාකරණ අධ්‍යක්ෂ | නැත |
| | ඇක්විටි සෙක්යුරිටීස් පුද්ගලික සමාගම | සභාපති | නැත |
| | ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් පුද්ගලික සමාගම | සභාපති | නැත |
| | මධ්‍යම තැන්පතු හුවමාරුව | අධ්‍යක්ෂ | නැත |
| | සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ලංකා වෙන්චර්ස් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | එල්.වී.එල්. එනර්ජි ෆන්ඩ් පී.එල්.සී. | අධ්‍යක්ෂ | නැත |
| | ගාඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | අධ්‍යක්ෂ | නැත |
| වජිර විජේගුණවර්ධන මහතා | ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | අධ්‍යක්ෂ ජෙනරාල් - 2020 පෙබරවාරි 28 දක්වා | නැත |
| | ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය | නිල බලයෙන් පත් වූ සාමාජික - 2020 පෙබරවාරි 28 දක්වා | නැත |
| | ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල | භාරකරු - 2020 පෙබරවාරි 28 දක්වා | නැත |

වෙළඳපොල මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාර ගනුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන්/ආයතන සමඟ වර්ෂය තුලදී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

පියවීම් සහතික කිරීමේ අරමුදල විසින් ලංකා බැංකුවේ පහත සඳහන් ජංගම ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර ඒ එක් එක් ගිණුමෙහි ශේෂය පහත දක්වා ඇති පරිදි වේ.

| ජංගම ගිණුමේ නම | ගිණුම් අංකය | 2020.12.31 දිනට ශේෂය | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| පියවීම් සහතික කිරීමේ අරමුදල - ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | 1833 | 238,938 | 430,853 |

2020 වර්ෂය තුලදී පහත දැක්වෙන ආයෝජනයන් ලංකා බැංකුව හරහා සිදු විය.

| ආයෝජන වර්ගය | වර්ෂය තුලදී ලංකා බැංකුවේ කරන ලද ආයෝජන (රු.) | 2020 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ ඇති ශේෂය (රු.) |
|---|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | නැත | 375,874,050 |
| ප්‍රතිමිලදීගැනුම් මත ආයෝජන | 915,706,442 | නැත |
| එකතුව | 915,706,442 | 375,874,050 |

# සටහන්

# සටහන්

# සාංගමික තොරතුරු

**කාර්යාලීය ලිපිනය**

28 සහ 29 වන මහල
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව

**දුරකථනය**

+94 11 2143843

**ෆැක්ස්**

+94 11 2439149

**ඊ-මේල්**

mail@sec.gov.lk

**වෙබ් අඩවිය**

www.sec.gov.lk

**ගිණුම්කරණ වර්ෂය**

2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**විගණකවරු**

විගණකාධිපති

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
සම්පත් බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව



පිටකවරය නිර්මාණය කරන ලද්දේ
**ආශාරා සෙනෙවිරත්න මෙනෙවිය**, සහකාර කළමනාකාරිනී, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව


Designed & produced by
emagewise
Printed by Gunaratne Offset (Pvt) Ltd

SEC SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA